- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXVI කොටස සහ හයවැනි කාණ්ඩයේ XXVI කොටස; සහ
- 2025 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ I කොටස මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Reports be printed.

II

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩය 2024 ජූනි 30 දිනට ලියාපදිංචි බදු ගෙවන්නන්ගෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අයවිය යුතු වූ නිහ බදු, දඩ හා පොලී මුදල් පිළිබඳ විශේෂ විගණන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතු ය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තාව, මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්, නියෝගය සහ නියම ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂයේ තුන්වන සහ හතරවන කාර්තු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව;

(ii) 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්;

(iii) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 පෙබරවාරි 24 දිනැති අංක 2477/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iv) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/05 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 මාර්තු 03 දිනැති අංක 2478/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

මෙම වාර්තාව, මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම්, නියෝගය සහ නියම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කොළඹ මහ නගර සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු අනුර කරුණාතිලක මහතා]

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර 2025 ජූලි මසදී අත්සන් කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

මෙම නියමය අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තා
நிலைக்கட்டளை இல. 52(6)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 52(6)

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත
காணி அபிவிருத்தி (திருத்தம்) சட்டமூலம்
LAND DEVELOPMENT (AMENDMENT) BILL

"ඉඩම් සංවර්ධන (සංශෝධන) නමැති පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

පනත් කෙටුම්පත 2026 මැයි 20වන බදාදා දෙවන වර කියවීය යුතුයයි නියෝග කරන ලදී.
சட்டமூலம் 2026 மே 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.
Bill ordered to be read a Second time upon Wednesday, 20th May, 2026.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
கோதாகொட குணரதன நாஹிமி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
KODHAGODA GUNARATHANA NAHIMI FOUNDATION (INCORPORATION) BILL

"කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

පනත් කෙටුම්පත 2026 මැයි 20වන බදාදා දෙවන වර කියවීය යුතුයයි නියෝග කරන ලදී.
சட்டமூலம் 2026 மே 20, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.
Bill ordered to be read a Second time upon Wednesday, 20th May, 2026.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Speaker, as Pro-tem Chair of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the -

(i) Annual Economic Review of the Central Bank of Sri Lanka for the year 2025; and

(ii) Inland Revenue (Amendment) Bill,

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Speaker, I want to point out a few matters. The Central Bank Report was tabled, and the response of the Governor to certain questions that we raised has been unnecessarily sensationalized by some social media posts.

I see that even today's "Daily Mirror" reports it. The response was in keeping with a question related to inflation targeting. The article is titled "Rupee value slides against major currencies". That is a fact. The same issue has also been raised in some social media posts. That article states, I quote:

> "Meanwhile, addressing the Committee on Public Finance (CoPF), the Governor said the import bill had increasingly exceeded export revenue, primarily due to rising oil prices, which had resulted in the depreciation of the rupee."

That is a fact. Then, it goes on to state, I quote:

> "The oil import bill of the Ceylon Petroleum Corporation (CPC) had exceeded US$ 1 billion for the first four months of this year, according to him.
>
> Sri Lanka Muslim Congress (SLMC) leader MP Rauff Hakeem, who chaired the CoPF meeting, asked whether Sri Lanka was taking measures to mitigate economic risks arising from the fallout of the Middle East conflict.
>
> Dr. Weerasinghe stressed the need for such measures to be taken in consultation between the Central Bank and the Ministry of Finance."

Actually, this is what has been factually reported, but some social media posts have unnecessarily sensationalized it. In fact, some Hon. Members of the Government pointed it out to us, and I want to clarify that.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please finish submitting the Report.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, my question was based on inflation targeting and whether there was any need for stagflation in the country.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, this is not the time to debate it. Can you proceed with submitting the Report.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
No, I am not trying to debate it, but to explain because that has been sensationalized in the newspapers.

Also, regarding the Inland Revenue (Amendment) Bill, we had a lengthy discussion, particularly relating to the penal sanctions that could visit a taxpayer - that is a new provision that has been brought in - where we got matters clarified from the Inland Revenue Department. Particularly, the Government, in keeping with the suggestions of the Supreme Court, has agreed not to file a certificate, in case there is an appeal pending. That was an issue that had been pending and I just wanted to say this as a matter of clarification.

Thank you.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ විවාද කරන්න, සංවාද කරන්න තිබෙන අයිතියට ගරු කරන ගමන් මම මේ කාරණය කියන්න ඕනෑ. ඒවා වැඩි වෙන්නත් ඕනෑ. විශේෂයෙන්ම Committee එකක වාර්තාවක් ඉදිරිපත් කරද්දී අපි හිතනවා, අදාළ කමිටුවල සභාපතිවරුන්ගෙන් යම්කිසි ප්‍රමාණයකට - සියයට සියයක්ම බැරි නම් වැඩි ප්‍රමාණයක්වත් - කමිටුවේ මූලික අදහස තමයි ඉදිරිපත් විය යුත්තේ කියලා. අද නිශ්චිතව මෙතුමා සම්බන්ධ පුවත් පත් වාර්තාවක් තිබෙන නිසා මෙතුමා ඒ ගැන කරුණු ඉදිරිපත් කළ බව මට තේරෙනවා. ඒ විධියට සියලු කමිටුවල සභාපතිවරු විශේෂ debate එකකින් තොරව කමිටු වාර්තා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරන්න පටන් ගත්තොත්, මම හිතන හැටියට ඒකෙන් කමිටුව යම්කිසි ප්‍රමාණයකට politicize වෙනවා, වෙන පැත්තකට. මට ඒ කාරණයයි මතු කරන්න ඕනෑ වුණේ. ගරු මන්ත්‍රීතුමා අද කරුණු ඉදිරිපත් කළ එකට මම විරුද්ධ නැහැ. නමුත්, ඔබතුමා අන්තිමට ඉදිරිපත් කළ කාරණය ගත්තොත්, ඒක එහෙම එකක් නොවෙයි. අපි ඒක Inland Revenue (Amendment) Bill එක පිළිබඳ Debate එකේදි බේරාගනිමු. I mean, you have to represent the Committee, not the Hon. Rauff Hakeem.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
This matter was raised in the Committee by your Members and I was trying to clarify that.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කමිටුවේදී raise වෙන කරුණු ගොඩක් තිබෙනවා නේ. කමිටුවකදී සාකච්ඡා කරන කරුණු ගොඩක් තිබෙනවා. ඕනෑ කමිටුවක එහෙම තමයි. ඒ කරුණු ඔක්කොම ඉදිරිපත් කරන්න වෙන්නේ නැහැ.

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
No, no. - *[Interruption.]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒකයි මම කිව්වේ. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මට තේරෙනවා. ඒ නිසා කරුණාකරලා පාර්ලිමේන්තුව පාර්ලිමේන්තුව විධියට පවත්වාගෙන යමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, වාර්තාව පමණක් ඉදිරිපත් කර පුවත් පත් වාර්තාව ඉදිරිපත් නොකර සිටියා නම් හරි. ඒක ඊට අදාළ වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අපි මේ බයක් නිසා නොවෙයි. හොඳ ද? අපට ඒක ප්‍රශ්නයක් නැහැ. මම කියන්නේ මේකයි. කමිටුවේ සභාපතිතුමා කමිටුව represent කරන්න ඕනෑ. නමුත්, එතුමා සම්බන්ධ පුවත් පත් වාර්තාවක ප්‍රශ්නයක් තිබෙනවා නම්, එතුමාට වෙන අවස්ථාවකදී ඒක කරන්න පුළුවන්. *[බාධා කිරීමක්]* නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, එතුමාට පුළුවන් ඒක තරන්න. *[බාධා කිරීමක්]* ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒක කරන්න පුළුවන්. නමුත්, ඒක කරන්න පුළුවන් වන්නේ කමිටු වාර්තාව ඉදිරිපත් කරද්දී නොවෙයි. මම කියන්නේ අපි මේක, - *[Interruption]* - You have to represent the Committee; you have to represent the Committee here.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ මොහොතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට රවුෆ් හකීම් මැතිතුමා ඒ කමිටුව තුළ ඉදිරිපත් කරපු කරුණු කාරණාවල සමහරක් ඒවා වැරදි ආකාරයට විවිධ මාධ්‍ය තුළින් වාර්තා කිරීම නිසා එතුමාට අයිතියක් තිබෙනවා,- *[බාධා කිරීමක්]* විනාඩියක් ඉන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක ඔබතුමාගේ point of Order එකක් නොවෙයි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමාට අයිතියක් තිබෙනවා ඒක නිවැරදි කර ගන්න. මොකද, එතුමාට ඒ අයිතිය තිබෙනවා. එතුමාට ඒ අයිතිය ලබා දෙන්නට ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පුවත් පත් වාර්තා මෙතැන කියවන්න ගියොත් ලෝක ප්‍රශ්නයක් වෙනවා, ගරු විපක්ෂ නායකතුමා. විවිධ පුවත් පත් විවිධ අර්ථකථන, විවිධ තොරතුරු වාර්තා කරනවා. ඒ වාර්තා මෙතැන ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලෙස මා ඉල්ලා සිටිනවා.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, ලේක් පාර, අංක 160/47 යන ලිපිනයෙහි පදිංචි කේ. දුල්ලෑව දිසානායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා (තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க - இளைஞர் விவகாரங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Dinindu Saman Hennayake - Deputy Minister of Youth Affairs)
ගරු කථානායකතුමනි, බදුලුඔය, කරමැටිය, පරණ මහියංගනය පාර, අංක 2/74 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. පියසේන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.වී. චානක මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
ගරු කථානායකතුමනි, මාතර, දම්පහල, පාසල් මාවත, අමුකොරටුව යන ලිපිනයෙහි පදිංචි සිරිදාස පතිනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නන්ද බණ්ඩාර මහතා
(மாண்புமிகு நந்த பண்டார)
(The Hon. Nanda Bandara)
ගරු කථානායකතුමනි, මීගොඩ, ලයනල් ජයසිංහ මාවත, හයි ලයිෆ්, අංක 555/73 යන ලිපිනයෙහි පදිංචි පී.ඩී. මනෝජ් උපශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
ගරු කථානායකතුමනි, මුන්දලම, කොත්තන්තීවු, ප්‍රධාන පාර, අංක 104 යන ලිපිනයෙහි පදිංචි එම්.එම්.එම්. ෆයිසාලා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -120/2024- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -363/2024- (1), ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.- *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 32 යටතේ මම මේ කාරණය මතු කරන්නේ, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය ගැන මම දිගින් දිගටම කිව්වා. මේ දෙවැනි වරට අහන්නේ. චීන කාබනික පොහොර ගෙනැල්ලා වෙච්ච අලාභය ගැන තමයි මම අහන්නේ. මට තිබෙන ප්‍රශ්නය තමයි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාට -

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මගේ ප්‍රශ්නය කියනකල් ඉන්නකෝ. කලබල වෙන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Point of Order එක තමයි ස්ථාවර නියෝග 32 යටතේ මම මේ කියන්න හදන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 32 යටතේ එහෙම එකක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, එතකොට -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. ඔබතුමාට -

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේ ප්‍රශ්න ඉදිරිපත් කරන ක්‍රමවේදයේ වැරැද්ද ගැන මම ඔබතුමාට කියන්න හදන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් ලේකම් මණ්ඩලය ඔබතුමාට පැහැදිලි කිරීමක් ලබා දීලා තිබෙනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ලේකම් මණ්ඩලයත් පැහැදිලි කළා; ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකත් පැහැදිලි කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්නකෝ, ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු රෝහණ බණ්ඩාර මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට මම නියෝග කළා, අසුන් ගන්න කියලා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ කාරණය නොවෙයි, මේ වෙන කාරණයක්. ස්ථාවර නියෝග 92 යටතේ, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 92 යටතේ ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 92හි රීතිවල තිබෙනවා සභා කටයුතුවලින් බැහැර වෙනවා නම්, ඒ බැහැර වීම නිවැරදි කිරීමේ අයිතිය ගරු මන්ත්‍රීවරයෙකුට තිබෙනවා කියලා. එසේ බැහැර වුණේ, සභානායකවරයා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභා කටයුතුවලින් බැහැර වීමක් සිදු වුණේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ප්‍රශ්න අංක 3, ගරු රෝහණ බණ්ඩාර මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් ඉන්න, මම කියනකම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විකාර දොඩවනවා, ගරු මන්ත්‍රීතුමනි. එහෙම එකක් නැහැ. සභාව නියම විධියට පවත්වාගෙන යනවා.

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව: පුරප්පාඩු
வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம்: வெற்றிடங்கள்
DEPARTMENT OF WILDLIFE CONSERVATION: VACANCIES

588/2025

3. ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඉතා වැදගත් දෙපාර්තමේන්තුවක් බව පිළිගන්නේද;

(ii) එම දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවකයන් සංඛ්‍යාව සහ මේ වනවිට එහි සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අලි-මිනිස් ගැටුම මේ වනවිට වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් තුළ ඉහත පුරප්පාඩු පිරවීමට හා එම දෙපාර්තමේන්තුවට අවශ්‍ය වෙනත් සම්පත් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் மிகவும் முக்கியமானதொரு திணைக்களம் எனும் விடயத்தை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) இத்திணைக்களத்துக்கு அங்கீகரிக்கப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை மற்றும் இன்றளவில் அங்கு கடமையாற்றும் ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது இத்திணைக்களத்தில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை ஒவ்வொரு பதவிக்கு ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iv) தற்போது யானை-மனித மோதல் அதிகரித்து வருகின்ற நிலையில், மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கும் வனசீவராசிகள் திணைக்களத்துக்குத் தேவையான ஏனைய வளங்களை வழங்குவதற்கும் எடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he admits that the Department of Wildlife Conservation is a very important department;

(ii) the approved cadre for the said Department and the number of employees currently serving there;

(iii) the number of vacancies in the said Department, separately in each position at present; and

(iv) the measures being taken to fill those vacancies and provide other necessary resources to the Department at a time when the human-elephant conflict is escalating?

(b) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඇමුණුම 01හි සඳහන් කර ඇත.

ඇමුණුම 01

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2026.03.31 දිනට අනුමත හා දැනට සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව

තනතුර	සේවය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	1	1
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)	ශ්‍රී ලංකා පරිපාලන සේවය	1	1
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්)	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	1	1
අධ්‍යක්ෂ(පාලන)	ශ්‍රී ලංකා පරිපාලන සේවය	1	1
අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	2	0
අධ්‍යක්ෂ(වනජීවී සෞඛ්‍ය)	ශ්‍රී ල. සත්ත්ව නිෂ්. හා සෞ. සේවය	1	0
අධ්‍යක්ෂ (මුදල්)	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	1	1
ප්‍රධාන අභ්‍යන්තර විගණක	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	1	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා පරිපාලන සේවය	3	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	18	10
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	3	3
ඉංජිනේරු	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	2	2
ඉංජිනේරු(යාන්ත්‍රික)	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	1	1
පශු වෛද්‍ය	ශ්‍රී ල. සත්ත්ව නිෂ්. හා සෞ.සේවය	33	19
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	1	1
සහකාර අධ්‍යක්ෂ*	දෙපාර්තමේන්තුගත	9	9
සහකාර අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	7	0
		86	52
පරිපාලන නිලධාරී	කළ. සේවා නිලධාරී සේවය(අධි)	1	1
වනසත්ව අඩවි ආරක්ෂක	දෙපාර්තමේන්තුගත	13	13
අධ්‍යාපන පුහුණු නිලධාරී	දෙපාර්තමේන්තුගත	2	2
සංචාරක සේවා නිලධාරී*	දෙපාර්තමේන්තුගත	1	1
		17	17
පාරිසරික සංචාරක සහකාර	දෙපාර්තමේන්තුගත	1	1
කළමනාකරණ හා මූල්‍ය සහකාර *	දෙපාර්තමේන්තුගත	11	11
සන්නිවේදන පද්ධති සහකාර*	දෙපාර්තමේන්තුගත	1	1
සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	155	151
ප්‍රචාරක නිලධාරී	දෙපාර්තමේන්තුගත	1	1
පුස්තකාලයාධිපති	ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය	1	1
වනසත්ව අඩවි ආරක්ෂක	දෙපාර්තමේන්තුගත	336	180
කාර්මික සහකාර	දෙපාර්තමේන්තුගත	5	3
සැලසුම් ශිල්පී	දෙපාර්තමේන්තුගත	1	1
ප්‍රවාහන නිලධාරී	දෙපාර්තමේන්තුගත	1	0
කළමනාකරණ සේවා නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	138	109
වනසත්ව අඩවි සහකාර	දෙපාර්තමේන්තුගත	382	232
වනසත්ව නියාමක	දෙපාර්තමේන්තුගත	873	455
සන්නිවේදන තාක්ෂණ ශිල්පී	දෙපාර්තමේන්තුගත	2	1
තොරතුරු තාක්ෂණ ශිල්පී (භූගෝල විද්‍යාත්මක)*	දෙපාර්තමේන්තුගත	1	1
වීඩියෝ කැමරා ශිල්පී	දෙපාර්තමේන්තුගත	1	1
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	2	3
		1912	1152
බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	15	0
විදුලි කාර්මික	දෙපාර්තමේන්තුගත	1	1
රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	243	201
බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	39	20
සහකාර බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	26	17
යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	6	5
බෝට්ටු ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	10	10
කාර්යාල සේවක සේවය	කාර්යාල සේවක සේවය	13	13
ක්ෂේත්‍ර සහායක	දෙපාර්තමේන්තුගත	130	96
ක්ෂේත්‍ර සහායක *	දෙපාර්තමේන්තුගත	275	275
ලොරි සහායක	දෙපාර්තමේන්තුගත	1	1
		759	639
		2774	1860
විදුලි වැට නඩත්තු සහායක *	දෙපාර්තමේන්තුගත	3778	3452
එකතුව		6552	5312

* දරන්නාට පමණක් පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

(iii) ඇමුණුම 02හි සඳහන් කර ඇත.

ඇමුණුම 02

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2026.03.31 දිනට සේවක පුරප්පාඩු සංඛ්‍යාව

තනතුර	සේවය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	2	0	2
අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්. හා සෞ. සේ.	1	0	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා පරිපාලන සේවය	3	1	2
නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	18	10	8
පශු වෛද්‍ය නිලධාරී	ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්. හා සෞ. සේ.	33	19	14
සහකාර අධ්‍යක්ෂ	දෙපාර්තමේන්තුගත	7	0	7
සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	155	151	4
වනසත්ව අඩවි ආරක්ෂක	දෙපාර්තමේන්තුගත	336	180	156
කාර්මික සහකාර	දෙපාර්තමේන්තුගත	5	3	2
ප්‍රවාහන නිලධාරී	දෙපාර්තමේන්තුගත	1	0	1
කළමනාකරණ සේවා නිලධාරී	කළ. සේවා නිලධාරී සේවය	138	109	29
වනසත්ව අඩවි සහකාර	දෙපාර්තමේන්තුගත	382	232	150
වනසත්ව නියාමක	දෙපාර්තමේන්තුගත	873	455	418
සන්නිවේදන තාක්ෂණ ශිල්පී	දෙපාර්තමේන්තුගත	2	1	1
බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	15	0	15
රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	243	201	42
බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	39	20	19
සහකාර බංගලා භාරකරු	දෙපාර්තමේන්තුගත	26	17	9
යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	6	5	1
ක්ෂේත්‍ර සහායක	දෙපාර්තමේන්තුගත	130	96	34
එකතුව		2415	1500	915

(iv)
- රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමා කර තිබීම, විශ්‍රාම ගැනීම් ආදී හේතූන් මත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පැවතුණි. 2025 වර්ෂයේ එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලබා දුන් අතර ඊට අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. ඒ අනුව වන සත්ව අඩවි ආරක්ෂකයින් 149ක් හා වන සත්ව නියාමකයින් 381ක් බඳවා ගැනීම සඳහා තරග විභාග මේ වන විට පවත්වා

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

අවසන් අතර, විභාග දෙපාර්තමේන්තුවෙන් අදාළ ප්‍රතිඵල ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

එසේම පුරප්පාඩුව පැවති බංගලා භාරකරු තනතුරු 17ක් බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කර, එහිදී සුදුසුකම් ලැබූ 15දෙනෙකු සඳහා 2026.04.28 දින පත්වීම් ලබා දී ඇත.

- තවද, අලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල සවි කර ඇති විදුලි වැටවල සේවයේ යෙදවීම සඳහා විදුලි වැට නඩත්තු සහායකයින් 3,500කට ආසන්න පිරිසක් 2025 ජූනි මස බඳවා ගන්නා ලදී. තවද, ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් මත සිවිල් ආරක්ෂක බලකා සේවකයින් 5,000ක් ද මෙම දෙපාර්තමේන්තුව වෙත මේ වන විට අනුයුක්ත කර ඇති අතර, ඔවුන් අලි මිනිස් ගැටුම් පවතින ප්‍රදේශවල සේවයේ යොදවා ඇත. ඉදිරියේදී ඔවුන් ද මෙම දෙපාර්තමේන්තුව වෙත ස්ථිර වශයෙන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

- එසේම රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත පසුගිය වර්ෂවලදී මෙම දෙපාර්තමේන්තුවට අවශ්‍ය සුදුසු වාහන මිලදී ගැනීම සඳහා හැකියාවක් නොලැබිණි. එහෙත් මේ වන විට රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ගෙන ඇති තීරණ මත වාහන ආනයනය සඳහා අවසර ලබා දී ඇත. ඒ අනුව තනි කැබ් රථ 84ක් ද, ද්විත්ව කැබ් රථ 16ක් ද, රෝද 04 ට්‍රැක්ටර් 09ක් ද, රෝද 02 ට්‍රැක්ටර් 02ක් ද, යතුරුපැදි 181ක් ද මෙම දෙපාර්තමේන්තුව වෙත මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

අපි හැමදාම අලි-මිනිස් ගැටුම ගැන කථා කරනවා. එයට විවිධ විධියේ උත්තර දෙනවා. නමුත්, ප්‍රායෝගිකව හැමදාම කොහේ හරි අලි-මිනිස් ගැටුමක් සිද්ධ වෙනවා. මෑතකදී තාත්තා කෙනෙකුයි දුවෙකුයි අලි ප්‍රහාරයකට ලක් වෙලා මිය ගිය පුවතක් අපට දැනගන්නට ලැබුණා. ඒ වාගේ සිද්ධි කිහිපයක් තිබෙනවා. වන්දි ලබා දීමේදීත් යම් යම් ගැටලු සිද්ධ වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉස්සෙල්ලාම වන්දි ලබා දෙනවා. දෙවැනි පාර ලැබෙනකොට කාලයක් ගත වෙනවා. එතැනත් ප්‍රමාදවීම් ගණනාවක් තිබෙනවා.

අපි දැක්කා, ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු කාලයේ - මමත් සහභාගි වුණා - මැදවච්චිය නගරයේ සති ගණනාවක් අට්ටාල ගහගෙන මේ සම්බන්ධව කටයුතු කළ ආකාරය. ඔබතුමන්ලා විපක්ෂයේ හිටපු ඒ කාලයේ ගොවි සංවිධානත් ඒක රාශි කරගෙන ඒ ස්ථානවල අට්ටාල ගහගෙන, මාරුවෙන් මාරුවට සෙනඟ ගෙනැල්ලා, අලි-මිනිස් ගැටුමට විද්‍යාත්මක විසඳුම් යෝජනාවලියක් තමන් ළඟ තිබෙනවා කියන එක පෙන්වමින් අඛණ්ඩව සති ගණන් විශාල campaign එකක් කළා. අද වනකොට ඔබතුමන්ලා ආණ්ඩුව අරගෙන වසර එකහමාරක විතර කාලයක් ගත වෙලා තිබෙනවා. හැබැයි, එදා කියපු ඒ විද්‍යාත්මක විසඳුම් හරහා හෝ මේ ගැටලුවට විසඳුම් ලබා දීමට තවමත් ඔබතුමන්ලාට හැකියාවක් ලැබිලා නැහැ. ඔබතුමන්ලා පෙන්වපු විද්‍යාත්මක විසඳුම් කෙසේ වෙතත්, අපි දැක්කා අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු අමාත්‍යවරයෙකුත් ප්‍රකාශයක් කරලා තිබෙනවා, අලින් එක්ක ජීවත් වෙන්නට සිද්ධ වෙනවාය කියලා. එතකොට කෑම ටික, වැව් ඇතුළු අලින්ට අවශ්‍ය පහසුකම් ටික සකස් කරනතුරු මේ ගැටලුවට විසඳුමක් නැහැ. මොකද, ඔබතුමන්ලා අර කලින් කියපු විද්‍යාත්මක යෝජනාවලිය අනුව මෙම ගැටලුවට විසඳුම් ලබා දෙන්නේ නැතුව දැන් ආපසු යන්න වෙන්නේ අලින් එක්ක ජීවත් වෙන්නයි. එතකොට අපි වගා කරලා අලින්ට කන්න දෙන තැනටද මේ යන්නේ, නැත්නම් ඔබතුමන්ලාට මේ සම්බන්ධයෙන් වෙනත් විසඳුම් තිබෙනවාද?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවධානය යොමු කරපු එක බොහොම හොඳයි. අපි දන්නවා, අලි-මිනිස් ගැටුම අද අපේ රටේ ඉතාම සංවේදී ගැටලුවක් බවට පත් වෙලා තිබෙන බව. ඔබ කියනවා වාගේම මෙවැනි අලි-මිනිස් ගැටුම් නිසා මිනිස්සු මිය යෑමත්, අලි ඇතුන් මිය යෑමත් කියන දෙකම සිදු වෙමින් පවතිනවා. මේ සඳහා විද්‍යාත්මක විසඳුමක් සෙවීම සඳහා මේ ආණ්ඩුව පත් වෙච්ච දවසේ ඉඳලා අපි කටයුතු කරමින් ඉන්නවා. ඔබ දන්නවා, ඔබත් නියෝජනය කළ ආණ්ඩු ගත් වැරදි ක්‍රියාමාර්ග, ඔබතුමන්ලාත් සම්බන්ධ වෙලා පවත්වාගෙන ගිය ඒ වැරදි දේශපාලන සංස්කෘතියේ ප්‍රතිඵල විසින් තමයි කාලයක් තිස්සේ මෙම ගැටුම වර්ධනය වෙලා තිබෙන්නේ කියන එක.

මේ සඳහා විසඳුම් සොයද්දි අපට ඒ කරුණ සම්බන්ධයෙනුත් සැලකිලිමත් වන්න සිද්ධ වෙලා තිබෙනවා. කාලයක් තිස්සේ අලින්ට අවශ්‍ය කරන වනාන්තර විනාශ කරලා, ඒ සුපෝෂණ ස්ථාන විනාශ කරලා, පරිසරය විනාශ කරලා ඇති කරපු ප්‍රශ්න විසින් මේ ගැටුම තීව්‍ර කරලා තිබෙනවා. අපි වසරක් තිස්සේ මේ ගැටුමට විසඳුම් සොයන්න මැදිහත් වෙලා තිබෙනවා. එලෙස විසඳුම් සොයන්න මැදිහත් වෙද්දි අපි පසුගිය කාලයේ දැකපු ප්‍රධාන කාරණයක් තිබෙනවා. මේ ගැටුම විසඳීම සඳහා මැදිහත් වන ප්‍රධාන දෙපාර්තමේන්තුව තමයි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව. ඒ දෙපාර්තමේන්තුව අවශ්‍ය ප්‍රමාණයට ශක්තිමත් කරලා තිබුණේ නැහැ. මේ ගැටුම් නිරාකරණය කිරීමට අවශ්‍ය මානව සම්පත සහ භෞතික සම්පත් පැවති ආණ්ඩු විසින් ලබා දීලා තිබුණේ නැහැ. ඒ නිසා ඒ අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා අපේ ආණ්ඩුව පත් වෙච්ච දවසේ ඉඳලා මැදිහත් වුණා. ඒ අනුව තමයි, මා ඉහතින් සඳහන් කළ මානව සම්පත සහ භෞතික සම්පත් සම්පාදනය කිරීම සඳහා අපි මැදිහත් වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අපි විද්‍යාත්මක වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. අපි ශ්‍රේෂ්ඨාධිකරණයටත් දන්වා තිබෙනවා. මේ සම්බන්ධයෙන් විද්‍යාත්මක වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කිරීමට අපි දැන් සූදානම්. මේ සඳහා 2020දී ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළක් තිබෙනවා. නමුත්, ඒ වැඩ පිළිවෙළ යාවත්කාලීන වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන බලය ලබාගෙන තිබුණේත් නැහැ. ඒ නිසා අපි ඉදිරියේදී බලාපොරොත්තු වනවා, විශේෂඥ කමිටුවක් පත් කරලා මේ සඳහා විද්‍යාත්මක වැඩ පිළිවෙළක් සකස් කරලා 2020දී ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළත් යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක කරන්න. ඒ අතර දෙනිකව සිදුවන අලි-මිනිස් ගැටුම සඳහා විසඳුම් සෙවීමට අපි දැනටමත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

අපි භෞතික සම්පතින් සහ මානව සම්පතින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කරමින් තිබෙනවා. ඒ වාගේම අපි අලි වැට ප්‍රකෘතිමත් කරනවා, අලින්ට සුපෝෂණ ස්ථාන ගොඩනඟමින් සිටිනවා සහ අලි මංකඩ ප්‍රකාශයට පත් කරමින් සිටිනවා. අපි මේ වසර එකහමාරක කාලය තුළ ප්‍රමාණවත් මැදිහත්වීමක් කරලා තිබෙනවා, අලි-මිනිස් ගැටුම විසඳීම සඳහා. ඉතින් අපි බලාපොරොත්තු වනවා, ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ ගැටලුවට නිශ්චිත විසඳුමක් ලබා ගන්න පුළුවන් වේවි කියලා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, ගැටලුව මෙයයි. සිතියම් සකස් කරගෙන, ඒ සම්බන්ධව විද්‍යාත්මක විසඳුමක් තිබෙනවා කියලා ඔබතුමන්ලා කලින් පෙන්වාගෙන සිටියා. නමුත් ඔබතුමාගේ පිළිතුරෙන් පැහැදිලි වනවා, දැන් තමයි ඔබතුමන්ලා මේ සම්බන්ධව විසඳුම් හදුනා ගන්න යන්නේ කියන එක. මෙතුවක් කාලයක් තිබුණු අලි වෙඩි ලබා දීමවත් දැන් ක්‍රමවත්ව සිද්ධ වන්නේ නැහැ; ජනතාවට දැන් ඒකවත් හරියට ලැබෙන්නේ නැහැ. ඔබතුමන්ලාගේ අලුත් වැඩ පිළිවෙළ කොයි කාලයේ එයිද දන්නේ නැහැ. එතෙක් අලි වෙඩි ලබා දුන් පරණ ක්‍රමයවත් නැවත ක්‍රියාත්මක කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ඔබතුමාගේ උත්තරයේම තිබුණා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කටයුතු කළ නිලධාරීන් 5,000ක් මේ වන විට ඔබතුමන්ලාගේ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරගෙන තිබෙනවා කියලා. කලින් රාජකාරි කළ ස්ථානවලින් බැහැරව විශාල දුරක තිබෙන ස්ථානවල තමයි ඒ අයට දැන් රාජකාරි කරන්න වෙලා තිබෙන්නේ. ඔවුන්ට වැටුපට අමතරව දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දෛනිකව රුපියල් 250ක විතර දීමනාවක් ලබා දෙන බව කියනවා. අද ඒ රුපියල් 250න් පෙට්‍රල් ලීටරයක්වත් ගහගන්න බැරි වෙලා තිබෙනවා. තමන් පදිංචි ස්ථානයේ ඉඳලා අලි වැට ආරක්ෂා කරන්න යනවා නම් ඒ රාජකාරි කරන ස්ථානයට තව විශාල දුරක් යන්න ඔවුන්ට සිදු වනවා. එහිදී ජීවිත ආරක්ෂාව පිළිබඳ ගැටලුවකුත් ඒ අයට තිබෙනවා. මොකද, ඒ අය ගමන් කරන්නේ අලි ගැවසෙන ස්ථාන හරහා. එම නිසා ඔවුන්ට ලබා දෙන මෙම දීමනාව ප්‍රමාණවත් නැහැ කියන කාරණය සඳහන් කරනවා වාගේම ඔවුන්ට අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දෙන වැඩ පිළිවෙළකුත් සකස් කරන්න ඔබතුමා සූදානම්ද කියන එකත් මම දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන විධියට, අලි වෙඩි සම්බන්ධයෙන් ගැටලු පවතින තැන් පිළිබඳ විස්තර ටික අපට ඉදිරිපත් කරන්න. අක්‍රමිකතා හෝ ප්‍රමාණවත් නොවන විධියේ සැපයුම් තිබෙනවා නම් අපි ඒවා ගැන සොයා බලා කටයුතු කරන්න සූදානම්.

අපි සේවක ප්‍රශ්න සම්බන්ධව දෛනිකව මැදිහත් වෙමින් ඉන්නවා. ඔය කියන අඩුපාඩු ටික ගැන අපි මේ වනවිටත් ඒ ක්ෂේත්‍රයේ සේවකයන් සමඟ සාකච්ඡා කරමින් ඉන්නවා. අපි ඒ සඳහා ඉක්මන් විසඳුමක් ලබා දීමට බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1886/2026- (1), ගරු අබූබකර් අතම්බාවා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත පාසල් දරුවන්: බස්නාහිර පළාත

விசேட கல்வித் தேவைகளைக் கொண்ட பாடசாலை மாணவர்கள்: மேல் மாகாணம்

SCHOOL CHILDREN WITH SPECIAL EDUCATIONAL NEEDS: WESTERN PROVINCE

1925/2026

5. ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) බස්නාහිර පළාත තුළ ඇති රජයේ පාසල්වල වයස අවුරුදු 5-16 අතර දරුවන් සඳහා අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීමට පාසල් කමිටු පිහිටුවා තිබේද;

(ii) කඩින්කඩ, දීර්ඝ කාලීනව සහ සම්පූර්ණයෙන් පාසල් නොයන දරුවන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ආ) (i) බස්නාහිර පළාත තුළ ඇති රජයේ පාසල්වල සාධන මට්ටම අඩු සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් හඳුනාගෙන තිබේද;

(ii) එම දරුවන් හඳුනා ගැනීම සඳහා පත් කරන ලද නිලධාරීන් කවරේද;

(iii) සාධන මට්ටම අඩු දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) විශේෂ අධ්‍යාපනය අවශ්‍ය දරුවන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ කවරේද;

(v) පාසල් අධ්‍යාපනය හැර යන දරුවන් යළි පාසල්ගත කිරීම සඳහා නියාමන වැඩ පිළිවෙළක් තිබේද;

(vi) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மேல் மாகாணத்திலுள்ள அரசாங்க பாடசாலைகளில் 5-16 வயதுக்கு இடைப்பட்ட சிறுவர்களுக்கு கட்டாயக் கல்விப் பணிப்புரையை அமுல்படுத்துவதற்கான பாடசாலைக் குழுக்கள் தாபிக்கப்பட்டுள்ளனவா;

(ii) அவ்வப்போது, நீண்ட காலமாக மற்றும் முற்றாகப் பாடசாலை செல்லாத சிறுவர்கள் இனங்காணப்பட்டுள்ளனரா;

(iii) ஆமெனில், மேற்படி சிறுவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேல் மாகாணத்திலுள்ள பாடசாலைகளில் அடைவு மட்டம் குறைவான மற்றும் விசேட கல்வித் தேவைகளைக் கொண்ட சிறுவர்கள் இனங்காணப்பட்டுள்ளனரா;

[ගරු දේවානන්ද සුරවීර මහතා]

(ii) மேற்படி சிறுவர்களை இனங்காண்பதற்காக நியமனம் செய்யப்பட்டுள்ள அலுவலர்கள் யாவர்;

(iii) அடைவு மட்டம் குறைவான சிறுவர்களின் எண்ணிக்கை யாது;

(iv) விசேட கல்வித் தேவைகளைக் கொண்ட சிறுவர்களுக்காக அமுல்படுத்தப்பட்டுள்ள வேலைத்திட்டங்கள் யாவை;

(v) பாடசாலைக் கல்வியை விட்டு விலகிச் செல்லும் சிறுவர்களை மீண்டும் பாடசாலை மயப்படுத்துவதற்கான ஒழுங்குபடுத்தல் நிகழ்ச்சித்திட்டமொன்று உள்ளதா;

(vi) ஆமெனில், மேற்படி வேலைத்திட்டம் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she state -

(i) whether school committees have been established to implement compulsory education regulations for children between the ages of 5-16 years in government schools in the Western Province;

(ii) whether students who attend school intermittently, those who are absent for prolonged periods and those who have dropped out of school have been identified; and

(iii) if so, the number of such students, separately?

(b) Will she also state -

(i) whether students with low levels of achievement and those with special educational needs in government schools in the Western Province have been identified;

(ii) the officers who have been appointed to identify such children;

(iii) the number of students identified as having low achievement levels;

(iv) the programme implemented for children who require special education;

(v) whether there is a regulatory programme for the readmission of students who leave school; and

(vi) if so, what the said programme is?

(c) If not, why?

ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)

(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) බස්නාහිර පළාත තුළ ඇති රජයේ පාසල්වල අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව 2025 දෙසැම්බර් වනවිට පාසල් කමිටු පිහිටුවා ඇත.

බස්නාහිර පළාත තුළ ඇති පාසල් සංඛ්‍යාව	පාසල් කමිටු පිහිටුවා ඇති සංඛ්‍යාව	පාසල් කමිටු පිහිටුවා නොමැති සංඛ්‍යාව
1,344	1,217	127

පාසල් කමිටු පිහිටුවා නොමැති පාසල්හි එම කමිටු පිහිටුවීමට අවශ්‍ය කටයුතු පළාත්, කලාප, කොට්ඨාස මට්ටමින් සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. ඊට අදාළ ක්‍රියාමාර්ග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් සිදු කර ඇත.

(ii) ඔව්. 2025 වර්ෂයේ පාසල් නොයන දරුවන් සංඛ්‍යාව පහත (iii)හි සඳහන් ආකාරයෙන් හඳුනාගෙන ඇත.

(iii)

වර්ෂය	හඳුනාගෙන ඇති පාසල් නොයන ළමයින් සංඛ්‍යාව			පාසලට ඇතුළත් කරන ලද ළමයින් සංඛ්‍යාව						අධ්‍යාපන අවස්ථාවකට යොමු නොවූ සංඛ්‍යාව	
	ගැහැනු	පිරිමි	එකතුව	විධිමත් පාසලට		විශේෂ අධ්‍යාපන ඒකකයට		සාක්ෂර පන්ති සඳහා			
				ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි
2024	347	364	711	280	290	5	4	52	52	10	18
2025	424	461	885	384	393	-	5	29	40	11	23

පාසල් හැර ගිය සිසුන් නැවත පාසල්ගත කරන ලද සංඛ්‍යාව

වර්ෂය	පාසල් හැර ගිය සිසුන් සංඛ්‍යාව			නැවත පාසල්ගත කරන ළමයින් සංඛ්‍යාව			පාසලට ඇතුළත් නොකරන ලද සංඛ්‍යාව		
	ගැහැනු	පිරිමි	එකතුව	ගැහැනු	පිරිමි	එකතුව	ගැහැනු	පිරිමි	එකතුව
2024	266	331	597	241	309	550	26	21	47
2025	143	158	301	109	101	210	42	49	91

(ආ) (i) හඳුනාගෙන ඇත.

(ii) බස්නාහිර පළාත තුළ සෑම කලාපයකටම තක්සේරු කමිටුවක් පිහිටුවා ඇත. (33/2022 චක්‍රලේඛය අනුව) ගුරු භවතුන් සහ විදුහල්පතිවරුන් මඟින් යොමු කරන ලද සිසුන් අදාළ කලාපයේ තක්සේරු කමිටුව මඟින් තක්සේරු කරනු ලැබේ. මෙම තක්සේරු කමිටුවේ සංයුතිය වන්නේ,

- කලාපීය විශේෂ අධ්‍යාපන විෂය අධ්‍යක්ෂ
- කලාපීය ප්‍රාථමික අධ්‍යාපන විෂය අධ්‍යක්ෂ
- ප්‍රාථමික ගුරු උපදේශක
- සම්පත් දායක (විශේෂ අධ්‍යාපන)
- විශේෂ අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්

(iii) මේ සම්බන්ධයෙන් සෘජු සංඛ්‍යාත්මක අගයක් දැක්විය නොහැක.

(iv)
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියලුම ළමයින් සඳහා අන්තර්කරණ අධ්‍යාපන ලබා දීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ 37/2020 හා 2020.12.03 දිනැති විශේෂ අධ්‍යාපන චක්‍රලේඛය අනුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි යටතේ සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සහාය ඇතිව හඳුනාගෙන එම දරුවන්ට වයස අවුරුදු 03 සම්පූර්ණ වීමට පෙර කලාප අධ්‍යාපන කාර්යාලයේ ලියාපදිංචි කිරීමට කටයුතු කරන අතර, වයස අවුරුදු 04දී පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකය වෙත ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.
- මෙම උපදෙස් සංග්‍රහය පිළිබඳ පළාත් හා කලාප නිලධාරීන්, විදුහල්පතිවරුන්, අංශ ප්‍රධානීන්, ගුරුභවතුන් දැනුවත් කිරීම හා ඒ අනුව විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 33/2022 හා 2022.09.08 දිනැති අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය අනුව කලාපීය තක්සේරුකරණ කමිටු පිහිටුවා ඒ අනුව කටයුතු කිරීම.
- අන්තර්කරණ අධ්‍යාපනයක් කරා විශේෂ අධ්‍යාපන ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය I හා II පිළිබඳ සියලු පළාත්වල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සහ අන්තර්කරණය කිරීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම සහ අධ්‍යාපනික මැදිහත් වීම පිළිබඳ උපදෙස් සංග්‍රහය හඳුන්වා දීම සහ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් පුහුණු කිරීම.
- ශිෂ්‍යෝද්දා විශේෂ හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනය පිහිටුවීම සහ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් තක්සේරු කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම, ගුරු පුහුණුව, දෙමව්පියන් දැනුවත් කිරීම් සිදු කිරීම.
- ජාතික පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ඉගෙනුම් උපකරණ සැපයීම.
- පළාත් මට්ටමින් හඳුනාගත් පාසල් සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ සවන්වහල් ලබා දීම.
- උපකෘත විශේෂ පාසල්වල අධ්‍යාපන සංවර්ධනය සඳහා 28/2024 දරන අධ්‍යාපන චක්‍රලේඛ නිකුත් කර ඇති අතර, එමඟින් උපකෘත විශේෂ පාසල්වල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා උපදෙස් ලබා දී ඇත.
- උපකෘත විශේෂ පාසල් හා විශේෂ අධ්‍යාපන ඒකක සහිත පාසල් අධීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර එමඟින් සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.
- 2025/01 විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ඇගයීම් කටයුතු පහසු කිරීම වෙනුවෙන් නිකුත් කරනු ලබන විභාග පහසුකම් සැලසීමේ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය සකසා මුද්‍රණය සඳහා යොමු කර ඇත.
- සෑම වසරකම විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා සංඥා හා බ්‍රේල් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම සහ අධ්‍යාපනික මැදිහත්වීම සම්බන්ධයෙන් ප්‍රාථමික ගුරු උපදේශකවරුන් හා ගුරුභවතුන් පුහුණු කිරීමේ කටයුතු සිදු කිරීම.

(v) පාසල් අධ්‍යාපනය හැර යන දරුවන් යළි පාසල්ගත කිරීම සඳහා නියමිත වැඩ පිළිවෙළක් ඇත.

(vi) අංක 1963/30 අති විශේෂ ගැසට් නිවේදනය අනුව අනිවාර්යය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ පාසල් පැමිණීවීමේ කමිටු සහ අධීක්ෂණ කමිටු මඟින් අධ්‍යාපනය හැර යන දරුවන් යළි පාසල්ගත කිරීම සඳහා කටයුතු කරනු ලබයි.
- පාසල් කමිටු මඟින් තම පාසල් පෝෂක ප්‍රදේශයේ සිටින පාසල් නොයන ළමයින් හඳුනා ගැනීම කළ යුතුය. ඒ අනුව ඔවුන්ගේ ගැටලුවලට විසඳුම් ලබා දෙමින් පාසල්වලට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.
- එසේම අධීක්ෂණ කමිටු සාමාජිකයන් විසින් හඳුනා ගන්නා ළමයින්ද කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් පාසල්වලට ඇතුළත් කිරීම සිදු කරනු ලබයි.
- පරිවාස හා ළමාරක්ෂක නිලධාරි හෝ වෙනයම් කවරෙකු විසින් පාසල් නොයන ළමයකු හඳුනා ගතහොත් අනිවාර්යය අධ්‍යාපන නියෝග යටතේ අධීක්ෂණ කමිටු සභාපති වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂට යොමු කළ යුතු අතර ඔහු හෝ ඇය අනිවාර්යයෙන් පාසලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබයි.
- යම් හෙයකින් සාක්ෂර හැකියාව නොමැති නම් ඔහු හෝ ඇය පළමුව නොවිධිමත් අධ්‍යාපන සාක්ෂර පාඨමාලාවට යොමු කළ යුතු අතර, ඔවුන් සාක්ෂරතාව අත්පත් කරගන්නා කාල සීමාව තුළ පාසල් අධ්‍යාපනයට ඇතුළත් කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර මුලින්ම මා ස්තුතිවන්ත වෙනවා, වර්තමාන අධ්‍යාපන අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා ගන්න ක්‍රියාමාර්ග සහ පසුගිය සමයන් තුළ වට්ටපු පාසල් පද්ධතිය නහා සිටුවීම සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් ඇගයීමක් තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නයේදී ඔබතුමා දෙන උත්තර තුළින් ඒ කටයුතු එහෙමම සාර්ථක නැහැ කියන හැඟීම තමයි මට තිබෙන්නේ.

මගේ ප්‍රශ්නයේ පළමුවැනි කොටසින් අසා තිබෙන්නේ අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයයි. ඔව්, අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම යටතේ පාසල්

[ගරු දේවානන්ද සුරවීර මහතා]

සංවර්ධන කමිටු ගොඩනහලා තිබෙනවා, ඒකට අධීක්ෂණ කමිටු ගොඩනහලා තිබෙනවා. පැහැදිලියි. හැබැයි, අඩුම තරමින් පාසල් කමිටුවක් මාසයකට දෙපාරක්වත් කැඳවන්න ඕනෑ. ඒ කමිටුව ඇතුළේ සාකච්ඡා වෙන්න ඕනෑ, පළමුවැනි දවසේ එන්නේ නැති ළමයි, දෙවැනි දවසේ එන්නේ නැති ළමයි, තුන්වැනි දවසේ ආපු නැති ළමයි පිළිබඳව විශේෂ වාර්තාවක් සැකසීම ගැන. හැබැයි මම දන්නවා, මේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ තමයි ඒ අදාළ කලාප ඇතුළේ, අදාළ දිස්ත්‍රික්ක ඇතුළේ තොරතුරු කඩිමුඩියේ හොයන්න ගත්තේ. මේ දීලා තිබෙන තොරතුරු සත්‍ය යැයි පිළි ගැනීමට අමාරුයි. මොකද, ඒ තරම් බරපතළ විධියට අවුරුදු 5-16 අතර ළමයි පාසල් හැර යනවා. හැබැයි අනිවාර්ය අධ්‍යාපන නියෝග 1997දී ක්‍රියාත්මක කරනවා. ඒ නිසා මෙය සක්‍රිය කර ගැනීම සඳහා; මේ හානිය අවම කර ගැනීම සඳහා ඔබතුමන්ලා ගන්නා වූ ක්‍රියාමාර්ග මොනවාද කියන එක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන පරිදි විශේෂයෙන්ම පසුගිය කාලයේ මේ සඳහා අවධානය අඩුවීමක් තිබුණා කියලා අමාත්‍යාංශය පිළිගන්නවා. ඒ වෙනුවෙන් තමයි විශේෂයෙන්ම මෑතකාලීනව මේ වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නේ. අපි දෙන ලද පිළිතුර අනුව බස්නාහිර පළාත් සභාවේ පාසල් 1,344කින් 1,217කම මේ වෙනකොට මේ කමිටු පිහිටුවා තිබෙනවා. ඒවා ගැන පසුවිපරම් ක්‍රියාවලියක් සිද්ධ වෙනවා. අපි හිතනවා, ඉදිරියේදී මේ කරුණ අනිවාර්යයෙන් නිවැරදි කරගන්න පුළුවන් කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ මැදිහත්වීම යටතේ මේ සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාවලිය තවදුරටත් වේගවත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු දේවානන්ද සුරවීර මහතා
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 1997දී මේ අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහාම අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළේ විශේෂ ඒකකයක් ආරම්භ කරනවා, "නොවිධිමත් අධ්‍යාපන ඒකකය" කියලා. හැබැයි මේක ආරම්භ කරපු දවසේ සිට පසුගිය සමයන්හි මේ ඒකකය ස්වයං මරණයකට පත් කරලායි තිබුණේ. අද දවසේත් ඒ ඒකකය සම්බන්ධයෙන් පැහැදිලි අදහසක් නැහැ. ඒ නිසා මේ නොවිධිමත් අධ්‍යාපන ඒකකය සක්‍රිය කිරීම සඳහා අමාත්‍යාංශය විධියට වර්තමානයේ ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු නලින් හේවගේ මහතා
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)

විශේෂයෙන්ම මේ දරුවන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න තමයි ඒ නොවිධිමත් අධ්‍යාපන ඒකකය පිහිටුවා තිබුණේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ පරිදිම යම් ප්‍රමාණයකට එහි කටයුතු අකර්මණ්‍ය වෙලා; අඩපණ වෙලා තිබෙනවා. මේ වනවිට අප ඒ සම්බන්ධව සාකච්ඡා කරගෙන යනවා. මේ ඒකකය ඉතා වැදගත් එකක්. මේ තුළින් තමයි මේ දරුවන් පිළිබඳව සොයා බලන්නේ සහ ඔවුන් නැවත පාසල්ගත කිරීමට අදාළ කටයුතු කරන්නේ. ඒ අනුව ඉදිරියේදී අනිවාර්යයෙන්ම මෙම ඒකකය ශක්තිමත් කරන්න සහ එම ඒකකයේ අභිලාෂ පණ ගන්වන්න අමාත්‍යාංශය හැටියට අප මැදිහත් වෙනවා.

මාබෝල, ෆාතිමා පාර ක්‍රීඩාංගණය: වත්තල මාබෝල නගර සභාවට පවරා ගැනීම
மாபோலை, பாத்திமா வீதி விளையாட்டு மைதானம்: வத்தளை மாபோலை நகர சபைக்குக் கையகப்படுத்தப்படல்
PLAYGROUND ON FATIMA ROAD, MABOLA: ACQUISITION BY WATTALA MABOLA URBAN COUNCIL

1949/2026

6. ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාබෝල, ෆාතිමා පාර ක්‍රීඩා පිටිය, වත්තල මාබෝල නගර සභාවට පවරා ගනු ලැබූ ආකාරය කවරේද;

(ii) එම ඉඩම, වත්තල මාබෝල නගර සභාවේ නිටපු සභාපතිවරයා සතුව තිබූ ඉඩමක් බව දන්නේද;

(iii) ඔහු නගර සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරමින් සිටියදී තමන් සතු ඉඩමක් නගර සභාවට අළෙවි කිරීම සිදු කිරීමට හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වගුරු බිමක් වශයෙන් තිබූ එම ඉඩම ව්‍යාජ ඔප්පු සකසා අළෙවි කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ඉඩම නගර සභාව විසින් මිලදී ගැනීමට වැය කළ මුදල කොපමණද;

(iii) එම මිලදී ගැනීම නීත්‍යානුකූල වන්නේද;

(iv) නොඑසේ නම්, අදාළ මිලදී ගැනීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வத்தளை பிரதேச செயலாளர் பிரிவிலுள்ள மாபோலை, பாத்திமா வீதி விளையாட்டு மைதானம், வத்தளை மாபோலை நகர சபைக்கு கையகப்படுத்தப்பட்ட விதம் யாது என்பதையும்;

(ii) மேற்படி காணி வத்தளை மாபோலை நகர சபையின் முன்னாள் தவிசாளருக்குச் சொந்தமானது என்பதை அறிவாரா என்பதையும்;

(iii) நகர சபையின் தவிசாளராக அவர் கடமையாற்றி வரும்போது, தனக்குச் சொந்தமான ஒரு காணியை நகர சபைக்கு விற்பனை செய்வதற்கு வாய்ப்புள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சதுப்பு நிலமொன்றாகவிருந்த மேற்படி காணி, போலி உறுதியொன்று தயாரிக்கப்பட்டு விற்பனை செய்யப்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி காணியைக் கொள்வனவு செய்வதற்கு நகர சபை செலவிட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி கொள்வனவு, சட்டமுறையானதா என்பதையும்;

(iv) இன்றேல், மேற்படி கொள்வனவோடு தொடர்புபட்ட அலுவலர்களுக்கு எதிராக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the manner in which the Fatima Road playground in Mabola within the Wattala Divisional Secretary's Division was acquired by the Wattala Mabola Urban Council;

(ii) whether he is aware that the aforesaid land was owned by the former Chairman of the Wattala Mabola Urban Council; and

(iii) whether it is permissible for a Chairman of an Urban Council to sell a land owned by him to the same Council during his tenure of office?

(b) Will he also inform this House -

(i) whether he is aware that the aforesaid land, which was originally a marshy area, was sold by preparing forged deeds;

(ii) if so, the amount of money that was spent by the Urban Council to purchase the aforesaid land;

(iii) whether the aforesaid purchase is legal; and

(iv) if not, of the action that will be taken against the officers involved in the relevant purchase?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මාබෝල ෆාතිමා පාර ක්‍රීඩාංගණයට අයත් ඉඩම කොටස් 03කින් නගර සභා ප්‍රතිපාදන යටතේ මිලදී ගෙන ඇත.

- ඔප්පු අංක 787 - 2007.01.17 දින මිලදී ගෙන ඇත.
- ඔප්පු අංක 788 - 2007.01.17 දින මිලදී ගෙන ඇත.
- ඔප්පු අංක 1640 - 2012.02.02 දින මිලදී ගෙන ඇත.

(ii) ඉඩම සඳහා නගර සභාව සතු ඔප්පු අනුව ඉඩමේ මුල් අයිතිකරු ජෝශප් එමලියන් සමරසිංහ නැමැත්තෙක් වන අතර, ඔහු නගර සභාවේ සභාපතිවරයෙක් වශයෙන් කටයුතු කර නොමැති බව ලේඛන අනුව සනාථ වේ.

(iii) අදාළ නොවේ.

(ආ) (i) ෆාතිමා පාර ක්‍රීඩා පිටියට අයත් ඉඩම් ඔප්පුවල මිල්ලගහකුඹුර සහ මිදෙල්ලගහකුඹුර නමැති ඉඩම ලෙස සඳහන්ව ඇති අතර, ෆාතිමා පාර ක්‍රීඩා පිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරන ලද නගර සභාව සතු නීත්‍යානුකූල ඔප්පු සහිත වගුරු නොවන ඉඩමකි.

නමුත් ගරු කථානායකතුමනි, මේ ඔප්පුවල තිබෙන්නේ මිල්ලගහකුඹුර සහ මිදෙල්ලගහකුඹුර වශයෙන් නිසා මිලදී ගැනීමට පෙර කුඹුරක් හෝ වගුරු බිමක් හැටියට තිබුණාද කියන ප්‍රශ්නය තිබෙනවා.

(ii)
- ඔප්පු අංක 787 - 2007.01.17 දින රුපියල් 4,275,000.00ක මුදලකට මිලදී ගෙන ඇත.
- ඔප්පු අංක 788 - 2007.01.17 දින රුපියල් 525,000.00ක මුදලකට මිලදී ගෙන ඇත.
- ඔප්පු අංක 1640 - 2012.02.02 දින රුපියල් 5,220,000.00ක මුදලකට මිලදී ගෙන ඇත.
- ක්‍රීඩා පිටිය සතු ඉඩම් කොටස් 03 මිලදී ගැනීම සඳහා රුපියල් 10,020,000.00ක මුදලක් වැය කර ඇත.

(iii) එම ඉඩම්, ඔප්පු මඟින් මිලදී ගෙන, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නීත්‍යානුකූලව ඔප්පු ලියාපදිංචි කර ඇති බැවින් මිලදී ගැනීම නීත්‍යානුකූල වේ.

- ඔප්පු අංක 787 - 2007.01.17
- ඔප්පු අංක 788 - 2007.01.17
- ඔප්පු අංක 1640 - 2012.02.02

(iv) නීත්‍යානුකූලව අදාළ මිල දී ගැනීම සිදු කර ඇති බැවින් එවැනි අවශ්‍යතාවක් පැන නැඟී නොමැත.

(ඇ) අදාළ නොවේ.

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

එම ඉඩම් ජනතා බදු මුදලින් මිල දී ගත් ඉඩම්. එම ඉඩම් මිල දී ගැනීමේදී හිටපු සභාපතිවරයා ඒ ඉඩම් පිළිබඳව පත් ඉරු පරීක්ෂා කිරීමක් කර සොයා බලා ඇති බව ඔබතුමා දන්නේද?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එබඳු පරීක්ෂා කිරීමක් කළා ද, නොකළා ද යන්න පිළිබඳව තොරතුරු සඳහන් වන්නේ නැහැ. නමුත්, සාමාන්‍යයෙන් ඉඩමක් මිල දී ගැනීමේ ක්‍රමවේදයේදී අදාළ පත් ඉරු පරීක්ෂා කර බලා තමයි මිල දී ගන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා අදාළ පත් ඉරු පරීක්ෂා කිරීමකින් පසුව මේ මිල දී ගැනීම් සිදු කරන්නට ඇති කියලා.

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා එම ක්‍රීඩා පිටිය කොටස් තුනකින් සමන්විත එකක් වන බව. මා දන්නා පරිදි ඒ කොටස් තුනෙන් කොටස් දෙකක ඔප්පු තිබෙනවා. හැබැයි, ලියාපදිංචි කර නැහැ. ඒවා අතරින් තුන්වැනි එක රෑඩ 3යි, පර්වස් 38ක කොටසක්. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මම ඒ විස්තර ගත්තා. හැබැයි, එහි ඔප්පුවක්වත් නැහැ, ලියාපදිංචි කරලාවත් නැහැ. පැහැදිලි විමර්ශනයක් කරලා මේ පිළිබඳව සොයා බැලිය යුතු වෙනවා. මේ වාගේම තමයි ඒ සභාව තුළ ඉඩම් පරිහරණය සම්බන්ධවත් සොයා බලන්න ඕනෑ. මොකද, හිටපු සභාපතිවරු කටයුතු කළ කාලයේ ඉඩම් විශාල ප්‍රමාණයක් ඒ මේ අත ගිහිල්ලා තිබෙනවා. පැහැදිලි විමර්ශනයක් කරලා මේ ගැන සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ ගැන දන්නවාද, නැත්නම් ඔබතුමා මේ ගැන විමර්ශනයක් කරන්න බලාපොරොත්තු වනවාද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, සභාව සතුව පවතින ලිපිලේඛන අනුව ඒ ඉඩම් කොටස් තුනම නීත්‍යානුකූලව ලියාපදිංචි කරලා තිබෙනවා. නමුත්, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ආකාරයට යම් ගැටලුවක් පවතිනවා නම් ඒ පිළිබඳව විධිමත් විමර්ශනයක් පැවැත්වීම සඳහා කටයුතු කරන්න අපට පුළුවන්.

ආබාධිත දරුවන් සඳහා පෙර පාසල් අධ්‍යාපනය: ක්‍රියාමාර්ග

வலதுகுறைந்த பிள்ளைகளுக்கான முன்பள்ளிக் கல்வி: நடவடிக்கை

PRESCHOOL EDUCATION FOR CHILDREN WITH DISABILITIES: MEASURES TAKEN

1975/2026

7. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ආබාධිත දරුවන් අතරින් වයස අවුරුදු 3-5 අතර දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අය අතරින් පෙර පාසල්වලට ඇතුළත්ව සිටින ප්‍රතිශතය කොපමණද;

(iii) එම දරුවන්ගේ මුල් ළමා විය සංවර්ධනය සඳහා සමාන සහ සාධාරණ අවස්ථා ලබා දීමට විධිමත් වැඩ පිළිවෙළක් දියත් කරන්නේද;

(iv) අඩු ආදායම්ලාභී පවුල් ඒකකවල ආබාධිත දරුවන් පෙර පාසල් අධ්‍යාපනයට යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) රාජ්‍ය හා පෞද්ගලික පෙර පාසල්වල ඉගෙනුම ලබන ආබාධිත දරුවන් සඳහා විධිමත් පහසුකම් සහ සේවා සපයන්නේද;

(vi) එසේ නම්, එම සේවා සහ පහසුකම් කවරේද;

(vii) ආබාධිත දරුවන් පෙර පාසල්වලට ඇතුළත් කිරීම සඳහා නිකුත් කර ඇති මාර්ගෝපදේශ හා චක්‍රලේඛ කවරේද;

(viii) පෙර පාසල් ගුරුවරුන්ට විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සමඟ කටයුතු කිරීම සඳහා ලබාදෙන පුහුණු වැඩසටහන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் வலதுகுறைந்த பிள்ளைகளில், 3 தொடக்கம் 5 வயதுக்கு இடைப்பட்ட பிள்ளைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) இவர்களில் முன்பள்ளிக்குச் செல்பவர்களின் சதவீதம் யாது என்பதையும்;

(iii) அந்தப் பிள்ளைகளின் முன் பிள்ளைப்பருவ அபிவிருத்திக்காக சமமானதும் நியாயமானதுமான வாய்ப்புகளை வழங்குவதற்கு முறையானதொரு வேலைத்திட்டம் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(iv) குறைந்த வருமானத்தை ஈட்டும் குடும்ப அலகுகளிலுள்ள மாற்றுத்திறனுள்ள பிள்ளைகளை முன்பள்ளிக் கல்வியின்பால் ஆற்றுப்படுத்த எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) அரசாங்க மற்றும் தனியார் முன்பள்ளிகளில் கல்விகற்கும் மாற்றுத்திறனுள்ள பிள்ளைகளுக்கு முறையான வசதிகளும் சேவைகளும் வழங்கப்படுகின்றனவா என்பதையும்;

(vi) அவ்வாறாயின், அத்தகைய சேவைகளும் வசதிகளும் யாவை என்பதையும்;

(vii) மாற்றுத்திறனுள்ள பிள்ளைகளை முன்பள்ளிகளில் அனுமதிப்பதற்கென வெளியிடப்பட்டுள்ள வழிகாட்டிகளும் சுற்றறிக்கைகளும் யாவை என்பதையும்;

(viii) முன்பள்ளி ஆசிரியர்களுக்கு, சிறப்புக் கல்விக்கான தேவையுடைய பிள்ளைகளுடன் செயற்படுவதற்காக வழங்கப்படுகின்ற பயிற்சி நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House -

(i) the number of children with disabilities in Sri Lanka between the ages of three to five years;

(ii) the percentage of the children, out of the aforesaid number, who have got enrolled in preschools;

(iii) whether a formal arrangement would be made to provide equal and fair opportunities for the early childhood development of those children;

(iv) the measures taken to direct the children with disabilities from low-income households to preschool education;

(v) whether formal facilities and services are provided for the children with disabilities studying in public and private preschools;

(vi) if so, the aforesaid services and facilities;

(vii) the guidelines and circulars issued for the admission of the children with disabilities to preschools; and

(viii) the training programmes provided to preschool teachers to enable them to work with children with special educational needs?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)

ගරු කථානායකතුමනි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මේ සම්බන්ධව සංඛ්‍යාලේඛන මේ වන විට අමාත්‍යාංශය සතුව නොමැති අතර, මෙම තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.

(ii) මේ සම්බන්ධව දත්ත මේ වන විට අමාත්‍යාංශය සතු නොවන අතර ඉදිරියේදී සිදු කිරීමට නියමිත පෙර පාසල් සංගණනයේදී පෙර පාසල්වල අධ්‍යාපනය ලබන ආබාධ සහිත සියලු දරුවන් පිළිබඳව ද තොරතුරු රැස් කිරීමට නියමිත ය.

(iii) පෙර පාසල් ප්‍රමිති හඳුන්වා දීම මඟින් අන්තර්කරණ වටපිටාවක් පෙර පාසල තුළ නිර්මාණය වීමට ඉඩ සලසා ඇත.

(iv) පෙර පාසල් දරුවන් සඳහා උදැසන ආහාරය ලබා දීමේ වැඩසටහන හරහා පොදුවේ අඩු ආදායම්ලාභී පවුල් ඒකකවල දරුවන් පෙර පාසල් අධ්‍යාපනයට යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇත.

(v) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන ජාතික ප්‍රමිති මාලාව මඟින් පෙර පාසල්වල ඉගෙනුම ලබන ආබාධ සහිත දරුවන් සඳහා පහසුකම් සැලසීම සිදු කළ යුතු බවට මඟ පෙන්වීම් සිදු කර ඇත.

(vi) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා වන ප්‍රමිති යටතේ පහත දර්ශක හඳුන්වා දී ඇත.

ක්ෂේත්‍ර 1: භෞතික පරිසරය

- ආබාධ සහිත ළමයින්ට ප්‍රවේශ වීමට හා සියලු දෙනා සමඟ එක්ව සෙල්ලම් කිරීමට ද හැකි (අන්තර්කරණ) ස්ථාන ගොඩනැඟීම.
- ආබාධ සහිත ළමයින් ඇතුළු සියලුම ළමයින්ට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ගොඩනැඟිලි වෙත ප්‍රවේශ වීමට හැකි විය යුතු ය.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ගෘහස්ථ පරිසරය චිත්තාකර්ෂණීය ලෙස සකස් කර ඇති අතර ආබාධ සහිත ළමයින් ඇතුළු සියලුම ළමයින් සඳහා ගැළපෙන අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ ප්‍රමාණවත් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.
- එහි ආබාධ සහිත ළමයින්ට භාවිත කළ හැකි ක්‍රීඩා උපකරණ තිබිය යුතු ය.

ක්ෂේත්‍රය 4: ඉගෙනුම් පරිසරය

- ළමයින්ගේ සංවර්ධනය හා ඉගෙනුම තක්සේරු කිරීමේදී විවිධ අර්ථවත් ක්‍රම (නිරීක්ෂණ, වැඩ ගොනු, පිරික්සුම් ලැයිස්තු හා සංස්කෘතික වශයෙන් අදාළ ප්‍රමිතිගත ඇගයුම් ක්‍රම) භාවිත කරනු ලැබේ.

(vii) පෙර පාසල් සඳහා දරුවන් ඇතුළත් කිරීම සම්බන්ධව මෙම අමාත්‍යාංශය වක්‍රලේඛ නිකුත් කර නොමැති අතර, පළාත් පෙර පාසල් ඒකක/ අධිකාරි විසින් එක් එක් පළාතට අදාළව එම කාර්යය සිදු කරනු ලබයි.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් දන්නවා ඇති, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පෙර පාසල් සම්බන්ධ වැඩිපුර බලතල පළාත් සභාවලට වෙන් වෙලා තිබෙන බව. ඒ අනුව ගොඩනඟපු පෙර පාසල් ඒකක සහ අධිකාරි තිබෙනවා.

ප්‍රඥප්තියට අදාළව ඒ තොරතුරු සම්බන්ධයෙන් පළාත් සභාව විධියට මැදිහත් වෙනවා.

(viii)
- පෙර පාසල් ගුරු පුහුණු විෂය මාලාවේ අධ්‍යයන පැය 50ක් ආබාධ සහිත දරුවන් සමඟ කටයුතු කිරීම වෙනුවෙන් හඳුන්වා දීම.
- අවදානමට ලක්විය හැකි දරුවන් හැසිරවීම සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමට පුහුණු වැඩ සටහනක් පැවැත්වීමට මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ 2026 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කිරීම.
- ඔටිසම් ආබාධ සහිත දරුවන් හැසිරවීම සම්බන්ධයෙන් පෙර පාසල් ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා අත් පොතක් නිර්මාණය කිරීම.

(ආ) අදාළ නොවේ.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා අවංකව ලබා දුන් පිළිතුර ගැන මා සෑහීමට පත් වෙනවා. හැබැයි, ඒ පිළිතුර තුළ ගැබ් වූ එක් කාරණයක් තමයි, සාමාන්‍ය අධ්‍යාපනයට වඩා මුල් ළමාවිය අධ්‍යාපනයේදී විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා තිබෙන ආබාධ සහිත දුවා දරුවන් පිළිබඳව ලොකු අවධානයක් නැහැ කියන එක. අප විශ්වාස කරන විධියට, "ළමයෙක්" නම් ආබාධිත වුණත්, නැතත්, "ළමයෙක්" විධියට තමයි අප සලකන්නේ. ඔවුන් තමයි අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්නේ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, එම නිසා මා විශ්වාස කරන දේ තමයි, මුල් කාලීනවම ආබාධ සහිත දරුවාගේ ආබාධිත බව හඳුනාගෙන සංවර්ධනය කරන්න පටන් ගත්තොත් ඉතා ඉහළ ඵලදායිත්වයකින් යුක්ත පුරවැසියෙකු බිහි කිරීමේ අවස්ථාව තිබෙනවා කියන එක. එම නිසා, රෝහල්, MOH කන්තෝරු ඇතුළු සෞඛ්‍ය අංශත් එක්ක එකතු වෙලා ආබාධ සහිත දරුවන්ගේ ස්වභාවය සහ ආබාධිත බවේ ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක් සහිතව හඳුනා ගැනීමක් තුළින් පෙර පාසල් අධ්‍යාපනයට යොමු කිරීමේ හැකියාව සහ අවශ්‍යතාව ජාතික වශයෙන් අපි පිළිගන්නවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. එවැනි වැඩ පිළිවෙළක් සඳහා අනිවාර්යයෙන්ම විද්‍යාත්මක ප්‍රවේශයක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

ගන්නවා නම්, ඔබතුමා කිව්වා වාගේම ඉතා හොඳ සහ ඉහළ ගණයේ දත්ත පද්ධතියක් - ගොනුවක් - ඔබ අමාත්‍යාංශය සතුව තිබෙන්න ඕනෑ. එම දත්ත පද්ධතිය - ගොනුව - සම්පාදනය සඳහා ඔබ අමාත්‍යාංශය විසින් ගන්නා වූ පියවර දැන ගන්න සතුටුයි.

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)

ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල්කරණ ව්‍යාපෘතිය හරහා දැනටමත් සියලුම අමාත්‍යාංශවල ඒ ඒ අමාත්‍යාංශයට අදාළව දත්ත පද්ධති ගොඩනැඟෙමින් පවතිනවා.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයටත් පසුගිය වසරේ සහ මේ වසරේ මුදල් ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා මේ දත්ත පද්ධතිය ගොඩ නහන්නට. මේ වෙනකොට අපි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධ වෙලා දත්ත පද්ධතියේ වැඩ කටයුතු බොහෝදුරට අවසන් කරලා තිබෙනවා. මේ වසර අවසන් වනවිට මේ දත්ත පද්ධතිය ගොඩනඟන්නට පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම මේ වෙනකොටත් අමාත්‍යාංශය විධියට සිදුකරමින් පවතිනවා.

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ගරු ජනාධිපතිවරයා පසුගිය අය වැය ලේඛන දෙක තුළින් ස්නායු ආබාධ සහ බුද්ධි වර්ධන ඌනතා තිබෙන දරුවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ බව අපි දැක්කා. ඒ එක්කම පාසල් යන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීමටත්, ඔවුන් ආකර්ෂණය කර ගැනීමටත් මාසිකව රුපියල් 5,000ක විශේෂ දීමනාවක් ලබා දුන්නා. මේ වාගේ දීමනා හරහා අපි බලාපොරොත්තු වෙන දේ තමයි ආබාධ සහිත දරුවන් පොදු අධ්‍යාපන ධාරාව ඔස්සේ ඉහළට ගෙනෙන එක. මේ වාගේ වැඩ පිළිවෙළක් සහිතව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා තිබෙන වයස අවුරුදු 3-5 අතර - මුල් ළමාවිය - ආබාධ සහිත දරුවන් පාසල්වලට එකතු කරගැනීමේ අවශ්‍යතාව පිළිගනිමින්, ජාතික ළමා ප්‍රඥප්තිය තුළ කොයි වාගේ අවස්ථාවක්, කොයි වාගේ ගැඹුරු තැනක් ඔබ අමාත්‍යාංශය විසින් දීලා තිබෙනවාද කියන එක දැනගන්න සතුටුයි.

ඒ එක්කම අපි විශ්වාස කරන දේ තමයි මුල් ළමාවිය පාසල් පද්ධතිය තුළ අනිවාර්යයෙන්ම අන්තර්කරණීය අවශ්‍යතා ඉෂ්ට වෙන විධියට ප්‍රතිපත්තිය සහ වැඩ පිළිවෙළ සකස් විය යුතුයි කියන එක. මේ ප්‍රඥප්තිය සහ මේ ප්‍රතිපත්තිය තුළ මුල් ළමාවියේ සිටින ආබාධ සහිත දරුවන්ට කොයි වාගේ අවස්ථාවක්, කොයි වාගේ ඉඩ ප්‍රමාණයක් සහ සාධාරණ අවස්ථාවක් හිමි වෙනවාද?

ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)
ඒ ප්‍රශ්නය ඇසීම ගැන බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ඇත්තටම අපේ රටේ පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැඟිලා තිබුණේ නැහැ. මුල් ළමාවිය සංවර්ධනය සම්බන්ධයෙන් 2008දී ජාතික ප්‍රතිපත්තියක් තිබුණාට, පෙර පාසල් අධ්‍යාපනය කියන විෂයයට ජාතික ප්‍රතිපත්තියක් ගොඩ නැඟිලා තිබුණේ නැහැ. මේ වෙනකොට අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය එකතු වෙලා ජාතික පෙර පාසල් ප්‍රතිපත්තියක් ගොඩ නහන්නට අවශ්‍ය කටයුතු සිදු කරලා දැන් එය අවසන් අදියරේ තිබෙන්නේ. ඒ තුළ උපාය මාර්ග - strategies - හයක් යටතේ මේ රටේ පෙර පාසල් අධ්‍යාපනය ගොඩනංවන්නට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු අපි අරගෙන තිබෙනවා. ඒකේ පළමුවැනි strategy එක විධියට අපි නම් කරලා තිබෙන්නේ, "Equitable access to physical education." මේ රටේ සියලු දරුවන්ට සමාජ තත්ත්ව, ආර්ථික තත්ත්ව සහ ආබාධිතද, නිර්බාධිත ද කියන කිසිම දෙයක් නොසලකා පෙර පාසල් අධ්‍යාපනයට ඇතුළත් වීමට සුදුසු පරිසරයක් ගොඩනඟන එක තමයි ජාතික පෙර පාසල් ප්‍රතිපත්තියේ පළමුවැනි ප්‍රතිපත්තිමය කාරණය විධියට අපි හඳුන්වා දී තිබෙන්නේ. ඒ සඳහා අපි පියවර ගනිමින් ඉන්නවා. ඒත් එක්කම 2026-2030 මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ අවුරුදු පහක ක්‍රියාකාරී සැලැස්මක් අපි ගොඩ නඟලා තිබෙනවා. මේ තුළ සියලු අමාත්‍යාංශ - කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය - එකතු වෙලා මේ රටේ සියලු දරුවන්ට මුල් ළමාවිය අධ්‍යාපනය සම්බන්ධ සමාන ප්‍රවේශයක් ලබා දෙන්න පුළුවන් වටපිටාවක් ගොඩනඟන්නට අවශ්‍ය කටයුතු මේ වනවිට සූදානම් කරමින් පවතිනවා.

"දිට්වා" සුළි කුණාටුවෙන් හානි වූ මහනුවර දිස්ත්‍රික්කයේ නිවාස සහ ව්‍යාපාර: වන්දි

கண்டி மாவட்டத்தில் "தித்வா" புயலால் சேதமடைந்த வீடுகள் மற்றும் வணிகங்கள்: இழப்பீடுகள்

HOUSES AND BUSINESSES IN KANDY DISTRICT DAMAGED DUE TO CYCLONE "DITWAH": COMPENSATION

1981/2026

8. ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ -

(i) දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදුවී ඇති ප්‍රධාන ආපදා කවරේද;

(ii) ජනතාවගේ ඉඩම් අහිමිවීම්, නිවාස හානිවීම් සහ ව්‍යාපාර හානිවීම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හානි සිදුවූ ආගමික ස්ථාන සහ එම හානිවල මූල්‍ය වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නිවාස අහිමිවීම් හේතුවෙන් කුලී නිවාසවල පදිංචිව සිටින සංඛ්‍යාව කොපමණද;

(v) නිවාස අහිමිවූ පවුල් සඳහා ගෙවා ඇති මුළු වන්දි මුදල කොපමණද;

(vi) හානිවූ නිවාස වෙනුවෙන් යෝජනා කර ඇති නව නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව සහ මේ වනවිට ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනවිට විකල්ප ඉඩම් ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(viii) උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පොල නගරයේ ව්‍යාපාර හානිවූ ව්‍යාපාරිකයන් අතරින් මේ වනවිට වන්දි ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) கண்டி மாவட்டத்தில் -

(i) தித்வா புயல் காரணமாக ஏற்பட்டுள்ள பிரதான அனர்த்தங்கள் யாவை என்பதையும்;

(ii) மக்களின் காணி இழப்புகள், சேதமடைந்த வீடுகள் மற்றும் சேதமடைந்த வணிக நிறுவனங்கள் பிரதேச செயலக வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) சேதமடைந்த மதஸ்தலங்கள் மற்றும் மேற்படி சேதங்களின் நிதிப் பெறுமதி வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) வீடுகளை இழந்ததால் வாடகை வீடுகளில் வசிப்போரின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) வீடுகளை இழந்த குடும்பங்களுக்குச் செலுத்தப் பட்டுள்ள மொத்த இழப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(vi) சேதமடைந்த வீடுகளுக்காக முன்மொழியப் பட்டுள்ள புதிய வீட்டுத் திட்டங்களின் எண்ணிக்கையும் இன்றளவில் ஆரம்பிக்கப் பட்டுள்ள அத்தகைய திட்டங்களின் எண்ணிக் கையும் யாவை என்பதையும்;

(vii) இன்றளவில் மாற்றுக் காணிகள் வழங்கப் பட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(viii) உடபலாத்த பிரதேச செயலாளர் பிரிவின், கம்பளை நகரில் வணிக நிறுவனங்கள் சேத மடைந்துள்ள வர்த்தகர்களில் இன்றளவில் இழப்பீடுகள் வழங்கப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House, in relation to the Kandy District, the -

(i) major destructions that had occurred due to Cyclone "Ditwah";

(ii) losses of land, damages to houses and damages to businesses, separately in each Divisional Secretary's Division;

(iii) religious places that had been damaged and the financial assessment of such damages, separately;

(iv) number of people living in rented houses due to the loss of their own houses;

(v) total compensation paid to the families who had lost their houses;

(vi) number of new housing projects proposed for the damaged houses and the number of projects that have been initiated so far;

(vii) number of families that have been provided with alternative lands so far; and

(viii) number that has been compensated so far, out of the businessmen in the Gampola Town of the Udapalatha Divisional Secretary's Division, due to the disruption of businesses?

(b) If not, why?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ආපදා වර්ගය	ආපදා හේතුවෙන් සිදුව ඇති විපත්
1	ගඟවට කෝරළය	නායයෑම්, ගංවතුර, කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාර හානි, ආගමික ස්ථාන හානි
2	කුණ්ඩසාලේ	නායයෑම්, ගංවතුර, කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, මරණ
3	පන්විල	නායයෑම්, ගංවතුර, කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
4	පාතදුම්බර	නායයෑම්, ගංවතුර, තද සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
5	යටිනුවර	ගංවතුර, නායයෑම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
6	උඩුනුවර	නායයෑම්, අධික සුළං, ගංවතුර	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
7	උඩපළාත	නායයෑම්, ගංවතුර, ඉවුරු කඩා වැටීම්, නායයෑම් අවදානම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
8	දොළව	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
9	පාතහේවාහැට	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ
10	දෙල්තොට	නායයෑම්, ගිලා බැසීම්, කණ්ඩි කඩා වැටීම්, ජල ගැලීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්
11	මැදදුම්බර	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්, මරණ

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ආපදා වර්ගය	ආපදා හේතුවෙන් සිදුව ඇති විපත්
12	උඩුදුම්බර	නායයෑම්, අධික සුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්,
13	මිනිපේ	නායයෑම්, සුළිසුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්,
14	අකුරණ	නායයෑම්, ගංවතුර, අධික සුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්,
15	පූජාපිටිය	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, නිවාස අධි අවධානම්, ව්‍යාපාරික ස්ථාන හානි, ආගමික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්,
16	හාරිස්පත්තුව	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	මරණ, පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන හානි, මාර්ග අවහිරවීම්
17	තුම්පනේ	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං	ජීවිත හානි, නායයෑම්, ගස් කඩා වැටීම්, මාර්ග අවහිරවීම්, නිවාස පූර්ණ හා අර්ධ හානි
18	හතරලියද්ද	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්	මරණ, නායයෑම් නිසා පූර්ණ නිවාස හානි, අර්ධ නිවාස හානි, ව්‍යාපාරික ස්ථාන අහිමිවීම්, යටිතල පහසුකම් හානිවීම, විහාරස්ථානවලට හානිවීම
19	ගහඉහළ	නායයෑම්, ගංවතුර, පස් කණ්ඩි කඩා වැටීම්	පුද්ගල මරණ, පුද්ගල අතුරුදහන්, නිවාස හා ගොඩනැඟිලි හානි, ව්‍යාපාරික ස්ථාන හානි, සත්ව හා ගොවිපළ හා ඉඩම් හානි
20	පස්බාගේ කෝරළය	නායයෑම්, පස් කණ්ඩි කඩා වැටීම්, අධික සුළං, ගංවතුර	පුද්ගල මරණ, පුද්ගල අතුරුදහන්, නිවාස හා ගොඩනැඟිලි හානි, ව්‍යාපාරික ස්ථාන හානි, සත්ව හා ගොවිපළ හා ඉඩම් හානි

(ii)

අ.අ	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉඩම් අහිමි වූ පුද්ගල සංඛ්‍යාව	නිවාස හානිවීම්		ව්‍යාපාර හානිවීම්
			පූර්ණ නිවාස හානි	අර්ධ නිවාස හානි	
1	ගඟවට කෝරළය	82	41	236	288
2	කුණ්ඩසාලේ	53	9	384	48
3	පන්විල	110	20	102	17
4	පාතදුම්බර	99	26	303	354
5	යටිනුවර	244	74	656	179
6	උඩුනුවර	329	65	802	810
7	උඩපළාත	690	241	1286	1117
8	දොළව	710	206	1834	203
9	පාතහේවාහැට	236	88	307	41
10	දෙල්තොට	355	181	514	45
11	මැදදුම්බර	431	35	483	30
12	උඩදුම්බර	716	125	209	163
13	මිනිපේ	208	59	1973	252
14	අකුරණ	126	36	152	73
15	පූජාපිටිය	170	102	252	168
16	හාරිස්පත්තුව	75	15	486	66
17	තුම්පනේ	116	62	344	23
18	හතරලියද්ද	241	46	292	18
19	ගහඉහළ	993	165	577	238
20	පස්බාගේ කෝරළය	135	64	160	46
	එකතුව	6119	1660	11352	4179

(iii)

අ.අ	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ආපදා සිදු වූ ආගමික ස්ථානය	මූල්‍ය වටිනාකම	වෙනත්
1	ගඟවටකෝරළය	31	58,600,000.00	සිද්ධස්ථාන 14ක් සඳහා දළ ඇස්තමේන්තුව පමණි. බෞද්ධාගමික ස්ථාන 10ක් සඳහා NBRI වාර්තා ලැබී නොමැත. 4ක් සඳහා ඇස්තමේන්තු සාදා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත.
2	කුණ්ඩසාලේ	0	0	
3	පන්විල	0	0	
4	පාතදුම්බර	5	ඇස්තමේන්තු හා ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු වෙතින් ස්ථානීය පරීක්ෂාව සඳහා NBRI වෙත යොමු කර ඇත.	

අ.අ	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ආපදා සිදු වූ ආගමික ස්ථානය	මූල්‍ය වටිනාකම	වෙනත්
5	යටිනුවර	16	72,976,705.00	
6	උඩුනුවර	15	41,687,778.07	සිද්ධස්ථාන 08ක් සඳහා දළ ඇස්තමේන්තුව පමණි. දිස්ත්‍රික් ඉංජිනේරු වෙත 03ක් යොමු කර ඇති අතර පූර්ණ හානි 01කි.
7	උඩපළාත	22	4,670,288.24	බෞද්ධ ස්ථාන සඳහා 4,570,288.24 ඇස්තමේන්තු කර ඇත. මුස්ලිම්, ක්‍රිස්තියානි පල්ලි සඳහා රු. 50,000 බැගින් ගෙවා ඇත.
8	දොළුව	26	41,000,000.00	
9	පාතහේවාහැට	24		තක්සේරු කරමින් පවතී.
10	දෙල්තොට	11	8,202,053.48	පන්සල් දෙකේ පමණි. අනික් ස්ථාන තක්සේරු කරමින් පවතී
11	මැදදුම්බර	21		දිස්ත්‍රික් ඉංජිනේරු වෙත 06ක් ද, තාක්ෂණ නිලධාරි වෙත 01ක් ද, ඇස්තමේන්තු සකස් කරමින් 06ක් ද, NBRI පරීක්ෂාවෙන් පසු දිස්ත්‍රික් ඉංජිනේරු වෙත 02ක් ද, NBRI පරීක්ෂාව සඳහා 01ක් ද යොමු කර ඇත.
12	උඩදුම්බර	7		තක්සේරු කරමින් පවතී.
13	මිනිපේ	1	2,022,543.52	
14	අකුරණ	2	50,000.00	
15	පූජාපිටිය	11	14,650,000.00	දිස්ත්‍රික් ඉංජිනේරු වෙත 03ක් ද, බුද්ධශාසන අමාත්‍යාංශය වෙත 02ක් ද, විහාරස්ථානය මඟින් පිළිසකර කර ගැනීම් 01ක් ද පවතී.
16	හාරිස්පත්තුව	2	0	ප්‍රතිපාදන ලැබී ඇත.
17	තුම්පනේ	3		දෙකක NBRI වාර්තා ලැබී නොමැති අතර එකක් දායක සභාව මඟින් සකසා ඇත.
18	හතරලියද්ද	3	1,800,000.00	
19	ගහඉහළ	2	2,760,000.00	
20	පස්බාගේ කෝරළය	5		තක්සේරු කරමින් පවතී.
			248,419,368.31	

(iv)

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	කුලී නිවාසවල සිටින සංඛ්‍යාව
1	ගහවටකෝරළය	51
2	කුණ්ඩසාලේ	42
3	පන්විල	59
4	පාතදුම්බර	47
5	යටිනුවර	124
6	උඩුනුවර	187
7	උඩපළාත	306
8	දොළුව	408
9	පාතහේවාහැට	133
10	දෙල්තොට	169
11	මැදදුම්බර	102
12	උඩදුම්බර	435
13	මිනිපේ	190
14	අකුරණ	89
15	පූජාපිටිය	86
16	හාරිස්පත්තුව	30
17	තුම්පනේ	66
18	හතරලියද්ද	195
19	ගහඉහළ	616
20	පස්බාගේ කෝරළය	69
	එකතුව	3,404

(v)

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	නිවාස අහිමි වූ පවුල් සඳහා ගෙවා ඇති මුළු වන්දි මුදල
1	ගහවටකෝරළය	0
2	කුණ්ඩසාලේ	50,000,000.00
3	පන්විල	69,499,000.00
4	පාතදුම්බර	7,000,000.00
5	යටිනුවර	27,500,000.00
6	උඩුනුවර	11,000,000.00
7	උඩපළාත	2,000,000.00
8	දොළුව	54,000,000.00
9	පාතහේවාහැට	42,000,000.00
10	දෙල්තොට	14,000,000.00
11	මැදදුම්බර	17,000,000.00
12	උඩදුම්බර	36,000,000.00
13	මිනිපේ	16,000,000.00
14	අකුරණ	6,000,000.00
15	පූජාපිටිය	180,000,000.00
16	හාරිස්පත්තුව	2,000,000.00
17	තුම්පනේ	28,000,000.00
18	හතරලියද්ද	54,000,000.00
19	ගහඉහළ	8,000,000.00
20	පස්බාගේ කෝරළය	2,000,000.00
	එකතුව	625,999,000.00

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

නිවසක් පූර්ණ හානි වීම මත හෝ අධි අවදානම් ප්‍රදේශයක පිහිටීම මත නැවත පදිංචි කිරීමට ඇති පවුල් සඳහා ප්‍රතිලාභියාට අයත් ඉඩමක නිවාස ඉදිකිරීමට/රජයේ ඉඩමක නිවස ඉදිකිරීමට/ නිවසක් මිලදී ගැනීමට හෝ ඉඩමක් මිලදීගෙන නිවසක් සෑදීමට යන කරුණු වෙනුවෙන් මෙතෙක් ලබා දී ඇති වන්දි මුදල මෙහි සඳහන් කර ඇත.

(vi) මෙහිදී පූර්ණ නිවාස හානිවීම හෝ අධි අවධානම් ප්‍රදේශයක නිවස පිහිටීම හේතුවෙන් නැවත පදිංචි කිරීමට සිටින ආපදාවට ලක් වූ පවුල් සඳහා නිවාස යෝජනා ක්‍රම/මහල් නිවාස ලෙස වන නිවාස පමණක් මෙහි දක්වා ඇත. මෙම තොරතුරු තුළ කේවල නිවාස ඉදිකිරීම්/මිලදී ගැනීම් ඇතුළත් නොවේ.

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	හානි වූ නිවාස වෙනුවෙන් යෝජනා කර ඇති නව නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව	මේ වන විට ආරම්භ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව
1	ගඟවටකෝරළය	1	1
2	කුණ්ඩසාලේ	2	1
3	පන්විල	2	0
4	පාතදුම්බර	0	0
5	යටිනුවර	2	0
6	උඩුනුවර	0	0
7	උඩපළාත	2	0
8	දොළුව	0	0
9	පාතහේවාහැට	1	1
10	දෙල්තොට	0	0
11	මැදදුම්බර	0	0
12	උඩදුම්බර	0	0
13	මිනිපේ	0	0
14	අකුරණ	0	0
15	පූජාපිටිය	0	0
16	හාරිස්පත්තුව	2	1
17	තුම්පනේ	1	1
18	හතරලියද්ද	0	0
19	ගඟඉහළ	0	0
20	පස්බාගේ කෝරළය	1	0
	එකතුව	14	5

නිවාස ව්‍යාපෘති යනුවෙන් සඳහන් කර ඇත්තේ තනි තනි ලෙස ඉදිකරන ලද නිවාස නොවේ.

(vii)

අ.අ.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	විකල්ප ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව
1	ගඟවටකෝරළය	44
2	කුණ්ඩසාලේ	33
3	පන්විල	16
4	පාතදුම්බර	2
5	යටිනුවර	12
6	උඩුනුවර	0
7	උඩපළාත	9
8	දොළුව	10
9	පාතහේවාහැට	21
10	දෙල්තොට	32
11	මැදදුම්බර	7
12	උඩදුම්බර	48
13	මිනිපේ	0
14	අකුරණ	0
15	පූජාපිටිය	58
16	හාරිස්පත්තුව	6
17	තුම්පනේ	10
18	හතරලියද්ද	24
19	ගඟඉහළ	0
20	පස්බාගේ කෝරළය	14
	එකතුව	302

(viii)

අ.අ.	ගම්පොල නගරයේ ව්‍යාපාර හානි වූ ව්‍යාපාරිකයන් සංඛ්‍යාව	මේ වන විට වන්දි ලබා දී ඇති සංඛ්‍යාව
	1,117	කර්මාන්ත අමාත්‍යාංශය මඟින් 140ක්, ආරක්ෂක අමාත්‍යාංශය මඟින් 182ක්, තනි හා ක්ෂුද්‍ර පරිමාණ රු.25,000/- මුදල් ගෙවීම් 73ක්, ජීවනෝපාය අහිමිවීම් 18ක් ලෙස 780කට 2026.04.23 දින වන විට ගෙවීම් සිදු කර ඇති අතර සෙසු ගෙවීම් සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. අයදුම් පත්‍රවල ගැටලු හා අවශ්‍ය ලේඛන අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම, සමාගම් පනත් යටතේ ලියාපදිංචි වී ඇති ප්‍රතිලාභීන් සඳහා ගෙවීම් සඳහා උපදෙස් ඉල්ලා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, විපතට පත් පවුල් වෙනුවෙන් රුපියල් 15,000, 25,000, 50,000 ආදී වශයෙන් වන්දි මුදල් ලබා දීම පිළිබඳ ගැටලුවක් නැහැ. ඒ මුදල් ගෙවීමේ ප්‍රගතිය ආණ්ඩුව හැටියට හොඳයි. ඒ ගැන ජනාධිපතිතුමා පසුගිය දිනයක ප්‍රගති සමාලෝචනයක් කළා. ඒකට අපේ ගෞරවය එකතු කරනවා. ගරු කථානායකතුමනි, හැබැයි අපේ සංඛ්‍යාලේඛනවලට අනුව මහනුවර දිස්ත්‍රික්කයේ විතරක් පූර්ණ නිවාස හානි 1,739ක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු විධියට නම් 1,630යි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඕනෑ නම් මම සංඛ්‍යාලේඛනවලින් කියන්නම්. මේ කියන නිවාස හානි වෙච්ච, ඉඩම් හානි වෙච්ච පිරිස්වලට මේවා දීලා නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පවුල් 1,600ක් කියන්නේ, පුද්ගලයන් හැටියට ගත්තොත්, 5,000ක, 6,000ක, 7,000ක විතර පිරිසක්.

මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. මාවතුරේ විතරක් ජීවිත 29ක් නැති වුණා, ගෙවල් 17ක් ගියා. අද වන විට ඒ අයට එක ගෙයක්වත් දීලා නැහැ. මේ ගමම නාය ගියා. මම තවත් සිද්ධියක් ඔබතුමාට කියන්නම්. උඩුම්බර අපේ බස්නායක මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගංගොඩ ප්‍රදේශයේ පවුල් 34ක් ඉවත් කරන්න ඕනෑ කියනවා. ඒ ඉවත් කරපු පවුල් 24 පදිංචි කරවන්න පිටිගොඩ ස්ථානයක් සොයා ගත්තා, එතැනට යන්න මිනිස්සු කැමති නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතකොට මේ පවුල් 1,630ට නිවාස ලබා දෙන්නේ කවදාද? මේ මාසයේ 27වැනි දා වෙනකොට "දිටිවා" ව්‍යසනය ඇවිල්ලා මාස 6යි. මේ විපතට පත් වෙච්ච මිනිස්සු අද ඉන්නේ සහෝදරයන්ගේ ගෙවල්වල; දෙමව්පියන්ගේ ගෙවල්වල; කුලී නිවාසවල. ඒ අයගේ ජීවිත සම්පූර්ණයෙන්ම අවුල් වෙලා තිබෙන්නේ. මේ තත්ත්වය මහනුවර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මාතලේ, නුවරඑළිය ඇතුළු ගොඩක් දිස්ත්‍රික්කවල තිබෙනවා. එම නිසා ඔබතුමාට පුළුවන් ද මේ පාර්ලිමේන්තුවට සහතිකයක් දෙන්න, කවදා වෙනකොට මේ අයට නිවාස ලබා දෙන්න පුළුවන් ද කියලා? අපි යෝජනාවක් ගෙනාවා නියෝජ්‍ය ඇමතිතුමනි, ඉඩම් ටික අත්පත් කර ගන්නවා නම් යෝජනාවක් ගෙනැල්ලා අත්පත් කරගන්න කියලා. ප්‍රාදේශීය ලේකම්වරු වතුවලින් ඒ ඉඩම් ඉල්ලුවාට, එක වතු අධිකාරියක්වත් ඒ නිවාස හදන්න තවම හරියට ඉඩම් නිදහස් කරලාත් නැහැ. ඒක ඒ අයගේ වරදක් නොවෙයි. එම නිසා කවදා වෙනකොට මේ නිවාස ටික මේ මිනිස්සුන්ට දීලා අවසන් කරන්න පුළුවන් ද කියලා ඔබතුමා සහතිකයක් දෙනවා ද?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, අපේ රජයේ වගකීම තමයි මේ ආපදාවට සහ පීඩාවට ලක් වෙච්ච සියලු ජනතාවට අවශ්‍ය ඉඩම් ටික, ඒ වන්දි මුදල් ටික හරි වේලාවට ලබා දෙන එක. අප උපරිම උත්සාහ කරලා ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාම නිලධාරිවරුන්ගේ සිට දිස්ත්‍රික් ලේකම්වරු වෙනකම් උදේ, දවල්, රාත්‍රී වැඩ කරලා තමයි මේ කටයුතු කළේ. ඉඩමක් වෙන් කර ගැනීමේදී, ඉඩමක් සොයා ගැනීමේදී, ඉඩම තක්සේරු කිරීමේදී මෙන්ම, විශේෂයෙන්ම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය විසින් සහතික කිරීමට යම්කිසි කාලයක් යනවා. ඒකටත් අපි විශේෂ සැලකිල්ලක් අරගෙන ඉතාම ඉක්මනින් මේ කටයුතු අවසන් කරන්න තමයි අපි බලාපොරොත්තු වන්නේ. ඒකට අපි බැඳී සිටිනවා. ඒක අපේ වගකීමක්. ඒ වෙනුවෙන් ඔබතුමන්ලාගේත්, අපේත්, අනෙකුත් ආයතන ඇතුළු සියලු අයගේ සහයෝගය අරගෙන හැකි ඉක්මනින් මේ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ දිනයටම කරනවාය කියලා සහතිකයක් දෙන්න අපට අපහසුයි. හේතුව, ඒ සඳහා තාක්ෂණික වශයෙන්, පරිපාලනමය වශයෙන් කළ යුතු කාරණා තිබෙනවා. මොකද, ඒ ඉඩම් එක එක අයට සහ ආයතනවලට අයිති ඉඩම්. ගරු ජනාධිපතිතුමා පසුගිය දින කිහිපය තුළ එම දිස්ත්‍රික්කයට ගිය අවස්ථාවේ දීත් ගැටලුකාරී අදහස් මතු වුණා ඔබතුමා දකින්න ඇති, ගරු මන්ත්‍රීතුමනි. ඒවාත් සමථයකට පත් කරගෙන තමයි කටයුතු කරන්නේ. නමුත් ඉතාම ඉක්මනින් අපි ඒ කටයුතු නිම කරනවා.

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "දිටිවා" ඇවිල්ලා මේ මාසයේ 27වැනි දාට මාස 6යි කියන එක අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මම මතක් කරන්න කැමැතියි. ඒකත් මතක් කරන ගමන් මේ කාරණයත් මම කියන්න ඕනෑ, ගරු කථානායකතුමනි. සම්පූර්ණයෙන් හානි වෙච්ච නිවාසයක් වෙනුවෙන් අලුත් නිවාසයක් හදා ගැනීම සඳහා, ඉඩම අරගෙන ගේ හදා ගන්න දැන් රුපියල් මිලියන 5ක් දෙනවා. හැබැයි, කවුරු හරි කෙනෙක් ඉඩමක් තෝරාගෙන, ඒ ඉඩමට NBRI එකේ report එක අරගෙන, ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය අරගෙන, මුදල් ගෙවනවාය කියලා සහතිකය අරගෙන ආයෙත් අර ඉඩම අයිතිකාරයා ළඟට යනකොට එම ඉඩම විකුණලා ඉවරයි, ගරු කථානායකතුමනි. ඒක ප්‍රායෝගිකව මහ පොළොවේ තිබෙන ප්‍රශ්නයක්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ගම්පොළ ගත්තොත්, "දිටිවා" ව්‍යසනය හේතුවෙන් පීඩාවට පත් වෙච්ච මනුස්සයෙකු ගන්න යන ඉඩමක්ය කිව්වොත්, ඒ කෙනාට ඉඩම විකුණන්නේත් නැති තත්ත්වයට දැන් පත් වෙලා තිබෙනවා. මොකද හේතුව, රුපියල් මිලියන 5 ගන්න මාස තුනක්, හතරක්, පහක් ඒ ඉඩම නිර කරගෙන ඉන්න ඕනෑ. ඒක ප්‍රායෝගික නැහැ, නියෝජ්‍ය ඇමතිතුමා. මොකද, "දිටිවා" ව්‍යසනය හේතුවෙන් පීඩාවට පත් වෙච්ච කෙනෙකුට ඉඩම විකුණනවාය කියලා කවුරුහරි මනුස්සයෙක් ලියුමක් දුන්නාට පස්සේ ඒ මනුස්සයාට එම ඉඩම වෙන කෙනෙකුට විකුණා ගන්නත් බැහැ. ඒ නිසා ඒ සඳහා රජය හැටියට යම් වැඩ පිළිවෙළක් හදනවාද කියලා මා දැන ගන්න කැමැතියි.

ඒ වාගේම, "දිටිවා" සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කැඳවා තිබුණා මා දැක්කා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. 27වැනි දා සුළි කුණාටුව ඇවිල්ලා, මේ විධියට වැහැලා සම්පූර්ණයෙන් විනාශ වෙලා ජීවිත ගණනක් හානි වෙනකල් සුළි කුණාටුවක් එනවාය කියලා මහවැලි අධිකාරිය දන්නේ නැහැ, ගරු කථානායකතුමනි. එම නිලධාරීන් ඒ විධියටම තියාගෙන හිටියොත් මොකක්ද වෙන්නේ? ඇමතිතුමා දන්නේත් නැත්නම්, නිලධාරීන් දන්නේත් නැත්නම් කටද කියන්නේ? තවත් පාරක් වැහැලා තවත් ප්‍රශ්නයක් ආවත් ඔව්වරයි. BBC එකෙන් කිව්වා, ඉන්දියාවේ පාර්ලිමේන්තුවේ 20වැනිදා කිව්වා, අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දිගින් දිගටම කිව්වා, හැබැයි අපේ මහවැලි අධිකාරිය දන්නේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා, වැරදිලා හරි කොත්මලේ හරි කොහේ හරි ජලාශයකට ප්‍රශ්නයක් වුණා නම්, මුළු රටේම පානීය ජලය, වගා කටයුතු සියල්ල සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙනවා. ඒ නිසා ඔබතුමන්ලා මේ කාරණාව පිළිබඳව අවධානය යොමු කරලා, නියමාකාරයෙන් නිලධාරීන් පත් කරලා වැඩ පිළිවෙළක් හදනවාද? රජය හැටියට ඒකට භයිය දෙන්න පුළුවන් කණ්ඩායමක් පත් කරන්න වැඩ පිළිවෙළක් හදනවාද?

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු මන්ත්‍රීතුමනි, "දිවිවා" සුළි කුණාටුව දිස්ත්‍රික්ක 22කට බලපෑ බව ඔබතුමාත් දන්නවා; අපත් දන්නවා; සියලු දෙනාම දන්නවා. මහා විශාල දරුණු ආපදා තත්ත්වයක් නිසා වෙච්ච හානියක්, මේ. එහෙම නැතිව, අමාත්‍යාංශය දන්නේ නැති එකක්වත්, අනෙක් අය මොනවත් දන්නේ නැති එකක්වත් නොවෙයි. අපි බිම් මට්ටමේ සියලු විස්තර දන්නවා. ඔබතුමාත් ඇවිල්ලා බලන්න, ගරු මන්ත්‍රීතුමනි. අපේ මන්ත්‍රීවරු විතරක් නොවෙයි, රජයේ නිලධාරීන් ඔක්කෝම ඒ සම්බන්ධව කටයුතු කරනවා. 27වැනි දා වෙනකොට මාස 6ක් ගතවෙලා තිබෙන එක හරි. නමුත් අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න විශේෂ වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒ අනුව තමයි කටයුතු කරන්නේ. ඊයේත් අපි විශේෂ වැඩ පිළිවෙළක් දියත් කළා, ආපදාවට ලක්වුණු ජනතාවට තිබෙන ගැටලු ජාතික ආපදා සහ සහන සේවා මධ්‍යස්ථානයට - NDRSC එකට - ලබා ගන්න. අපට තොරතුරු ලැබිලා තිබෙනවා. නමුත් තාක්ෂණික මට්ටමේ තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයක් තිබෙනවා. අපි ඒ ප්‍රමාදයත් හදාගෙන ඉක්මනින්ම මේ කටයුතු සිදු කරනවා කියලා සහතික වෙනවා. ඒ වාගේම අපි බිම්මට්ටමට එනකම් විශේෂ වැඩ පිළිවෙළවල් කිහිපයක්ම සකස් කර තිබෙනවා.

ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය: විස්තර
கல்கமுவ நீர்ப்பாசன பயிற்சி நிறுவனம்: விபரம்
IRRIGATION TRAINING INSTITUTE, GALGAMUWA: DETAILS

1988/2026

9. ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) එම ආයතනය පිහිටුවීමේ අරමුණු කවරේද;

(iii) එම ආයතනය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට එම භූමිය තුළ ඇති ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(v) මේ වනවිට එම ආයතනයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත ආයතනය තුළ පවත්වනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම ආයතනයට පළමුවරට සිසුන් ඇතුළත් කරගත් වර්ෂය කවරේද;

(iii) එම සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනතෙක් එම පාඨමාලා සාර්ථකව අවසන් කළ සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) එම පාඨමාලාවලට අවසන් වරට සිසුන් ඇතුළත් කරගත් වර්ෂය කවරේද;

(vi) එම පාඨමාලාවලට සමාන පාඨමාලා පවත්වනු ලබන රජයේ හෝ පෞද්ගලික ආයතන තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கல்கமுவ நீர்ப்பாசன பயிற்சி நிறுவனம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது;

(ii) அந்த நிறுவனத்தை நிறுவியதன் நோக்கங்கள் யாவை;

(iii) அந்த நிறுவனத்துக்காக ஒதுக்கப்பட்டுள்ள நிலப்பரப்பு யாது;

(iv) தற்போது அந்த நிலப்பரப்பினுள் உள்ள கட்டிடங்களின் எண்ணிக்கை யாது;

(v) தற்போது அந்த நிறுவனத்தில் பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்தில் நடாத்தப்படும் பாடநெறிகள் யாவை;

(ii) அந்த நிறுவனத்துக்கு முதன்முதலாக மாணவர்கள் சேர்த்துக்கொள்ளப்பட்ட ஆண்டு யாது;

(iii) அந்த மாணவர்களின் எண்ணிக்கை யாது;

(iv) இதுவரையில் அந்தப் பாடநெறிகளை வெற்றிகரமாகப் பூர்த்திசெய்துள்ள மாணவர்களின் எண்ணிக்கை யாது;

(v) அந்தப் பாடநெறிகளுக்கு கடைசியாக மாணவர்கள் சேர்த்துக்கொள்ளப்பட்ட ஆண்டு யாது;

(vi) அந்தப் பாடநெறிகளுக்கு நிகரான பாடநெறிகளை நடாத்தும் அரச அல்லது தனியார் நிறுவனங்கள் உள்ளனவா;

(vii) அவ்வாறாயின், அவை யாவை;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) year in which the Irrigation Training Institute, Galgamuwa was established;

(ii) objectives for which the said institution was established;

(iii) extent of land allocated for the said institution;

(iv) number of buildings presently situated within the said land; and

(v) number of staff currently employed at this institute?

(b) Will he also state this House -

(i) the courses conducted at this institute;

(ii) the year in which the said institute first enrolled students;

(iii) the number of students so enrolled;

(iv) the number of students who have successfully completed the courses to date;

(v) the most recent year in which students were enrolled to the said courses;

(vi) whether there are any government or private institutions that conduct similar courses; and

(vii) if so, the names of such institutions?

(c) If not, why?

ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அரவிந்த சேனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1959 ජනවාරි මස 01වැනි දා.

(ii)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුමය හා වාරිමාර්ග තාක්ෂණය පිළිබඳ නිපුණතාවකින් හෙබි ද්විතීයික ගණයේ කාර්ය මණ්ඩලයක් ලෙස කාර්මික සහකාරවරුන් (වර්තමානයේ ඉංජිනේරු සහකාරවරුන්) පුහුණු කිරීම.
- දෙපාර්තමේන්තුවේ විවිධ සේවා ගණයන්ට අදාළව නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා මෙන්ම සේවා අවශ්‍යතා සපුරනු වස් සේවාරම්භක පුහුණු පාඨමාලාවන් හා කෙටි කාලීන සේවාස්ථ පුහුණු පාඨමාලා පැවැත්වීම.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විවිධ සේවා ගණයන්ට අදාළ නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම.

(iii) අක්කර 16ක ඉඩමක් තමයි මේ සඳහා යොදාගෙන තිබෙන්නේ.

(iv) 36යි.

(v) 31යි.

(ආ) (i)
- වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Irrigation Engineering - (වසර 03)
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවට විවිධ සේවා ගණයන්ට අදාළ නිලධාරීන්ගේ එනම් ඉංජිනේරුවරුන්, ඉංජිනේරු සහකාරවරුන්, තාක්ෂණ සහායක නිලධාරීන්, වෙනත් තාක්ෂණ සේවාවල නිලධාරීන් හා තාක්ෂණ නොවන සේවාවල නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු - Induction Trainings - මේ ආයතනයේදී පවත්වනවා.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විවිධ සේවා ගණයන්ට අදාළ නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ - Efficiency Bar Examinations - පවත්වනු ලබනවා.
- වාරිමාර්ග ඉංජිනේරුවරුන් සඳහා ජාත්‍යන්තර සුදුසුකම් (වරලත් ඉංජිනේරු) ලබා ගැනීම සඳහා වන පුහුණු.
- දෙපාර්තමේන්තුව විසින් කාලීනව හඳුනා ගනු ලබන අවශ්‍යතා අනුව නේවාසික පුහුණු වැඩසටහන් හා කෙටිකාලීන පුහුණු පාඨමාලා.
- වාරිමාර්ග ඉංජිනේරුවරුන්, ඉංජිනේරු සහකාරවරුන් සඳහා ජල කළමනාකරණය පිළිබඳ පුහුණු.
- ගොවි නියෝජිතයින් සඳහා නේවාසික හා ක්ෂේත්‍ර පුහුණු කිරීම.
- වාරිමාර්ග ව්‍යාපාරවල, ව්‍යාපාර කළමනාකරුවන් පුහුණු කිරීම.
- රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨ විද්‍යාර්ථීන් සඳහා මැනුම් කඳවුරු පැවැත්වීම.

(ii) 1959 (ඉංජිනේරු සහකාර ඩිප්ලෝමා පාඨමාලාව සඳහා)

(iii) 35

(iv) 1260

(v) 2014

(vi) ඔව්.

(vii) කොත්මලේ ජාත්‍යන්තර වාරිමාර්ග හා ජල කළමනාකරණ පුහුණු ආයතනය.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා දන්නවා මෙම ආයතනය තුළ අඛණ්ඩව සිසුන් බඳවා ගැනීමක් සිදු වෙන්නේ නැති බව. ඒ නිසාම මතු වෙලා තිබෙන ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එක පැත්තකින්, භෞතික හා මානව සම්පත් විශාල ප්‍රමාණයක් අපතේ යමින් තිබෙනවා. උපරිම කාර්යක්ෂමතාව භාවිතයට නොගැනීමේ ප්‍රශ්නයත් තිබෙනවා. අනෙක් පැත්තෙන්, අධ්‍යාපන ආයතනයකට අඛණ්ඩව සිසුන් බඳවා නොගැනීම නිසා ඒ තුළින් අත්දැකීම් හුවමාරුව හා ශක්තිමත් සංස්කෘතියක් ගොඩ නැඟීමට බාධා ඇති වෙලා තිබෙනවා. වාරිමාර්ග ක්ෂේත්‍රය තුළ ඉංජිනේරු සහකාරවරුන්ගේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිසා මෙම ආයතනයට සිසුන් බඳවා ගැනීම සඳහා නෛතික බාධාවක් තිබෙනවාද, නැත්නම් වෙනත් බාධාවක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමාගේ මෙම අතුරු ප්‍රශ්නය ගත්තාම එය මේ මොහොතේ අපි ආයතනයක් විධියටත්, ඒ වාගේම සියලුම අමාත්‍යාංශත් මුහුණ දෙමින් තිබෙන ප්‍රශ්නයක්. මේ පුහුණු මධ්‍යස්ථානයට සිසුන් බඳවා ගන්න නීතිමය බාධාවක් නැහැ. පසුගිය පාලන කාලයන් තුළ ගෙනාපු බඳවා ගැනීම් සීමා කිරීමේ යම් යම් යෝජනා එක්ක මේ සඳහා වසර 3ක් විතර කණ්ඩායම් බඳවා ගෙන තිබුණේ නැහැ.

හැබැයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ වසරේදී අලුත් පාඨමාලාවලට බඳවා ගැනීම් ආරම්භ කරන්න දැන් කටයුතු සූදානම් කරලා තිබෙනවා. ඒ අනුව පුවත් පත් දැන්වීම් පළ කරලා, සුදුසුකම් පරීක්ෂා කරලා, කණ්ඩායම් බඳවා ගැනීම් සඳහා වූ ආරම්භක පියවර මේ වසරට අදාළව තබා තිබෙනවා. ගරු කථානායකතුමනි, පාඨමාලා සඳහා කණ්ඩායම් බඳවා ගැනීම ප්‍රමාද වුණත්, මේ ආයතනය මේ ක්ෂේත්‍රයට විශාල සේවාවක් කරනවා. ඒ වාගේම මේ ආයතනය විසින් විවිධ වූ පාඨමාලා පවත්වනු

[ගරු අරවින්ද සෙනරත් මහතා]

ලබනවා. ඒ නිසා මේ ආයතනයේ කාර්යභාරය මෙතෙක් කාලයකට අඩු වෙලා හරි ඒ පිළිබඳ අවධානය යොමු නොවීමක් හරි සිදුවෙලා නැහැ. නමුත් ඉංජිනේරු සහකාරවරුන් බඳවා ගැනීම තමයි ප්‍රමාද වෙලා තිබෙන්නේ. අනෙකුත් පාඨමාලා, විශේෂයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව තුළ දැනට සේවය කරන නිලධාරීන්ගේ අවශ්‍යතාවන් සඳහා වූ පුහුණු වැඩසටහන්, ඒ වාගේම ගොවි පුහුණු වැඩසටහන් මේ ආයතනය තුළ මේ වනකොටත් පවත්වාගෙන යනවා.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා විධියට මා දන්නවා, ප්‍රායෝගිකව ගත්තාම මේ ආයතනයේ විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙන බව. මෙය, අක්කර 16ක විතර ඉඩමක් තිබෙන, ඒ වාගේම ගොඩනැඟිලි 36ක් විතර තිබෙන, දැනටත් නඩත්තු කටයුතු සඳහා කාර්ය මණ්ඩලය 31ක් සිටින, ඒ වාගේම විශාල පරිගණක ඒකකයක් තිබෙන ආයතනයක්. ඒ වාගේම සිසුන් විශාල සංඛ්‍යාවක් සඳහා නේවාසික පහසුකම් සහ දේශන පහසුකම් ලබා දෙන්න පුළුවන් ශාලා පහසුකම් පවා මෙහි තිබෙනවා. හැබැයි ආයතනය ඇතුළට ගියාම පෙනෙනවා, මාසයකට දවසක් දෙකක් තමයි මෙතැන වාරිමාර්ග ක්ෂේත්‍රයට අදාළ වැඩසටහන් පවතින්නේ කියන එක. හැබැයි අපේ ප්‍රදේශ ගත්තාම, දරුවන්ගේ උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන් විශාල ගැටලු ගණනාවක් තිබෙනවා. ඒවාට අදාළ ආයතන සංවර්ධනය වෙලා නැහැ. ඉතින් මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ පාඨමාලාවලට අමතරව, මෙම ආයතනය ඇතුළේ අපේ ප්‍රදේශයේ දරුවන්ගේ තාක්ෂණික හැකියාවන් හා අනෙකුත් උසස් අධ්‍යාපන හැකියාවන් දියුණු කරන්නට අදාළ වන වෙනත් පාඨමාලා ආරම්භ කරන්න පුළුවන්ද, එහෙම නැත්නම් මෙම ආයතනයේ උපරිම කාර්යක්ෂමතාව ක්‍රියාවට නංවන්න සමත් ආකාරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනත් ආයතනයක් බවට මේ ආයතනය පරිවර්තනය කරන්න පුළුවන්ද කියන එක.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය ගත්තොත්, එය ආයතනය සහ පවතින නීති රාමුව යටතේ සාකච්ඡා කරලා ගත යුතු කීන්දුවක් වනවා. මෙම ආයතනය විශාල භූමියක පිහිටි, විශාල සම්පත් ප්‍රමාණයක් තිබෙන ආයතනයක්. ඒක පැහැදිලිවම අපි හඳුනාගෙන තිබෙනවා. ඉදිරියේදී අපි සැලසුම් සහගත මෙන්ම විධිමත් ව්‍යාපෘති සහ වැඩසටහන් හරහා මේ තුළින් උපරිම ඵලදායීතාවක් ලබා ගන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම ගරු මන්ත්‍රීතුමා කරපු ඉල්ලීම අනුව, ඒ ප්‍රදේශයේ ඉගෙනුම ලබන දරුවන්ට මේ සම්පත් පරිහරණය කරන්න, ඒ සම්පත්වලින් යම් ප්‍රයෝජනයක් ගන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන්ද කියන එකට අදාළව ගත්තොත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විධියට ඒ සඳහා තිබෙන නීති රීති පිළිබඳව අධ්‍යයනය කරලා, කර ගන්න පුළුවන් වෙනස්කමක් තිබෙනවා නම් එයත් සිදු කරලා, ගරු මන්ත්‍රීතුමා කරපු යෝජනාව අනුව ඒ සඳහා වැඩ පිළිවෙළක් සැදීමට අපි බලාපොරොත්තු වනවා. අපි ඒ පිළිබඳව සොයා බැලීමක් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

මඩකලපුව, කලුවාන්චිකුඩි සහ පාලෙයඩිවට්ටෙයි තැපැල් කාර්යාල: විස්තර
மட்டக்களப்பு, களுவாஞ்சிக்குடி மற்றும் பாலையடிவட்டை தபால் அலுவலகங்கள்: விபரம்
POST OFFICES IN KALUWANCHIKUDI AND PALAYADIVATTAI, BATTICALOA: DETAILS

363/2024

2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ දකුණ, එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාන්කාඩු ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් නොමැති බැවින් ප්‍රදේශයේ ජනතාව කිලෝමීටරයක් පමණ ඇතින් පිහිටි සෙට්ටිපාලයම් තැපැල් කාර්යාලයට යන බව දන්නේද;

(ii) එසේ නම්, මාන්කාඩු ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් පිහිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) පෞද්ගලික ගොඩනැඟිල්ලක පිහිටුවා ඇති කලුවාන්චිකුඩි තැපැල් කාර්යාලයේ ප්‍රමාණවත් පහසුකම් නොමැති බව දන්නේද;

(ii) තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිල්ල මේ වන විට භාවිතයට ගත නොහැකි තත්ත්වයක පවතින බවත් දන්නේද;

(iii) එසේ නම්, ඉහත ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කර තැපැල් දෙපාර්තමේන්තුවට භාර දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) පෝරතීවුපත්තු, වෙල්ලාවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාලෙයඩිවට්ටෙයි ගම්මානයේ තැපැල් කාර්යාලය පිහිටුවා ඇති ඉඩමෙන් කොටසක් හමුදා පාලනය යටතේ තවදුරටත් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, ඉහත ඉඩම හමුදා පාලනයෙන් නිදහස් කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

සුකාදාරම් மற்றும் වෙකුසන ඌටක අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்தின், மண்முனை தெற்கு, எருவில்பற்று பிரதேச செயலாளர் பிரிவின் மாங்காடு பிரதேசத்தில் தபால் அலுவலகமொன்று இல்லாதிருப்பதனால், குறித்த பிரதேச மக்கள் சுமார் ஒரு கிலோமீற்றர் தொலைவில் அமைந்துள்ள செட்டிபாளையம் தபால் அலுவலகத்துக்குச் செல்வதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மாங்காடு பிரதேசத்தில் தபால் அலுவலகமொன்றை அமைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) தனியார் கட்டிடத்தில் அமைந்துள்ள களுவாஞ்சிக்குடி தபால் அலுவலகத்தில் போதிய வசதிகள் இல்லை என்பதை அறிவாரா;

(ii) தபால் திணைக்களத்துக்குச் சொந்தமான கட்டிடம் இன்றளவில் பயன்படுத்த முடியாத நிலையில் காணப்படுவதை அறிவாரா;

(iii) ஆமெனில், மேற்படி கட்டிடத்தைப் புனரமைத்து தபால் திணைக்களத்துக்கு ஒப்படைப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) (i) போரதீவுப்பற்று, வெல்லாவெளி பிரதேச செயலாளர் பிரிவிலுள்ள, பாலையடிவட்டை கிராமத்திலுள்ள தபால் அலுவலகம் அமைந்துள்ள காணியின் ஒரு பகுதி இதுவரை இராணுவத்திடம் உள்ளதை அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி காணியை இராணுவத்திடமிருந்து விடுவிப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா;

என்பதை மேலும் அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) whether he is aware that there is no post office in the Mankadu area of the Eruvilpattu Divisional Secretary's Division, Manmunai South in Batticaloa District, and therefore, the people of the area go to the Settipalayam Post Office, which is located about one kilometre away; and

(ii) if so, the steps that will be taken to establish a post office in the Mankadu area?

(b) Will he also state -

(i) whether he is aware that the Kaluwanchikudi Post Office, which is located in a private building, does not have adequate facilities;

(ii) whether he is aware that the building belonging to the Postal Department is currently in an unusable condition; and

(iii) if so, whether steps will be taken to renovate the above building and hand it over to the Postal Department?

(c) Will he further state -

(i) whether he is aware that a part of the land on which the post office is located in Palayadivattai village in Vellavelli Divisional Secretary's Division, Poratiu Pattu is still under military control; and

(ii) if so, whether steps will be taken to free the said land from military control?

(d) If not, why

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) මාන්කාඩු ප්‍රදේශයේ කිලෝමීටරයක දුරින් තැපැල් කාර්යාල දෙකක් ක්‍රියාත්මක වන බැවින් එම ප්‍රදේශයට තැපැල් කාර්යාලයක් පිහිටුවීමට පියවර ගෙන නැත.

(ආ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) පවතින ගොඩනැඟිල්ල ඉතා අබලන් ගොඩනැඟිල්ලක් වන අතර, එය අලුත්වැඩියා කළ නොහැකිය. එබැවින් තැපැල් කාර්යාලය සඳහා රුපියල් මිලියන 29.5ක ඇස්තමේන්තුගත වටිනාකමකින් යුතුව අලුතින් ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට 2025 සැප්තැම්බර් මස 18වන දින මුල්ගල තබා ඇත.

(ඇ) (i) තවදුරටත් ශ්‍රී ලංකා හමුදාව භාරයේ නොමැත. එම ඉඩම් කොටස 2026 වර්ෂයේදී හමුදාව විසින් නැවත භාර දීමට කටයුතු කර ඇත.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

කල්මුනේ මහ නගර සභාව: වාහන, යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික උපකරණ හිඟය

கல்முனை மாநகர சபை: வாகனங்கள், இயந்திர உபகரணங்கள் மற்றும் தொழில்நுட்ப சாதனங்களின் பற்றாக்குறை

KALMUNAI MUNICIPAL COUNCIL: SHORTAGE OF VEHICLES, MACHINERY AND EQUIPMENT

1886/2026

4. ගරු ධර්මප්‍රිය වීජේසිංහ මහතා (ගරු අබූබකර් අතම්බාවා මහතා වෙනුවට)
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Aboobucker Athambawa)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කල්මුනේ මහ නගර සභාව වර්තමානයේ මෙහෙයුම් ගැටලුවලට මුහුණ දී ඇති බවත්;

(ii) අත්‍යවශ්‍ය යන්ත්‍රෝපකරණ, වාහන සහ තාක්ෂණික මෙවලම් හිඟය එම ගැටලු සඳහා හේතු වී ඇති බවත්;

[ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා]

(iii) එම අඩුපාඩුකම් හේතුවෙන් සන අපද්‍රව්‍ය කළමනාකරණය, මාර්ග නඩත්තු කිරීම්, ජලාපවහන කටයුතු සහ පොදු සෞඛ්‍ය සේවා ඇතුළු මහජන සේවා අඩාළ වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත මහ නගර සභාවේ යන්ත්‍රෝපකරණ හා ධාරිතා අවශ්‍යතා හඳුනාගැනීම සඳහා නිල ඇස්තමේන්තුවක් සකස් කර තිබේද;

(ii) එසේනම්, එම ඇස්තමේන්තුව මඟින් හඳුනාගෙන ඇති අවශ්‍යතා කවරේද;

(iii) අවශ්‍ය සම්පත් ලබා දීම සඳහා සකස් කර ඇති කාලරාමුව කවරේද;

(iv) විධිමත් හා ස්ථිර සේවාවක් ලබා දීම තහවුරු කිරීම සඳහා මහ නගර සභාවට අවශ්‍ය වාහන හා යන්ත්‍රෝපකරණ ලබා දීමට කඩිනම් හෝ දීර්ඝ කාලීන සැලසුම් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

පොදු නිරුවාහ, මාකාණ සපෙකල් මත්‍රුම් උල්ලූරාට්චි අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) கல்முனை மாநகர சபை தற்போது செயல்பாட்டுப் பிரச்சினைகளுக்கு முகங்கொடுத்துள்ளது என்பதையும்;

(ii) அத்தியாவசியமான இயந்திர உபகரணங்கள், வாகனங்கள் மற்றும் தொழில்நுட்ப சாதனங்களின் பற்றாக்குறையானது மேற்படி பிரச்சினைகளுக்குக் காரணமாக அமைந்துள்ளது என்பதையும்;

(iii) மேற்படி குறைபாடுகள் காரணமாக திண்ம கழிவுப்பொருள் முகாமைத்துவம், வீதிப் பராமரிப்பு, வடிகாலமைப்பு நடவடிக்கைகள் மற்றும் பொதுச் சுகாதார சேவைகள் அடங்கலான பொதுச் சேவைகள் சீர்குலைந்துள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மாநகர சபையின் இயந்திர உபகரணங்கள் மற்றும் கொள்திறன் தேவைகளை அடையாளம் காண்பதற்கு உத்தியோகபூர்வ மதிப்பீடொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி மதிப்பீடுமூலம் அடையாளம் காணப்பட்டுள்ள தேவைப்பாடுகள் யாவை என்பதையும்;

(iii) தேவைப்படும் வளங்களின் வழங்கலுக்காக வகுத்தமைக்கப்பட்டுள்ள காலச்சட்டகம் யாது என்பதையும்;

(iv) முறைசார்ந்த மற்றும் நிரந்தரமான சேவையொன்றின் வழங்கலை உறுதிப்படுத்துவதற்காக மாநகர சபைக்குத் தேவைப்படும் வாகனங்களையும் இயந்திர உபகரணங்களையும் வழங்குவதற்குத் துரித அல்லது நீண்டகாலத் திட்டங்கள் வகுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Is he aware that the -

(i) Kalmunai Municipal Council is facing operational problems at present;

(ii) shortage of essential machinery, vehicles and technical equipment has led to the said problems; and

(iii) public services including solid waste management, road maintenance, drainage works and public health services have been hampered due to the said shortages?

(b) Will he inform this House -

(i) whether an official estimate has been prepared to identify the machinery and capacity requirements of the aforementioned Municipal Council;

(ii) if so, the requirements that have been identified in the said estimate;

(iii) the time frame that has been prepared for providing the necessary resources; and

(iv) whether expeditious or long-term plans have been prepared to provide the necessary vehicles and machinery to the Municipal Council to ensure the delivery of a proper and consistent service?

(c) If not, why?

ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i), (ii),(iii) ඔව්.

(ආ) (i) නැත.

වාහන අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

(ii) හඳුනාගෙන ඇති අවශ්‍යතා ලැයිස්තුව ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

Annex

Approval of the Department of National Budget for Procurement of Vehicle
Name of the Ministry/Department/Public Institution : Municipal Council Kalmunai

SN	Vehicle Type	No. of Vehicle	Purpose of Purchasing	Remarks
1	Tractor only	2	Replacement of existing (For collecting solid waste in MC area)	
2	Tractor with trailer for garbage collection	5	Replacement of existing (For collecting solid waste in MC area)	
3	Tractor with trailer for carrying construction material	2	Non-availability of suitable new vehicle	
4	Only trailer for garbage collection	5	Replacement of existing (For collecting solid waste in MC area)	
5	Only trailer for carrying construction material			
6	Gully trailer (Specify required capacity in l)			
7	Water bowser trailer (Specify required capacity in l)			
8	Backhoe loader	1	Collecting solid waste and drainage cleaning in MC area	
9	Motor Grader			
10	Compaction rammer (Please specify required impact force in KN)			
11	Plate compactor (Please specify required impact force in KN)	1	Compacting for playground and road walkway	23610 lbs12KN
12	Walk behind vibratory roller-single drum (Please specify required centrifugal force in KN)	1	Compacting for playground and road walkway	1 Ton
13	Walk behind vibratory roller - double drum (Please specify required centrifugal force in KN)			
14	Gully bowser truck (Please specify required capacity in l)	1	Non-availability of suitable new vehicle in use for gully waste management	6000 L
15	Water bowser truck (Please specify required capacity in l)	1	Non-availability of suitable new vehicle in use for water supply	6000 L
16	Tipper (Please specify required carrying capacity in ton)			
17	Dump truck (Please specify required capacity in ton)			
18	Hand tractor			
19	Crusher (Please specify type of crusher and required capacity in tons/hour)			
20	Garbage compactor truck (Please specify required capacity in m^3)	2	Non-availability of suitable new vehicle in solid waste management	Capacity 6+1m^3 Loading capacity m^3
21	Sky lift truck (Please specify required working height in m)	1	For street lamp repair and maintenance	13 metres
22	Crawler excavator (Please specify operating weight in tons)			13.865-16.1 Ton
23	Wheel excavator (Please specify operating weight in tons)	1	For drainage cleaning in MC area	13.865-16.1 ton
24	Wheeled model skid steer loader (Please specify operating weight in tons)			
25	Vibrating road roller (Please specify operating weight in tons)	1	For MC road renovation work	5 ton (Operating weight 6.1 ton)
26	Road sweeper (Please specify operating weight in tons)			
27	Fire and rescue vehicle	1	For disaster and fire unit management	Volume 3000L curb weight 5900
28	Chopper machine (Please specify type and cutting capacity)			
29	Paddy harvester			
30	Dozer (Please specify operating weight in tons)			
31	Wheel loader (Please specify operating weight in tons)			
32	Motor bicycle			
33	Double cab vehicle	2	Non-availability of suitable vehicle for field inspection (Assign and pool)	
34	Single cab vehicle			
35	Crew cab vehicle			
36	Three wheeler	1	Use for MC work	
37	Generator (Please specify required power in KW)			
38	Portable air compressor (Please specify max. pressure and tank capacity)	1	Use for MC vehicle	116 psi, 40L
39	Levelling instrument, tripod and levelling stuff			

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(iii) ප්‍රමාණවත් ප්‍රතිපාදන කල්මුනේ මහ නගර සභාව සතුව නොමැති බැවින්, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ මුදල් අමාත්‍යාංශය මඟින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා වූ ඉල්ලීම් පිළිවෙළින් නැඟෙනහිර පළාත් සභාව සහ මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(iv) කල්මුනේ මහ නගර සභාවට, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් නැඟෙනහිර පළාත් සභාව විසින් 2025 වසරේදී සන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 2.5ක මුදල සමඟ කල්මුනේ මහ නගර සභා අරමුදලින් රුපියල් මිලියනයක් යොදාගෙන ට්‍රැක්ටර් රථයක් මිලදී ගෙන ඇති අතරම 2026 වර්ෂයේදී සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් වෙන් කරන ලද රුපියල් මිලියන 4ට රුපියල් මිලියන 3.5ක නගර සභා අරමුදල් යොදවා ට්‍රැක්ටර් රථ දෙකක් මිලදී ගෙන ඇත.

එසේම මුදල් අමාත්‍යාංශය මඟින් අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/GPS/13/03/2025 හා 2025.09.13 දිනැති ලිපිය මඟින් පළාත් පාලන ආයතනවල ට්‍රැක්ටර්, ගලිබවුසර්, බැකෝ යන්ත්‍ර, ත්‍රී වීලර්, ටිපර් රථ හා මෝටර් ග්‍රේඩර් ආදී වාහන අවශ්‍යතා කැඳවා තිබූ අතර, ඒ අනුව කල්මුනේ මහ නගර සභාවේ එම වාහන අවශ්‍යතාව ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

සාර්ව ආර්ථික හා ක්ෂුද්‍ර ආර්ථික කළමනාකරණය සඳහා රජයේ උපායමාර්ගික ප්‍රවේශය
பேரியல் பொருளாதாரம் மற்றும் நுண் பொருளாதார முகாமைத்துவ அணுகலுக்கான அரசாங்கத்தின் மூலோபாயம்
GOVERNMENT'S STRATEGIC APPROACH TO MACROECONOMIC AND MICROECONOMIC MANAGEMENT

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

රට මුහුණ දී සිටින වර්තමාන ආර්ථික තත්ත්වය, රුපියලේ අගය අඩුවීම, ජීවන වියදම ඉහළ යෑම, ආදායම් අසමානතා වර්ධනය සහ ජනතාවගේ ජීවන මට්ටමට එල්ල වී ඇති දැඩි පීඩනය යන කරුණු සැලකිල්ලට ගනිමින්, සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් රජයේ ක්‍රමෝපායික ප්‍රවේශය පිළිබඳව මම පහත ප්‍රශ්න ඉදිරිපත් කරමි.

ඇත්තවශයෙන්ම අපට අවශ්‍ය වනවා, සාර්ව ආර්ථික කළමනාකරණයක්. Macroeconomic management පිළිබඳව ගන්නා පියවර අපට වෙන් වෙන් වශයෙන් දැනගන්න අවශ්‍යයි. සාර්ව ආර්ථික කළමනාකරණය සේම ක්ෂුද්‍ර ආර්ථික කළමණාකරණය - microeconomic management - පිළිබඳව ගන්නා ක්‍රමෝපායික කළමනාකරණ සැලසුම් මොනවාද කියන එක අපට දැනගන්න අවශ්‍යයි.

1. දිගින් දිගටම රුපියල අවප්‍රමාණයවීමට හේතු කවරේද? ඒ පිළිබඳව රජයේ මතය සහ ප්‍රතිපත්ති කවරේද? එම තත්ත්වය පාලනය කිරීම, විදේශ විනිමය ස්ථාවර කිරීම සහ රුපියලේ ස්ථාවරභාවය තහවුරු කිරීම සඳහා රජය ගන්නා කෙටි කාලීන, මධ්‍ය කාලීන, ඒ වාගේම දීර්ඝ කාලීන පියවර කවරේද?

   ඒ වාගේම සාර්ව ආර්ථිකය සහ ක්ෂුද්‍ර ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කිරීම සඳහා රජය විශ්වාස කරන අභියෝග මොනවාද?

   විශේෂයෙන්ම මේ අවස්ථාවේදී ඒවා පිළිබඳව විග්‍රහයකුත් අපට අවශ්‍යයි, ඒ වාගේම අපේක්ෂිත විසඳුම් මොනවාද කියන එකත් අපට අවශ්‍යයි.

2. පවතින ආර්ථික තත්ත්වය තුළ රටේ අතිමහත් බහුතරයක් පීඩනයට පත් වී සිටින බව පිළිගන්නේද? එසේනම්, එම පීඩනය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කවරේද?

3. රටේ බහුතර ජනතාව, විශේෂයෙන්ම මධ්‍යම හා අඩු ආදායම්ලාභී පවුල් - ඒ කියන්නේ, මැද පන්තිය ඇතුළුව - ණයබරතාවෙන් සහ මූල්‍ය පීඩනයෙන් ණය මර උගුලකට ඇත්තවශයෙන්ම ලක් වී සිටිනවා. ඔවුන් එසේ ලක්ව සිටින බව රජය පිළිගන්නේද? ණයබරතාවෙන් මේ රටේ ජනතාව පෙළෙනවා කියන එක පිළිගන්නවා නම්, ඒ අධික ණය පීඩනය අවම කිරීම සඳහා වූ රජයේ වැඩ පිළිවෙළ කවරේද?

   විශේෂයෙන්ම අපි දැනගන්නට ඕනෑ, කෘෂිකාර්මික ක්ෂේත්‍රය, සේවා ක්ෂේත්‍රය සහ කර්මාන්ත ක්ෂේත්‍රය හරහා දළ දේශීය නිෂ්පාදිතයට ලබා දෙන දායකත්වය ප්‍රවර්ධනය කරන්නට රජය ගන්නා පියවර මොනවාද කියලා. ජනතාව මේ වැටී තිබෙන ණය මර උගුලෙන් මුදා ගන්නට රජය ගන්නා පියවර මොනවාද?

4. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දරිද්‍රතා රේඛාව පිළිබඳව ඉදිරිපත් කළ අගයන් දිස්ත්‍රික්ක වශයෙන් වෙන් වෙන්ව කවරේද? වර්තමාන වෙළෙඳ පොළ මිල ගණන්, ජීවන වියදම් හා පවුල් ආදායම් සැලකිල්ලට ගත් විට එම අගයන් යථාර්ථවාදීද? ඒ වාගේම ඒවා ප්‍රායෝගික මිනුම් දර්ශක ලෙස රජය පිළිගන්නේද?

   විශේෂයෙන්ම රටේ ජනතාව මුහුණ දෙන අතිශය දුෂ්කර පීඩනකාරී, අසහනකාරී තත්ත්වයට රජය ගන්නා පියවර පිළිබඳව පැහැදිලි ඉදිරිපත් කිරීමක් කරන්න කියලා මම ගරු අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මහතා ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. දිගින් දිගටම රුපියල අවප්‍රමාණය වීමට බලපෑ හේතු කිහිපයක් තිබෙනවා. ඒවා මෙසේයි.

   - 2026 වසර තුළ ශ්‍රී ලංකා රුපියල විදේශීය අංශයේ නැඟී එන පීඩනයන් සහ ඉහළ ගිය ගෝලීය අවිනිශ්චිතතා මධ්‍යයේ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්

වර්ගවලට සාපේක්ෂව ඉහළ අවප්‍රමාණය වීමේ පීඩනයක් නිර්මාණය වෙලා තිබෙනවා. 2026 වසර ආරම්භයේ සිට අඛණ්ඩව මාස දෙකක් තුළදී මාසිකව අතිප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, විශේෂයෙන් මැද පෙරදිග ගැටුම් ආරම්භ වීමෙන් පසුව විදේශීය අංශයේ නැඟී එන පීඩනයන් සහ ගෝලීය අවිනිශ්චිතතාව වැඩි වීම හේතු කොට ගනිමින් යම් අවප්‍රමාණය වීමේ පීඩනයකට දැන් මුහුණ දෙමින් තිබෙනවා. ඒ අනුව, 2026 වසරේ මැයි මාසයේ 18වන දින දක්වා වූ කාල පරිච්ඡේදයේදී ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 4.8කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා. නමුත්, මේ කලාපයේ අනෙක් රටවල ඊට වඩා වැඩි ප්‍රමාණයකින් එම රටවල මුදල් ඒකක අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඒකටත් බලපෑ හේතුවක් තිබෙනවා. මේ යුද තත්ත්වය ඇතුළේ ඩොලරය අත්පත් කර ගත් තත්ත්වයේදී අනෙකුත් විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව ඩොලරය අධිප්‍රමාණය වෙලා තිබෙනවා. ඒ නිසා තමයි කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂවත් අපේ සියයට 4.8ක අවප්‍රමාණයක් තිබෙන්නේ.

- ගෝලීය අවිනිශ්චිතතාව ඉහළ යෑම සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳ පොළවල අවදානම් නොගැනීමේ ප්‍රවණතාව ඉහළ යෑම මධ්‍යයේ ආයෝජකයින් ආරක්ෂිත වත්කම් වෙත යොමු වූ අතර, මැද පෙරදිග කලාපයේ උත්සන්න වෙමින් පැවති භූ දේශපාලනික ආතතීන් සහ යුද ගැටුම් හේතුවෙන් 2026 වසරේදී බොහෝ ප්‍රධාන මුදල් ඒකකවලට සාපේක්ෂව ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වෙලා තිබෙනවා. ඒ වාගේම ගෝලීය වශයෙන් අපි දන්නවා, තෙල් මිල ඉහළ යෑම, ගෝලීය ආර්ථික වර්ධනය පිළිබඳව ඇති වුණු අවිනිශ්චිතතාව සහ ඊට සාපේක්ෂව වඩා ආරක්ෂිත වූ ඩොලර්වලින් නාමනය කරන ලද වත්කම් වෙත නැඟී එන වෙළෙඳ පොළවල් - emerging markets - වෙතින් වූ ප්‍රාග්ධන ගෙවීම් නිසා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරය තවදුරටත් ශක්තිමත් වෙලා තිබෙන බව. මෙවැනි වාතාවරණයකදී භූ දේශපාලනික අවිනිශ්චිතතාව ඉහළ ගිය කාල පරිච්ඡේදය තුළ කලාපයේ අනෙක් රටවල මුදල් ඒකකවලට සාපේක්ෂව අපේ මුදල් ඒකකය අවප්‍රමාණය වීම සාපේක්ෂව අඩුයි.

- මැද පෙරදිග යුද ගැටුම් උත්සන්න වීම තුළින් ගෝලීය බොරතෙල් මිල සැලකිය යුතු ලෙස ඉහළ යෑම ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ඉන්ධන සහ ගෑස් ආනයන පිරිවැය ඉහළ යෑමට හේතු වූ අතර, එමඟින් ශ්‍රී ලංකා රුපියල මත අවප්‍රමාණය වීමේ පීඩනය වැඩි වෙලා තිබෙනවා. මැද පෙරදිග යුද ගැටුම් උත්සන්න වීමෙන් පසු මූලිකවම, ප්‍රධාන මගී හුවමාරු මාර්ග ලෙස ක්‍රියා කරනු ලබන මැද පෙරදිග ගුවන් සේවා මධ්‍යස්ථානවලට ඇති වූ බාධා හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක අංශය සැලකිය යුතු පසුබෑමකට ලක් වෙලා තිබෙනවා. වෙළෙඳ පොළ සහභාගිවන්නන් අතර තවදුරටත් පවතින අහිතකර සමපේක්ෂණ ද විදේශ විනිමය වෙළෙඳ පොළ මත පීඩනයන් ඇති කිරීමට හේතු වෙලා තිබෙනවා. රුපියල අවප්‍රමාණය වනු ඇතැයි අපේක්ෂාවෙන් අපනයනකරුවන් අපනයන ආදායම පරිවර්තනය කිරීමේදීත් යම් ප්‍රමාද තිබෙන අතර, අපේක්ෂිත අවප්‍රමාණයට සාපේක්ෂව ආරක්ෂා වීම සඳහා ආනයනකරුවන් ආනයන ඇණවුම් සහ විදේශ විනිමය මිලදී ගැනීම් වැඩි කර ගැනීමේ ප්‍රවණතාවක් ද තිබෙනවා. තවද, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳ පොළෙන් මෙන්ම කොළඹ කොටස් වෙළෙඳ පොළ වෙතින්ද යම් ගෙවීමක් සිදු වෙමින් තිබෙනවා.

ඒ වාගේම සමප්‍රේක්ෂණ චිත්තතාවත්, සමාජය තුළ ඇති වන අවිනිශ්චිතතාව සැබෑ තොරතුරු ඇතිව තව වැඩි වෙයි කියන තත්ත්වය තුළත් වෙළෙඳ පොළෙහි මේ පීඩනය ඇති වෙලා තිබෙනවා. අවසානයේදී මේ ඉල්ලුම සැපයුමට වඩා වැඩිවීමත් මෙතැනට බලපා තිබෙනවා.

ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කිහිපයක් තිබෙනවා. ඒවා මෙසේයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාවර විනිමය අනුපාතිකයක් දැනට ඉලක්ක කරගෙන නැහැ. ශ්‍රී ලංකා මහ බැංකුව පනතට අනුකූලව, දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළෙහි ඉල්ලුම සහ සැපයුම යන වෙළෙඳ පොළ බලවේග මඟින් විනිමය අනුපාතිකය තීරණය කරන නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් දැනට අනුගමනය කරනවා. මෙම නම්‍යශීලිභාවය බාහිර කම්පනවලට ඔරොත්තු දීම සහ විදේශ අංශයේ ස්ථාවරත්වයට සහාය වීමට උපකාරී වනවා.

- ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම අනිවාර්යයෙන්ම ආර්ථිකයට අහිතකර ලෙස බලපාන්නේ නැති බව සැලකිල්ලට ගත යුතුයි.

  මොකද, එය ඉහළ පහළ යාමේ වාසි අවාසි දෙපැත්තෙන්ම තිබෙනවා. වඩාත්ම වැදගත් වෙන්නේ යම්කිසි තත්ත්වයකදී අසාමාන්‍ය ලෙස හෝ පුරෝකථනය කර ගන්න බැරි ලෙස හෝ පාලනය කර ගන්න බැරිව අසාමාන්‍ය ඉහළ පහළ යාමක්. අපි volatility කියලා කියනවා, ඒ විචලතාවන් ඇති වනවා නම්. නමුත්, එවැනි විචලතාවක් නොවෙයි දැන් ඇති වෙලා තිබෙන්නේ.

  ශ්‍රී ලංකා රුපියලේ විචලනයන් ආර්ථිකයේ විවිධ කොටස්කරුවන්ට විවිධාකාරයෙන් බලපෑම් ඇති කරනවා. ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම අනෙක් පැත්තෙන් ආනයනකරුවන්ට අහිතකර ලෙස බලපෑ හැකි වුවද, අපනයනකරුවන්ට, සංචාරක සේවා සපයන්නන්ට, විදේශ විනිමය උපයන්නන්ට සහ ඒ ප්‍රේෂණ එවන අයට - විදේශ ප්‍රේෂණ ලංකාවට එවන කුටුම්භවලට - හිතකර විධියට බලපානවා.

- මැද පෙරදිග යුද තත්ත්වය ඉක්මනින් අවසන් වුවහොත් ඒ සමඟම විදේශ විනිමය අනුපාතික මත ඇති වන පීඩනය ලිහිල් වනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. ඒ වාගේම විනිමය අනුපාතික පීඩනය අඩු කරන ප්‍රධාන ලැබීම් කිහිපයක් ශ්‍රී ලංකා ආර්ථිකය අපේක්ෂා කරන බව අවධාරණය කරන්නට ඕනෑ. මැයි මස අවසානයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් යටතේ අපි වාරික දෙකක් අපේක්ෂා කරනවා, ඩොලර් මිලියන 700ක.

  ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවෙන් මේ වර්ෂය අවසාන වනකොට අපි ඩොලර් මිලියන 380ත්, 480ත් අතර ප්‍රමාණයක ඩොලර් ලැබීමක් අපේක්ෂා කරනවා. ඒ වාගේම ලෝක බැංකුවෙන් ජූනි මාසය වනකොට තවත් ඩොලර් මිලියන 150කුත්, ලෝක බැංකුව හා සම්බන්ධ වෙලා තිබෙන ආයතනයක් මඟින් තවත් ඩොලර් මිලියන 50කුත් ලැබෙනවා. ඒ අනුව, මේ වර්ෂය අවසාන වනකොට අපට ගෙවුම් ශේෂ තුලනය කළමනාකරණය කර ගැනීමේ හැකියාව තිබෙනවා.

  ඉදිරි කාලය තුළ අනෙකුත් බහුපාර්ශ්වීය ආයතනවලින් ද මේ මුදල් ලැබීම අපි අපේක්ෂා කරනවා.

- මැද පෙරදිග කලාපයේ දැනට පවතින යුද ගැටුම් මධ්‍යයේ ඉන්ධන පරිභෝජනය සීමා කිරීම සඳහා 2026 වර්ෂයේ මාර්තු මස මැද භාගයේ සිට ක්‍රියාත්මක වන පරිදි QR කේතය පාවිච්චි කරනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

එය තවදුරටත් අපි ඉදිරියටම පවත්වාගෙන යනවා, විශේෂයෙන්ම ඉන්ධන පරිභෝජනය හැකි තරම් දුරට කළමනාකරණය කර ගැනීම සහ අඩු කිරීමේ අදහසින්.

ඒ වාගේම මැයි 16වැනි දින සිට බලපවත්වන පරිදි පෞද්ගලික වාහන - ත්‍රී වීලර්, මෝටර් සයිකල් හැර අනෙකුත් පෞද්ගලික වාහන - ආනයනය සඳහා පමණක් දැනට සියයට 30ක්ව තිබෙන තීරු බද්දෙන් සියයට 50ක අධිභාරයක්, ඒ කියන්නේ අවසානයේ පෞද්ගලික වාහන ආනයනයට සියයට 15ක ගාස්තුවක් පනවා තිබෙනවා. මෙය වාණිජ වාහන ආනයනයට බලපාන්නේ නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
බස්වලට,-

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
බස්වලට, ලොරිවලට බලපාන්නේ නැහැ. එය බලපාන්නේ පෞද්ගලික වාහන සඳහා පමණයි. ඒත් එය පනවා තිබෙන්නේ මාස තුනක් සඳහායි. එම නිසා දැනට ගෙන්වා තිබෙන වාහනවලත්, මැයි 15වැනි දා දක්වා ණයවර ලිපි - LCs - විවෘත කරපු වාහනවලත් වෙළෙඳ පොළේ කිසිදු ආකාරයකින් මිල වැඩි වීමක් සිදු විය යුතු නැහැ. එවැනි වැඩි වීමක් කරන්න හදනවා නම් ඒක විකෘතියක්. ඒක වෙළෙඳ පොළ අවස්ථාවාදී හැසිරීමක් විධියටයි අපි දකින්නේ. මෙයින් අපි යෝජනා කරන්නේ පෞද්ගලික වාහන ආනයනය මාස තුනකට ප්‍රමාද කර ගැනීමයි.

2. මේ ඇති වුණු තත්ත්වයන් හරහා රටේ ජනතාව තුළ පොදුවේ පීඩනයක් ඇති වෙලා තිබෙන බව ඇත්ත. නමුත්, රටේ බහුතරයක් දරා ගන්න බැරි පීඩනයකට ලක් වුණා කියන කාරණය අපි පිළිගන්නේ නැහැ. කෙසේ වෙතත්, අපේ ආණ්ඩුව යටතේ මේ වෙනකොට යොදාගෙන තිබෙන සමාජ වියදම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අස්වැසුම වැඩසටහන ඇතුළු ඉලක්කගත වැඩසටහන් වාගේම 2025 අය වැයෙන් පාසල් දරුවන්ට පාසල් උපකරණ දීමේ යෝජනාවේ ඉඳලාම ඉලක්කගත වියදම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඊට අමතරව මැද පෙරදිග ඇති වූ තත්ත්වය සැලකිල්ලට භාජන කරමින් විවිධ වූ වැඩසටහන් යටතේ අතිරේකව රුපියල් බිලියන 100ක් වෙන් කර තිබෙනවා. මම එම වැඩසටහන්වල නම් පමණක් ඉදිරිපත් කරන්නම්. ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයකුත්, පෙට්‍රල් සඳහා රුපියල් 20ක සහනාධාරයකුත් වශයෙන් රුපියල් මිලියන 19,000ක - රුපියල් බිලියන 19ක - ගෙවීමක් සිද්ධ කරනවා. අස්වැසුම ප්‍රතිලාභීන්ටත්; විශේෂයෙන්ම පහළ ආදායම් උපයන කණ්ඩායම්වලට ලැබෙන ආදායමට අතිරේකව තවත් රුපියල් බිලියන 8,475ක් වෙන් වෙනවා.

සමස්ත විදුලි පාරිභෝගිකයන්ගෙන් සියයට 95ක් විතරම ඉන්නේ ඒකක 180ට අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන අයයි. එම නිසා සමස්ත විදුලි පාරිභෝගිකයන්ගෙන් සියයට 95කට මේ විදුලි බිල වැඩි වීම බලපාන්නේ නැහැ. අපි ඒ සහනය ලබා දීලා තිබෙනවා, ඒකක 180ට වඩා අඩුවෙන් විදුලිය පරිභෝජනය කරන අයට විදුලි බිල වැඩි නොවන විධියට.

ඒ වාගේම යල කන්නය සඳහා ගොවීන් වෙත සහන සැලසීමට තවත් රුපියල් බිලියන 2,650ක් වෙන් කරලා තිබෙනවා. කුඩා තේ වැවිලිකරුවන් සඳහා රුපියල් 2,500ක වෙන් කිරීමක් සිද්ධ කරලා තිබෙනවා. කාල වේලාව ගත වන නිසා මම විස්තර වශයෙන් ඒ ගැන කියන්නේ නැතුව කරුණු විධියටයි ඉදිරිපත් කරන්නේ. පොදුවේ පවතින ඒවාට අමතරව මේ මොහොතේදී නිශ්චිතව මේ හැම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විධියට අපි මැදිහත් වෙලා තිබෙනවා. ඒ අනුව ධීවර කර්මාන්තයේ යෙදෙන අයට රුපියල් බිලියන 4,121කුත් යනාදී වශයෙන් මුදල් වෙන් වෙලා තිබෙනවා. එතැනදී අපේ ඉලක්කය රුපියල් බිලියන 100ක්. මේ සියල්ලටම රුපියල් බිලියන 92ක් තමයි වැය වෙන්නේ. සංචාරක කර්මාන්තය සහ තවත් ඉලක්කගත ක්ෂේත්‍රවලට තව රුපියල් බිලියන 8ක ආධාර දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

3. රටේ බහුතර ජනතාව මූල්‍ය උගුලකට අහු වෙලා කියන කාරණය සම්බන්ධයෙන් සමාජයේ විවිධ කථා බහ තිබෙන බව අපි දන්නවා. ඒ නිසා මම ඒ ගැන පැහැදිලි කරන්නම්. ග්‍රාමීය දුප්පත්භාවය තුළ යම් ප්‍රමාණයකින් ණයවලට හිර වීමක් සිදුව තිබෙනවා. විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමේ අඩු ආදායම්ලාභී පවුල් සහ ක්ෂුද්‍ර ව්‍යාපාරවල නියැළෙන්නන් අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හරහා තම ව්‍යාපාර කටයුතු සහ පාරිභෝගික අවශ්‍යතා සඳහා ණය ගැනීම නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ අනුව අපි හඳුනාගෙන තිබෙනවා, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර නියාමනයට ලක් නොවීම නිසා අඩු ආදායම්ලාභියා, ක්ෂුද්‍ර ව්‍යාපාරවල නියැළෙන අයට ඇති වුණු ගැටලුව වාගේම විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන කාන්තාවන්ගේ අඩු මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන්. රටේ ලිඛිත සාක්ෂරතාව දැන් සියයට 97 දක්වා වැඩි වෙලා තිබුණත්, මූල්‍ය සාක්ෂරතාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. එතැනදී කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාව තවත් පහළ මට්ටමකයි තිබෙන්නේ. බැංකු හරහා ණය ලබා ගැනීමේදී පවතින දැඩි කොන්දේසි හා සුරැකුම් අවශ්‍යතා නිසාත්, ඒ ප්‍රායෝගික ගැටලු නිසාත් ඔවුන් මෙවැනි තැන්වලට හිර වෙලා තිබෙන්න පුළුවන්. නමුත්, අපි මේ තත්ත්වයන් අධ්‍යයනය කරලා, අවිධිමත් මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතන නියාමනය කිරීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරි පනත සම්මත කිරීම හා ඊට අදාළ ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වෙනකොටත් ආරම්භ කරලා තිබෙනවා. එහි නියාමන කටයුතු 2027 පළමු කාර්තුවේ සිට ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අවිධිමත් අංශයෙන් විධිමත් අංශයට අපි ගොස් තිබෙනවා. විශේෂයෙන් බැංකු පද්ධතියෙන් ණය ලබා ගැනීමේ කැපී පෙනෙන වර්ධනයක් 2025 වර්ෂයේදී සිද්ධ වෙලා තිබෙනවා. එය රුපියල් බිලියන 2,000කින් වැඩි වෙලා තිබෙනවා.

ඒ කියන්නේ බැංකු අංශයෙන් ණය ලබා ගැනීම. විධිමත් අංශයට ළඟා වීම ගත්තොත් එතැනත් යම් ප්‍රවණතාවක් තිබෙනවා. ඒ වාගේම, අඩු ආදායම්ලාභීන්ගේ ඉපැයීම් ශක්තිය - ක්‍රය ශක්තිය - ඉහළ නැංවීම සඳහා "අස්වැසුම" දීමනාව වැඩි කර තිබෙනවා.

ඒ වාගේම, මම කලිනුත් සඳහන් කළ පරිදි ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. දශක ගණනාවක් පුරාවට ලංකාවේ මූල්‍ය විනය නිසි පරිදි ස්ථාපිත කර ගැනීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ මෙම වාතාවරණය ක්ෂණිකව අවසන් කරගන්න බැරි වෙනවා. මේක ව්‍යුහාත්මකව ගැටගැහිලා තිබෙන්නේ. අපි මේක ඉදිරියේදී ක්‍රමිකව විසඳීමට බලාපොරොත්තු වෙනවා.

4. 2026 මාර්තු මාසය සඳහා ජාතික පාරිභෝගික මිල දර්ශකය - NCPI - මඟින් ලබාගත් නවතම මිල දර්ශකයන් උපයෝගි කර ගනිමින් යාවත්කාලීන කරන ලද දිස්ත්‍රික් නිල දරිද්‍රතා රේඛාවන් තිබෙනවා. ඒ list එක පහත දැක්වෙනවා.

දිස්ත්‍රික්කය	නිල දරිද්‍රතා රේඛාව (මාසික ඒක පුද්ගල වියදම රුපියල්)
ජාතික මට්ටම (National)	16,690
කොළඹ (Colombo)	18,000
ගම්පහ (Gampaha)	17,908
කළුතර (Kalutara)	17,520
මහනුවර (Kandy)	16,942
මාතලේ (Matale)	16,918
නුවරඑළිය (Nuwara Eliya)	17,551
ගාල්ල (Galle)	16,958
මාතර (Matara)	16,300
හම්බන්තොට (Hambantota)	16,216
යාපනය (Jaffna)	16,288
මන්නාරම (Mannar)	17,095
වව්නියාව (Vavuniya)	16,673
මුලතිව් (Mullaitivu)	16,573
කිලිනොච්චිය (Kilinochchi)	16,124
මඩකලපුව (Batticaloa)	16,781
අම්පාර (Ampara)	16,823
ත්‍රිකුණාමලය (Trincomalee)	16,262
කුරුණෑගල (Kurunegala)	16,395
පුත්තලම (Puttalam)	17,037
අනුරාධපුරය (Anuradhapura)	16,288
පොළොන්නරුව (Polonnaruwa)	16,331
බදුල්ල (Badulla)	16,814
මොනරාගල (Monaragala)	15,958
රත්නපුරය (Ratnapura)	16,764
කෑගල්ල (Kegalle)	17,451

ඒ අනුව මෙම දර්ශකයන්හි භාවිත වන නිරපේක්ෂ දරිද්‍රතාව පිළිබඳ සංකල්පය අපි මෙන්න මේ ආකාරයට තමයි හඳුනා ගන්නේ.

"නිල දරිද්‍රතා රේඛාව මඟින් නිරූපණය වන්නේ පුද්ගලයෙකුට අවම මූලික පහසුකම් සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය වන අවම වියදමේ අගයයි. වඩාත්ම වැදගත් කරුණ වන්නේ, මෙම මූල්‍ය සීමාව මඟින් පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය කරන අවම පෝෂණ අවශ්‍යතාව වන කිලෝ කැලරි - Kcal - 2,030ක ප්‍රමාණය සපුරා ගැනීමට සහ ආහාර නොවන අනෙකුත් අත්‍යවශ්‍ය මූලික අවශ්‍යතා සපුරා ගැනීමට යන ඇස්තමේන්තු වියදමයි."

ඒ අනුව යම් පුද්ගලයෙකු ජීවත් වන කුටුම්බයක මාසික ඒක පුද්ගල වියදම ඉහත වගුවෙන් පෙන්නුම් කර තිබෙනවා. එම පුද්ගලයා පදිංචි දිස්ත්‍රික්කය අනුව දරිද්‍රතාවයේ අගය වඩා අඩු නම් එම පුද්ගලයා දුප්පත් පුද්ගලයෙකු ලෙස සලකනවා, මේ තිබෙන සීමාවලට යටත් නම්. ඒ තනි පුද්ගලයෙකුට. කුටුම්බයක් නම්, එය වැඩි කරලා ගන්න වෙනවා, කුටුම්බයේ ඉන්න සංඛ්‍යාවත් එක්ක. 2026 මාර්තු මාසය සඳහා හතරදෙනෙකුගෙන් යුත් පවුලකට මසකට අවම මූලික පහසුකම් සහිතව ජීවත් වීම සඳහා අවශ්‍ය වන අවම වියදම ඒ අනුව රු. 66,760ක් වෙනවා. දිස්ත්‍රික්ක සඳහා වෙන් වෙන් වශයෙන් සැලකිල්ලට ගැනීමේදී හතරදෙනෙකුගෙන් යුත් පවුලක් සඳහා මසකට අවම මූලික පහසුකම් සහිතව ජීවත් වීමේ අවම වියදම රුපියල් 63,832ක් - මොනරාගල දිස්ත්‍රික්කය සඳහා - ලෙසත්, උපරිමය රුපියල් 72,000ක් ලෙසත් - කොළඹ දිස්ත්‍රික්කය සඳහා - වාර්තා වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කරුණු පැහැදිලි කර ගැනීමට සඳහා ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණය අහන්න කැමැතියි. අවස්ථා ගණනාවකදී ජනාධිපතිවරයාත්, ඇමතිවරුන් විශාල ප්‍රමාණයකුත් ප්‍රකාශ කළා, ප්‍රාථමික ශේෂයේ ලොකු අතිරික්තයක් තිබෙනවා, රාජ්‍ය ආදායමේ වැඩි වීමක් තිබෙනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිහිල්ලා තිබෙනවා කියලා. ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමා අද ඉදිරිපත් කළා, විස්තීර්ණය පහසුකම් යටතේ ලෝක බැංකුවෙන්, ආසියානු සංවර්ධන බැංකුවෙන් විශාල මුදලක් ලැබෙනවාය කියන කාරණාව. මේ තත්ත්වය තුළ විශේෂයෙන්ම පැහැදිලි කර ගැනීමක් හැටියට කාරණයක් අහන්න තිබෙනවා. අපි දැක්කා, ජනාධිපතිවරයා කියනවා, තවත් වරක් තෙල් මිල ඉහළ දමන්නට සිදු වෙයි කියලා. විශේෂයෙන්ම භාණ්ඩාගාරයේ මුදල් පිරී ඉතිරී යන මොහොතක ඒ මුදල උපයෝගි කරගන්නේ නැත්තේ ඇයි, තෙල් මිල වැඩි කිරීම වළක්වන්නට; ඇත්තවශයෙන්ම මිල වැඩි කිරීමකට නොවෙයි, මිල අඩු කිරීමකට යොමු වන්නට? ඒ වාගේම තමයි විදුලි බිලත්.

ඊළඟට මම පැහැදිලි කරගන්න කැමැතියි, මෙන්න මේ කාරණය. ඔබතුමන්ලාම කිව්වා ජනතාවට ලක්ෂ 12කට Vitz car එකක් ගන්න අවස්ථාව සලසා දෙනවා කියලා. ඒ අනුව මම අහන්න කැමැතියි, අපේ රටේ ජනතාවගේ වාහනයක් අයිති කර ගැනීමේ සිහිනය, අඩුම ගණනේ ලක්ෂ 12කට Vitz car එකක්වත් ගැනීමේ ඒ සිහිනය සැබෑ කරවන්නේ කවදාද කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් අහන්න කැමැතියි. ඔබතුමාගේ උත්තරයෙන් බොහොම පැහැදිලි වෙනවා, ඔබතුමන්ලා රජයක් හැටියට ඉදිරිපත් කරපු මේ දත්ත මත පදනම්ව තමයි විසඳුම් සපයන්නේ කියන කාරණය. මම ඔබතුමාගෙන් අවංකවම මේ අහන්නේ. දැන් ඔබතුමා සංඛ්‍යාලේඛන ගණනාවක් ඉදිරිපත් කළා. ඔබතුමා ඉදිරිපත් කරපු සංඛ්‍යාලේඛනවලින් කියනවා, එක පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් මේ රට තුළ මාසයක් ජීවත් වෙන්න රුපියල් 16,690ක් ඇති කියලා. මේක ඇත්තටම ඔබතුමා පිළිගන්නවාද? රුපියල් 16,690කින් පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා පිළිගන්නවාද? කොළඹ දිස්ත්‍රික්කයේ පුද්ගලයෙකුට රුපියල් 18,000කින් දින 30ක් ජීවත් වෙන්න පුළුවන්ලු. ඊළඟට, ගම්පහ කෙනෙකුට රුපියල් 17,908ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ කෙනෙකුට රුපියල් 17,520ක් දින 30කට ඇතිලු. මේ ආදී වශයෙන් ගත්තාම, මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දරිද්‍රතා රේඛාව ගණනය කිරීම සම්පූර්ණයෙන්ම වැරදියි කියන කාරණයට. ඔබතුමාම කියනවා නම් එදිනෙදා ආහාර අවශ්‍යතාව සහ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරගෙන සාමාන්‍ය වශයෙන් රටක් හැටියට ගත්තොත්, එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න රුපියල් 16,690ක් ඇති කියලා, ඒක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ තොරතුරු, දත්ත විශ්ලේෂණය කිරීමේදී, ඒවා නිර්වචනය කිරීමේදී ඒක -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කරුණු ඉදිරිපත් කිරීම කෙටි කරන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේක බරපතළ කාරණාවක්, ගරු කථානායකතුමනි. මොකද, මේ බොරු දත්ත මත පදනම්ව තමයි මේ රාජ්‍ය ප්‍රතිපත්තිය නිර්මාණය වෙන්නේ. එක පුද්ගලයෙකුට රුපියල් 16,690කින් දින 30කට අවශ්‍ය ආහාර සහ ආහාර නොවන වියදම් ටික සම්පූර්ණ කරගන්න පුළුවන්ද? ඒ නිසා මම කාරුණිකව ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගෙන්වා, ඇත්තවශයෙන්ම මේ සංඛ්‍යාලේඛනවලට අනුව මේ රටේ පරිපාලන දිස්ත්‍රික්ක 25 තුළ ජීවත් වන ජනතාවට මේ වාගේ සොච්චම් මුදලකින් දින 30ක් ජීවත් වෙන්න පුළුවන්ද කියන කාරණය අහන්න කියලා. ඒ වාගේම කරුණාකර කියන්න, ලක්ෂ 12ට Vitz වාහනයක් අයිති කර ගැනීමේ සිහිනය සැබෑ කරගන්නට අපේ රටේ ජනතාවට අවස්ථාව ලැබෙන්නේ කවදාද කියන කාරණයත්.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ඒ මතු කළ කාරණා සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමා පළමුවෙන්ම ඇහුවා, ප්‍රාථමික ශේෂයේ විශාල අතිරික්තයක් තිබෙනවා; එමඟින් සහන දෙන්නේ නැත්තේ ඇයි කියලා. ඇත්තටම ප්‍රාථමික ශේෂය වශයෙන් අපිට ලැබෙන්නේ අපි ඉතුරු කරගන්නා, ඒ කියන්නේ ප්‍රාථමික වියදම් අවසාන වුණාට පසුව ඉතුරු වෙන රාජ්‍ය ආදායමයි. අපි ආණ්ඩුව භාර ගන්නකොට තිබුණු තත්ත්වය ගත්තාම, අපේ රට විශාල ආර්ථික අර්බුදයක් එක්කම ණය බරකින් හිර වෙලා තිබුණා. ඒ නිසා තමයි ණය තිරසර වැඩසටහනකට ගිහින් තිබුණේ. එහිදී බිලියන 2,500 ගණනක් පොලිය විධියට ගෙවන්න තිබෙනවා. මේ ප්‍රාථමික ශේෂය කියන්නේ ණය පොලී ගෙවීම් හැර. අපි ප්‍රාථමික ශේෂය ඉතුරු කර ගැනීමේ වාසිය තමයි ණය තිරසරභාවය දෙසට ගමන් කිරීමේ හැකියාව. එහෙම නොවුණා නම්, පොලී ගෙවීමට තව ණය ගන්න සිද්ධ වෙනවා. එහෙම වුණා නම් අපි මේ ණය උගුලේ හිර වෙනවා. නමුත් ප්‍රාථමික ශේෂය වැඩිවීම නිසා අපිට පුළුවන්කම ලැබුණා, ණය පොලී ගෙවා ණය ගන්නා ප්‍රමාණය අඩු කර ගන්න.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇති කර ගත් වැඩසටහනට අනුව 2032දී අපේ ඉලක්කය විධියට තිබුණේ අපේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට මධ්‍යම ආණ්ඩුවේ ණය සියයට 95 කියන මට්ටමේ පවත්වා ගැනීමයි. 2032 වසර වෙනකොට එසේ සියයට 95 මට්ටමේ පවත්වා ගත්තොත් හොඳයි. හැබැයි, මේ වෙනකොටම අපිට පුළුවන් වෙලා තිබෙනවා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 104ක තිබුණු ණය ප්‍රමාණය සියයට 96.8ට ගෙනෙන්න. ඒ අනුව අපි සැලසුම් කර තිබෙනවා, 2030 වෙනකොට ඒ ප්‍රමාණය සියයට 86 දක්වා ගෙනෙන්න. එතැන තිබෙන්නේ ණය තිරසරභාවය. ඒක පටලවා ගත යුතු නැහැ, සහන දීම කියන කාරණයත් එක්ක.

දෙවැනි කරුණ තමයි, රාජ්‍ය ආදායම වැඩි වීම. ඔව්, රාජ්‍ය ආදායම වැඩි කළා කියන්නේ අතිරේක බදු ගසා නොවෙයි. අද අපි දෙවැනිවර කියවීමේ විවාදයට ගන්නා දේශීය ආදායම් පනතට අදාළ සංශෝධනවලත් ඉතාම පැහැදිලිව මේ කාරණය දක්වා තිබෙනවා. බදු අනුකූලතාව වැඩි කර ගැනීම, බදු පරිපාලනය වැඩි කර ගැනීම, බදු පදනම පුළුල් කර ගෙන යාමේ කාර්යක්ෂමතාව කියන කාරණා නිසා තමයි අපට අපේක්ෂිත ආදායම සියයට 110කින් වැඩි කර ගන්න පුළුවන් වුණේ. 2025 අවුරුද්දේ එසේ කරගන්න හැකි වුණේ ඉතිහාසයේ පළමුවෙනි වතාවට. කලින් පැවැති කිසිම ආණ්ඩුවකට තමන් සැලසුම් කරන ලද බදු ආදායම එකතු කරගන්න බැරි වුණා. බදු ආදායම් එකතු කර ගන්න බැහැ කියන්නේ, බදු සැලසුම් පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියන්නේ ඇත්තටම දුෂණයට පාර කපන තත්ත්වයක්. අපි 2025දී බදු ආදායම් එකතු කරගෙන තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ එකතු කර ගත්ත මුදල්වලින් තමයි, රුපියල් බිලියන 100ක අතිරේක ප්‍රතිපාදනයක් අපි ලබා දෙන්නේ, අර ඇති වූ විශේෂ තත්ත්වය හමුවේ. ඒක තමයි මම පිළිතුරේදී සඳහන් කළේ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විස්තීර්ණ ණය පහසුකම් යටතේ දෙන සල්ලි දෙන්න බැරිද අහනවා. ඒක ඉතාම වැරදියිනේ ගරු විපක්ෂ නායකතුමනි. ණයක් අරගෙන ඒක සහනාධාර විධියට ගෙවන්න බැහැ. ඒ ණය භාවිත කරන්න විවිධ වැඩසටහන් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගන්න ඒවායින් සහනාධාර සඳහා වන වැඩසටහන්වලට බිලියන 240ක් වෙන් කරලා තිබෙනවා. ඉතිරි ඒවා සංවර්ධන ව්‍යාපෘති. ඒවායේ ප්‍රතිඵල ලැබෙන්නේ ඉදිරියේදී. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවේ තිබෙන්නේ ව්‍යාපෘති. ලෝක බැංකුවේ තිබෙන්නේ ව්‍යාපෘති. ඒවා බෙදා හැරියාම මොකද වෙන්නේ? අතීතයේ ඒ විධියට කරලා තමයි ඇත්තටම මේ ණය අර්බුදයක රට හිර කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, වාහන පිළිබඳ කතන්දරයේදීත් විවිධ කරුණු කාරණා මතු කළා. ආර්ථිකයක් ප්‍රසාරණය වෙනකොට ඒ තත්ත්වය හොඳයි. ඇත්තටම අපි අපේක්ෂා කළාට වඩා වාහන මිලදී ගැනීම් වෙලා තිබෙනවා. 2026 වර්ෂයේ අප්‍රේල් මාසය අවසන් වෙනකොට වාහන 178,000ක් ලංකාවට ඇවිල්ලා තිබෙනවා. මෝටර් සයිකල්, ත්‍රිවීලර්, කාර් සහ අනෙකුත් වාහන ගෙනැල්ලා තිබෙනවා. අපිට කිසිම ගැටලුවක් ඇති වෙන්නේ නැහැ, අපිට පාලනය කරන්න බැරි වෙච්ච මේ බාහිර තත්ත්වය නොපැමිණියා නම්. එහෙම නම් මෙය තවත් ප්‍රසාරණය වෙන්න ඉඩ තිබුණා. මේ තිබෙන්නේ අන්න ඒ බාහිර තත්ත්වයේදී අපි ගත්ත තීන්දුවක්. ඒකෙන් කරන්නේ, විදේශ විනිමය මාස තුනකට ආරක්ෂා කර ගැනීම. ආර්ථිකය ඉදිරියේදී ප්‍රසාරණය වීමේදී ක්‍රමිකව තමයි කටයුතු කරන්න වෙන්නේ. මොකද, දශක ගණනාවක් තිබුණු ගැටලු එකවර විසඳන්න බැහැ.

විපක්ෂ නායකතුමා අවසානයේදී අහනවා, දරිද්‍රතාව පිළිබඳ ප්‍රශ්නය ගැන. ඒ කාරණයේදීත් මම ඉදිරිපත් කළ පිළිතුරේ පැහැදිලිව කිව්වා, මේ තිබෙන්නේ දරිද්‍රතාව ගණනය කිරීමේදී එක් පුද්ගලයෙකුගේ මූලිකම අවශ්‍යතාව ඉෂ්ට කර ගැනීම සඳහා

වූ තත්ත්වයක් කියන එක. ව්‍යුහාත්මක ගැටලුවක් රට ඇතුළේ තිබෙනවා. අපි මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි ග්‍රාමීය දුප්පත්භාවය. අපේ අරමුණ තමයි මේ ග්‍රාමීය දුප්පත්භාවය ඉදිරියට නැති කර ගන්න එක. ඒක එක දවසින්, එක අවුරුද්දෙන් ඉවර කරන්න බැහැ. මේ ඉදිරිපත් කළ දත්ත අනුව මේ රුපියල් 16,000, රුපියල් 17,000 කියලා කියන්නේ තනි පුද්ගලයෙකුට අවමය පවත්වා ගෙන යාම සඳහා වන මුදල. ඔබතුමන්ලාට අමතක නැතිව ඇති, අතීතයේදී පැවැති සමහර ආණ්ඩු කාලවලදී කිව්වා රුපියල් 2,500න් ජීවත් වෙන්න පුළුවන් කියලා. එවැනි තර්ක මතු කරපු අතීතයක් තිබුණා. මේ තිබෙන්නේ, අපි පෞද්ගලිකව කියන එකක් නොවෙයි, සංඛ්‍යා දත්ත ලේඛනවලට අනුව - ඒවායේ දැනට අඩුපාඩු තිබෙනවා නම් ඒවා නිවැරදි කර ගන්න වෙනවා - උද්ධමනය මනින, ලෝකය පිළිගත් ක්‍රමවේදවලට අනුව. එහිදී අපි කිසිදු විධියකට කියන්නේ නැහැ, රුපියල් 16,000ක් ලැබුණු ගමන් සුඛිත මුදිත ජීවිතයක් අත් වෙනවා කියලා. මේ තිබෙන තත්ත්වය ගැන ඇත්ත තොරතුරු තමයි තිබෙන්නේ. ඒ මත ඉඳගෙන අපි ඉදිරියට ගමන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

II

රාජ්‍ය ආයතන සහ මූල්‍ය පද්ධති සයිබර් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීම

அரச நிறுவனங்கள் மற்றும் நிதியியல் முறைமைகளை சைபர் தாக்குதல்களிலிருந்து பாதுகாத்தல்

SAFEGUARDING PUBLIC INSTITUTIONS AND FINANCIAL SYSTEMS FROM CYBERATTACKS

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, I would like to ask the following Question under Standing Order No. 27(2) from the Minister of Finance, Planning and Economic Development or the Ministry of Digital Economy.

I seek Government's view concerning the growing vulnerability of Sri Lanka's public institutions and financial systems to cybercrime, cyberattacks, hacking, ransomware, data breaches and digital espionage.

Recent incidents and attempted intrusions involving the Ministry of Finance, the banking sector, the Registrar of Persons, the Registrar of Companies, the Central Bank of Sri Lanka, the RDA and the General Post Office have raised serious concerns regarding cyber resilience, national security, institutional preparedness and public confidence in Sri Lanka's digital infrastructure. Serious public concerns also arise as to whether key institutions such as the Inland Revenue Department, the Sri Lanka Customs, the Excise Department, the Department Immigration and Emigration, the Ceylon Electricity Board, the CPC, the Bank of Ceylon, the People's Bank, the NSB and the SriLankan Airlines - the Hon. Anura Karunathilaka is present here and I think he knows about the SriLankan Airlines - are adequately protected against cyberattacks, financial fraud, data theft and operational disruption.

Despite repeated assurances and the Government's push towards digital transformation, e-governance, digital identity systems and fintech expansion, many critical institutions appear exposed due to outdated systems and weak safeguards, Sir. Inadequate monitoring, insufficient staff preparedness and lack of accountability seem to be the major problem. මම හිතන විධියට, ඒක තමයි තිබෙන විශේෂ ප්‍රශ්නය, ගරු කථානායකතුමනි. Therefore, I ask the Hon. Minister the following questions:

Will the Government -

1. state the total number of cyberattacks, attempted breaches, ransomware incidents, phishing attacks, hacking attempts and digital fraud complaints reported from 2023 to date involving,
   (a) government institutions;
   (b) State and private banks; and
   (c) critical public infrastructure institutions?
2. specify whether the institutions referred to above have faced cyber intrusions, attempted breaches or unauthorized access during the past three years?

Sir, I would appreciate it if they give it on per year basis.

3. state what cybersecurity systems, monitoring mechanisms, encryption safeguards, backup systems and cyber defence protocols are presently operational and whether they comply with internationally accepted standards?

Firewalls et cetera need to be introduced, Hon. Speaker. Remember, on 23rd of October 2025, I asked a question related to this from the Minister and the information given at the time was that everything was completely in good order, but that is not the case now, as we can see.

4. Is it not a fact that many institutions continue operating on outdated legacy systems, thereby exposing Sri Lanka to financial fraud, identity theft, disruption of services and foreign cyber espionage?

The impact of it, as of now, is Rs. 64 billion - රුපියල් කෝටි 6,400යි.

5. Are annual cybersecurity audits, penetration testing and independent cyber risk evaluations mandatory for government institutions and if so, which institutions have failed to comply?
6. Who is directly accountable for cyber breaches, data theft or cyber fraud within government institutions?

   Who is held responsible?

[ගරු රවී කරුණානායක මහතා]

7. Will the Government state the financial losses and operational disruptions arising from cyber incidents reported from 01st January, 2025 to date?

8. What urgent measures will the Government take to protect Sri Lanka from future cyber warfare and organized cybercrime?

Sir, I saw today's "Daily News" which states that the Central Bank of Sri Lanka and the Ministry of Finance, Planning and Economic Development will be held responsible. The Central Bank comes in only when holding hands with others. When they are independent, why are they not doing their job? That is the question we want you to answer.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය අමාත්‍යවරුන් හතර දෙනෙකුට යොමු කරලා තිබෙනවා. ඒ නිසා අපි තීරණයක් ගත්තා එය එක් අමාත්‍යාංශයකට යොමු කරන්න කියලා. ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍යතුමා ඒ සමස්තය වෙනුවෙන් පිළිතුර දෙනවාද? නැතිනම්?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා කල් ඉල්ලා සිටිනවා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, මෙහෙම කරන්න. *[බාධා කිරීමක්]* නැහැ, මේක ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාටම අදාළ ප්‍රශ්නයක් නොවෙයි. මේකේ basically තිබෙන්නේ data breach සම්බන්ධව නේ. මේක වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා මෙම ප්‍රශ්නය Digital Economy Ministry එකට directly යොමු කරන්න කියලා. මොකද, ඔබතුමා මෙතැනදී mention කරලා තිබෙනවා, CEB, CPC, BOC, People's Bank ආදිය. එතකොට මේ ප්‍රශ්නය අමාත්‍යාංශ ගණනකට අයිති වෙනවා. ඔබතුමා අහන ප්‍රශ්නයේ core එක, ඔබතුමා අහන වැදගත්ම කාරණය data breach සම්බන්ධව නේ. ඒකට හදලා තිබෙන National Cyber Security Operations Centre එක තිබෙන්නේත් Ministry of Digital Economy යටතේ. ගරු කථානායකතුමනි, අපි දැනුවත් කරන්නම්, මේ ප්‍රශ්නයට හෙට හෝ අනිද්දා දවසේදී - Deputy Minister of Digital Economy ලංකාවේ ඉන්නවා ඇති කියලා මා හිතනවා - නැත්නම්, අපි අමාත්‍ය මණ්ඩලය විධියට මේ සතිය තුළදී ඔබතුමාට Ministry of Digital Economy පැත්තෙන් පිළිතුරක් දෙන්න බලාපොරොත්තු වෙනවා. එහෙම කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය අහලා තිබෙන්නේ සම්පූර්ණයෙන්ම රට වෙනුවෙන්. ඒකට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයෙන් හෝ මුදල් අමාත්‍යාංශයෙන් පිළිතුරු දුන්නාට කමක් නැහැ. මොකද, ඒ අමාත්‍යාංශ දෙකම භාර ඇමතිවරයා අනුර දිසානායක ජනාධිපතිවරයා නේ. ඒ නිසා මම ඒ ප්‍රශ්නය ඇහුවේ ඒ ආකාරයෙන් උත්තර දෙන්නයි. ඔබතුමාගේ ලේකම් මට කථා කරලා ඒ ගැන ඇහුවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම logic එකක් විධියට නොවෙයි මෙය කියන්නේ. උදාහරණයක් විධියට ගත්තොත්, Department of Immigration and Emigration අයිති අපේ ආනන්ද විජේපාල ඇමතිතුමාගේ අමාත්‍යාංශයට.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ තිබෙන්නේ cybercrime ගැන.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක හරි. CEB එක අයිති අපේ අනුර කරුණාතිලක ඇමතිතුමාගේ අමාත්‍යාංශයට. ඒක නිසා අපි මෙහෙම කරන්නම්, ගරු කථානායකතුමනි. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය අපි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට යොමු කරලා උත්තර ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

2026.01.22 දින සහ 2026.02.18 දින ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම, මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ මුදල් ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

සේවක අර්ථසාධක අරමුදලේ පාරිතෝෂිකය විශ්‍රාම වැටුප් ක්‍රමයකට පරිවර්තනය කිරීම පිළිබඳ පුවත් වාර්තා: කම්කරු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஊழியர் சேமலாப நிதியத்தின் பணிக்கொடையை ஓய்வூதியத் திட்டத்துக்கு மாற்றுதல் தொடர்பான செய்தி அறிக்கைகள்: தொழில் அமைச்சரினது கூற்று

NEWS REPORTS ON CONVERSION OF EMPLOYEES' PROVIDENT FUND GRATUITY INTO A PENSION SCHEME: STATEMENT BY MINISTER OF LABOUR

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න දෙකකට පිළිතුරු ලබා දීමට තිබෙනවා. පළමුව මම පිළිතුරු සපයන්නම් 2026.01.22 දින අසන ලද ප්‍රශ්නයට.

1. No such decision has been taken to convert EPF into a pension-only model.
2. There is no requirement to do an actuarial valuation since such a decision has not been taken.
3. No need has arisen, as such a decision has not been taken.
4. There is no such proposal. However, any decision on EPF will be taken in consultation with the National Labour Advisory Council - NLAC - and with other relevant stakeholders.
5. Discussions on EPF-related matters is one of the major topics discussed at NLAC meetings regularly and a special consultation meeting on EPF was held on 21.01.2026 to discuss these key issues.

   Consensus was reached to introduce a tripartite - employees, employer and Government - mechanism including technical experts for EPF governance.
6. In fact, the asset base of the EPF as of 31.12.2025 is not Rs. 6 trillion, but it is exactly Rs. 4,965 billion, according to the Annual Report of EPF.

   Once, the tripartite governance is established in EPF, decisions related to EPF including investment-related decisions will be taken under the supervision of the tripartite mechanism. Such a governance structure will ensure good governance and better use of EPF assets.

Trade unions and employers express their dissatisfactions on the use of EPF for domestic debt restructuring in the past. They were not consulted even though they are the real owners of the Fund.

7. No such decision has been taken to remove these benefits. Tripartite discussions have focused on further simplifying the 30 per cent withdrawal procedures to enable workers to access these benefits more conveniently.
8. The Government is fully committed to consultation with the trade unions and employers in taking policy decisions, including legislation reforms. This commitment had already been demonstrated through the reactivation of the NLAC in December, 2024, which had been inactive since 2023. In 2025, seven NLAC meetings were held with several subcommittee meetings.

Thank you.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, මගේ ප්‍රශ්නවලට යම් උත්තරයක් ලබා දීම පිළිබඳව. නමුත්, මෙම ප්‍රශ්නයට උත්තර දෙන්න මහ බැංකුව මාස හතරක් අරගෙන තිබුණා. ගරු කථානායකතුමනි, අද ඇතිවෙලා තිබෙන තත්ත්වය ගැන මම කියන්නම්. ඒ මාස 4කදී ඇති වූ පිරිහීම නිසා තමයි අද තිබෙන ඇත්ත තත්ත්වය හෙළිදරව් වෙන්නේ.

ඔබතුමා දන්නවා, මේ තත්ත්වය තුළ ස්වාධීනත්වයක් තිබෙන මහ බැංකුව තමයි EPF එකේ පරිපාලනය ගෙනියන්නේ කියලා. ඒගොල්ලන්ට NDB බැංකුවේ සියයට 10ක කොටස් ප්‍රමාණයක් තිබෙනවා. EPF එකේ ETF එකේ, Bank of Ceylon එකේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සියයට 33ක් වන කොටස් වෙනුවෙන් ඔබේ මුදල් අමාත්‍යාංශය තවමත් අධ්‍යක්ෂකවරු දෙදෙනෙක්, තුන්දෙනෙක් ඒ Boardsවලට පත් කරලා නැහැයි කියන එක මතක් කරන්නට අවශ්‍යයි. EPF එකේ සියයට 10ක කොටස් තිබෙනවා නම්, අඩු ගණනේ එක් අධ්‍යක්ෂකවරයෙක් ගන්න පුළුවන්. EPF එකේ පරිපාලනය ගෙනියනකොට ඒගොල්ලෝ shares විකුණලා තිබෙනවා. එසේ විකිණීම නිසා සහ දූෂණයට ලක්වෙලා තිබෙන NDB එකේ රුපියල් මිලියන 13,200ක අලාභය නිසා ඒගොල්ලන්ට dividends ලැබිලා නැහැ. සමස්තයක් වශයෙන් රුපියල් බිලියන 2.5ක් නැතිවෙලා තිබෙනවා. එම නිසා ඒ අය සතුව තිබුණු EPF එකට අදාළ කොටස ගැන ඔබතුමා දන්නවා ඇති. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ සඳහා අවශ්‍ය අධ්‍යක්ෂකවරු ගත්තේ නැත්තේ ඇයි, NDB එක යම් විධියකට දූෂණයට ලක්වෙලා තිබෙනකොට මහ බැංකුවට තිබෙන ස්වාධීනත්වය තුළින් Bank Supervision Department ඒක හොයලා දීලා නැත්තේ ඇයි කියලා කරුණාකරලා කියන්න පුළුවන්ද? මේ ඔක්කෝම අරගෙන බැලුවාම පෙනෙන්නේ, ස්වාධීනත්වය ලබා ගන්න ඉස්සෙල්ලා මහ බැංකුව රට බංකොලොත් කළා කියන එකයි. ස්වාධීනත්වය ලබා දුන්නාට පස්සේ දැන් බැංකු ටික බංකොලොත් කරගෙන යන එක තමයි අපට පෙනෙන්නට තිබෙන්නේ, ගරු කථානායකතුමනි. මම මේ ප්‍රශ්නය අහපු වෙලාවේ ඒකේ වටිනාකමක් තිබුණා. පෙබරවාරි මාසයේ මේකට උත්තර දීලා මහ බැංකුව විධිමත් ලෙස ක්‍රියා කළා නම්, අඩු ගණනේ ඒ දූෂණවලට උත්තරයක් සොයා ගන්න තිබුණා. දැන් ඒකත් නැතිවෙලා තිබෙනවා; නිශ්ශබ්දවෙලා තිබෙනවා. දැන් මහ බැංකුව කියනවා, "අපි දන්නේ නැහැ, මොනවාද වෙන්න තිබෙන්නේ කියලා" යනුවෙන්. එහෙම නම්, ඒ අයට මේ ස්වාධීනත්වය දීලා මොකටද, ගරු කථානායකතුමනි?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, NDB එක සම්බන්ධයෙනුත් කරුණු කිහිපයක් මතු වුණා. එය මේ ප්‍රශ්නයට සෘජුවම අදාළ වෙන්නේ නැති නිසා අපි ඒ පිළිබඳව කරුණු විමසලා බලන්නම්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
EPF එකේදී,-

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු මන්ත්‍රීතුමනි, මම එතැනට එන්නම්. EPF එක ගත්තොත්, ඇත්තටම EPF එක පාලනය කිරීම මහ බැංකුවේ තිබෙන EPF අරමුදලේ අරමුදල් පරිපාලන කමිටුව හරහා තමයි කරන්නේ. ඒ වාගේම යම් පරිපාලනමය කටයුත්තක්, ඒ සඳහා වන සම්බන්ධීකරණ කටයුත්තක් කම්කරු අමාත්‍යාංශය යටතේත් තිබෙනවා. ඒ නිසා තමයි මම කලින් සඳහන් කළ ජාතික කම්කරු උපදේශන සභාව හරහා දැනට සාකච්ඡාවක් නිර්මාණය වෙලා තිබෙන්නේත්. දැන් ඒ සාකච්ඡාව පැවැත්වෙමින් තිබෙනවා. අපි ගිය සතියේ මහ බැංකුවත් එක්කත් ඒ සාකච්ඡාව පැවැත්වුවා. වඩාත් හොඳ governance structure එකකට යෑම සඳහායි අපි ඒ සාකච්ඡාව කරන්නේ. නමුත්, ඔබ විශේෂයෙන් මතු කළා වාගේ EPF එකේ ආයෝජන සම්බන්ධයෙන් දැනට ඔවුන් හදාගත් guidelines, policies ප්‍රමාණයක් තිබෙනවා. අපිත් යම් ආකාරයක විමසීමක් කළා, යම් ප්‍රමාණාත්මක ආයෝජනයක් තිබෙනවා නම් Board representation එකක් නැත්තේ ඇයි කියලා. විශේෂයෙන්ම ඔවුන්ගේ ප්‍රතිපත්ති ඇතුළේ neutral position එකක් maintain කරනවාය කියන එක තමයි මේ වෙලාවේ කථා කළේ. ඒ කියන්නේ, අරමුදල් පවත්වාගෙන යෑමේදී,- *[බාධා කිරීමක්]* ඒ කියන්නේ, Board එකට යන්නේ නැතුව ඔවුන් ආයෝජනය පැත්තෙන් ප්‍රතිපත්ති හදාගෙන තිබෙනවා. ඔබතුමා කියනවා වාගේ මේ පිළිබඳ ප්‍රතිපත්තිය තවදුරටත් අධ්‍යයනය කරලා යම් වෙනස්කම් කරන්න ඕනෑ නම්, අපි ඒ පිළිබඳව සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. මම ඔබතුමාට සඳහන් කළේ, දැනට EPF එකේ ආයෝජන පිළිබඳ තත්ත්වයයි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක අපෙන් ගන්න තුන්දෙනෙක් සිටියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, දැන් අවසන් කරන්න.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මම සඳහන් කළා වාගේ ප්‍රතිපත්තිමය වෙනස්කම් කරන්න සිද්ධ වුණා. අපි ඉදිරියේදී ඒ පිළිබඳ සාකච්ඡා කරනවා.

ඊළඟට මම ස්ථාවර නියෝග 27(2) යටතේ 2026.02.18වැනි දින ගරු රවී කරුණානායක මහතා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

නිල සංචිත තත්ත්වය සහ විදේශ ගෙවීම් gateways හරහා විදේශ විනිමය අහිමි වීම: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மொத்த உத்தியோகபூர்வ கையிருப்பு நிலைமை மற்றும் வெளிநாட்டு கட்டண நுழைவாயில்கள்மூலம் அந்நியச் செலாவணி இழப்பு: நிதி, திட்டமிடல் பிரதி அமைச்சினது கூற்று

GROSS OFFICIAL RESERVE SITUATION AND LOSS OF FOREIGN EXCHANGE THROUGH FOREIGN PAYMENT GATEWAYS: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ Gross Official Reserves සම්බන්ධයෙන්. මතක ඇති නේ. ඒ නිසා ප්‍රශ්නය කියවන්න අවශ්‍ය නැහැ නේ.

1. The latest published Gross Official Reserve - GOR - position at the end of April, 2026, which is provisionally estimated, stands at US Dollars 6.8 billion.

   There is no standard definition for usable reserves. However, the Net International Reserves - NIR - are the difference between Gross Official Reserve - GOR - and the liabilities of the Central Bank of Sri Lanka - CBSL.

   As per the Central Bank definition, the outstanding international currency swaps and the outstanding IMF-EFF liability of the 2016 Programme are considered as the CBSL liabilities.

   Latest NIR - Net International Reserve - data is given in the below table.

Year	**NIR** (USD mn.)
2023	- 404
2024	2,487
2025	4,285

   So, compared to 2024, the Net International Reserves increased by US Dollars 1,798 million in 2025, which was an increase of 73 per cent.

2.

GOR breakdown (USD mn)	**End December 2025**	**End March 2026**	**End April 2026(Prov)**
Official Reserve Assets	6,838	7,026	6,759
Foreign Currency Reserve	6,747	6,800	6,505
Reserve position in the IMF	4	4	4
SDRs	1	1	32
Gold	86	222	219
Other Reserve Assets	0	0	0

So, Special Drawing Rights - SDRs - have increased from US Dollars 1 million in 2025 to US Dollars 32 million in 2026. Then gold reserves, real gold, not paper gold, has increased from US Dollars 86 million in 2025 to US Dollars 219 million in 2026.

At the end of April, 2026, there was a Bilateral Currency Swap Agreement with the People's Bank of China. The counterparty was the Central Bank. Principal amount is around US Dollars 1.4 billion and as per the tenure, the Agreement is valid until December, 2027. As regards the maturity profile, it will mature in December, 2027, with the annual roll-over in December, 2026. If we take the all-in cost, at present, there is no cost; the cost is zero as the drawn down CNY Swap.

Then, the Special Swap Agreement with the Reserve Bank of India - RBI. Again, the counterparty is the Central Bank. The principal amount is US Dollars 2.6 billion, as of October, 2023. As per the tenure, the Agreement is valid until December, 2026. However, the swap will be fully paid off by September, 2026.

Forex swap maturity profile as at 30 April, 2026 with the domestic licensed banks is given below:

Maturity	Amount (USD mn)
2026	1,814
2027	501
2028	25
2029	3
	2,342

3. The Government Gross Official Reserve is immediately deployable except for the proceeds from the People's Bank of China Swap facility and the forex balance of the Sri Lanka Deposit Insurance Fund.

4. The Central Bank of Sri Lanka does not apply any spread, fee or margin when buying or selling US Dollars from or to the Government of Sri Lanka.

   Accordingly, no profit or gain has been realized by the Central Bank of Sri Lanka from US Dollar transactions with the Government of Sri Lanka.

5. The Auditor-General appoints a qualified audit firm to carry out the financial audit of the Central Bank of Sri Lanka - CBSL - in terms of Section 101 of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023. The appointed external audit firm conducts the financial audit and submits its findings to the Auditor-General for the purpose of issuing the audit opinion on the annual financial statements. Based on the report of the external auditor, the Auditor-General issues the audit opinion, which is published together with the annual financial statements in the website of the Central Bank of Sri Lanka and in printed form. The audited financial statements are submitted to the Minister of Finance, Planning and Economic Development within four months after the close of the financial year by the Central Bank of Sri Lanka.

   Further, the appointed external auditor issues the interim management letter and the final management letter with responses from the Central Bank of Sri Lanka to the Auditor-General with particular emphasis on material weaknesses identified in the internal controls and systems on the affairs of the Central Bank, including the financial statements in terms of Article 154(6) of the Constitution of Sri Lanka.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It is a private auditor?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
It is not mentioned here.

In addition, the monthly balance sheets of the Central Bank of Sri Lanka are reviewed by the Auditor-General in accordance with Sri Lanka Standard on Review Engagements - SLSRE - and are published on the Central Bank's official website. The Auditor-General also makes inquiries from time to time on matters considered necessary in the discharge of his statutory responsibilities and the Central Bank of Sri Lanka provides the required responses and clarifications in a timely manner.

6. In terms of the Section 47(2) of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023, all transactions executed between or among persons resident in Sri Lanka shall be made in Sri Lankan Rupees, unless otherwise authorized by the Central Bank for the purposes of the Foreign Exchange Act, No. 12 of 2017.

   It has come to the notice of the Central Bank of Sri Lanka that there are transactions effected in Sri Lanka between persons resident in Sri Lanka in foreign currency. For example, there is an article published in the "Daily Mirror" newspaper dated 30.12.2025.

   The Department of Foreign Exchange has taken several measures during the recent past to prevent transactions effected in foreign currency between persons resident in Sri Lanka. One such measures is the press release dated 12.02.2026 issued by the Central Bank of Sri Lanka with the aim of increasing awareness among the general public and the merchants, explaining applicable legal framework in respect of making payments between persons resident in Sri Lanka in foreign currency, as well as the consequences of engaging in such transactions without obtaining the required approval of the Central Bank of Sri Lanka under the Foreign Exchange Act.

7. The Central Bank of Sri Lanka does not collect such information.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

8. As per the Payment Cards and Mobile Payment Systems Regulations No. 1 of 2013 issued under the Payments and Settlements Systems Act, No. 28 of 2005, no person shall engage in the business of or function as a Service Provider except under the authority and in accordance with the terms and conditions of a licence issued by the Central Bank. Those terms and conditions are provided in the Annex and I **table*** that.

Accordingly, facilitating to accept payments via Payment Cards, that is, functioning as a Financial Acquirer of Payment Cards, in the country requires a licence issued by the Central Bank.

Thank you.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මහ බැංකුවේ ප්‍රශ්න ගැන තමයි ඔබතුමා සඳහන් කළේ. මම එය අගය කරනවා.

ගරු කථානායකතුමනි, මේ පිළිතුර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න මාස 4ක් ගත වුණා. මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් කරුණු 8ක් ගැන ප්‍රශ්න කළා. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමාගේ එම වැඩකටයුත්ත තුළ අද ප්‍රශ්න දෙකකට පිළිතුරු ලැබුණා. මීට පෙර මේ පිළිතුර ලබා දී තිබුණා නම් මේ වාගේ අවප්‍රමාණ තත්ත්වයකට වැටෙන්නේ නැහැ කියන එක ගරු කථානායකතුමාටත්, සමස්ත මන්ත්‍රීවරුන්ටත් මම මතක් කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් මම යම් හෙළිදරව් කිරීමක් කරන්න කැමැතියි. මේ කථා කරන මොහොතේ - අද - ඩොලර් එකේ අගය රුපියල් 338.78යි. මම මේ ගණනය කළේ, පස්වැනි වතාවට ලැබෙන්න තිබෙන IMF tranche එක ඩොලර් මිලියන 350යි. ඒ ඩොලර් මිලියන 350, රුපියල් 335න් වැඩි කළොත් අපට ලැබෙන්න තිබෙන්නේ රුපියල් බිලියන 117යි. මේ අවප්‍රමාණ වීම නිසා තොග ණය - ඇමෙරිකානු ඩොලර් බිලියන 39ක් අද සම්පූර්ණයෙන් විදේශ ණයක් වශයෙන් ගෙවන්න තිබෙනවා. ඩොලරය රුපියල් 293 සිට රුපියල් 338ට අවප්‍රමාණ වුණාම තොග ණය impact එක බිලියන 1,688යි. අද සමස්ත carrying cost එක සියයට 8යි. සියයට 8න් වැඩි කළොත් මේ ණය වැඩිවන ප්‍රමාණය බිලියන 135යි. ඉතින්, මගේ මන්ත්‍රීවරුන් සමඟ මේ ආණ්ඩුවෙන් මම මේ කාරණය අහනවා. IMF එකට වැඳලා, පුදලා විදුලි බිල වැඩි කරනවා, තෙල් මිල වැඩි කරනවා. දැන් රුපියල අවප්‍රමාණ කරනවා. මම හිතන විධියට, තව සුමානයක් යන්න ඉස්සරවෙලා පොලී අනුපාතයත් වැඩි කරාවි. ඒ ඔක්කොම කරලා අපට ලැබෙන බිලියන 117ට අපේ අවප්‍රමාණ වියදම බිලියන 135යි. ණය මුදල ලැබෙන්න ඉස්සරවෙලා රට අලාභයකටයි පත් වෙන්නේ. ස්වාධීන බැංකුවක් ලෙස මහ බැංකුව තුළින් කරන්නේ මේ වාගේ දේවල්ද?

දැන් මහ බැංකුවේ අධිපති කියනවා, "මම දන්නේ නැහැ, මේක විදේශ ප්‍රශ්නයක්" කියලා. එහෙනම්, ස්වාධීනත්වය ඉල්ලුවේ මොකටද? අවුරුදු 76ක් තිස්සේ මේ වාගේ ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මේ වාගේ කියලා ආණ්ඩුවට බර පටවන එක නොවෙයිද දැන් කරන්නේ? මේ නිසා තමයි මමත්, විපක්ෂයේ සමස්ත මන්ත්‍රීවරුනුත් ඒ විධියට හැසිරුණේ. අපි දන්නවා, කොතරම් අමාරුද කියලා. දැන් ඩොලරයේ අගය රුපියල් 338ට ගියේ මුදල් අව්වු ගහලාද? සත පහක් අව්වු ගහන්නේ නැහැයි කියපු ආණ්ඩුවේ මහ බැංකුව කියනවා, දැන් රුපියල අවප්‍රමාණ වෙලා කියලා. මේ කථා කරන මොහොතේ ඩොලරයේ අගය රුපියල් 339යි. ජනතාව කොතරම් මේ බර උසුලන්න අවශ්‍යද? මේක 338න් නැවතෙනවාද, තව වැඩි වෙනවාද, කවුද මේකට වග කියන්න ඕනෑ වන්නේ කියන එක මම ඉතාම ඕනෑකමින් අහනවා. ඒ තුළින් අද scamming කියනවා, phishing කියනවා, මේ ගැන ප්‍රශ්න ඇති වෙනවා. මේ ඔක්කොම ගත්තාම, අපේ රුපියලත් එක්ක සෙල්ලම් කරන්නේ කවුද කියන එක මගේ සමස්ත මන්ත්‍රීවරුන් එක්ක ගරු කථානායකතුමාගෙන් කාරුණිකව අහනවා. මේක දේශපාලනීකරණය කරන්න ඕනෑ නැහැ. නමුත්, ඩොලරයේ අගය රුපියල් 290ට ගියාම කොතරම් හොඳද කියලා මහ බැංකුව කිව්වා. දැන් ඩොලරයේ අගය රුපියල් 339ට ගියාම ඔවුන් නිශ්ශබ්ද වෙනවා. සාකච්ඡා කරන එක විතරයි වෙන්නේ.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, විනිමය අනුපාතය අවප්‍රමාණ වීම පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාට ලබා දුන් පිළිතුරේදී මා පැහැදිලි කළා. මෙය ක්ෂණිකව, - *[බාධා කිරීමක්]* ඔබගේ reference එක අනුව, රුපියල් 338යි කියලා කියන්නේ. ඊයේ වෙනකොට indicative rate එක රුපියල් 333ක්. ඔබතුමාට දැන් ඩොලරයේ අගය රුපියල් 338ක් කියන්න මොකක් හරි reference එකක් තිබෙනවාද? *[බාධා කිරීමක්]* Okay. ඒක තමයි, මේකේ වෙන්න පුළුවන් තත්ත්වය මේකයි. මම අර කලින් සඳහන් කරපු න්‍යායාත්මක කාරණාවලට අමතරව වෙළෙඳ පොළේ ඇති වන තත්ත්වයේදී, මේ කලබල වීම - panicking - නිසාත්, demand එක වැඩිවීම නිසාත් යම් ප්‍රමාණයකට ඉහළ යනවා. නමුත්, අපි ගත් ක්‍රියාමාර්ග අනුව මේ සතිය ඇතුළත ඒක සමනය කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, අපට අනුගමනය කරන්න පුළුවන් තවත් උපාය මාර්ග - tools - තිබෙනවා. ඉදිරියේදී ඒවා භාවිත කරනවා. විදේශ විනිමය අනුපාතය ප්‍රතිශතයක් විධියට 4.8ක් කියලා මම කලින් සඳහන් කළා. මේ විදේශ විනිමය අනුපාතය ක්‍රමිකව පාලනය කළ යුතුයි. විදේශ විනිමය අනුපාතය පොඩ්ඩක් වැඩි වූ පමණින් මේ ආර්ථිකය දෙදරා බිඳ වැටෙනවාය කියන එක එයින් අදහස් කරන්නේ නැහැ. විශේෂයෙන් මේ රුපියල අවප්‍රමාණ වීමට ඩොලරය අධිප්‍රමාණ වීමේ බලපෑමත්, ලෝක යුද තත්ත්වයේ බලපෑමත් සුවිශේෂී පසුබිමක් - context එකක් - වෙනවා. අතීත තත්ත්වයන් ගත්තාම, 2022දී එවැනි තත්ත්වයක් නැතිව මේ රට ඇතුළේ ගත්ත තීන්දු තීරණ නිසා ඇති වුණු ආර්ථික අර්බුදය නිසා තමයි ඩොලරයේ අගය රුපියල් භාරසිය ගණන්වලට ගියේ. ඒ කෙසේ වෙතත්, අපට ඒ පිළිබඳ වාද විවාද කරන්න පුළුවන්.

නමුත් මට පොඩි කාරණාවක් පැහැදිලි කරන්න අවශ්‍යයි, ගරු මන්ත්‍රීතුමනි. අපට ලැබෙනවා කියන ඩොලර් මිලියන 700 කිසිදු ආකාරයකට වෙනස් වන්නේ නැහැ. ඔබතුමා කියන්නේ වාර්තා කිරීම පිළිබඳව. ඇත්තටම අපේ ආණ්ඩුව රාජ්‍ය ණය පාර්ලිමේන්තුවේදී වාර්තා කරන්නේ රුපියල්වලින්. ඒ වාගේම අපි ගනුදෙනු කරන්නේත් රුපියල්වලින්. එතකොට අපි වාර්තාකරණය - reporting - කරන්නේත් රුපියල්වලින්. එතකොට ඉතාම පැහැදිලියි, අපි ඩොලර් එකක් ණය ගත්තොත් අපි ගෙවන්න ඕනෑ ඩොලර් එකක්ම බව. මම එය පැහැදිලි කරන්නම්. ඩොලර් එකක් ණය ගත්තොත්, අපට ඩොලර් එකක්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ලැබෙනවා, ගෙවන්න තිබෙන්නේත් ඩොලර් එකයි. ඒ ඩොලර් ණය ප්‍රමාණය වෙනස් වන්නේ නැහැ. හැබැයි, ඩොලර් එක ගන්නකොට රුපියල් 300යි, දැන් 330යි නම් ගෙවන රුපියල් ණය ප්‍රමාණය වැඩි වනවා. ඒකේ අනෙක් පැත්තත් එහෙමයි. ගරු මන්ත්‍රීතුමනි, අපි පාර්ලිමේන්තුවට රුපියල්වලින් වාර්තා කරන ගමන් ජාත්‍යන්තර ගනුදෙනුවලදී, ඒ අවශ්‍යතාවලදී අපි ඩොලර්වලින් වාර්තා කරනවා. ඩොලර්වලින් වාර්තා කරද්දි IMF එකේ ණය ඩොලර් මිලියන 700 නම් 700ම තමයි. හැබැයි, අපි ලංකාව ඇතුළේ දේශීයව ණය අරගෙන තිබෙනවා, බිල්පත්වලින්, බැඳුම්කරවලින්. ඒක ඩොලර්වලට පරිවර්තනය කිරීමේදී මොකද වෙන්නේ? ඒකේ අනෙක් පැත්ත. ඒ නිසා මෙතැනදි වඩාත් වැදගත් වන්නේ ඩොලර්වලින් ණය ලබා ගන්නකොට ඩොලර්වලින් සාකච්ඡා කරන එකත්, රුපියල්වලින් ණය ලබා ගන්නකොට රුපියල්වලින් සාකච්ඡා කරන එකත් තමයි. ඒ අනුව ගත්තාම අපේ සමස්ත ණය - absolute debt - ප්‍රමාණය වැඩි වෙලා නැහැ. විදේශ විනිමය අනුපාතයේ බලපෑමෙන් අහිතකර දේවල් වෙන්නත් පුළුවන්, වාසිදායක දේවල් වෙන්නත් පුළුවන්. මේ තිබෙන්නේ විදේශ විනිමය අනුපාතය ඉහළ යෑමක් මිසක් ඩොලර් වැඩි මිලට අරගෙන නැහැ.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
VALUE ADDED TAX (AMENDMENT) BILL

"2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ තෘතීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා විසිනි.

2026 ජූනි 09වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

පිරිසිදු අමෙරිකානු ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

පිරිසිදු අමෙරිකානු ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவர் சார்பாக மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2026 யூன் 09, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Anil Jayantha on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education;

to be read a Second time upon Tuesday, 09th June, 2026 and to be printed; and to be referred to the Committee on Public Finance.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කිරීම. ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
The Hon. Nishantha Jayaweera to start the Debate. You have 12 minutes.

[පූ.භා. 11.49]

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, අද දින දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙනවා. මේ පනත් කෙටුම්පත ප්‍රධාන කරුණු කිහිපයක් මත පදනම් වෙලා තිබෙනවා. ඉන් ප්‍රධානම කරුණක් තමයි, දැනට පවතින බදු ක්‍රමයේ තිබෙන සංකීර්ණතා ඉවත් කිරීම. ඒක මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ ප්‍රධාන මූලිකම අරමුණක් වනවා. ඊට අමතරව බදු පරිපාලනය සිදු කිරීමේදී පනතේ තිබෙන disputes, එහෙම නැත්නම් අවිනිශ්චිතතා ද හඳුනාගෙන තිබෙනවා. අන්න ඒවා ඉවත් කර ගැනීමත් මෙහි එක්තරා අරමුණක් වනවා. මේ අවිනිශ්චිතතා ඉවත් කරන්න සහ බදු ක්‍රමය සරල කරන්න අවශ්‍ය පියවර මෙහි ඇතුළත් වනවා. අපේ බදු අනුකූලතාව වැඩි කරලා බදු පදනම පුළුල් කර ගැනීම තුළින් විශාල බදු ආදායමකට ගමන් කිරීම තමයි අපි බලාපොරොත්තු වන්නේ. තවදුරටත් බදු අනුපාත වැඩි කිරීම හෝ බදු පැනවීම නොවෙයි මෙතැන ප්‍රධානම

[ගරු නිශාන්ත ජයවීර මහතා]

අරමුණ වන්නේ. මෙන්න මේ අරමුණු පෙරදැරිව, අය වැයේදී ඉදිරිපත් කළ යෝජනා නීතිමය තත්ත්වයට පත් කරලා පවතින පනත සංශෝධනය කිරීම තමයි මෙහි ප්‍රධානම අරමුණ වන්නේ.

මේ පනත් කෙටුම්පත තුළ තවත් ප්‍රධානම කාරණයක් තිබෙනවා. බදු ක්‍රමය සරල කරන්න ගත්ත හොඳම සාධනීය පියවරක් මෙහි තිබෙනවා. ඒක මොකක්ද කියලා අපි බලමු. ගරු කථානායකතුමනි, දැනට පවතින බදු පනත අනුව ආදායම් බදු ගෙවන කෙනෙකුට තක්සේරු වර්ෂය අවසන් වෙලා තමන්ගේ ආදායම් බදු වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට අමතරව ඒ තක්සේරු වර්ෂය ආරම්භයේදීම ඇස්තමේන්තුගත ආදායම් බදු වාර්තාව - Statement of Estimated Tax Payable - දෙපාර්තුමේන්තුවට ලබා දෙන්න ඕනෑ, මේ තක්සේරු වර්ෂය ඇතුළත තමන්ගේ ආදායම කොච්චරද කියලා පුරෝකථනය කරලා, එහෙම නැත්නම් ඇස්තමේන්තු කරලා. ඒ අනුව තමයි ඒ තක්සේරු වර්ෂය ඇතුළේ ගෙවන්න ඕනෑ බදු ප්‍රමාණය තීරණය වන්නේ. එතකොට යම් කෙනෙකු තක්සේරු වර්ෂය ආරම්භයේදී ඇස්තමේන්තු කරනවා, මගේ ආදායම මෙච්චරයි කියලා. මේක ඇස්තමේන්තු පදනම්න් නේ ඉදිරිපත් කරන්නේ. ඊට පස්සේ තව ටික දවසක් - මාසයක්, දෙකක්, තුනක් - යනකොට ඔහුට හිතෙනවා, මේක වැරදියි කියලා. එතකොට ඔහුට සිද්ධ වනවා, මගේ ආදායම කලින් එක නොවෙයි, මෙන්න මේක තමයි මගේ අලුත් ආදායම කියලා නැවත ඇස්තමේන්තුගත ආදායම් වාර්තාවක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්න.

ඒ අනුව තමයි ආදායම් බදු ගෙවීම් සිද්ධ වෙන්නේ. ඊටත් පස්සේ තවත් මාස කිහිපයක් යනකොට මගේ ආදායම වැරදියි කියලා හිතෙනවා නම්, තවත් ඇස්තමේන්තුගත ආදායම් වාර්තාවක් ඉදිරිපත් කරන්න වෙනවා. බදු ගෙවන්නෙකුට අනවශ්‍ය පීඩාවක්, කරදරයක් වෙන මෙන්න මේ ඇස්තමේන්තුගත ආදායම් වාර්තාව ලබා දීමේ අවශ්‍යතාව ඉවත් කිරීම මෙන්න මේ සංශෝධනයේ ප්‍රධානම අංගයක් වෙනවා.

ඊටත් අමතරව මෙතැන තවත් විශේෂ දෙයක් සඳහන් කර තිබෙනවා. බදු ගෙවන යම්කිසි කෙනෙක් පසුගිය තක්සේරු වර්ෂයේදී ගෙවන ලද ආදායම් බද්දට වඩා සියයට 120කට වැඩි ප්‍රමාණයක ආදායම් බද්දක් ගෙවනවා නම් සහ මගේ ආදායම මම නිවැරදිව වංචාවකින් තොරව, පැහැර හැරීමකින් තොරව ප්‍රකාශ කර තිබෙනවා කියලා ඒත් එක්කම ඔහු දිවුරුම් ප්‍රකාශයකින් ලබා දෙනවා නම් සහ ඒ කෙනා ආපසු ගෙවීමක් ඉල්ලන්නේ නැත්නම්, අන්න ඒ බදු ගෙවන්නාට තමන්ගේ ආදායම් වාර්තාව විගණනයකට ලක් කිරීමකින් තොරව පිළිගන්න අවශ්‍ය විධිවිධාන මේකේ ඇතුළත් කර තිබෙනවා. මේකෙන් බලාපොරොත්තු වන්නේ නිවැරදිව බදු ආදායම් ප්‍රකාශ කරන බදු ගෙවන්නන් අනවශ්‍ය harassmentsවලට භාජන නොවී ඒ වාර්තාව ඒ විධියට පිළිගැනීමයි. මේක අනුකූලතාව ඉහළ නංවන්න ගත් ඉතාම සාධනීය පියවරක් වෙනවා.

ඊටත් අමතරව මෙතැනදී තවත් විශේෂ සහන දීලා තිබෙනවා. මෙතෙක් පැවති නීතිය තමයි, යම් ව්‍යවසායකයෙක් තමන්ගේ ව්‍යවසාය ආරම්භ කරන්න අවශ්‍ය යන්ත්‍රෝපකරණ අරගෙන එනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 3කට වැඩි වියදමක් කළොත් තමයි තමන්ට ඒ ආදායම් බද්ද ලාභයෙන් අඩු කර ගන්න පුළුවන් වන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහනයක් ලබා දෙන්න මෙන්න මෙතැනදී ඒක සංශෝධනය කරනවා. ඕනෑම ව්‍යවසායකයෙක් තමන්ගේ නව ව්‍යවසායට අලුතින් යන්ත්‍රෝපකරණ අරගෙන එනවා නම්, ඒකේ මිල ඇමෙරිකානු ඩොලර් 250,000කට වැඩි නම් මෙහිදී අපි යම් සහනයක් ලබා දෙනවා. කලින් ඒ ප්‍රමාණය තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක් ලෙසයි. ඒක අපි ඇමෙරිකානු ඩොලර් 250,000ක් දක්වා අඩු කරනවා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අන්න එතැනට කරන වියදම තමන්ගේ ලාභයෙන් එක පාරටම සියයට 100ක්ම අඩු කර ගන්න පුළුවන්. ඊටත් අමතරව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට එතැනින් එන ක්ෂය දීමනා ලබා දෙන අනුපාතය අනුව ඉදිරියේදී එය අඩු කර ගැනීමේ හැකියාවත් තිබෙනවා. මේක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබා දෙන ඉතාම හොඳ දිරිගැන්වීමක් වෙනවා.

ඊටත් අමතරව විශේෂයෙන්ම මෙතැනදී අපනයනකරුවන්ට තවත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. අපනයනකරුවන්ට මෙතෙක් තිබ්බ නීතිය අනුව ඒ අපනයන වෙනුවෙන් තමන් විදේශ රටකදී දරන වියදම තමන්ගේ ලාභය ගණනය කරන කටයුත්තේදී අඩු කරන්න අවස්ථාව තිබුණේ නැහැ. මෙන්න මේ නව සංශෝධනයත් එක්ක අපනයනකරුවෙකු තමන්ගේ අපනයන කටයුතු වෙනුවෙන් විදේශයකදී යම් වියදමක් දරනවා නම්, ඒ වියදම අඩු කර ගන්න අවශ්‍ය අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ඊටත් අමතරව හිඟ බදු සම්බන්ධයෙනුත් සුවිශේෂී අවස්ථාවක් මෙහිදී ලබා දෙනවා. ගරු කථානායකතුමනි, කවුරු හරි කෙනෙක් ගෙවිය යුතු ආදායම් බදු නියමිත දිනට ගෙවන්න අපොහොසත් වනවා නම්, ඒ ගෙවන්න අපොහොසත් වන හැම මාසයකටම සියයට 1.5ක පොලියක් - සරකට සියයට 18ක පොලියක් - එකතු වනවා. ඊට අමතරව දණ්ඩනයකුත් පැනවෙනවා. පසුගිය කාල වකවානුවලදී ගොඩක් ව්‍යවසායකයින්, මුලින්ම කොවිඩ් ව්‍යසනය තිබුණු කාලපරිච්ඡේදයේදී විවිධ අපහසුතාවන්ට පත් වුණා. ඊට අමතරව "දිට්වා" සුළි කුණාටු තත්ත්වය හේතුවෙන් විවිධ අපහසුතාවන්ට පත් වුණා. මෑත කාලීනව සිදු වන මැද පෙරදිග යුද්ධයත් එක්ක ඔවුන් විවිධ අර්බුදයන්ට මුහුණ දෙමින් තිබෙනවා. මෙන්න මේ සියලු කාරණා කටයුතු සලකා බලා මෙතෙක් ආදායම් බදු සහ අධිභාර සම්බන්ධයෙන් ඒ බද්ද ගෙවා නැති කෙනෙක් ඉන්නවා නම්, ඒ බදු ගෙවන්නා දෙපාර්තමේන්තුවට ඇවිල්ලා ඒ බදු මුදල මාස 6ක් ඇතුළත ගෙවනවා නම්, ඒ බදු ගෙවන්නාගේ සම්පූර්ණ පොලී ආදායම අහෝසි කරන්න පුළුවන් විධිවිධානයක් මේකේ ඇතුළත් වනවා. මේකෙන් බලාපොරොත්තු වන්නේ ඒ කර්මාන්තකරුවන්ට අවශ්‍ය බදු ගෙවීමේ හැකියාව ලබා දීලා, තමන්ගේ කර්මාන්ත ඉදිරියේදී වඩාත් හොඳින් වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමයි.

ඊටත් අමතරව තවත් විශේෂ කාරණා විශාල ප්‍රමාණයක් මේ පනත් කෙටුම්පතේ තිබෙනවා. මෙතැනින් ලබා දෙන තවත් සහනයක් තිබෙනවා. මෙතෙක් කල් පැවති නීතිය අනුව කවුරු හරි කෙනෙකුට හිඟ වැටුප් ලැබෙන අවස්ථාවකදී පවතින බද්දට තමයි එය යටත් වුණේ. මේ ප්‍රශ්නය ගොඩක් ආයතනවල මතු වෙලා තිබුණා. මොනවා හරි හේතුවක් හින්දා ඒ වැටුප මාසිකව ලැබෙන්නේ නැහැ. හැබැයි අවුරුද්දක්, දෙකක්, තුනක්, හතරක් ගිහිල්ලා පසුව විශාල මුදලක් එකවර ලැබෙනවා. එතකොට දැනට පවතින නීතිය අනුව ඒ වැටුප ලැබෙන වෙලාවේදී තමයි බද්දට යටත් වෙන්නේ. එතකොට ඒ වැටුප ලැබෙන කාලයේදී ලොකු බදු මුදලක් ඒ පුද්ගලයාට ගෙවන්න වෙනවා.

නමුත් ඒ අඩුපාඩුව හඳුනාගෙන මෙතැනදී සංශෝධනයක් ගෙන එනවා, ඒ වාගේ හිඟ වැටුප් ලැබෙන කෙනෙකුට ඒ වැටුප් ඒ ඒ වර්ෂයේදී ලැබුණාය කියලා සලකා ඒ අනුව ගෙවිය යුතු බදු මුදල තීරණය කරන්න. එතැනදී හිඟ වැටුප් ලැබෙන කෙනෙකුට විශාල සහනයක් ලැබෙනවා.

ඊට අමතරව අපි කවුරුත් දන්නවා, අප බලයට එන්න කලින් කාගේ හරි තැන්පතුවක් බැංකුවක තිබුණා නම්, ලැබෙන පොලිය

කීයක් වුණත් ඒ සියලුම තැන්පතු මුදල් වෙනුවෙන් සියයට 5ක රඳවා ගැනීමේ බද්දක් අය කළ බව. රඳවා ගැනීමේ බද්දක් සියලුදෙනාගෙන් අය කළා, පොලී මුදල කීයක් වුණත්. එහෙම තිබෙන ගමන් ඒකේම තවත් ප්‍රතිපාදනයක් තිබුණා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු කියන්නේ, වයස අවුරුදු 59ක් හෝ ඊට වැඩි පුද්ගලයෙකුට. ඒ අනුව ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකුට අඩු කරපු බදු මුදල අවුරුද්ද ඇතුළත රුපියල් 60,000ට වඩා අඩු නම් ආපසු ගෙවීමක් ලබා ගන්න හැකියාව තිබෙනවා. හැබැයි, ඔවුන් වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ ආපසු ගෙවීම ලබා ගන්න මේ වෙනකොට ඉල්ලීම් විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. හැබැයි, දැනට පවතින නීතිරීති අනුව ඒ ආපසු ගෙවීම ලබා දෙන්නේ ඔවුන් විගණනයට ලක් කරලා. ඒ ආපසු ගෙවීම ඉල්ලන පුද්ගලයන් documents විශාල ප්‍රමාණයක් දෙන්න ඕනෑ; දෙපාර්තමේන්තුවට කිහිප වරක් යන්න එන්න වෙනවා; ඒ විධියට, ඔවුන් විශාල කරදරයකට පත් වෙනවා. ඉතින්, මෙතැනදී ඒ කරුණු සලකා බලා ඒ වාගේ ආපසු ගෙවීම් ඉල්ලා තිබෙන අයට විගණනයකින් තොරව ඒ ඉල්ලන ආපසු ගෙවීම මාස තුනක් ඇතුළත ගෙවන්න අවශ්‍ය විධිවිධාන සලස්වා තිබෙනවා. ඒ කියන්නේ, පොලී ආදායම මත සියයට 5ක රඳවා ගැනීමේ බදු අඩු කරලා, ආපසු ගෙවීමක් ඉල්ලා තිබෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා කිසිම විගණනයකින් තොරව මාස තුනක් ඇතුළත ඒ ආපසු ගෙවීම ලබා දෙන්න අවශ්‍ය නීතිමය සංශෝධන මේ පනතට ඇතුළත් කරලා තිබෙනවා.

අපි දන්නවා, දැන් සේවා නියුක්ති ආදායමක් - employment income එකක් - තිබෙන ගොඩක් අය ඉන්න බව; වැටුපක් ලැබෙනවා. ඒ වාගේ වැටුපක් හිමි වන කෙනෙකුට ලැබෙන අනෙක් අමතර ආදායම්වල එකතුව රුපියල් 5,000ට වඩා අඩු නම්, අන්න ඒ අවස්ථාවේදී ආදායම් බදු ලිපි ගොනුවක් පවත්වාගෙන යන්න ඕනෑ නැහැ කියලා නීතිමය ප්‍රතිපාදනයක් මෙහි ඇතුළත් වෙනවා.

තවත් ප්‍රධාන කාරණයක් තමයි, නඩු පැවරීම්. මොකද, පසුගිය දවස්වල සමාජයේ විශාල කතිකාවක් ඇති වුණා, නඩු පැවරීම සම්බන්ධ විධිවිධාන ගැන. මේ විධිවිධාන ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, මේ පනත් කෙටුම්පත අපි ගැසට් කළාට පස්සේ මේකේ වගන්ති 6ක් සම්බන්ධයෙන් උසාවියේ - අධිකරණයේ- අභියෝගයට ලක් කළ බව. අන්න ඒ අවස්ථාවේදී කැබිනට් මණ්ඩලය එකඟ වුණා, කරුණු 3ක් සම්බන්ධයෙන්. ඒ අනුව රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් බදු අය කරන ආකාරය, thin capitalization - අරගෙන තිබෙන ණය අනුව ගෙවන පොලී මුදල් සම්බන්ධයෙන් - සහ documents ලබා දීම පිළිබඳව වන කරුණු 3 සම්බන්ධයෙන් වන වගන්ති 3 ඉවත් කර ගන්න එකඟ වෙනවා. ඊටත් අමතරව අධිකරණයෙන් අනෙක් වගන්ති 3 සම්බන්ධයෙන්; හිඟ බදු සම්බන්ධයෙන් නඩු පැවරීම පිළිබඳව විතරක් ඉතාම සුළු සංශෝධනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සංශෝධනයත් ඉදිරිපත් කරලා තමයි මේ පනත ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙන්නේ. අධිකරණය මේ සම්බන්ධයෙන් වෙන කිසිම දැනුම් දීමක් කරලා නැහැ.

ඊට අමතරව පෞද්ගලික වාහනයක් තිබෙන කෙනෙකු ඒ වාහනය විකුණන වෙලාවේදී ඒකෙන් ලැබෙන capital gain එක, ආදායම් බද්දෙන් නිදහස් කරනවා. කලින් තිබුණු පනතේ ඒක නිශ්චිත වෙලා තිබුණේ නැහැ. ඒක මෙහි නිශ්චිතව දක්වා තිබෙනවා.

ඊටත් අමතරව මම මේ වෙලාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ, Withholding Tax සම්බන්ධයෙන්. අපේ නව රජය පත් වුණාට පස්සේ පළමුවැනි අය වැයෙන්ම ඉදිරිපත් කළා, රඳවා ගැනීමේ බදු - Withholding Tax - සම්බන්ධයෙන්. කලින් පොලී මුදල් මත සියයට 5ක ආදායම් බද්දක් සියලුදෙනාගෙන් අය කළා. අපි සියයට 10ක ප්‍රමාණයට එය වැඩි කළා. හැබැයි, ඒ සියයට 10 අය කරන්නේ බදු ගෙවන අයගෙන් විතරයි. අන්න ඒකට අදාළව ස්වයං ප්‍රකාශයක් දෙන්න ඕනෑ. ඒ ප්‍රකාශයට අදාළ නීතිමය විධිවිධාන මෙහි ඇතුළත් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ වෙලාවේදී මට කියන්න තිබෙන්නේ මෙකයි. අපි මේ සියලු කාරණා ඇතුළත් කිරීමෙන් අවසානයේදී බලාපොරොත්තු වෙන්නේ රටේ පවතින බදු ක්‍රමය ජාත්‍යන්තරව පිළිගත් බදු ප්‍රතිපත්තීන්ට, බදු මූලධර්මයන්ට අනුකූලව ගැළපීම, එලෙස ගැළපීම තුළ බදු පදනම වැඩි කර ගැනීම සහ බදු අනුකූලතාව වැඩි කර ගැනීමයි. ඒ කරුණු අනුව මෙතෙක් පැවැති කිසිම රජයකට හැකියාව ලැබුණේ නැති වුණත් ඉතිහාසයේ පළමුවැනි වතාවට 2025 අවුරුද්දේදී අපි වැඩිම බදු ආදායම රැස් කර ගත්තා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 2,402ක ඉලක්කගත ආදායමට වඩා රුපියල් බිලියන 41කට වැඩි බදු ආදායමක් රැස් කර ගන්න සමත් වෙනවා. හැබැයි, ඒ බදු ආදායම රැස් කර ගන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් වෙන්නේ ඊට කලින් පැවති බදු නීති ඇතුළේ යම් සහන ලබා දීම නිසායි. නමුත්, ඒ බදු සහන ලබා දී තිබෙන්නේ රුපියල් බිලියන 100ක වාගේ අවාසියක් සිදු වන පැත්තටයි. ඒ වාගේ සහන ලබා දීම තුළත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉතිහාසයේ පළමුවැනි වතාවට වැඩිම ඉලක්කගත ආදායමට වඩා රුපියල් බිලියන 41කට වැඩි බදු ආදායමක් රැස් කර ගන්න සමත් වෙනවා. ඊට අමතරව පොදුවේ ගත්තාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව රැස් කරපු ආදායම් තුළින් ඉතිහාසයේ පළමුවැනි වතාවට රජයක් අය වැයකින් ඇස්තමේන්තු කරපු ආදායමට වඩා එහාට ගිය ආදායමක් ලබා ගන්න අපට හැකියාව ලැබෙනවා කියන කාරණය මතක් කරමින්, මගේ කරුණු දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Kabir Hashim. You have 14 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[අ.භා. 12.02]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Speaker, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂය වෙනුවෙන් මම කථා කිරීමට බලාපොරොත්තු වෙනවා.

[ගරු කබීර් හෂීම් මහතා]

රටක සාර්ථක බදු ක්‍රමයක් පදනම් වෙන්නේ මර්දනය හෝ බලහත්කාරකම් මත නොවෙයි. සාර්ථක බදු ක්‍රමයක් ඇත්තටම පදනම් වෙන්නේ විශ්වාසය, සාධාරණත්වය, විශ්වසනීයත්වය සහ ශක්තිමත් සමාජ සම්මුතියක් මතයි. ඒ සමාජ සම්මුතිය ඉතාම වැදගත්. ඒකට හොඳම උදාහරණයක් තිබෙනවා. 1977 කාලයෙන් පසුව 1994 දක්වා මේ රටේ ඒ වාගේ සමාජ සම්මුතියක් ආණ්ඩුව සහ ජනතාව අතර තිබුණා. ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස සහ ඩී.බී. විජේතුංග හිටපු ජනාධිපතිතුමන්ලාගේ කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 22ක් දක්වා වැඩි වුණා. ඒ කියන්නේ, සිංගප්පූරුව, මලයාසියාව සහ තායිලන්තය වාගේ දියුණු රටවල් හා සමාන වන මට්ටමකට අපේ රට පත් වුණා. ඒ කාල පරිච්ඡේදය තුළ කෝටිපති ව්‍යාපාරිකයින්ගෙන්, විශාල සමාගම්වලින් සහ ධනපතියන්ගෙන් තමයි මේ බදු මුදල් අය කළේ. මොකද, ඒ කාලයේ VAT කියලා දෙයක් තිබුණේ නැහැ. ඒ වාගේම දුප්පත් මිනිස්සුන්ගෙන් බදු අය කරන්න කටයුතු කළේත් නැහැ. මහා පරිමාණ ව්‍යාපාරිකයින්ගෙන් තමයි මේ බද්ද අය කළේ. සියයට 22ක් කියන්නේ, ලොකු ප්‍රමාණයක්. ඒ රුපියල් කෝටි ගණන එකතු කරලා, සමාජ සම්මුතිය හරහා මේ රට තුළ දැවැන්ත සංවර්ධනයක් වාගේම විශාල සුබසාධන වැඩ පිළිවෙළක්ද ක්‍රියාත්මක කළා.

ඔබතුමන්ලාට මතක ඇති, ඒ මුදලින් පාසල් යන සියලුම දරුවන්ට පාසල් පොත්, නිල ඇඳුම් සහ දිවා ආහාරය ලබා දුන් බව. ඒ වාගේම සෑම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුටම මහපොළ ශිෂ්‍යාධාරය ලබා දුන්නා. දුප්පත් මිනිස්සු වෙනුවෙන් "ජනසවිය" වැඩසටහන ක්‍රියාත්මක කළා. ඒ වාගේම නිවාස නැති හැම පවුලකටම නිවසක් ලබා දීම සඳහා නිවාස දසලක්ෂයේ වැඩසටහන ක්‍රියාත්මක කළා. හැබැයි, ඒ වැඩසටහන නවත්වන්නත් මූලික වුණේ ජනතා විමුක්ති පෙරමුණයි. මොකද, ජනතා විමුක්ති පෙරමුණ 1994 වෙනකොට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය එක්ක ඩීල් එකක් දමාගෙන ඒ පැත්තට ගිහිල්ලා ඒ ආණ්ඩුව පෙරළන්න උදව්වු කළා. ඊට පස්සේ 2005දී මහින්ද රාජපක්ෂ මැතිතුමා එක්ක එකතු වෙලා ආණ්ඩුව පෙරළලා ඒ ආණ්ඩුවට ජනතා විමුක්ති පෙරමුණ උදව්වු කළා. ඒ කාල පරිච්ඡේදයේදී තමයි මේ රටේ රාජ්‍ය ආදායම අඩු වෙන්න පටන් ගත්තේ. අන්තිමට රාජ්‍ය ආදායම සියයට 7කට අඩු වුණා. ඊට පස්සේ අපේ රට බංකොලොත් වුණා. ඇත්තටම ඒකට තමයි 76 ශාපය කියලා කියන්නේ.

රටක නීතිය සහ ආධිපත්‍යය රජ වෙන්නේත්, පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේත් ඇත්තවශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ජීවමානව පවතින තාක්කල් පමණයි. බලතල බෙදී යෑමේ මූලධර්මය මතයි ප්‍රජාතන්ත්‍රවාදය රැකෙන්නේ. ඒ කියන්නේ විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය ස්වාධීන විය යුතුයි. නීති හැදීම, නීති ක්‍රියාත්මක කිරීම සහ දඬුවම් දීම එකම පාර්ශ්වයකට පැවරුණොත් ඒකෙන් බිහි වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි ඒකාධිපතිවාදයයි.

මේ යෝජිත දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත හරහා බදු ගෙවන්නාගේ සහ මේ රටේ පුරවැසියාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ නීතියේ අයිතීන් උල්ලංඝනය වීමක් සිදු වන බව තමයි අපි නම් දකින්නේ. ඒක නිසා අපට මේ ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේකට අවශ්‍ය සංශෝධන ඇතුළත් කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

Hon. Deputy Speaker, with regard to the Inland Revenue (Amendment) Bill that has been submitted, several significant amendments have been brought in. There were five petitions to the Supreme Court on the Bill. A few Clauses were withdrawn including Clause 28. We thank the Government for withdrawing Clause 28.

However, today, my focus is on Clauses 31(4) and 34. Clause 31(4) proposes new Sections 163(4A) to (4H). I believe the Government is going to amend it. I do not know whether that amendment is coming in. Clause 31(4) empowers the Commissioner-General to issue a certificate of default to the Magistrate's Court, wherein the tax in default is considered a fine for a criminal offence. Furthermore, Section 163(4C) even bars the Magistrate from questioning the correctness of the certificate. There, the power of the Judiciary is taken out and that is not separation of powers. Further, under Section 163(4H), even if an appeal is pending, a certificate is treated as conclusive evidence. So, that is a draconian piece of legislation. The Court held that that is arbitrary, irrational and contrary to Article 12(1) of the Constitution. Therefore, they said it has to be amended, if it is going to be passed by simple majority. I believe the Government would amend it; I hope the Government would actually look at amending this Clause.

The more controversial, harsh and draconian provision is Clause 34 that brings in the insertion of Section 185A, which criminalizes the failure to file returns. In which country do you see it, criminalizing the failure to file returns? On top of that, it criminalizes a delay for registration of a TIN. සාමාන්‍යයෙන් මේ රටේ පුරවැසියන්, මේ රටේ තරුණ පරම්පරාව, YouTubersලා ව්‍යාපාර කරනවා. Bitcoin වාගේ ව්‍යාපාර කරනවා. ඒගොල්ලන් Internet එකෙන් සල්ලි හම්බ කරනවා. අලුත් ව්‍යාපාර පටන් ගන්නවා. හැබැයි, ඒගොල්ලන් සමහර වෙලාවට TIN එකක් අරගෙන නැහැ. ඒ වාගේ, ගමේ පොඩි ළමයෙකු, තරුණයෙකු TIN එකක් ගත්තේ නැත්නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා නඩු දාලා, ඒක අපරාධ දඬුවමක් බවට පත් කරලා, මාස හයකට හිරේ දාන්න පුළුවන්. දෙමව්පියන්ගේ දරුවන්ට අද සුරක්ෂිතතාවක් නැහැ. මේක තමයි ඔබතුමන්ලා ගෙනෙන නීතියේ ඇත්ත තත්ත්වය. If you do not appear before the Commission, that is a criminal offence and you could be jailed.

With regard to conviction with fines and imprisonment, the Court rejected the challenge to Clause 34, which criminalize compliance failure. Compliance failure is a very scary thing. The Court only looks at constitutional inconsistency and also at legal infringement because they look through a narrow window. That is, the court's issue. But, policymakers - the parliamentarians and the Government - have to look beyond it. When you bring in a new law, you have to look at what its economic impact, the social impact, the democratic impact and the impacts on the people are and whether it harasses people.

For example, look at the Central Bank Act of 2023. When it was brought in, economists and policy analysts identified several critical shortcomings in how the Government evaluated the Bill's framework. The primary critique raised by economists was that the Supreme Court focused heavily on narrow constitutional legality and procedural consistencies rather than the *de facto* operational and macroeconomic risks embedded in the

new structural framework. It is the same with this Inland Revenue (Amendment) Bill. The Court did not look beyond the constitutional inconsistencies. But, as policymakers, we need to look into it more and this Government has not looked beyond its nose. Therefore, this is a very dangerous piece of legislation.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය එක රැයකින් ඒකාධිපතිවාදයක් බවට පත් වෙන්නේ නැහැ. එය පරිපාලන පහසුව මුවාවෙන් පියවරෙන් පියවර ඛාදනය වෙනවා. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතේ 185ඒ වගන්තිය මඟින් පුරවැසියා සහ රාජ්‍යය අතර පවතින සන්ධානය දැවැන්ත වෙනසකට තල්ලු වෙන බවයි අපේ හැඟීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය හුදු සුළු පනත් සංශෝධනයක් නොවෙයි. මෙයින් රාජ්‍ය පාලනයේ දාර්ශනික මාරුවක් සිදු වෙනවා. යෝජිත ප්‍රතිපාදන අනුව වාර්තා ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම අපරාධ දඩුවමක් බවට පත් වෙනවා. ලියාපදිංචි වීමට අපොහොසත් වී තරුණයෙකු TIN එක ගත්තේ නැත්නම්, ඒක පමණක් ඇති, මාස හයකට හිරේ යවන්න. ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම අපරාධ දඩුවමක් බවට පත් වෙනවා. මේ යනාදී සියල්ල ගත්තාම මේ නීතිය භයානක, මර්දනකාරී නීතියක් බවට පත් වෙනවා. මේක ගැන කථා කරන්න ගොඩාක් කරුණු තිබුණාට වේලාව මදි නිසා මම ඒ හැම කාරණයක්ම කියන්නේ නැහැ.

ප්‍රමාද වී ගොනු කිරීමක් බලපෑමක් බවටත්, පරිපාලනමය අතපසු වීමක් අපරාධ ගොනුවක් බවටත්, තාක්ෂණික උල්ලංඝනයක් දේශපාලන ආයුධයක් බවටත් මේ පනතින් පත්විය හැකි නම්, මෙය ජනතා හිතෛෂී පනතක්ද, නැත්නම් ජනතා මර්දනකාරී පනතක්ද කියන එක මේ ආණ්ඩුව හිතන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජේවීපී රජය බලයට ඇවිල්ලා වසරක් පහුවෙලා ඉවරයි; දැන් වසර එකහමාරක් වෙනවා. System change එකක් ගේන්න හැදුවා, ඒක ෆේල්. ඩිජිටල්කරණය ගේන්න හැදුවා, ඒකත් ෆේල්. මාෆියාව කඩනවා කිව්වා, ඒකත් ෆේල්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නවීකරණය කරනවා කිව්වා, ඒකත් ෆේල්. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ජේවීපී ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, 2වැනි ඡේදයේ ආර්ථික න්‍යාය යටතේ රාජ්‍ය මූල්‍ය, රාජ්‍ය ආදායම්, ආයතනික ඩිජිටල්කරණය පිළිබඳව කථා කරනකොට කියා තිබෙනවා, තරුණ වෘත්තිකයන් 3,000ක් බඳවා ගන්නවා කියලා, the recruitment of 3,000 professionals. රාජ්‍ය ආදායම් උපයන ආයතනවල කාර්යක්ෂමතාව උපරිම කිරීම සහ එම ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා රජය විසින් ගණකාධිකාරීවරුන්, නීති විශේෂඥයන් සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් 3,000ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බඳවා ගෙන එහි කාර්යක්ෂමතාව වැඩි කරනවාය කියලා තිබෙනවා. ඒක ඔබතුමන්ලා කරලා නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ කොතැනකවත්. හැබැයි, ගේන්නේ වෙන පනතක්. ඔබතුමන්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ශක්තිය නවීකරණය කරලා නැහැ. අවශ්‍ය software එක, ඒ කියන්නේ Revenue Administration Management Information System එක, මෘදුකාංග පද්ධතිය දියුණු කරන්නත්, තවත් ශක්තිමත් කරන්නත්, ඒ හරහා බදු නොගෙවන ලොකු ඩීල්කාරයන්ගේ සල්ලි එකතු කරන්නත් ඔබතුමන්ලා පොරොන්දු වුණා. RAMIS එක දියුණු කරලා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, රේගු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව එකතු කරගෙන මේ leakage එක නවත්වන්න කටයුතු කරනවා කියලා පොරොන්දු වුණා. ඒ එක දෙයක්වත් කර නැහැ. IRD එක තුළ තිබෙන ප්‍රශ්න එකකටවත් අත තියලාවත් නැහැ. ඒක ගැන මට කථා කරන්න වෙලාව මදි. ඒ නිසා මම මේ වෙලාවේ ඒ තොරතුරු ඔක්කොම කියන්නේ නැහැ. දැන් IMF එකේ බලපෑමට; IMF එක ඔබතුමන්ලාගේ රාජ්‍ය ආදායම වැඩි කරන්න කියන නිසා දරදඬු, මර්දනකාරී නීති හරහා මේ රටේ පුරවැසියන් සිර දඬුවමට ලක් කරන්න, බලෙන් බදු අය කරන්න නීතියක් ගෙනෙන කොට අපට ඒකට එකඟ වෙන්න බැහැ.

ශ්‍රී ලංකාව IMF එකත් එක්ක 17වැනි ගිවිසුම අත්සන් කරනකොට එහි එක බරපතළ කොන්දේසියක් තිබුණා. ඒ කොන්දේසිය තමයි, උපරිම බදු අය කිරීම හරහා රාජ්‍ය ආදායම වැඩි කරන්න කියන එක. දැන් IMF එක කියපු ඒ කාරණය භාවිත කරලා මේ රටේ මිනිස්සුන්ව හිර කරන්න බලනවා. ඒ අනුව දේශීය ව්‍යාපාරිකයා, කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයා, තරුණ ව්‍යවසායකයා, පොදු ජනයා මේ අපරාධ නීතියට යටත් වෙන බව තමයි අපට පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා මේ බදු අය කරගන්න අපොහොසත් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුවේ කාර්යක්ෂමතාව, ක්‍රියාකාරිත්වය දුර්වලයි. මම ඒක පෙන්වලා දෙන්නම්. මේ රටේ විශාලතම බදු පැහැර හරින්නන් කවුද? මහා පරිමාණයේ සමාගම් සහ කෝටිපතියන්; කැසිනෝ වාගේ සමාගම්. ඔබතුමන්ලා පොරොන්දු වුණා ඒ සල්ලි ඔබතුමන්ලා උපයනවා කියලා. හරියට උගන්ඩාවෙන් සල්ලි ගෙනෙනවා කිව්වා වාගේ. ලෝකයේ ප්‍රමිතියක් තිබෙනවා, සමාගම් බදු අය කිරීම සම්බන්ධයෙන්. එම ප්‍රමිතිය අනුව සමාගම් බදු දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.5ක් එකතු කළ යුතුයි. හැබැයි, 2025දී ඔබතුමන්ලා සමාගම් හරහා එකතු කරපු ප්‍රමාණය සියයට 2යි. ඒ කියන්නේ, සමාගම්වලින් අය කළ යුතු බදු ප්‍රමාණය ඔබතුමන්ලා එකතු කරලා නැහැ. ඒගොල්ලන්ගේ මාෆියාව ඔබතුමන්ලා කඩලා නැහැ.

ඊළඟට Corporate Tax exemptions, ඒ කියන්නේ සමාගම්වලට දුන් සහන පිළිබඳව බැලුවොත්, 2022 වෙනකොට දීපු බදු සහනවලට අදාළව රුපියල් බිලියන 978ක් එකතු කරන්න තිබෙනවා. ඔබතුමන්ලා පොරොන්දු වුණා ඒ බදු මුදල් එකතු කරනවා කියලා. ඒ කියන්නේ, US Dollars 2.7 billion. මේක නවත්වන්නේ නැතුව, මේ මුදල් අය කරන්නේ නැතුව 2025දී ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ තවත් සමාගම් හතරකට බදු සහන දුන්නා. සමාගම්වලට බදු සහන දෙන්න පුළුවන්. හැබැයි, මිනිස්සුන්ට අපරාධ නීතිය ගේනවා. ඔබතුමන්ලා කොහේද ඉන්නේ? මේ, ජනතා හිතෛෂී ආණ්ඩුවක්ද? ජනතා ආණ්ඩුවක්ද මේක? ඊළඟට, හිඟ බදු මුදල් - arrears - එකතු කිරීම ගත්තොත්, විශාල arrears එකක් තිබෙනවා. ඒ ටික ගන්නවා කිව්වා. ඔබතුමන්ලා පොරොන්දු වුණා ඒ මාෆියාවලින් ඒ සල්ලි ගන්නවා කියලා. 2023 වෙනකොට මේ රටේ හිඟ බදු මුදල රුපියල් ට්‍රිලියන 1.6යි. ඒ කියන්නේ, ඩොලර් බිලියන 3.5යි. An amount equivalent to half of our foreign exchange reserves or US Dollars 3.56 billion is in arrears. ඒක එකතු කරලා නැහැ.

ඊළඟට, VAT ගැන බලමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, VAT ගෙවන්නේ බහුතරයක් දුප්පත් මිනිස්සු නේ. එතකොට විගණකාධිපතිතුමාගේ 2023 වාර්තාව අනුව VAT එකේ හිඟ මුදල රුපියල් බිලියන 369යි. ඒ, හිඟ මුදල. ඒ කියන්නේ, US Dollars 1.23 billion. විගණකාධිපතිතුමාගේ වාර්තාවේ highlight කරනවා, මේ මුදල් පාරිභෝගිකයාගෙන් අය කරලා ඉවරයි කියලා. ඒ කියන්නේ අපේ කිරි පැකට් එකට, අපේ සපත්තුවලට, සෙරෙප්පුවලට, පොත්වලට,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, your time is up.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Please give me two more minutes, Sir.

අප ගන්නා බෙහෙත්වලට, පොත්පත්වලට පාරිභෝගිකයන් හැටියට මේ රටේ දුප්පත් මිනිස්සු රුපියල් බිලියන 369ක් ගෙවලා ඉවරයි, පුද්ගලික සමාගම්වලට. ඒකවත් ඔබතුමන්ලා දැන් recover කරගෙන නැහැ. ඒක නොකර ඇවිල්ලා දානවා අපරාධ නීතියක්. එහෙම නම්, මේක සාධාරණද? ඒ විගණනය අනුව, නඩු 46ක් තිබුණා. ඒ නඩු 46න් රුපියල් මිලියන 296ක් ලබා ගත යුතුයි. හැබැයි, ඒ files ටික missing. එතකොට, ඒ ටික ඔබතුමන්ලා අරගෙන නැහැ. ඉතින් ඔබතුමන්ලාගේ නොහැකියාව, ඔබතුමන්ලාගේ දුර්වලකම නිසා ඔබතුමන්ලාට ආදායම එකතු කරන්න බැරි වනකොට, IMF එක ඔබතුමන්ලාගේ ඇඟට පනින කොට ඔබතුමන්ලා අපරාධ නීතිය ගෙනැල්ලා, මේ රටේ පොඩි මිනිස්සුන්ට, මේ රටේ හැදෙන්න පුළුවන් ව්‍යවසායකයන්ට අවස්ථාව නැති කරලා, බය කරලා ඔවුන්ගේ උත්සාහය නැති කරනවා. මේක බරපතළයි.

I think Clause 34 which introduces Section 185A is a draconian piece of legislation, Hon. Minister. So, think of that. This is not the way it is done. Tax compliance is a social contract with the people. You do not collect taxes forcing people, aiming the barrel of a gun. That is not the way it is done. This is bad for our country.

Then, you are trying to bring in investments. මම දැක්කා, හඳුන්නෙත්ති ඇමතිතුමා ගිය සතියේ National SME Strategy Framework එක launch කරනවා, US Dollars 300 billion target එකකට යන්න. ඒක launch කරද්දී, World Bank එක survey එකකින් පැහැදිලිව කියන්නේ මොකක්ද? ව්‍යාපාරිකයන්ට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි බදු අය කිරීම සහ බදු පරිපාලන ක්‍රමය. දැන් මේක අස්සේ ඔබතුමන්ලා අපරාධ නීතිය ගෙනෙනවා. ඔබතුමන්ලා මේ මොකක්ද කරන්නේ? Consistency එකක් තිබෙනවාද? එක පැත්තකින් SME strategy එකක් දාලා ඊළඟ සතියේ මෙහේට ගේනවා පනත් කෙටුම්පතක්; ව්‍යාපාරිකයන් බය කරවන පනත් කෙටුම්පතක්. මේ ආණ්ඩුව කොහේද යන්නේ කියලා මේ ආණ්ඩුවටම තේරෙන්නේ නැහැ. මේ ගැන ගොඩක් දේවල් කථා කරන්න තිබෙනවා. නැවතත්, අපි විපක්ෂය හැටියට රජයෙන් ඉල්ලනවා, Clause 34, introducing Section 185A, amend කරන්න කියලා. ඒක මේ රටට වැදගත් දෙයක් බව කියා සිටිමින් මම නිහඬ වෙනවා.

ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chathuranga Abeysinghe, you have 11 minutes.

[අ.භා. 12.19]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පතේ හරය සම්පූර්ණයෙන්ම මහ හැරලා පොඩි වේදනාකාරී ස්වරූපයකින් කථා කළා. මට හිතෙනවා මෙච්චර කාලයක් අපේ රටේ දේශපාලනය කරපු අයට අරමුදල් සපයපු අය ගැන දුක හිතිලා කථා කළාද කියලා. මොකද, මේ පනත් කෙටුම්පතේ සඳහන්, 'වාර්තා ආදියට අදාළ වැරදි සඳහා නඩු පැවරීම' ගැන එතුමා කථා කළා. එහි සඳහන් ක්‍රමයට කටයුතු නොකිරීම, එහෙම නැත්නම් ඒක අපරාධ වරදක් බවට පත් කරන්නත්, ඒ වාගේම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මේ පිළිබඳ අවසාන තීරණය ලබා දීමටත් ගත්තු තීරණය ගැන තමයි ඔය කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු නැවත අය කර ගන්න ගියාම බදුවලට assessments issue කළාම, ඒවා පිළිගන්න තැනක් මේ දක්වා තිබුණේ නැහැ. අධිකරණයට ඒවා පිළිගන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඒගොල්ලෝ නඩු බොරුවට ඇදගෙන යනවා අවුරුදු 10, 15. ඔය කියපු සියලු දෙනාගේ නඩු files සම්බන්ධයෙන් නඩු දාලා තිබෙන්නේ; ඒවාට action අරගෙනයි තිබෙන්නේ. නමුත් අපට ක්‍රියාත්මක කරන්න ක්‍රියාවලියක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි මේ වෙනස වෙන්නේ. අපි ව්‍යවසායකත්වයට යන්නේ ඉතාම සංවිධිත ආකාරයෙන්. අසංවිධිත ව්‍යවසායකත්වය සංවිධිත ව්‍යවසායකත්වය බවට පත් කරනවා. එතකොට අපේ රටේ බදු ගෙවන මිනිසුන්ට, සද්භාවයෙන් මේකට මැදිහත් වෙන මිනිසුන්ට කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. නමුත් හොරු නම් බය වෙන්න ඕනෑ. ඒක තමයි ඇත්ත. මොකද, මේ කියන විධියට යම්කිසි බදු file එකක් දුන්නේ නැත්නම් ඒකේ යම්කිසි අඩු පාඩුවක් තිබෙනවා නම්, මුලින්ම Inland Revenue Department එකෙන් ඒ අදාළ පුද්ගලයාට කියනවා, 'ඔබේ මෙහෙම අඩුපාඩුවක් තියෙනවා; ඒක හදා ගන්න' කියලා. ඒකට කාලයක් දෙනවා. ඊළඟට, ඒ අඩු පාඩුව සම්බන්ධයෙන් කරුණු දක්වන්න කාලයක් දෙනවා. ඊට පස්සේ තමයි මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන්න යන්නේ. මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරුවාට පස්සේ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් මේකට Show Cause Order එකක් දෙනවා; මේකට සාධාරණ හේතු තියෙනවා නම් ඇවිල්ලා කියන්න කියනවා. එතකොට තක්කඩි හොරුන්ට නම් ඒවා කියා ගන්න බැරි වෙයි. අපට ඒකට කරන්න දෙයක් නැහැ. අපි මේක ආපස්සට ගන්නේත් නැහැ.

විශේෂයෙන්ම මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමාගේ කථාව බලන්න. එතුමා කිව්වා 1990දී මෙච්චර ගාණක් බදු එකතු කළා, අන්තිමට 8.5ට වැටුණා කියලා. ඒක ඇත්ත. ඒ වුණාට දැන් ඒ කථා කරපු මහත්මයාගේ ආණ්ඩුවේ ආර්ථික ඔස්තාර්ලා තමයි, 2015 ඉඳලා 2019 වනකල් බදු එකතු කළේ. පසුගිය අවුරුදු එකහමාර තුළ අප කරපු දේවලින් දශමයක්වත් කර ගන්න ඒ කාලයේ බැරි වුණා. අප කරපු දේවලින් දශමයක්වත් කර ගන්න ඒ කාලයේ බැරි වුණා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු මන්ත්‍රීතුමා, මේක මගේ වේලාව.

ඊළඟට කිව්වා, RAMIS එක ගැන. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, you can have time after he finishes. - *[Interruption..]* Hon. Chathuranga Abeysinghe, you may continue.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
මම කාගේවත් නමක් සඳහන් කළේ නැහැ. මට කථා කරන්න දෙන්න.

මේ වනකොට RAMIS එකට සියලු පද්ධති ඒකාබද්ධ කරලායි තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will give you time after the Hon. Deputy Minister finishes.

ගරු කබීර් හෂීම් මහතා
(මාණ්පුමිකු கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
I want to ask him something, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, would you let him ask something? - *[Interruption.]*

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
No, Sir. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon.Chathuranga Abeysinghe, you may continue and wind up. - *[Interruption.]*

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
No, I do not have enough time. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He does not wish to be distrubed. - *[Interruption.]*

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
ඔයයි, ඔයයි. ඔබතුමාට ඔයයි. අම්මෝ! ඔයයි! ඉඳගන්න. හොරුන්, තක්කඩින් වෙනුවෙන් ඔබතුමා කථා කරපු එකට අපි ඔයයි. *[බාධා කිරීමක්]* මොකද දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* කලබල වෙන්න එපා ඉතින්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, I will give you a minute after the Hon. Deputy Minister finishes.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
දැන් මේ නොහැකියාවයි කියන්නේ. 2025 වසරේදී තමයි සියයට දහසයයි දශම,- *[බාධා කිරීමක්]* ඔබතුමාට දුකයි නේද, ඉරාන් වික්‍රමරත්නව ගත්තාට?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අනේ, නැහැ.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
එහෙම නම්, කට වහගෙන ඉන්න. *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
මෙතැනින් එහාට නීතිය ශක්තිමත් කරන කොට මේගොල්ලෝ කලබල වන එක සාමාන්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, what is your point of Order?

ගරු චතුරංග අබේසිංහ මහතා
(මාණ්පුමිකු சதුරංක අපේසිංහ)
(The Hon. Chathuranga Abeysinghe)
දැන් රවී කරුණානායක මන්ත්‍රීතුමාත් නැඟිට්ටා. මම දන්නවා, ඒ වාගේ නඩු ගොඩක් තිබෙනවා කියලා. ඒ නිසා කලබල වෙන්න එපා. මේ පනත් කෙටුම්පත ඉතාම සාධාරණව ගෙනැල්ලා තිබෙනවා. මෙතැනින් එහාට Inland Revenue Department එක කිව්වාම, "මෙයා බදු ගෙවලා නැති එක්කෙනෙක්" කියලා, ඒක අධිකරණය පිළිගන්නවා. ඒක තමයි ඇත්ත කථාව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will give you time after the Hon. Deputy Minister finishes.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
2025දී තමයි කාර්යක්ෂම බදු එකතු කිරීමක් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියපු නැති කාරණා ටිකක් මම දැන් කියන්නම්.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, what is your point of Order?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, when a Member is referred to, it is nothing but courtesy to allow him to immediately respond and not at the end of that particular speech; he has got to be heard at that particular moment. Otherwise, it would be character assassination that goes on.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Deputy Minister does not wish to be disturbed. - *[Interruption.]* Okay, I will give you 30 seconds and you finish up what you have to say.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Thank you, Sir.

Hon. Deputy Minster, it could be a misrepresentation because you said that our Government was in power from 2015. During that period, actually, the tax-to-GDP ratio started rising. So, we did our job.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Okay, I will accept that correction. - *[Interruption.]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Kabir Hashim, it does not refer to you personally.

Hon. Chathuranga Abeysinghe, you may continue.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔන්න මා දැන් ඊළඟට කියන ඒවා එකක්වත් මේගොල්ලන් කරලා තිබුණේ නැහැ. මම ඒ ගැන කියන්නම්. අප කරන්නේ ලංකාව මෙතැනින් එහාට ගෙන යන එකයි. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් හදන්න, මේකේ සාධාරණත්වය ඇති කරන්න, බදු ගෙවන්නන්ගේ පදනම ශක්තිමත් කරන්න අපි කටයුතු කරනවා. 2015-2019 කාලයේ මෙවායින් එකක් හරි කරලා තිබෙනවා නම්, ඔබතුමාට ආයෙත් නැඟිටලා කියන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. පෞද්ගලික වාහන - motor vehicles - විකුණන කොට අධිභාරයක්, එහෙම නැත්නම් Capital Gain Tax එකක් අය කරන තත්ත්වයක් තිබුණා. මේ පනත යටතේ අපි ඒක ඉවත් කරලා තිබෙනවා.

ඊළඟට, donations and gifts, Governmentඑකට, universitiesවලට දුන්නොත් ඒවාට බදු ගණනය කිරීමක් තිබුණා. දැන් අපි ඒක නැති කරලා තිබෙනවා. ඊට පස්සේ "දිවිවා" තත්ත්වය යටතේ කවුරු හරි donation කළා නම් ඒක allowable expense එකක් කරලා තිබෙනවා, ඉස්සරහට carry forward කරන්න පුළුවන් තත්ත්වයක් ලබා දීලා තිබෙනවා. මොකද, ඒ ආධාර දෙන්නේ රටේ අවශ්‍යතාවකට නිසා. ඊළඟට, life insurancesවල කෙනෙක් මිය ගියාම ලැබෙන මුදලට, ඒක surrender වෙනකොට තිබුණු මුදලට, maturity එකේදී ලැබෙන මුදලට tax වෙන තත්ත්වයක් තිබුණා. අපි දැන් ඒක පැහැදිලි කරලා අයින් කරලා තිබෙනවා.

ඊළඟට, interest income එක රුපියල් 5,000ට අඩුයි නම්, individual salary earner කෙනෙක් salary විතරක් නම් ගන්නේ income tax file එකක් අවශ්‍ය නැහැ කියලා අපි මේකේ පැහැදිලි කරලා තිබෙනවා. ඊළඟට, senior citizensලාගේ අවශ්‍යතාවට online වාගේම භෞතිකවත් දැන් tax filing කරන්න පුළුවන් අවස්ථාවක් අපි දීලා තිබෙනවා. ඒ වාගේම කාට හරි salary arrears එකක් ලැබෙනවා නම් ඒකට tax credit එකක් දීලා තිබෙනවා. ඒ වාගේම තනි පුද්ගලයෙක් individual tax filing එකේදී ගිය අවුරුද්දට වැඩිය සියයට 120ක් බදු මේ අවුරුද්දේ ගෙවලා තිබෙනවා නම් එයාව assessmentsවලින් නිදහස් කරලා තිබෙනවා; එයාට අපි ආපහු වද දෙන්නේ නැහැ. ඒ වාගේ වෙනස්කම් කරලා තිබෙනවා තනි පුද්ගලයකුගේ පැත්තෙන් ගත්තාම.

දැන් මම කියන්නම්, ආයෝජකයෝ ගැන. කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඇහුවා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට කරලා තිබෙන දේවල් ගැන. විශේෂයෙන්ම fair playing field එකක් හදලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී බදු ගෙවන ආයතනවලට අහේනියකුත්, බදු නොගෙවන ආයතනවලට වාසියකුත් වෙලා තිබෙනවා. ඒක වෙනස් කරලා තිබෙනවා. දැන් ලක්ෂ 5ට වැඩි ගෙවීම් online ක්‍රමයට හෝ චෙක්පතකින් කළේ නැත්නම් ඒක disallowable expense එකක් වෙනවා. ඒක නිසා මෙතැනින් පස්සේ ව්‍යාපාර cashවලින් වියදම් කරලා තිබුණොත් ඒක disallow වෙනවා tax expenditure calculation එකේදි.

ඊළඟට, thin capitalization එක ගැන ගැටලුවක් ඇවිල්ලා තිබුණා පසුගිය කාලයේ අර්බුදය නිසා. ඒක ගැන ඉල්ලීමක් තිබුණා. ඒ නිසා ඒ thin capitalization recommendation එක අපි මේ පනතින් අයින් කළා. ඊළඟට, investor visa ලැබුණාට පස්සේ ඒ ආයෝජකයා ලංකාවේ citizen කෙනෙකු විධියට අරගෙන වෙනත් රටක එයා ගන්නා ආදායමත් මෙහේ බදු එකතු කිරීම්වලට ලක් කරමින් තිබුණා. අපි දැන් ඒක වෙනස් කරලා තිබෙනවා. ඒ ආයෝජකයන්ට දේශීය වශයෙන් එන ආදායමට පමණයි බදු එකතු වෙන්නේ. මේක ආයෝජනවලට හොඳ තත්ත්වයක් වෙලා තිබෙනවා.

ඊළඟට, මේ දක්වා අපනයනකරුවන් රටින් පිට ඔවුන්ගේ අපනයන ප්‍රවර්ධනයට වියදම් කළොත් ඒක allowable expense

එකක් විධියට තිබුණේ නැහැ. ඒ වාගේම අපි විදේශ කාර්යාලයක් පවත්වාගෙන ගියොත්, buying office එකක් පවත්වාගෙන ගියොත් ඒකේ වියදම් මෙහේ වියදම්වලින් අඩු කරන්න අවස්ථාව ලබා දුන්නේ නැහැ. නමුත් අපි ඒක දැන් ලබා දීලා තිබෙනවා. ඊළඟට enhanced capital allowance එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම ආයෝජකයෙක්, අපේ රටේ ව්‍යාපාරිකයෙක් ආයෝජනයක් කළොත් එයාට ඒක ඔහුගේ බදු ගෙවීම්වලින් අඩු කර ගන්න හැකියාවක් මීට කලින් තිබුණේ නැහැ. මොකද, ඩොලර් මිලියන 3ක ආයෝජනයක් කරන්න ඕනෑකම තිබුණා ඒ වාගේ දෙයක් ලබා ගන්න. දැන් අපි ඒක ඩොලර් ලක්ෂ 250ට ගෙනාවා. ඒ කියන්නේ, කවුරු හරි රුපියල් මිලියන 82ක වාගේ ආයෝජනයක් කළොත් එයාට පුළුවන් ඔහු ගෙවන බදුවලින් ඒක අඩු කර ගන්න, පළමුවෙනි අවුරුද්දේ ඉඳලාම.

විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පසුගිය කාලවල අර්බුදයට ලක් වුණා. ඒ අර්බුදයට ලක් වුණු නිසා ඒ අයට බදු ගෙවා ගන්න බැරිව හිර වෙලා හිටියා. ඒ විධියට බදු ගෙවා ගන්න බැරිව හිර වෙලා හිටිය අයට Inland Revenue Act එකේ තිබුණු විධියට penalties එකතු වෙලා තිබුණා, interest එකතු වෙලා තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින් අපි දැන් මේ පනත හරහා කොමසාරිස්ට බලය දෙනවා සම්පූර්ණයෙන් ඒ බදු කපා හරින්න. ඒ කියන්නේ අර්බුදයට ලක් වෙච්ච සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙක් ඉදිරි මාස 6 ඇතුළත ගෙවනවා නම්, එයාගේ penalties සහ interests waive off කරන්න අපි අවස්ථාවක් ලබා දීලා තිබෙනවා. ඔබතුමන්ලාට කර ගන්න බැරි වුණු තව දෙයක් තමයි බදු දැල පුළුල් කර ගැනීම. බදු දැල පුළුල් කර ගන්න බැරි වුණු නිසා ලංකාවේ බදු file ලක්ෂ 8ක්වත් ඔබතුමන්ලා අපට බාර දුන්නේ නැහැ. දැන් මේ වෙනකොට ලංකාවේ බදු file මිලියන 1.3ක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඉහළ ආදායම් ලබන කට්ටිය මිලියන 2.3කට වඩා ඉන්නවා. අපි ඒ අය මේ බදු ක්‍රමය ඇතුළට ගන්න වැඩ පිළිවෙළක් ගෙනාවා. දැන් වෘත්තිකයෙක් යම්කිසි ආයතනයකට සේවා සපයලා ලැබීමක් ගන්නවා නම්, ලක්ෂයකට වඩා ලැබීමක් ගන්නවා නම් ඔහුගෙන් අපි දැන් Withholding Tax එකක් කපා ගන්නවා, සියයට 5ක. ඒ අනුව, මාසිකව රුපියල් ලක්ෂයකට වඩා ආදායම් ලබන සියලු වෘත්තිකයන් Withholding Tax එකට යටත් වනවා. අපි වෘත්තීන් 28ක් පමණ මෙම පනතට එකතු කරලා තිබෙනවා. ඒ සියලු වෘත්තිකයන් මෙතැනින් පසුව Withholding Taxවලට යටත් වනවා. Withholding Tax කියන්නේ, tax එකක් නොවෙයි, බදු කල් තියා අඩු කර ගැනීමක්.

පසුගිය පනතට අනුව TIN සහතිකය අපි එන්න ඉස්සෙල්ලාම මිලියන 1.3කට issue කරලා තිබෙනවා. ඒ ටික දැන් අපි ජනතාවට ලබා දෙනවා. එය ජනතාවට ලබා දුන්නාට පසුව විවිධ ආර්ථික කටයුතු කරනකොට ඉදිරියේදී TIN එක අනිවාර්ය වනවා. අපි ඒ පහසුකම සැපයුවාට පසුව බදු නොගෙවා සිටීමට කාටවත් හැකියාවක් ලැබෙන්නේ නැහැ, සියලුදෙනා මේ බදු ක්‍රමය ඇතුළට එනවා. ඒ වාගේම තමයි Withholding Tax deduct කර ගන්නා agentsලා විධියට ඉන්න අය ඒක කළේ නැත්නම්, ඒගොල්ලන්ටත් දඩුවම් පනවා තිබෙනවා. ඒ ආකාරයෙන් බදු පැහැර හැරීම් අපි නවත්වා තිබෙනවා. ඒ වාගේම බදු එකතු කිරීම් සිදු කර තිබෙනවා.

මේ ගැන මෙතුමන්ලා ටිකක් කෑ ගැහුවා. මම කියනවා, අනෙක් රටවල් එක්කත් මෙය compare කරලා බලන්න කියලා. අපි හැම තිස්සේම කියනවා නේ, ජාත්‍යන්තරයට යන්න ඕනෑ, ජාත්‍යන්තරයට යන්න ඕනෑ, ජාත්‍යන්තර සම්මතවලට යන්න ඕනෑ කියලා. හැබැයි, ජාත්‍යන්තර සම්මතවලත් එහෙම තමයි. අර මුලින් කිව්වා වාගේ, බදු පැහැර හැරීම criminal offence එකක් නොවී දියුණු ක්‍රමයකට, ආණ්ඩුවත්, ජනතාවත් එකතු වෙලා කරන කාලයක් තිබෙන්නේ. ඕස්ට්‍රේලියාව වාගේ රටවල එහෙම තිබෙන්න පුළුවන්. නමුත්, අපි වාගේ රටවලට ඒක හරියට streamline කර ගන්න අවශ්‍ය වනවා. විශේෂයෙන්ම බදු නොගෙවා හිටපු අය මෙතෙක් කල් ඒකෙන් පැන පැන හිටියා. ඒක නිසා තමයි දැන් මේ වේදනාවට පත් වෙලා තිබෙන්නේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු නොගෙවන අය සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට උදවු කරලා, බදු ක්‍රමයට ඇතුළු කර ගන්න තමයි අපි මේ පනත ගෙනැල්ලා තිබෙන්නේ. අපේ රටේ බදු නිසි අයුරින් එකතු වුණොත් ජනතාවට ආධාර දීලා, වක්‍ර බදු අඛණ්ඩව අඩු කරලා, සෘජු බදු ප්‍රතිශතය වැඩි කර ගන්න පුළුවන්. අපි බලයට එනකොටම කිව්වා, සියයට 80 සහ සියයට 20 කියන ආකෘතිය අපි අනෙක් පැත්ත හරවනවා කියලා. ඒ සඳහා වන ක්‍රමයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have five minutes.

[අ.භා. 1.00]

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින රණවිරු ප්‍රජාව වෙනුවෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ අවුරුදු 30කට ආසන්න කාලයක් පැවති කුරිරු යුද්ධය නිමා කරලීම සඳහා විශාල දායකත්වයක් ලබා දෙමින් අපේ ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ, සිවිල් ආරක්ෂක බලකායේ වීරෝදාර රණවිරුවන් කැපවීමකින්, දැඩි අධිෂ්ඨානයකින් යුතුව කටයුතු කළා. ත්‍රිවිධ හමුදා සාමාජිකයන්, පොලිසියේ සාමාජිකයන්, සිවිල් ආරක්ෂක බලඇණි සාමාජිකයන් සහ විශ්‍රාම සුවයෙන් සිටින සියලුදෙනා වාගේම, මේ මහා මෙහෙවරට දායක වීමේදී රණකම්ෂිතයට පත්, - ආබාධිත තත්ත්වයට පත් - සහ මිය ගිය අයගේ ළඟම ඥාතීන්, වැන්දඹුවන්, බිරින්දෑවරුන්, දරුවන් මෙම අවස්ථාවේදී විශේෂයෙන්ම සිහිපත් කරනවා.

අද උදෑසන ගරු ජනාධිපතිතුමා රණවිරු සෙවණට ගියා, එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් බැහැ දැකලා, ඔවුන් සමඟ කථා කරලා, ඔවුන්ට ආශීර්වාද කරලා එන්න. ඒ වාගේම මමත් අද උදේ මිහිදු සෙත් මැදුරට ගියා, එහි නේවාසිකව

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

රැකවරණය ලබමින් සිටින රණවිරුවන් සමඟ කථා කරලා එන්න. ඒ වාගේම ප්‍රාදේශීය මට්ටමිනුත් සෑම දිස්ත්‍රික්කයකම රණවිරු උපහාර උළෙල පවත්වා සිහිකිරීම් පවත්වනවා. රණවිරු ප්‍රජාව සිහි කිරීම පමණක් නොවෙයි, අපේ රජය ඔවුන් වෙනුවෙන් හැම දාමත් කටයුතු කරනවා කියන එකත් මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි. පසුගිය වසර ඇතුළත හමුදා රෝහල්වලින් ප්‍රතිකාර ගැනීමට අවශ්‍ය යටිතල පහසුකම් හදලා, මුළු ලංකාවේම තිබෙන යුද, ගුවන්, නාවික, පොලීසියේ ආරෝග්‍යශාලා ප්‍රතිසංස්කරණය කරලා, ඒ රණවිරුවන්ට ඉතා පහසුවෙන් අවශ්‍ය බෙහෙත් සහ වෙනත් පහසුකම් ලබා ගැනීම සඳහා කටයුතු සූදානම් කර තිබෙනවා.

අපේ රජයේ විශේෂ වැඩ පිළිවෙළක් අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ හයිටි රාජ්‍යයට යොමු කිරීම සඳහාත්, ලෝක සාමයට දායකවීම සඳහාත් 1,000කින් සමන්විත සාම සාධක භට පිරිසක් යැවීමට අපි දැන් කටයුතු සූදානම් කර තිබෙනවා.

මෙම රජයේ වගකීම විශේෂයෙන්ම නැවත යුද්ධයක් ඇති නොවෙන ආකාරයට කටයුතු කිරීමයි. සියලු ජන කොටස් අතර බෙදුම්වාදී තත්ත්වයක් ඇති නොකර, ජාති, ආගම්, කුල භේදයකින් තොරව සංහිඳියාවට මුල්තැන ලබා දෙමින් අපි ඒ කටයුත්ත කරනවා. ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපි ඒ කටයුත්ත ඉතා හොඳින් සිද්ධ කරනවා.

විශ්‍රාමික රණවිරුවන්, පොලීසියේ අය විශාල පිරිසක් පෞද්ගලික ආරක්ෂක සේවයේ කටයුතු කරනවා. ඒ වෙනුවෙනුත් අපි මේ වසර ඇතුළත විශේෂ නියාමන අධිකාරියක් පිහිටුවනවා. ඔවුන්ගේ වැඩ කටයුතුවලට හොඳ ගරුත්වයක්, පිළිගැනීමක් ලබාදෙන විධියට දේශීය හා විදේශීය වශයෙන් කටයුතු කරන්නත් අපි බැඳී සිටිනවා. ඒ වාගේම ත්‍රස්තවාදී ක්‍රියා මත තුවාල ලබා වෛද්‍ය නිර්දේශ මත විශ්‍රාම ගොස් ඇති අවිවාහක අයත්, විශ්‍රාම යෑමෙන් පසුව මිය ගිය විවාහක සාමාජිකයාගේ කලත්‍රයා, දරුවන්, ළඟම ඥාතීන් වෙනුවෙනුත් විශේෂ වැඩ පිළිවෙළක් හැටියට වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ වරප්‍රසාද ලබාදීම සඳහාත් අපි කැබිනට් අනුමැතිය අරගෙන සංශෝධිත පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම නීත්‍යානුකූලව විවාහය අවසන් කර, වයස අවුරුදු 55ට පෙර නැවතත් නීත්‍යානුකූලව විවාහ වන අයගේ ළඟම ඥාතීන්ටද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිවන පරිදි පනත සංශෝධනය කිරීමට ද දැනට කටයුතු කර තිබෙනවා. ඒකෙනුත් ප්‍රතිලාභ රාශියක් ඔවුන්ට ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෘත්තීමය තත්ත්වය හඳුනාගෙන, ඒ කියන්නේ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ දැනට විශ්‍රාම ගොස් සිටින අයගේ ව්‍යවසායකත්ව හැකියාව හඳුනාගෙන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ඒකාබද්ධව ඒ අය ජාතික ආර්ථිකයට දායක කර ගැනීම සඳහාත් කටයුතු කරනවා.

ඒ වාගේම මෙරටට අනුපමේය සේවයක් ඉටු කර ශ්‍රී ලංකා නාවික හමුදා ක්ෂේත්‍රයෙන් විශ්‍රාම යන අය වෙනුවෙන් වෙළෙඳ නාවික ක්ෂේත්‍රයේ විදේශ රැකියා අවස්ථා පුළුල් කිරීම සඳහා ද, ඔවුන්ට ජාත්‍යන්තර මට්ටමේ පිළිගත් වෘත්තීය සුදුසුකම් සහතික ලබා දීමේ අවස්ථාව සඳහා ද වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව යන්ත්‍රණයක් සකස් කරලා කටයුතු කරනවා. ඒ කියන්නේ සමස්ත රණවිරු ප්‍රජාවම - ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ, සිවිල් ආරක්ෂක බලඇණියේ සියලු අය - වෙනුවෙන් මේ රජය විසින් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට මම සියලු රණවිරු පවුල්වල අයගේ ගැටලු හඳුනාගෙන තිබෙනවා. හැම සතියකට දෙවතාවක් සෑම දිස්ත්‍රික්කයකටම ගිහිල්ලා ඔවුන්ගේ පවුල්වල අය හමු වෙලා, ඒ ගැටලු සාකච්ඡා කරලා, විසඳලා දෙන්න කටයුතු කරනවා. ගරු ජනාධිපතිතුමාත් විශේෂයෙන්ම ඒ ගැන අවධානය යොමු කරලා කටයුතු කරනවාය කියන එකත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sajith Premadasa. You have seven minutes.

[අ.භා. 1.06]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සුවිශේෂී දවසක්. මොකද, දශක තුනක කාලයක් තිස්සේ කුරිරු යුද පීඩාවකට පත් වෙච්ච ජනතාව එයින් මුදාගෙන යුද ජයග්‍රහණය තුළින් රට නිදහස් වුණු දවසක් නිසා. මේ සුවිශේෂී දවසේ ඒ යුද ජයග්‍රහණයට දේශපාලන නායකත්වය ලබා දුන් මහින්ද රාජපක්ෂ මැතිතුමාට, ඒ වාගේම යුද හමුදාපතිවරයා හැටියට නායකත්වය ලබා දුන් සරත් ෆොන්සේකා මැතිතුමා ඇතුළු ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයට මේ අවස්ථාවේදී අපේ විශේෂ ගරුත්වය පුද කරනවා.

ඒ වාගේම රට දැය බේරාගන්නට ජීවිත, ඇස්, හිස්, මස්, ලේ දන් දීලා. ඒ සියලු දේ කැප කරමින් තමන්ගේ පවුල දෙවැනි තැනට දමලා, රටට මුල් තැන ලබා දීලා එම මෙහෙවර ඉෂ්ට කරපු වීරෝදාර රණවිරුවන්ට අපේ ගෞරවනීය උත්තමාචාරය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. විශේෂයෙන්ම යුද්ධය නිසා දෙමව්පියන් අහිමි වුණු දරුවන් මේ මොහොත වන විට වැඩිහිටියන් බවට, තරුණයන් බවට පත් වී සිටියත්, එදා ඔවුන් විඳි වේදනාව, දරාගත් කම්පනය සහ දුක අපට තේරෙනවා. මටත් මගේ තාත්තා අහිමි වුණේ මේ ත්‍රස්තවාදී යුද්ධය නිසා. ඒ නිසා මටත් ඒ වේදනාව තේරෙනවා. අදටත් අසීමිත වේදනාවකින් සිටින රණවිරු පවුල්වල සියලුදෙනාගේ හැඟීම්, සංවේගය, දුක අපට අවබෝධ වෙනවා. ඒ නිසා එම රණවිරු පවුල්වල සියලුදෙනාටම අපේ කනගාටුව, සාතිශය සංවේගය මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

රට දැය බේරාගන්නට ඒ අභිමානවත් සේවාව ඉෂ්ට කරපු අයට "රණවිරුවන්" කියන වචනය භාවිත කරන්නට අපි මැළි වන්නට හොඳ නැහැ කියලා මම හිතනවා. නැවත වරක් ඒ වාගේ බෙදනීය, කුරිරු යුද්ධයක් අපේ රටේ ඇති නොවේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා. එවැන්නක් ඇති නොවන්නට අපි වගබලා ගන්නට ඕනෑ. යුද්ධය නිසා වින්දිතයන් බවට පත් වූ විවිධ ජන කොට්ඨාස සමස්ත රටේම සිටිනවාය කියන එක විශේෂයෙන්ම අපි මතක තබා ගන්නට ඕනෑ. වින්දිතයන් හැටියට ඒ ජනතාව මුහුණ දුන් ගැටලුවලට අපි විසඳුම් ලබා දෙන්නට ඕනෑ. ඒ විසඳුම් ලබා දීම අපි කරන්නට ඕනෑ ජිනීවාවලින් නොවෙයි. අපේ රටේ ප්‍රශ්න ටික අපේ රටේ විසඳාගන්නට ඕනෑ. ප්‍රතිසන්ධාන

ක්‍රියාවලියක් තුළින් සහෝදරත්වයෙන්, සංහිඳියාවෙන් යුතු තත්ත්වයක්, වාතාවරණයක්, පරිසරයක් නිර්මාණය කරමින් අපේ රට තුළ විත්දිතයන් බවට පත් වූ සියලුදෙනාගේ ප්‍රශ්න අපි විසඳන්නට ඕනෑ. සැබැවින්ම මේ රටේ ඒකීයභාවය, සහෝදරත්වය සුරැකෙන්නේ ඒ ඒ ජාතීන් අතර, ආගම් අතර, ජන කොට්ඨාස අතර ඒ සංහිඳියාව ඇති වුණොත් පමණයි.

හැබැයි කනගාටුවෙන් වුවත් කියන්නට ඕනෑ, රණවිරු සුබසාධනය පිළිබඳව ගැටලු රැසක් තිබෙන බව. විශේෂයෙන්ම රණවිරු පවුල්වලට ලබා දිය යුතු නිසි තැන ලබා දීම රණවිරු සේවා අධිකාරියක් හරහා ඉෂ්ට සිද්ධ කරන්න පුළුවන්ය කියලා මම හිතන්නේ නැහැ. මම යෝජනා කරන්න කැමැතියි, රණවිරු සුබසාධනය වෙනුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ තිබෙන Department of Veterans Affairs වාගේ වෙනම දෙපාර්තමේන්තුවක් අපේ රටේත් පිහිටුවා අපේ රණවිරු සුබසාධනය ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් වන බව. ඒ වාගේම කුරිරු ත්‍රස්තවාදී යුද්ධය තුළ රටේ හැම ප්‍රදේශයකම විත්දිතයන් බවට පත් වුණු සියලුදෙනාටම රට තුළ එකමුතුභාවය, ප්‍රතිසන්ධානය හා සහෝදරත්වය නිර්මාණය කිරීම තුළින් අපි අපේම රටේ ප්‍රශ්න ටික අපේ රට තුළම විසඳීම ඉතාම වැදගත් වනවා. ජිනීවා ගිහිල්ලා වාර්ෂිකව මෙවා කථා කරන එක නතර වන ආකාරයට රටේ ඒකීයභාවය, භෞමික අඛණ්ඩතාව, ස්වෛරීත්වය හා දේශපාලන නිදහස සුරක්ෂිත කරමින් අපි කටයුතු කළ යුතුයි කියන කාරණය මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා අද තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය කෙලෙසමින් කටයුතු කරනවා. බදු එකතු කිරීමේ ක්‍රියාවලියේදී විවිධ පුද්ගලයන්ගෙන්, ආයතනවලින්, ව්‍යාපාරවලින් හා ව්‍යවසායකයන්ගෙන් යම්කිසි අඩු පාඩු සිදු වනකොට එය සාපරාධී ක්‍රියාවක් බවට පත් කරන්නට රජය ගන්නා මේ පියවර ඉතාම වැරදි පියවරක් බව අපි මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

දැන් බලන්න, විදේශීය රටවල මේ කර්තව්‍යය සිදු වන්නේ කොහොමද කියලා. ඕස්ට්‍රේලියාව, ඉන්දියාව, සිංගප්පූරුව, ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය හා එක්සත් රාජධානිය වාගේ රටවල මේ සඳහා tier system එකක් තිබෙනවා. ඒ රටවල් මෙය එක පාරටම සාපරාධී ක්‍රියාවක් හැටියට හඳුන්වන්න යන්නේ නැහැ. චේතනාන්විතව කරන ක්‍රියාවලියක් හැටියට ඔප්පු වුණොත් තමයි එය සාපරාධී ක්‍රියාවක් බවට පත් වන්නේ. ඒ නිසා විශේෂයෙන්ම මේ රටේ ව්‍යාපාරික ප්‍රජාව ඉල්ලීමක් කරලා තිබෙනවා, මෙහිදී චේතනාව පිළිබඳවත් සලකා බලන්න කියලා. බදු නොගෙවීම, බදු ෆයිල් එකක් පවත්වාගෙන නොයෑම, TIN එකක් ලබා නොගැනීම යනාදී දේවල් චේතනාන්විතව ක්‍රියාත්මක කළොත් පමණක් සාපරාධී ක්‍රියාවක් බවට පත් කිරීම ඇත්ත වශයෙන්ම යෝග්‍යයි. ඒ වාගේම tier system එකක් අනුව දඬුවම් දීමත් අදියර වශයෙන් ක්‍රියාත්මක වන්න ඕනෑ. ඒ වාගේම ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන කරුණු කාරණා පිළිබඳව යම් කිසි ලිහිල්භාවයක් දක්වන්න ඕනෑ. ඒ වාගේම කාලය දීර්ඝ කිරීමේ ක්‍රියාවලියකටත් යොමු වන්න ඕනෑ. ඒ කියන්නේ මෙහිදී දින 30 කියන එක ප්‍රමාණවත් නැහැ කියන එක අපි විශ්වාස කරනවා.

බලන්න, මේ රජය විදුලි බිල ඉහළ දමා තිබෙනවා. වතුර බිලත් හෙට අනිද්දාම ඉහළ යනවාලු. ඉන්ධන මිලත් ඉහළ දැම්මා. ජනාධිපතිවරයා කියනවා, හෙට අනිද්දා ආපසු මිල ඉහළ දමනවාලු. මේ වන විට ආනයනික භාණ්ඩවල මිලත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඩොලරයේ අගයත් ඉහළ ගිහිල්ලා. නමුත් ආදායම පහළ වැටිලා තිබෙනවා. මේ වන විට පොහොර හිඟයක් ඇති වෙලා, පොහොර මිලත් වැඩි වෙලා තිබෙනවා. දැන් රටේ ජනතාව ගොවිතැනින් ඈත් වෙනවා. මම අහන්න කැමැතියි, පසුගිය වසර එකහමාරක දෙකක කාලය තුළ මේ රජය මේ රටේ ජනතාවට ඉටු කරපු සේවාව මොකක්ද කියලා. අසීමිත පීඩනයකට, අසහනයකට ලක් වුණු ඒ ජනතාවගෙන් බදු ගෙවීම් අතපසු වීම සාපරාධී ක්‍රියාවක් බවට පත් කරලා තවත් අමතර පීඩනයක් අද ඇති කරනවා.

මේ වාගේ තත්ත්වයක් තුළ අලුත් ව්‍යාපාර නිර්මාණය වීම, අලුතින් ආයෝජකයන් බිහි වීම, ඍජු විදේශ ආයෝජන අපේ රටට ලැබීම, විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර, සංචාරක ක්ෂේත්‍රය දියුණු කිරීම වැනි පැතිවලට අපේ රටේ ජනතාව යොමු නොකරන ක්‍රියාවලියක් ඇති වනවා. බදු ගෙවීම අතපසු වීම සාපරාධී ක්‍රියාවක් බවට හැඳින්වීම ඇත්ත වශයෙන්ම මේ රටේ සංවර්ධනය මොට කරන්නට දරපු උත්සාහයක් හැටියටයි අපි දකින්නේ.

අපි කවුරුවත් කියන්නේ නැහැ, බදු දැලට හසු වී සිටින අය බදු නොගෙවිය යුතුයි කියලා. සත්‍ය වශයෙන්ම පුරවැසියන් හැටියට බදු ගෙවීමේ වගකීම අපි අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන්නට ඕනෑ. ඒ රාජ්‍ය ආදායම අපි ලබා ගන්නට ඕනෑ. හැබැයි, ඒක ලබා ගැනීමේදී අපි ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලවයි ඒ ක්‍රියාවලියට යන්නට ඕනෑ. එහෙම නැතුව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය කෙලෙසමින්, මේ රටේ ජනතාවගේ මූලික අයිතිය උල්ලංඝනය කරමින්, විශේෂයෙන්ම මේ බදු නොගෙවීම සාපරාධී ක්‍රියාවක් බවට පත් කිරීම අතිශයින්ම වැරදි ක්‍රියාවක්. ඒක මේ රජය ක්‍රියාත්මක කරන වැරදි ප්‍රතිපත්තියක්. ඇත්ත වශයෙන්ම ඔබ කළ යුත්තේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - Inland Revenue Department එක - ශක්තිමත් කර, ඒ ආයතනය ඩිජිටල්කරණයට ලක් කර බදු එකතු කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමයි. එහෙම නැතුව යම් කිසි සුළු හේතුවක් මත කෙනෙකුට tax file එකක් open කරන්නට බැරි වුණොත්, එහෙම නැත්නම් tax ගෙවීම ප්‍රමාද වුණොත් ඒ අය කෙළින්ම හිරේ දමන වැඩ පිළිවෙළක් නොවෙයි අනුගමනය කළ යුත්තේ.

අද මේ රටේ තරුණ පරම්පරාව ඉතාම ඕනෑකමින් බලාගෙන සිටිනවා, ව්‍යාපාර ආරම්භ කරන්න; ව්‍යවසායකයන් හැටියට කටයුතු කරන්න. ඒ තරුණ අභිලාෂ සහමුලින්ම වළක්වන වැරදි ප්‍රතිපත්තියක් තමයි මේ ක්‍රියාත්මක කරන්නට යන්නේ. ඒ නිසා මේ වැරදි ප්‍රතිපත්තිය යම්තාක් දුරකට හෝ ලිහිල් කිරීමට අද සමගි ජන බලවේගය සහ අනෙකුත් සෙසු පක්ෂ වෙනුවෙන් අපේ ගරු සුජීව සේනසිංහ මැතිතුමා මේ කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරනවා. අඩුම තරමේ එම සංශෝධන ටික ඇතුළත් කොට මේ ක්‍රියාවලිය යම්තාක් දුරකට හෝ සාධාරණ ක්‍රියාවලියක් බවට පත් කරන්නට කටයුතු කරන්න කියා රජයට අපි කියනවා. ඒ වාගේම අපි කියනවා, නම්‍යශීලී වන්න කියා. උද්ධච්ච වෙන්නේ නැතුව, තමන් හිතන හැම දේම හරියි කියා හිතන්නේ නැතුව නම්‍යශීලී වෙලා මේ සංශෝධනවලට එකඟ වෙන්නය කියා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම රට දැය බෙරා ගත් වීරෝදාර රණ විරුවන්ට නැවත නැවතත් අපේ ශීර්ෂ ප්‍රණාමය, අපේ ගෞරවය අපි හදවතින්ම ප්‍රකාශ කර සිටිනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kaveenthiran Kodeeswaran. You have seven minutes.

[பி.ப. 1.17]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உண்ணாட்டரசிறை திருத்தச் சட்டமூலம் சம்பந்தமான இன்றைய விவாதத்திலே பல விடயங்களை இங்கே முன்வைத்திருந்தார்கள். வரிக்கு மேல் வரியை விதித்து, ஏழை மக்கள்மீது வரிச் சுமையைக் கூட்டுகின்ற செயற்பாட்டிலே ஈடுபட வேண்டாம் என்று இந்த அரசுக்கு நான் வேண்டுகோள் விடுகின்றேன். இந்த நாட்டிலே உள்நாட்டு உற்பத்தியை அதிகரித்து, முதலீட்டு ஊக்குவிப்பை மேற்கொண்டு முதலீடுகளை வரவழைத்து, ஏற்றுமதிகளை மேற்கொள்ளும் நிலையை ஏற்படுத்தி, அதன்மூலம் அந்நியச் செலாவணியைச் சம்பாதித்து இந்த நாட்டின் அபிவிருத்தி சார்ந்த விடயங்களை நீங்கள் முன்னெடுக்க வேண்டும். அதைவிடுத்து, வரியைக் கூட்டுகின்றபொழுது ஏற்படுகின்ற பொருட்கள், சேவைகளின் விலை அதிகரிப்பின் காரணமாக கூடுதலாக ஏழை மக்கள்தான் பாதிக்கப்படுகின்றார்கள். இதனால் சிறு கைத்தொழில்களை மேற்கொள்கின்றவர்கள் - சிறிய முதலீட்டாளர்கள், நடுத்தரக் கைத்தொழில்களை மேற்கொள்கின்றவர்கள் - பாதிக்கப்படக்கூடிய சந்தர்ப்பம் கூடுதலாகக் காணப்படுகின்றது. வரியை அறவிடுவதன்மூலம் மட்டும் நீங்கள் இந்த நாட்டைப் பாதுகாத்துக்கொள்ள முடியுமா? என்ற கேள்வியை நான் இந்த இடத்திலே எழுப்ப விரும்புகின்றேன். IMFஇன் நிகழ்ச்சித்திட்டத்திற்கு அமைய, வரி வருமானத்தைக் கூட்ட வேண்டும் அல்லது அதன் நிபந்தனையை அடிப்படையாகக்கொண்டு சில நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்கின்ற அடிப்படையிலே இந்தச் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றது. உண்மையாக இந்த முன்னெடுப்பு எங்களது மக்கள்மீது ஒரு சுமையைச் சுமத்துகின்ற ஒன்றாக இருக்கின்றதே ஒழிய, அவர்களுக்கு நிரந்தரத் தீர்வைத் தருகின்ற ஒன்றாக இல்லை என்பதனை இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நாங்கள் சரியான ஒரு பொறிமுறையின்கீழ் இந்த நாட்டின் உற்பத்தியை அல்லது முதலீட்டைக் கூட்டுகின்றபொழுதுதான் ஏற்றுமதி வருமானத்தின்மூலம் அந்நியச் செலாவணியை ஈட்டிக்கொள்ள முடியும். ஆனால், இன்று ரூபாயின் பெறுமதி என்பது வீழ்ச்சியடைந்து வரும் ஒன்றாக இருக்கின்றது. இன்று டொலரின் பெறுமதி கிட்டத்தட்ட 337 ரூபாயை அண்மித்ததாக உயர்வடைந்திருக்கின்றது. கடந்த காலத்திலே அரசாங்கம் பாரிய இக்கட்டானதொரு நிலையை எதிர்நோக்கியபோதுதான், டொலரின் பெறுமதி அதிகரித்திருந்தது. அதேபோன்றுதான் பெற்றோலியத்தின் பெறுமதியும் இன்று மிகவும் அதிகமாக இருக்கின்றது. ஆனால், இனிவருகின்ற காலங்களிலே இவை இன்னும் இன்னும் அதிகரித்துச் செல்லுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்படுமென்றால், இந்த நாடு மிகவும் பாரியதொரு வீழ்ச்சிக்குள்ளே தள்ளப்படக்கூடிய சூழ்நிலையும் சந்தர்ப்பமும் ஏற்படும். ஆகவே, இதனை அடிப்படையாகக்கொண்டு இந்த நாட்டின் மக்களை நீங்கள் பாதுகாக்க வேண்டும். உண்மையிலேயே நீங்கள் பல நல்ல விடயங்களைச் செய்திருக்கின்றீர்கள். நாங்கள் அதனை ஏற்றுக் கொள்கின்றோம், பாராட்டுகின்றோம். அதேபோல், நீங்கள் சில விடயங்களைச் செய்கின்றபொழுது அதை மக்களின் நன்மை கருதிச் செய்யும்படி உங்களிடம் தயவாய் இந்த இடத்தில் வேண்டி நிற்கின்றோம்.

கடந்த காலத்தில் அரசாங்க மற்றும் தனியார் ஊழியர்களுக்கான சம்பள அதிகரிப்பை நீங்கள் செய்திருந்தீர்கள். ஆனால், அந்தச் சம்பள அதிகரிப்போடு ஒப்பிடும்போது, தற்போது பொருட்கள் மற்றும் சேவைகளின் விலை மிகவும் அதிகரித்து இருக்கின்றது. அந்தச் சம்பள அதிகரிப்போடு இப்போது இருக்கின்ற பொருட்கள் மற்றும் சேவையின் விலை அதிகரிப்பை ஒப்பிடுகின்றபொழுது, அது பன்மடங்கு அதிகரித்திருக்கிறது. ஆகவே, அரசாங்க மற்றும் தனியார் ஊழியர்களுக்கான ஊதியத்தை நீங்கள் அதிகரிக்க வேண்டும். ஏனென்றால், அவர்கள் மிகவும் பாதிப்படைந்த நிலையில்தான் இருக்கின்றார்கள். ஏழைகள் தற்பொழுதும் ஏழைகளாகத்தான் இருக்கின்றார்கள். நடுத்தர வர்க்கத்தினர் நடுத்தர வர்க்கத்தினராகத்தான் இருக்கின்றார்கள். அவர்கள் பணக்காரர்களாக அல்லது ஏழ்மை நிலையிலிருந்து உயர்ந்து செல்லக்கூடிய ஒரு பொறிமுறை - ஒரு system - இந்த நாட்டிலே இல்லையென்பதுதான் என்னுடைய கருத்தாக இருக்கின்றது.

நீங்கள் வரியைக் கூட்டுகின்றபொழுது, எரிபொருளின் விலை கூடுகின்றபொழுது, அது விவசாயிகளுக்குக் கூடுதலான பாதிப்பை ஏற்படுத்துகின்றது. அம்பாறை மாவட்டத்திலே இருக்கின்ற விவசாயிகள் மட்டுமல்லாமல், இந்த நாட்டிலே இருக்கின்ற விவசாயிகள் மிகப் பாதிப்படைந்த ஒரு சூழ்நிலை காணப்படுகின்றது. விசேடமாக, உரத்தின் விலையும் மிகவும் அதிகரித்திருக்கின்றது. இன்று உரத்தின் விலையைப் பார்த்தால், ஓர் அந்தர் பசளையின் விலை கிட்டத்தட்ட 16,000 ரூபாய்க்கும் மேல் ஏறியிருக்கின்றது. ஆனால், விவசாயத்தின்மூலம் கிடைக்கின்ற நெல்லின் விளைச்சல் என்பது மிகக் குறைவாக இருக்கின்றது. ஒரு நெல் மூடைக்கான விலையானது இன்றும்கூட 7,000 - 7,500 ரூபாயாகத்தான் இருக்கின்றது. ஆகவே, விவசாயிகள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இப்பொழுது இன்று எல்லா இடமும் நெல் விதைப்பு நடந்திருக்கின்றது. ஆனால், உரத்துக்குத் தட்டுப்பாடு ஏற்பட்டிருக்கின்றது. ஆகவே, இந்த வரி அதிரிப்பினால் விவசாயிகளும் மீனவர்களும்தான் கூடுதலாகப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். நெல்லின் உத்தரவாத விலையை நீங்கள் சரியாகத் தீர்மானிக்க வேண்டும். ஏனென்றால், உத்தரவாத விலை இல்லாததன் காரணமாக விவசாயிகள் மிகவும் அடிமட்ட நிலைக்குச் செல்லுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது. ஆகவே, இந்த நாட்டின் முதுகெலும்பாக இருக்கின்ற விவசாயிகளைப் பாதுகாப்பதற்கான நடவடிக்கையை நீங்கள் மேற்கொள்ள வேண்டுமென்ற வேண்டுகோளையும் விடுத்து, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Wijesiri Basnayake. You have nine minutes.

[අ.භා. 1.24]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි විවාදයට භාජන කරන්නේ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳවයි. අද මේ පනත් කෙටුම්පත පිළිබඳව පවත්වන සාකච්ඡාවේදී සුපුරුදු පරිදි විපක්ෂයෙන් මහජනතාව තුළ භය උපද්දනවා, බිල්ලෝ මවනවා අපි දකිනවා. අපි අපරාධ නීතිය - Criminal Law එක - ගෙනෙන්න හදනවාලු. එහෙම නැහැ. අන්තර්ජාතික වශයෙන් රටවල තිබෙන ආදායම් බදු නීතිය පිළිබඳව සලකා බැලීමේදී අපට ඕනෑ, මේක ඒ රටවල පවතින level එකට ගෙනෙන්නයි.

විශේෂයෙන්ම අපි දන්නවා, රජයක් වාර්ෂිකව ක්‍රියාකාරකම් රාශියක් කරන බව. ඒ ක්‍රියාකාරකම් කිරීම සඳහා අරමුදල් අවශ්‍යයි. ඒ අරමුදල් සම්පාදනයේදී මූලික වශයෙන්ම බදු සහ බදු නොවන ප්‍රවේශයන් බොහොම වැදගත්. බදු ප්‍රවේශයන් ගැන සාකච්ඡා කරනකොට පුද්ගල බදු, සංස්ථාපිත බදු - Corporate Income Tax, භාණ්ඩ හා සේවා මත පනවන බදු වාගේම අන්තර්ජාතික වෙළෙඳාම මත පනවන බදු පිළිබඳව ඕනෑම රජයක් සලකා බලනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපි ගත්තොත්, ලෝකයේ පහළම ආදායම් උපද්දපු රට බවට අපේ රට 2022 වර්ෂයේදී පත් වුණා. ඒ අවස්ථාවේදී රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 7.3ක මට්ටමකයි පැවතියේ. මෙන්න මේ ප්‍රමාණය තමයි අපි 2022 වර්ෂයේදී අත්පත් කර ගත්තේ. ඇයි, මෙහෙම වෙන්නේ? පිළිගත්, පැහැදිලි අන්තර්ජාතික standardsවලට ගැළපෙන විධියට අපේ බදු නීතිය, ඒ පද්ධතිය අපි නිර්මාණය කරලා නැහැ. දුර්වල බදු පරිපාලනයක් තිබුණා. ඒ වාගේම තමයි, බදු පද්ධතියේ අකාර්යක්ෂමතාව, දූෂණ සහ වංචා. ඒ වාගේම අපි දැක්කා, තමන්ගේ හිතෛෂිවන්තයින්ට බදු සහන දෙනවා.

ඒ වාගේ තමයි, බදු පැහැර හැරීම්. මේකේ ප්‍රතිඵලයක් විධියට මොකක්ද වෙන්නේ? රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තොත්, ඒ අතින් ලෝකයේ පහළම රට බවට අපේ රට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටක් විධියට සංවර්ධනය කරා යන ගමනේදී මෙන්න මේ රාජ්‍ය ආදායම වැඩි කර ගන්න ඕනෑ. ඒ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට අවම වශයෙන් 15ක්, එහෙම නැත්නම් එතැනින් එහාට අපි නංවා ගත යුතුමයි.

අපි මේ රටේ මහජනතාවගෙන් බලය ඉල්ලනකොට ඒ ජනතාවත් එක්ක ගිවිසුමක් ඇති කර ගත්තා. ඒ ගිවිසුම තමයි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය. එහි 102වැනි පිටුවේ සඳහන් වන ආකාරයට, අපි මේ රටේ මහජනතාවට පොරොන්දුවක් ලබා දුන්නා, බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ගෙන එන බවට. මෙන්න මේකේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ මොහොත වනවිට අපි දේශීය ආදායම් පනතට මේ සංශෝධන ගෙන එන්නේ. මේ මඟින් මේ රටේ පවතින සංකීර්ණ වුණු බදු ක්‍රමය අපි සරල කරනවා; එය සරල ක්‍රමයක් බවට පරිවර්තනය කරනවා. ඒ වාගේම මේ ක්‍රමය තුළ තිබෙන අවිනිශ්චිතතාව දුරු කරලා, බදු පරිපාලනය අපි කාර්යක්ෂම කරනවා. ඒකට අවශ්‍ය පියවර ගැනීම තමයි මේ සිදු කරන්නේ. අද දවසේ සංශෝධන විශාල ප්‍රමාණයක් ගැන සාකච්ඡා කෙරෙනවා. විශේෂයෙන්ම ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රමාණය සම්බන්ධයෙන් වන SET report එක අපි මේ සංශෝධන යටතේ ඉවත් කරනවා. ඒ වාගේම තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු සෑම බදු වටිනාකමක්ම ඒ පුද්ගලයා විසින් පෙර තක්සේරු වර්ෂයේ ගෙවිය යුතු ආදායම් බද්ද මත තීරණය කරනවා. ඒ හරහා ඔවුන්ට පහසුවක් වෙනවා. ඒ විතරක් නොවෙයි. ගුවන් යානා සහ මෘදුකාංග බලපත්‍ර ආදී සේවාවන් සඳහා, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නිර්වාසික පුද්ගලයන්ට කරනු ලබන ගෙවීම් ආදායම් බද්දෙන් නිදහස් වෙනවා. ජීවිත රක්ෂණ ඔප්පුවලින් ලැබෙන මුදල් මත වන ආදායම් බදු සඳහාත් අපි සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාල පනත යටතේ සංස්ථාපිත, ඒ කියන්නේ සංස්ථාපිත අනෙකුත් විශ්වවිද්‍යාලවලට ත්‍යාග ලෙස - පරිත්‍යාග ලෙස - පිරිනමනු ලබන මුදල්, ඒ වත්කම් මාරු කිරීමකට අපි භාජන කරනවා. ඒ බදු අය කිරීමේදී අපි ශුද්ධ පිරිවැය සලකනු ලබනවා. ඒ වාගේම ඒ පුද්ගලයන්ට, එහෙම නැත්නම් හවුල්කාරිත්වයන්ට අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතිකය සියයට 10 ඉඳලා සියයට 15 දක්වා වැඩි කරනවා. නමුත් අනෙක් සියලු ආයතන සඳහා අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතිකය සියයට 30 මට්ටමේ පවත්වා ගෙන යනු ලබනවා. මෙන්න මේ ආකාරයට අපි සංශෝධන විශාල ප්‍රමාණයක් හරහා අපේ රටේ තිබෙන සංකීර්ණ වූ බදු පද්ධතිය සරල කරලා, බදු අනුකූලතාව ඇති කරලා, බදු පදනම පුළුල් කරලා බදු පද්ධතිය කාර්යක්ෂම කිරීමටයි මේ කටයුතු කරන්නේ. එහෙම නැතිව අපරාධ නීතිය නැවත වතාවක් මේ රටේ ක්‍රියාත්මක කිරීමට නොවෙයි. යම් කිසි පුද්ගලයෙකු බදු ගෙවන්නේ නැත්නම් ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් ක්‍රමානුකූලව පියවර ගැනීමේ පිළිවෙළක් තිබෙනවා; ක්‍රියාදාමයක් තිබෙනවා. ක්‍රමානුකූලව තමයි ඒ කටයුතු සිදු වෙන්නේ.

අපි මේ මොහොතේ රුපියල අවප්‍රමාණය වීම පිළිබඳ සාකච්ඡාවක ඉන්නේ. විවිධ පාර්ශ්ව විවිධ අර්ථකථන දෙනවා රුපියල අවප්‍රමාණය වීම පිළිබඳව. විශේෂයෙන් අපට එරෙහි වන්නන් කියනවා, මේක අපේ ජාතික ජන බලවේගයේ අකාර්යක්ෂමතාව කියලා. නැහැ, අපි දන්නවා මේ මොහොත වන විට රුපියලේ අගය පහත වැටීමට බලපාන කාරණා විශාල ප්‍රමාණයක් තිබෙන බව. එකක් තමයි, මැද පෙරදිග කලාපයේ පවතින යුද්මය තත්ත්වය. මේ නිසා නැව් ගාස්තු වැඩි වෙලා, රක්ෂණ ගාස්තු වැඩි වෙලා, අධිභාරයන් වැඩි වෙලා. මේ මොහොත වන විට බොරතෙල් බැරලයක මිල විශාල වශයෙන් වැඩි වෙලා. ඒ වාගේම ආනයනය කිරීම් සඳහා අපිට ඩොලර් ප්‍රමාණයක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් රුපියල අවප්‍රමාණය වීමත්, ඒ අවප්‍රමාණය වෙන්නේ කොහොමද කියන කාරණයත් සලකා බැලීමේදී අපි දීර්ඝ සාකච්ඡාවකට යන්න ඕනෑ. ඒ සම්බන්ධව ප්‍රධාන කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. රුපියල සහ ඩොලරය අතර තිබෙන අගය වෙනස් වෙන්නේ කොහොමද? ඒ වාගේම මේ රටේ මේ බැංකු පොලී අනුපාතිකය, අපේ රටේ තිබෙන ඩොලර් සංචිත ප්‍රමාණය ගැන අපි බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Wijesiri Basnayake, your time is up.

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
විශේෂයෙන්ම ඒ ඩොලර් සංචිත අපිට ලැබෙන්නේ අපනයන හරහා සහ විදේශ සංක්‍රාම මඟින්, සංචාරක ව්‍යාපාරයෙන්. මේ මොහොතේ මේ ත්‍රිත්වයටම දැඩි බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. මේ හරහා රුපියලේ අගය ඩොලරයේ අගයට සාපේක්ෂව පහළට යනවා. එහෙම නැතිව ජාතික ජන බලවේගය රජයේ අකාර්යක්ෂමතාවක් නොවෙයි තිබෙන්නේ. අද දවසේ අපි මේ ඉදිරිපත් කරන සංශෝධන හරහා උත්සාහ කරන්නේ මේ රටේ සරල වූ බදු ක්‍රමයක් නිර්මාණය කරලා, බදු අනුකූලතාවක් ඇති කරලා, බදු පදනම පුළුල් කරලා මේ රටේ රාජ්‍ය ආදායම වැඩි කරලා, මහජනතාවට අවශ්‍ය වන්නා වූ සේවාවන් ඉතා ඵලදායී ලෙස ඉෂ්ට කිරීමයි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Arjuna Sujeewa Senasinghe. The next nine minutes is yours.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I had ten minutes earlier, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, you have nine minutes.

[අ.භා. 1.33]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
One minute has been taken off. Okay, thank you, Sir.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, කුරිරු යුද්ධයක් අවසන් කරලා අපට නිදහස සහ සාමයෙන් ජීවත් වෙන්න අවස්ථාව ලබා දුන් මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, සරත් ෆොන්සේකා මැතිතුමාටත්, ත්‍රිවිධ හමුදාවටත්, පොලීසිය ඇතුළු ආරක්ෂක අංශවල සියලු දෙනාටත්. රාජපක්ෂවරුන්ගේ දේශපාලනයට හෝ ෆොන්සේකා මහත්තයාගේ දේශපාලනයට අපි එකඟ නොවුණත්, පක්ෂයක් වශයෙන් ඔවුන්ට ඒ ගෞරවය ලබා නොදෙන්න තරම් අපි කුහක වෙන්නේ නැහැ. ඒ වාගේම විශේෂයෙන්ම මම ආඩම්බර වෙනවා, අපේ අරුණ ජයසේකර මැතිතුමා පැකිළෙන්නේ නැතුව "රණවිරුවෝ" කියලා සඳහන් කරපු එකට. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාට ඒක කියා ගන්න පොඩ්ඩක් අමාරුයි. මම දන්නේ නැහැ, ඒ ඇයි කියලා.

විශේෂයෙන් ත්‍රස්තවාදීන් කියන්නේ කවුද කියලා අපි පොඩ්ඩක් විග්‍රහ කරලා බැලුවොත්, යම් දේශපාලන මතයක් හෝ යමක් ගැන තමන්ගේ මතයට, නිරායුධ පුද්ගලයන් මරණයට පත් කරන පිරිස තමයි ත්‍රස්තවාදීන් කියලා කියන්නේ. ජේවීපී වෙන්න පුළුවන්, එල්ටීටීඊ වෙන්න පුළුවන්, ඕනෑම ත්‍රස්තවාදී කණ්ඩායමක් තමන්ගේ මතය ප්‍රකාශ කරන්න ජීවිත නැති කරනවා නම්, මිනිස්සු මරනවා නම් ඒක ත්‍රස්තවාදය. ඒ මිලේච්ඡ ත්‍රස්තවාදය අවසන් කිරීම මම හිතන්නේ අපට අමතක වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ නිදහස තිබෙද්දී ඒ ත්‍රස්තවාදී ව්‍යසනය අපට අමතක වුණත් ඒ රණවිරුවන් තමන්ගේ ජීවිත පරදුවට තබලා ඒ කරපු වීරාන්විතය අපි අගය කරනවා. ඒ වාගේම ඒ මිය ගිය පවුල්වලට, ඒ සියලුදෙනාට අපේ ශෝකය ඒ වාගේම අපේ ගෞරවය මේ අවස්ථාවේදී පළ කරනවා.

විශේෂයෙන් මට පෙර කථා කළ මා මිත්‍ර මන්ත්‍රීතුමා බදු කළමනාකරණය කර ගැනීම සම්බන්ධව කථා කළා. එතුමාත් සාධාරණ මන්ත්‍රීවරයෙක්. මා ඉන්න කමිටුවල එතුමාත් ඉන්නවා. එතුමාත් පිළිගන්නවා ඇති, මල නොතළා රොන් ගන්නවා වාගේ තමයි මේ බදු අය කිරීමේ කටයුතු කරන්න ඕනෑ කියන එක. බදු ගෙවන මනුස්සයා මරලා විනාශ කරලා බදු එකතු කරන්න බැහැ. මේක ලෝකයේ තිබෙන සංකල්පයක්. බදු ගෙවන මනුස්සයා ආරක්ෂා කරලා ඒ බදු ගෙවන මනුස්සයා තවත් දියුණු කරලා තමයි බදු ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වෙන රටවල කරන්නේ බදු සම්බන්ධව දැනුවත් කරලා, ඒ සම්බන්ධ නීති තද කරලා, බදු දැලෙන් මිදෙන්න බැරි වෙන්න ඒ බදු නොගෙවන පිරිස කොහොම හරි ඒකට එකතු කරගන්න එක. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වයසක මව, අපේ අම්මලා-තාත්තලා කොම්පියුටර් එක හරහා බදු ගෙවන්න දන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ සේවකයන්ගේ නම්, පඩියෙන්ම ඒ බදු අඩු කරගන්නවා. ඔවුන් වෙන ව්‍යාපාර කරන්නේ නැහැ. බැරි වෙලාවත් ගමේ පොඩි බිස්නස් එකක් කරන මනුස්සයෙකුට බදු ෆයිල් එක දාගන්න බැරි වුණොත්, ඒ කටයුත්ත online ක්‍රමයට කරන්න දන්නේ නැත්නම් ඒ පුද්ගලයා හිරේට යන තත්ත්වයට පත් කරන්න පුළුවන්. ඔහුගේ ජීවිතය අවසන්. හිරේ ගිය පුද්ගලයෙකුට ආපසු ව්‍යාපාරයක් කරන්න හම්බ වෙන්නේ නැහැ. අපි යෝජනා වගයක් ඉදිරිපත් කරලා තිබෙනවා, මෙය සංශෝධනය කරන්න. හිතක් පපුවක් තිබෙනවා නම්, සාමාන්‍ය මනුස්සයෙකුට වෙන ව්‍යසනයක් සම්බන්ධයෙන් යම් හැඟීමක් තිබෙනවා නම්, මෙය සංශෝධනය කරන්න. නිකම් හිරේ දාන්නේ නැතුව මේ බදු සම්බන්ධයෙන් අනුගමනය කරන්න පුළුවන් ක්‍රියාවලියක් අපේ සංශෝධන ඇතුළේ තිබෙනවා. අපි ඒවා ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් වෛද්‍යවරයෙක්. ඔබතුමාට හොඳ දැනුමක් තිබෙනවා. මේ ආණ්ඩුව වැඩ වරද්දාගෙන තිබෙන්නේ. ආර්ථිකය නැටිටට බැහැලා තිබෙන්නේ. ඔබතුමා ඒක පිළිගන්වා ඇති. විශේෂයෙන්ම ගල් අහුරු හොරකම පටන් ගත්තාට පස්සේ රුපියල් බිලියන 500කට වැඩියි, එහි අලාභය. එන්න එන්නම එහි ripple effect එකක් තිබෙන්නේ. විදුලිය නිපදවන සමාගම් 390කට බිලියන 15ක් ගෙවලා නැහැ. Solar, hydro, windවලින් විදුලිය ජනනය කරන සමාගම්. කොහොමද ඒ අය පඩි ගෙවන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ? කයිය ගහනවා. බොරු පුරාජේරු කථා කියනවා. සමාගම් 390කට මාස පහකට මුදල් ගෙවලා නැහැ. ඒ කර්මාන්තවල සේවය කරන අයට පඩි ගෙවන්නේ කොහොමද? ගෝඨාභය රාජපක්ෂගේ අණ්ඩුව - නාමල් රාජපක්ෂ මහත්තයාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමාටත් මතක ඇති - බිල් ගෙවන්නේ නැතුව දිගට දිගට ඇවිල්ලා තමයි ඒ ආණ්ඩුව වැටුණේ. මේ ආණ්ඩුවේ සල්ලි තිබියදී මේ මුදල ගෙවා ගන්න බැරි වුණාම ඒක එන්න එන්නම ආණ්ඩුවේ ණය බරට එකතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නන්දලාල් මැතිතුමා තමයි එහෙන් මෙහෙන් පොඩි පොඩි වාසි ගන්න ආණ්ඩුව හෝද-හෝදා හිටියේ. දැන් නන්දලාල් මහත්මයා ඇවිල්ලා කියනවා, අනාගතය ෂුවර් නෑලු; ආර්ථිකය අවිනිශ්චිතයිලු. මහ බැංකුවේ අධිපතිවරයායි කියන්නේ, "අනාගතය ෂුවර් නැහැ" කියලා. එතුමා නේ කියන්න ඕනෑ, අනාගතය මෙහෙමයි, අනාගතයේදී පොඩි පොඩි ප්‍රශ්න එනවා කියලා. නමුත්, දැන් මේ අනිල් ජයන්ත මහත්මයා කියන්නේ මොකක්ද? ලෝකයේ අර්බුද එනකොට අපට ඒවා කළමනාකරණය කර ගන්න බැරිලු. එහෙම නම්, ඒක තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කරන්න තිබුණා නේ. "ලෝකයේ යම් අර්බුදයක් ආවොත් අපට මොකවත් කර ගන්න බැහැ" කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයට දාන්න තිබුණා නේ; ප්‍රතිපත්ති ප්‍රකාශනයට දාන්න තිබුණා, "ලෝකයේ අර්බුදයක් ඇති වුණොත් අපි silent වෙනවා" කියලා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඇති වුණු ව්‍යසනය මීට වඩා දහගුණයක ව්‍යසනයක් නේ. ඒ කාලයේ ලෝකයේ රටවල් අවුරුදු දෙකකට වැහුවා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට පස්සේ ආයෙත් කොහොමද, ආර්ථිකය ලේසියෙන් උස්සලා තියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පවතින තත්ත්වය හමුවේ ඉන්දියාවේ රුපියලේ අගය අඩු වෙලා නැහැ. ඉන්දියාවේ ආර්ථිකය කළමනාකරණය කරගෙන තිබෙනවා. ඉන්දියාවේ ලයිට් බිල වැඩි කරලා නැහැ. මීට කලින් මම මේ අනතුරු ඇඟවීම කළා. "උඹට පාන්ද?" කියලා දැන් මට Facebook එකේ බණිනවා.

අපට නොවෙයි, දුප්පත් ජනතාවටයි පාන්. නන්දලාල් මහත්මයාම කියන ආකාරයට ණය ප්‍රමාණය සියයට 30කට, සියයට 40කට වඩා වැඩි වෙලා තිබෙනවා. මේ අවුරුදු එකහමාරට ණය ප්‍රමාණය ට්‍රිලියන 5යි. ණය ගෙවන්න ණය ගන්න ඕනෑ. රාජපක්ෂවරු එන්න ඉස්සෙල්ලා ණය තිබුණේ ට්‍රිලියන 2යි. රජපක්ෂවරු ණය කළමනාකරණය කළේ නැහැ. ට්‍රිලියන දහයක්, ට්‍රිලියන දොළහක් එකතු කළා. ඊට පස්සේ ඒ ණය ගෙවන්න දිගින් දිගටම ණය ගන්න වුණා. එතකොට අනුර කුමාරලා මොනවාද ඇහුවේ? "ණය ගන්න ඕනේ නැහැ, ණය ගන්න ඕනෑ නම් ආණ්ඩුවක් ඕනෑද?" කියලා නේ, ඒගොල්ලන් ඇහුවේ. හුණ්ඩුවක් ගැන කියපු කට්ටිය දැන් ඇවිල්ලා ට්‍රිලියන 5ක් ණය අරන්. එහෙම කරලා කයිවාරු ගහනවා. මේ ආර්ථිකය ඉවරයි; සුන්බුන් වෙලා තිබෙන්නේ. අපි කිව්වා, මේ ආර්ථිකය විනාශ වෙනවා කියලා. මම නොවෙයි ඒක කියන්නේ. ADB එකයි කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ADB එක කියනවා, "Sri Lanka's export sector is operating far below its true capacity..." කියලා. ආණ්ඩුවේ නොහැකියාව හින්දා exports වැටිලා. ADB එක තවදුරටත් කියනවා, "... leaving an estimated US Dollars 6 billion in potential earnings untapped and exposing the economy to mounting external risks. A recent assessment by the Asian Development Bank (ADB) paints a concerning picture: if this dormant capacity were fully activated, the country's exports could surge by as much as 4 per cent, providing a much-needed cushion as foreign debt repayments intensify in the coming years." හරියට කළමනාකරණය කළොත් අපනයනය සියයට 4කින් ඉහළට යන්න ඕනෑ කියලා ADB එක කියනවා. තවදුරටත් කියනවා, "ADB warns of lasting social scars from Sri Lanka's overlapping crises. These shocks have tested the resilience of the country and its people, pushed many households into poverty" කියලා. මේ අයගේ නොහැකියාව නිසා මේ රටේ පවුල් දුප්පත් කරලා හිහන්නන් බවට පත් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද දිගින් දිගටම සිදු වන හොරකම් ටික දිහා බලන්න. එකක් තමයි, ගල් අහුරු වංචාව. NDB එකේ වංචාව ඩොලර් මිලියන 13යි. ඊළඟට, ඕස්ට්‍රේලියාවට මුදල් යැවීමේදී වෙච්ච වංචාව ඩොලර් මිලියන දෙකහමාරයි. ඒ වාගේමයි, RDA එක කරපු double payments; SriLankan Airlines සමාගමට අදාළ වැරැදි payments. එවැනි වැරැදි දිගින් දිගටම සිදු වුණා. ඒ වාගේමයි, People's Bank එකේ වැරැදි ගෙවීම්. ඊළඟට, Department of Posts ගෙවපු ඩොලර් ලක්ෂ 6. ඒ වාගේම, අස්වැසුම මුදල් දෙපාරක් ගෙවීම. මට ඒවා ගණන් කර ගන්නත් බැහැ. අප ගණන් හදලා තිබෙන විධියට රුපියල devalue වන එකේ පාඩුව ඩොලර් බිලියන 1,000යි. ඒ කියන්නේ, US Dollars 1 trillion. මේ ඔක්කොම පාඩුව සිදු වෙලා තිබෙන්නේ ජනතාවටයි. දේශපාලනමය වශයෙන් අපි රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකඟ නැහැ. හැබැයි, එතුමා ඩොලර් බිලියන 6.8ක් ඉතුරු කරලා ගියා. පැවැති ආර්ථික තත්ත්වය අනුව දැන් ඒ සංචිතය ඩොලර් බිලියන 12ක, 14කවත් තිබෙන්න ඕනෑ. ජනතාවගේ බෙල්ල මිරිකලා රනිල් වික්‍රමසිංහ මහත්මයා තමයි ඔය tax ගැහුවේ. ඒ tax ගහපු නිසා තමයි ඔය ටිකවත් ඇදගෙන ආවේ. අපි හිතුවා, ඔබතුමන්ලා මේ ආර්ථිකය ඒ මට්ටමේ හෝ තියාගෙන යයි කියලා. නමුත් එහෙම කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ අයට කරන්න බැරි වෙනකොට තව මාස හතරකින් අනුර කුමාර මහත්මයා විපක්ෂයට අඬගහනවා, ජාතික ආණ්ඩුවක් හදන්න එන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් තිබෙන මේ තත්ත්වය අනුව අනුර කුමාර මහත්මයා කියන්නේ 'මටත් වැඩ බැහැ, අපේ එවුන්ටත් වැඩ බැහැ' කියලා. ඒක පිළිගෙන තිබෙනවා. මම මේවා කියන්නේ දේශපාලන වශයෙන් ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරන්න නෙවෙයි. මේක අමාරු වැඩක්. රාජ්‍යකරණය කියන එක ලේසි වැඩක් නොවෙයි. ඒ හින්දා අපි ඉල්ලා සිටිනවා, මේ රටේ මිනිසුන් කබලෙන් ලිපට දමන්නේ නැතුව, මේ රටේ මිනිසුන් දුප්පත් කරලා විනාශ කරන්නේ නැතුව නඟා සිටුවන්න කියලා. අපට මේ රට දෙවනාවක් බංකොලොත් වෙන්න දෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ හින්දා මේ රට ගොඩනැඟීම සඳහා ඕනෑම පුද්ගලයෙකුට කථා කරන්න. දේශපාලනමය වශයෙන් අපට කිසි දෙයක් ඕනෑ නැහැ. මේ රට බේරා ගන්න. මම අද කිව්වා කියලා ලියලා තියාගන්න. ඇමෙරිකානු ඩොලර් එක රුපියල් 360 පනිනවා. තව මාස 5කින් මේ රට යන තත්ත්වය කොතැනටද කියලා බලන්න. ඩොලර් එක තිබුණේ රුපියල් 290ට. දැන් 330යි. දැන් ඩොලර් එකේ අගය දවසින් දවස රුපියල ගණනේ නඟිනවා.

අද ඉන්දියාවේ විදුලි බිල වැඩි කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Arjuna Sujeewa Senasinghe, your time is up.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අනුර කුමාර ජනාධිපතිතුමා කියන විධියට අපි තෙල් අරගෙන තිබෙන්නේ කීයටද? බොරතෙල් බැරලයක් ඩොලර් 280ට. දැන් ඩීසල් ලීටර් 1ක් සඳහා රුපියල් 750ක් යනවාලු. එතකොට, ඒ සල්ලි ගෙවන්නේ කොහොමද? ඒ තමයි නොහැකියාව. චූන් පාන් ගන්නවා වාගෙයි මුහුදු අයිනේ ඉඳලා තෙල් නැව් නවත්වලා තෙල් ගන්නේ. ගල් අහුරු ගන්නේත් එහෙමයි. යන එවුන්ට අත වනලායි ගන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ හින්දා තව මාස හතරකින්, පහකින් විශාල අගාධයකට වැටෙනවා; අපට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් මේ රට තුළ ඇති වෙනවා; ජීවන වියදම පාලනය කර ගන්න බැරිව අහස උසට යනවා. මේ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් නොගත්තොත්, මේ රට නැවත බංකොලොත්භාවයට පත් වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Nimal Palihena. You have nine minutes.

[අ.භා. 1.43]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අප එළඹ සිටින්නේ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිළිබඳ විවාදයටයි. මේ අවස්ථාවේදී මම කැමැතියි, බදු ආදායම එකතු කර ගැනීම සම්බන්ධයෙන් වන නිශ්චිත කරුණු ප්‍රමාණයක් මේ ගරු සභාව හමුවේ තබන්න. මොකද, ආර්ථික සංවර්ධනය කියන කාරණාව හුදෙකලාව සිදු වන දෙයක් නොවෙයි. එය ආදායම් උත්පාදනයත් එක්ක බැඳිලායි තිබෙන්නේ. අපේ රටට විශේෂ වූ ආදායම් කාණ්ඩයක් තමයි ආදායම් බදු. ඒක සෘජු බද්දක්. වක්‍ර බදු මේ රටේ හැම ජන කොටසක්ම ගෙවනවා. නමුත් අපේ බදු පදනම තුළ ඉන්න සෘජු බදු ගෙවන පිරිස ඉතාම කුඩායි;

[ගරු නිමල් පලිහේන මහතා]

සාපේක්ෂව ඉතාම අඩුයි. අද අප මේ ඉදිරිපත් කරන සංශෝධනවල අරමුණ වන්නේ බදු සම්බන්ධයෙන් වන අනුකූලතාව තවදුරටත් වැඩි කර ගනිමින්, ඒ සඳහා අවකාශය සලසමින්, අවශ්‍ය කරන සාධාරණ නෛතික පදනම මේ රටට හඳුන්වා දීමයි.

මේ සාකච්ඡාව කරගෙන යනකොට විපක්ෂයෙන් අපට ඇහෙන්නේ භීතියක් ජනතාව තුළට අරගෙන යන තත්ත්වයක කථායි. බිල්ලෝ මවලා ජනතාව රවටවලා එදා ආණ්ඩුවල ඉඳන් කරපු දේම තමයි විපක්ෂයේ ඉඳගෙන අදහස් දක්වන මන්ත්‍රීවරු අදත් කරන්නේ. අපි අපේ රටේ ජනතාවට ආරාධනා කරනවා, මේ සංශෝධන පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන්න කියලා; මේ සංශෝධන ඔබට බලපාන්නේ කොයි විධියටද කියන කාරණාව පිළිබඳව විමසිලිමත් වෙන්න කියලා.

විශේෂයෙන්ම රජයේ සේවය ගත්තාම, රජයේ සේවයේ සිටින ඕනෑම කෙනෙකු මේ කියන බදු නිර්ණායකයන්ට ඇතුළත් නම්, ඔවුන් උපයන අවස්ථාවේදීම බදු ගෙවනවා. ඒකට ඔවුන්ට බැඳීමක් තිබෙනවා; ඔවුන් බදු ගෙවනවා. නමුත්, අපේ රටේ මේ බදු පදනම තුළට, එහෙම නැත්නම් මේ බදු දැලට හසු නොවන ප්‍රජාවක් ඉන්නවා. ඔවුන්ටත් වගකීමක් තිබෙනවා මේ රටේ සංවර්ධනය, අභිවෘද්ධිය සම්බන්ධයෙන්. නම්‍යශීලීව ඔවුන් මේ තැනට අරගෙන එන්න තමයි අපි මේ උත්සාහ දරන්නේ. ඔවුන් බදු ගෙවීම මහ හරිනවා නම්; පැහැර හරිනවා නම්, එසේ පැහැර හරින්න හේතු වෙච්ච කරුණු බොහෝ ප්‍රමාණයක් තිබෙනවා. විශේෂයෙන්ම බදු අනුකූලතාව පිළිබඳව මේ රටේ කරන ලද අධ්‍යයනවලදී අනාවරණය වෙච්ච කරුණු කිහිපයක් තිබෙනවා. මම ඒ කරුණු මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි. සරල සහ ස්ථාවර බදු පද්ධතියක් නොමැතිකම, බදු නීතිය පිළිබඳ ජනතාව දැනුවත් නොවීම, විගණනය සහ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් තිබෙන අඩුපාඩු, රජය කෙරෙහි ජනතාවගේ විශ්වාසය බිඳ වැටීම යන කාරණා ඒ අතර වනවා. මා හිතන විධියට, ඒක තමයි වඩාම ඇත්ත. බදු ගෙවන්න මිනිසුන් කැමැති වුණත්, බදු සල්ලි එකතු කරලා ඉතිහාසය පුරා මේ රටේ මොනවාද කළේ කියලා මිනිස්සු ප්‍රශ්න කරනවා. ඒ නිසා ඔවුන් බදු ගෙවන්න යම් ප්‍රමාණයකට මැළිකමක් දක්වනවා නොවෙයි, බදු ගෙවීම දැඩිව ප්‍රතික්ෂේප කරනවා, "මොනවාටද අපි බදු ගෙවන්නේ?" කියලා. මේ වෙලාවේ මම අපගේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සඳහන් කරන්න කැමැතියි, මෙන්න මේවා ගැන - ඉතිහාසය පුරා මොනවාද වුණේ කියලා - සොයා බලන්න කියලා. බදු පද්ධතිය ඇත්තටම සාධාරණ වෙන්න ඕනෑ, විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ කියන කාරණා වාගේම තාක්ෂණය උපයෝගි කර ගනිමින් බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම කියන කාරණාවත් මේ පර්යේෂණ හරහා අනාවරණ වෙලා තිබෙනවා. පර්යේෂකයන් විසින් සොයාගෙන අනාවරණය කරන ලද යම් යම් සාධනීය ගැටලු සඳහා විසඳුම් අද අප මේ ගෙන එන සංශෝධන තුළ තිබෙනවා කියන කාරණයයි මා දකින්නේ. මා කැමැතියි, මේ කියන තත්ත්වය පිළිබඳ සංශෝධන ටිකක් ඉදිරිපත් කරන්න. මෙහිදී විශේෂයෙන් කිව යුතුයි, මහා පරිමාණ ආයෝජකයන්ට පමණක් හිමි වෙලා තිබ්බ ප්‍රාග්ධන දීමනාවට අදාළව කලින් පැවැති ඩොලර් මිලියන 3 සීමාව මේ සංශෝධනය තුළින් ඩොලර් 250,000ක් දක්වා අඩු කර තිබීම ගැන. එදා මහා පරිමාණයෙන් කර්මාන්තවලට ආපු අයට විතරක් තිබ්බ ඒ අවස්ථාව, අවකාශය අද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ටත් මේ හරහා හිමි කර දීම ඇත්තටම සාධාරණයි. ඒ තුළ ඔවුන්ට බය නැතිව තමන්ගේ ව්‍යාපාර කටයුතු සාර්ථකව කර ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ වාගේම, බදු ගණනයේදී ඒවා අඩු කර ගැනීමට අවස්ථාව, හැකියාව මේ සංශෝධන මඟින් ලබා දීලා තිබෙනවා.

නීතියේ අඩුපාඩු නිසා යම් යම් ප්‍රමාණයන්ගෙන් දඬුවමට ලක් වෙනවා කියන කාරණාව විපක්ෂය බොහොම ඉහළින් සඳහන් කරමින්, ජනතාව බය කරමින් කථා කරන තත්ත්වයක් යටතේ අපි මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. පනතෙහි එක්තරා වගන්තියක් සංශෝධනය වන අවස්ථාවේදී සඳහන් කරනවා, යම් විධියකට return එක submit කළේ නැත්නම් හෝ අදාළ අවස්ථාවේදී පෙනී සිටියේ නැත්නම් ඒ අයට නඩු පවරනවා, එහෙම නැත්නම් දඩ ගහනවා කියන කාරණාව. ඇත්තටම නීතිය ශක්තිමත් නැත්නම් මිනිස්සු මේවා ක්‍රියාත්මක කරන්න බැඳෙන්නේ නැහැ. ඒ නිසා මේ පෙළඹවීම කරන්නේ ඔවුන් බදු ගෙවීමේ ක්‍රියාවලිය තුළට අරගෙන එන්න මිසක් දඩු කඳේ ගහලා රජයේ ආදායම් තර කර ගන්නවා කියන පරමාර්ථයෙන්ම නොවෙයි.

මම මෙහිදී විශේෂයෙන්ම මේ කාරණය මතක් කරන්න කැමැතියි. මේ සංශෝධන ඉතාම සාධනීයයි. ජනතාවගේ පැත්තෙන් හැම පුරවැසියෙකුටම වගකීමක් තිබෙනවා, මේ රටේ අභිවෘද්ධිය වෙනුවෙන්, පොදු අරමුණු වෙනුවෙන් යුතුකම් දන්නා පුරවැසියන් විධියට තමන් ගෙවිය යුතු බදු මුදල් ගෙවන්න. බදුවලින් කර අරින්න ඕනෑම කෙනෙකුට පුළුවන්; බදු පැහැර හරින්න ඕනෑම කෙනෙකුට පුළුවන්. නමුත්, බලය තිබූ පමණින් රජයකට තනිවම මේ සියල්ල කරන්න බැහැ. මේක එකතු වෙලා යන්න ඕනෑ ගමනක්. රටේ ජනතාවට වගකීමක් තිබෙනවා, පොදු පහසුකම් සංවර්ධනය කිරීම සහ අනෙකුත් අරමුණු ඉටු කිරීම වෙනුවෙන් ක්‍රමානුකූලව බදු ගෙවීම සඳහා හුරු වෙන්න; බදු සම්බන්ධයෙන් මූලධර්මයක් විධියට කථා කරන "සාධාරණත්වය" කියන කාරණාවේදී ඇත්තටම තමන් උපයන ආදායමට සාපේක්ෂව සාධාරණ ගෙවීමක් කරන්න. මම එක උදාහරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම තනි පුද්ගල සහ හවුල් ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ලාභ බද්ද තිබුණේ සියයට 10යි. නමුත්, අනෙකුත් ආයතන සියයට 30ක් ගෙවනවා. එතකොට මෙතැනදී අපට පෙනෙනවා, යම් ආකාරයකට සියයට 30 සහ සියයට 10 අතරේ පරස්පරයක් තිබෙන බව. අපි මේ අවස්ථාවේදී ක්‍රමානුකූලව තනි පුද්ගල සහ හවුල් ව්‍යාපාර සඳහා වන ඒ සියයට 10ක ප්‍රමාණය සියයට 15 දක්වා වැඩි කර තිබෙනවා. මේ හැම දෙයක්ම තර්කානුකූලව සහතික කරමින් තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත අරගෙන ඇවිල්ලා තිබෙන්නේ.

මේ තත්ත්වය හමුවේ අප කියන්නේ, මේ සම්බන්ධයෙන් ජනතාව බිය විය යුතු නැහැ, එන්න අපිත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න කියලායි. මේ ක්‍රියාත්මක වන තත්ත්වය යටතේ එහි සියලු ප්‍රතිලාභ නැවත ජනතාවට ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න එකතු වන්න කියන ආරාධනයත් අපේ රටේ ජනතාවට මම මේ අවස්ථාවේදී කරන්න කැමැතියි.

බදු ගැන කිව්වාම ගොඩක් අය ඉතිහාසයේ ඉඳන්ම බය වන තත්ත්වයක් තමයි තිබෙන්නේ. අප ඉගෙන ගත්තු කාලයේ - විශ්වවිද්‍යාලවල ඉගෙන ගත්තු කාලයේ වුණත් - විශේෂයෙන් බදු ගණනය කරන ආයතනවලට ගියාම බොහෝ වෙලාවට නියමිත, නිශ්චිත බදු ප්‍රමාණය ගෙවන්න අවස්ථාව, අවකාශය සැලසෙන්නේ නැහැ. තිබෙන බය නිසාම ඒ අය අවශ්‍ය ප්‍රමාණයට, මෙන්න මේ වාගේ බද්දක් ගෙව්වොත් ඇති කියන යෝජනා කරන තත්ත්වයන් යටතේ බදු ගෙවපු ඉතිහාසයක් තිබුණා. නමුත්, අපි මෙහිදී බිය විය යුතු නැහැ. තක්සේරුව හරියට අරගන්න පුළුවන් නම්, ඒ තක්සේරුව තුළ ජනතාවට පුළුවන් අදාළ බදු කාර්තුගතව ඒ කියන ප්‍රමාණයට ගෙවීම් කටයුතු කරන්න. මේ පනත් කෙටුම්පත මඟින් ගෙනැවිත් තිබෙන සංශෝධනයකට අනුව, තමන්ට පුළුවන් නම් ස්වයං තක්සේරුවක් කර ගන්න තමන්ගේ ආදායම මෙච්චරයි කියලා, ඒ තක්සේරුව ඉදිරිපත් කරලා ඊට අනුකූලව ඒ ගාස්තු ගෙවාගෙන යාමේ

හැකියාව තිබෙනවා. එතකොට ඔවුන් තුළ රජය කෙරෙහි විශ්වාසයක් ඇති වෙනවා, "අපි මේ කරන කාරණාව සම්බන්ධයෙන් ඇගයීමක් තිබෙනවා" කියලා. ඒ වාගේම, ඒකට තවත් සංශෝධනයක් එකතු වෙනවා. ඔහු ගිය අවුරුද්දේ ගෙවපු බද්දට වඩා සියයට 20ක් වැඩියෙන් ගෙවනවා නම්, ඒ සම්බන්ධයෙන් විගණන කර්තව්‍ය සඳහා ඉදිරිපත් වන තත්ත්වයන් ඇත්තටම අවශ්‍ය නැහැ කියන තැනට කටයුතු කරන්න අවශ්‍ය කරන සංශෝධන ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
මේ කාරණයත් කියන්න මට පොඩි අවසරයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විපක්ෂයෙන් එක අදහසක් අරගෙන ආවා, RAMIS එක හුදෙකලාවේ දුවනවා, තොරතුරු එක්ක අන්තර් සම්බන්ධතාවක් නැහැ කියලා. මම මේ වෙලාවේ ඒකට උත්තරයක් දෙන්න අවශ්‍යයි. ඇත්තටම Revenue Administration Management Information System එක, බැංකු පද්ධතිය, Sri Lanka Customs ඇතුළු රජයේ ආයතන විශාල ප්‍රමාණයක් සමඟ සම්බන්ධ වෙලා තිබෙන නිසා, ඒ හැම තොරතුරක්ම ඒකාබද්ධව තිබෙන නිසා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් එකතු කර ගැනීමේ කර්තව්‍යය සඳහා ඉතා ඉහළ සේවයක් කරනවාය කියන කාරණාවත් මතක් කරමින්, මේ ගෙන එන බදු සංශෝධන මේ රටේ අභිවෘද්ධිය, ආදායම් උත්පාදනය සහ ආර්ථික සංවර්ධනය සඳහා වඩා ඵලදායී ලෙස යොදා ගන්න සුදුසු බවත් සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Namal Rajapaksa. You have seven minutes.

[අ.භා. 1.53]

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර 30ක් පැවැති යුද්ධය අවසන් කරලා මේ වෙනකොට වසර 17ක් වෙනවා. ඊයේ වැනි දිනයක තමයි යුද්ධය අවසන් කළේ. අද වැනි දිනක තමයි හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා පාර්ලිමේන්තුවේදී එය නිල වශයෙන් දැනුම් දුන්නේ. ඒ යුද ජයග්‍රහණය සඳහා මේ රටේ විශාල පිරිසක් කැපවීම් කළා. ඒ රණවිරුවන්, පොලීසිය, සිවිල් ආරක්ෂක බළකාය වාගේම මේ රටේ පුරවැසියන්. දමිළ, සිංහල, හින්දු යන හැම ජන වර්ගයක්ම නියෝජනය කරන මේ රටේ පුරවැසියන් ඒ යුද්ධය අවසන් කිරීම සඳහා විශාල කැපවීමක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සමහරුන්ට රණවිරුවන්ට "රණවිරුවන්" කියා ගන්න බැරි වුණාට, ඔවුන් කරපු කැප කිරීම නිසා තමයි ඒ බහුතරයක් අය අද නිදහසේ ඉන්නේ.

අද සමහරු අර්ථකථනය කරන්න හදනවා, අපි දමිළ ජනතාවට විරුද්ධව යුද්ධ කළා කියලා. නැහැ. අපි සටන් කළේ, එල්ටීටීඊ ත්‍රස්තවාදීන් එක්ක. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් එක්ක මිස දමිළ ජනතාව එක්ක නොවෙයි, අප යුද්ධ කළේ. ඉන්දියානු අග්‍රාමාත්‍යවරයා ඝාතනය කළ, අපේ විපක්ෂ නායකතුමාගේ පියා - සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා, රණසිංහ ප්‍රේමදාස මහත්මයා - ඝාතනය කළ, මේ රටේ රාජ්‍ය නායකයන් බහුතරයක් ඝාතනය කරන්න සැලසුම් කරලා ක්‍රියාත්මක වෙච්ච, ලක්ෂ්මන් කදිර්ගාමර් මහත්මයා වැනි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරපු දමිළ නායකයන් ඝාතනය කළ, දොරේඅප්පා නගරාධිපතිවරයාගෙන් පටන් ගෙන ලක්ෂ්මන් කදිර්ගාමර් මහත්මයා වැනි අය දක්වා ඝාතනය කළ, අරන්තලාවේ භික්ෂු ඝාතනය කළ, කාත්තන්කුඩි මුස්ලිම් පල්ලියේ යාඥා කරමින් හිටපු අය ඝාතනය කළ, කැබිතිගොල්ලෑවේ බස් බෝම්බය තියපු අය එක්ක තමයි අපි යුද්ධ කළේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා පාසල් යන පුංචි දරුවාගේ කරට දුන්නේ සයනයිඩ් කරලක්. ඒ ත්‍රස්තවාදය අවසන් කරලා, ඒ සයනයිඩ් කරල ගලවලා පෑන අතට දීපු නිසා තමයි අද ඒ දරුවන්ට උසස් පෙළ විභාගයෙන් ලංකාවේ එක, දෙක, තුන ස්ථාන අතරට එන්න පුළුවන් තත්ත්වයට උතුරු පළාත පරිවර්තනය වුණේ; ඒ යටිතල පහසුකම් සංවර්ධනය වුණේ. ඒවා ගැන මම වැඩිය කථා කරන්න යන්නේ නැහැ. හැබැයි ඒ ගෞරවය ඒ රණවිරුවන්ට, එදා හිටපු නායකයන්ට දෙන්න බැරි නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව මේ අයට නම් ඉතින් ඒ ගැන කියලා වැඩක් වෙන්නේ නැහැ. මොකද, මේ අයගේ ඉතිහාසය ගත්තාම, බල නහර කපපු ඉතිහාසයක් තිබෙන්නේ. බල නහර කපපු ඉතිහාසයක් තිබෙන්නේ. අදත් එහෙමයි. දැනුත් එහෙමයි. ඉතින්, අපි ඔබතුමා වැනි අය ගැන කනගාටු වෙනවා. හැබැයි ඒක තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යථාර්ථය. අද වෙනකල් රටේ රාජ්‍ය නායකයා විධියට ජනාධිපතිවරයාට, අගමැතිවරියට කටින් කියන්න බැරි නම් අඩුම ගණනේ Facebook එකේ දමන්න, අඩුම ගණනේ X පණිවුඩයක් දමන්න, අවුරුදු 30ක් තිබුණු යුද්ධය අවසන් කරපු රණවිරුවන්ට, ආබාධිත රණවිරුවන්ට සුබ පතලා. මම දැක්කා, අද රණවිරුවන් බලන්න ගිහිල්ලා තිබෙනවා. එක පැත්තකින් ත්‍රස්තවාදී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන සමහර අයට මේක සමරන්න පුළුවන්. හැබැයි අපි දැක්කා ඊයේ විමල් වීරවංශ හිටපු අමාත්‍යවරයා මේක සමරන්න ගියාම එළව එළවා ගහන තත්ත්වයට පොලීසිය පරිවර්තනය වෙලා තිබුණා. ලජ්ජයි!

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දුවනකොට වැටුණා.

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔව්, ඔව්. දුවනකොට වැටෙන්නේ කවුද කියලා බඩගාන කට්ටිය දන්නේ නැහැ. ඒ නිසා පරිස්සමින් ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බඩගාන අය නේ, කථා කරන්නේ. ඒ නිසා ඔය බල නහර කැපිල්ල තියාගන්න. බලමු, මොකද වෙන්නේ කියලා. හැබැයි, ඒ තැනට අද මේ සමාජය පරිවර්තනය කරන්න මේ අය කටයුතු කරලා තිබෙනවා.

අපි පැහැදිලිව කියනවා, අපි සටන් කළේ දමිළ ජනතාව එක්ක නොවෙයි, එල්ටීටීඊ ත්‍රස්තවාදීන් එක්ක කියලා. ඒ වාගේම අපි සටන් කළේ මේ රටේ ඒකීයත්වය ආරක්ෂා කරන්නයි. ඒ නිසා මොන අභියෝගය ආවත්, මොන අභියෝගයට මුහුණ දෙන්න සිද්ධ වුණත් මේ රටේ ඒකීයත්වය ආරක්ෂා කිරීමත්, රණවිරුවන් වෙනුවෙන් පෙනී හිටීමත් අපි කරනවාය කියන එක තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ.

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

දැන් රාජ්‍ය ආදායම ගැන බොහෝ අය කථා කළා. බදු වැඩි කරලා, අසීමිත විධියට බදු වැඩි කරලා, ලක්ෂ 12ට කාර් එකක් ගන්න හිතාගෙන ඉන්දය දීපු තරුණයන්ටත් සියයට 50කින් බද්දක් ගහලා, අසීමිත විධියට බද්ද වැඩි කරලා දැන් කියනවා, TIN එක නැත්නම් නඩු දමනවාලු. මාස හයක් හිරේ දමනවා, TIN එක නැත්නම්. ඔබතුමන්ලා බලයට එන්න කලින් මේ TIN එක පිළිබඳව සමාජයේ කතිකාවක් හැදෙනකොට, එදා ආණ්ඩුව ප්‍රතිපත්තියක් විධියට ඒක ක්‍රියාත්මක කරන්න ලෑස්ති වෙනකොට මොකක්ද ඔබතුමන්ලා කිව්වේ? TIN එක ඕනෑ නැහැ කිව්වා, රට හදන්න. හැබැයි, දැන් බලයට ආවාට පස්සේ මොකක්ද කියන්නේ? TIN එක නැත්නම් හිරේ දමනවාලු. ඔබතුමන්ලාට මේක තේරෙන්නේ නැහැ. මේ ඉන්න අයගෙන් බහුතරයක් බදු ගෙවලා නැහැ. මේ අය ජීවිතේට බදු ගෙවලා නැහැ. ඒ නිසා ඔබතුමන්ලා ඒකේ තිබෙන අමාරුව දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම ගෙවලා තිබෙන්නේ. ඔබතුමන්ලාගේ අය ඒක හොයලා තිබෙන්නේ. මාස ගණනක ඉඳන් හොයනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජීවිතේට බදු ගෙවපු නැති අය මෙතැන කෑ ගහනවා. නමුත් ඒ අයට තේරෙන්නේ නැහැ, මේ රටේ සාමාන්‍ය ජනතාවට ඒකෙන් ඇතිවෙන පීඩනය. සාමාන්‍ය ජනතාවට පීඩනයක් ඇති කරලා අනෙක් පැත්තෙන් මොකක්ද කරන්නේ? ආණ්ඩුව අසීමිත විධියට බද්ද පටවනවා විතරක් නොවෙයි, ඒක යම්කිසි විධියකින් ගෙවන්න බැරි වුණොත් තමන්ගේ සුපුරුදු න්‍යාය පත්‍රය, මර්දනයේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා.

අපි දැක්කා, මහ බැංකු අධිපතිවරයා පසුගිය දිනක ප්‍රකාශයක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකු අධිපතිවරයා ප්‍රකාශයක් කරනවා, රුපියල කඩා වැටෙන්න හේතුව මොකක්ද කියලා. ලංකාවට දවසකට අමතර තෙල් ලීටර් ලක්ෂ 8ක් ගෙන්වන්න ඕනෑ. දළ වශයෙන් දවසකට තෙල් ලීටර් ලක්ෂ 8ක් ගෙන්වන්න ඕනෑ. ඒක ලක්ෂ අටහමාර වෙන්නත් පුළුවන්. ලක්ෂ නවය වෙන දවසුත් තිබෙනවා. ඇයි දවසකට අමතර තෙල් ලීටර් ලක්ෂ 7ත්, 9ත් අතර ප්‍රමාණයක් ගෙන්වන්න සිද්ධ වුණේ? ඒ බාල ගල් අඟුරු ගෙනැල්ලා වෙච්ච පාඩුව මකාගන්නයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බාල ගල් අඟුරු ගෙනැල්ලා වෙච්ච පාඩුව මකාගන්න, අවශ්‍ය විදුලි ඒකක ගණන නිෂ්පාදනය කරන්න තෙල්වලින් විදුලිය නිෂ්පාදනය කරන්න ඕනෑ. ඒ සඳහා දවසකට අමතර තෙල් ලීටර් ලක්ෂ 7ත්, 9ත් අතර ප්‍රමාණයක් ගෙනෙන්න ඕනෑ. ඒ, වැඩිම මිලට. ලෝකයේ තෙල් බැරලයක් ඩොලර් 286යි, 302යි අතර මිලකට තමයි මිලදී ගන්නේ. දැන්, මහ බැංකු අධිපතිවරයා කියනවා, තෙල් මිලදී ගැනීමට සිද්ධවීම මත, ලෝක තෙල් මිල හින්දා තමයි රුපියල කඩා වැටෙන්නේ කියලා. ඒ කියන්නේ මොකක්ද? අමතර, නැත්නම් වැඩිපුර තෙල් මිලදී ගන්න සිද්ධ වුණේ, ඔබතුමන්ලාගේ බාල ගල් අඟුරු මගඩිය හින්දා කියන එකත් මතක් කරන්න ඕනෑ.

දැන් කියනවා බදු ගෙවන අයගේ සල්ලි ආරක්ෂා කරනවාලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම ආරක්ෂා කරන්නේ කොහේද? අර පෞද්ගලික බැංකුවකින් රුපියල් මිලියන 13ක් අතුරුදහන්. ඒක, මුදල් අමාත්‍යාංශය දන්නෙත් නැහැ, මහ බැංකුව දන්නෙත් නැහැ. රාජ්‍ය බැංකුවකින් රුපියල් මිලියන හයසිය ගණනක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒක, මුදල් අමාත්‍යාංශය දන්නෙත් නැහැ, මහ බැංකුව දන්නෙත් නැහැ. අනෙක් පැත්තෙන් RDA එක double payment කරලා. තවම මිලියන 51ක් හොයාගන්න නැහැ. දැන් Airbus ගැන කථා කරන්නේ. SriLankan Airlines එක වෙන්නායිවලත් වැරදි ගිණුමකට මුදල් ගෙවලා, ඩුබායිවලත් වැරදි ගිණුමකට මුදල් ගෙවලා. ඒක, මේ රටේ තිබෙන ප්‍රධාන ගුවන් සමාගම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් හැකර්ලා නේ ඉන්නේ. රුපියල් කෝටි 80කට වැඩි ප්‍රමාණයක්, අද වෙනකොට රුපියල් කෝටි 90කට ආසන්න ප්‍රමාණයක් මුදල් අමාත්‍යාංශයෙන් හොරකම් කරගෙන යනවා. ඒ ජනතාවගේ බදු සල්ලි. ඔබතුමන්ලා TIN දමලා, හිරේ දමලා, බෙල්ල මිරිකලා, ව්‍යාපාරිකයන්, ව්‍යවසායකයන් අනාථ කරලා ගන්න බදු සල්ලි තමයි ඔබතුමන්ලාගේ හැකර්ලා හොරකම් කරන්නේ.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත් හැකර් කෙනෙක් දමනවා නේ, පක්ෂය නියෝජනය කරලා. අන්න, "දිවිවා" සුළි කුණාටුව වෙනුවෙන් දීපු ආධාරත් හොරකම් කරලා. ඒ පිළිබඳවත් පරීක්ෂණයක් යනවා. අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ, කරුණාකරලා ජනතාව ගැන හිතන්න, ජනතාවගේ පැත්තට කථා කරන්න කියලායි. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට ඔය කථා කිව්වේ නැහැ.

අවසාන වශයෙන් පොහොර ගැන කථා කරන්න මට විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් විදුලි බිල වැඩි වෙනවා. වතුර බිලත් වැඩිවෙනවා කියලා කියනවා. යල කන්නයට අවශ්‍ය පොහොර ප්‍රමාණය තිබෙනවා කියලා ඇමතිවරයා කියනවා. හැබැයි, ගමට ගියාම පොහොර නැහැ. තවත් පැත්තකින් වීවලට ප්‍රමුඛතාව දෙනවා කියනවා. එතකොට තේවලට? බඩ ඉරිඟුවලට? එළවලුවලට? ඊළඟට මහ කන්නය එනවා. අපි ආණ්ඩුවෙන් අහනවා, මහ කන්නයේදී ගොවියාට දරාගන්න පුළුවන් මිලට පොහොර ලබා දීමට සකස් කර තිබෙන සැලැස්ම මොකක්ද කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මහ කන්නය වෙනකොට, දරාගත හැකි මුදලකට පොහොර ලබා දීම සඳහා සැලැස්මක් ආණ්ඩුවට නැති බව තමයි ගොවි ජනතාවගේ මතය. ඒකටත් ආණ්ඩුව උත්තරයක් දෙන්න. දැන් යල කන්නය ඉවරවේගෙන එන්නේ. දැන්, ලෝකයේ ආහාර හිඟයක් සම්බන්ධයෙන් කථා වෙනවා. ඒ වාගේම ලෝකයේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව කථා වෙනවා. අපටත් පැහැදිලිවම ආහාර සුරක්ෂිතතාව සහ බලශක්ති සුරක්ෂිතතාව පිළිබඳව විශාල ගැටලුවක් තිබෙනවා. ඒවා ගැනත් අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Sandaruwan Madarasinghe. You have nine minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

[අ.භා. 2.02]

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට ගෙනෙන සංශෝධන සම්බන්ධයෙන් වූ මෙම විවාදයට එකතු වෙන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

ජාතික රණවිරු සැමරුම තිබෙන අද දවසේ මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්නට කැමැතියි. සමහර දේශපාලන පක්ෂ හා සමහර දේශපාලනඥයන් හිතාගෙන ඉන්නවා, රණවිරුවන් ඔක්කොම ඒ අයගේ පක්ෂයට අයිතියි, ඒගොල්ලන්ගේ මුළු පවුලම රණවිරුවන්ගේ භාරකාරයෝයි කියලා. අවාසනාවකට, මේ රටේ රණවිරුවන්ට ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරියට අමතරව බලලෝභී කෑදර දේශපාලනඥයන්ගේ දේශපාලන වුවමනා වෙනුවෙන් ද මැදිහත් වෙන්න සිද්ධ වුණා. ඒ මැදිහත්වීම්වල ප්‍රතිඵල විධියට යුද්ධය වෙනුවෙන් සැලකිය යුතු සේවාවක් කරපු රණවිරුවන්ට සිරගත වෙන්නත් සිද්ධ වුණා. එහෙම වෙන්න හේතුව මොකක්ද? හේතුව තමයි බලලෝභී, පාදඩ දේශපාලන සංස්කෘතිය. එහෙම නොවෙයි නම්, රාජ්‍ය බුද්ධි අංශයේ හිටපු ප්‍රධානීන්ට පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙන්නේ කොහොමද? එහෙම නොවෙයි නම්, හමුදාවේ නිලධාරීන්ට, නාවික හමුදාවේ නිලධාරීන්ට අභිංසක තරුණයන් පැහැර ගැනීම සම්බන්ධයෙන් චෝදනා එල්ල වෙන්නේ කොහොමද? එහෙම නොවෙයි නම්, ක්‍රීඩකයන් ඝාතනය කළාය කියලා, මාධ්‍යවේදීන් පැහැර ගත්තා, අතපය කැඩුවා, මැරුවා කියලා හමුදාවේ නිලධාරීන්ට චෝදනා එල්ල වෙන්නේ කොහොමද? මේවාට හේතුව තමයි බලලෝභී දේශපාලනඥයන් "රණවිරුවා" කියන නාමයට මුවා වෙලා තමන්ගේ කෑදර බල වුවමනා වෙනුවෙන් ඔවුන් පාවිච්චි කිරීම.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරකැටියේ තිබෙන සමහර සොහොන් මුර කරන්න රණවිරුවන් සිටියා. යම් අයගේ ආච්චිලාගේ, සීයලාගේ සොහොන් හදලා තිබෙනවා. යුද්ධය වෙනුවෙන් විශාල කැප කිරීම් කරපු රණවිරුවන් ඒ සොහොන් මුර කරන්න ඉන්නවා. අපි ඒවා දැකලා තිබෙනවා. වීරකැටියේ තිබෙන පොල්වතු මුර කරන්න අවුරුදු ගණනක් තිස්සේ - යුද්ධ කාලයෙන් නොවෙයි - රණවිරුවන් යොදා ගෙන තිබෙනවා. ඒ, රණවිරුවන්ට තිබෙන ආදරයකටද? ඒ විතරක් නොවෙයි. මහානායක හිමියන් දළ දා මාළිගාව වටා කාර් රේස් පදින්න එපා කියලා කියද්දීත්, එවැනි නිවේදනයක් නිකුත් කර තිබෙද්දීත් ඒ සඳහා රණවිරුවන් ලවා වැලි කොටට ගැස්සවීම ගැන පසුගිය දවස්වල කථා වුණා. ඒ රණවිරුවන්ට තිබෙන ආදරයකටද? ඒ, රණවිරුවන්ට තිබෙන ආදරයකට නොවෙයි. ඒ වාගේම හිටපු ජනාධිපතිවරුන්ගේ පුත්තු අදාළ විධිවිධානවලට පිටින් නාවික හමුදාවේ නිලධාරීන් බවට පත් වුණා. ඒ, රණවිරුවන්ට තිබෙන ආදරයකටද? ඒ, ආදරයකට නොවෙයි. රණවිරු ගෞරවය කියන්නේ, හුදු වචනවලට විතරක් සීමා වෙච්ච එකක් නොවෙයි. ඒක ක්‍රියාවලියක් ඔස්සේ ඔප්පු වෙන්න ඕනෑ. ඇත්තටම, මේ බලලෝභී දේශපාලන අරමුණුවලට රණවිරුවන් යොදාගෙන ඔවුන් අසරණ කරපු දේශපාලනඥයන්ට මේ සඳහා ඉදිරිපත් වෙන්න සදාචාරාත්මක අනිනුත් අයිතියක් නැහැ.

ඊළඟට කිව්වා, හැකර්ස්ලා ගැන. පසුගිය දවස්වල හිටපු ජනාධිපතිවරයාගේ ගිණුමකිනුත් සල්ලි ඇදලා තිබුණා, ළඟ හිටපු කෙනෙක්. බැංකු පොතේ තිබ්බිච සල්ලි ටික නියාගන්න බැරිව ආණ්ඩුවට උපදෙස් දෙනවා, හැකර්ස්ලාගෙන් මුදල් බේරා ගන්නේ කොහොමද කියන එක ගැන. ඒ විතරක් නොවෙයි. 2021දී කාබනික පොහොර නැව් ගෙනැල්ලා ඩොලර් මිලියන 6.7ක් ගෙව්වා. ඒ, ගොවියා වෙනුවෙන්ද? දැන් කථා කරනවා ගොවියා වෙනුවෙන්. ඕනෑම කෙනෙකුට මෙතැනට ඇවිල්ලා එක එක කතන්දර කියලා යන්න පුළුවන්. හැබැයි, රටේ මිනිස්සු බලන්න ඕනෑ ඒ වචන දිහා නොවෙයි, මේගොල්ලන්ගේ සමස්ත ක්‍රියාවලිය මොන පැත්තකට ඇදිච්ච එකක්ද කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. රටේ බදු ආදායම සමස්ත රාජ්‍ය ආදායමින් අතිවිශාල පංගුවක් වුණාට, ඒ බදු ආදායම එකතු කර ගැනීම, ඒවා වියදම් කර ගැනීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ ගැන රාජ්‍ය නිලධාරීන්ට හෝ ජනතාවට විශ්වාසයක් නොතිබූ වකවානුවක් තමයි අපි පසු කරමින් සිටියේ. ඒ නිසාම තමයි විශාල වශයෙන් රාජ්‍ය බදු නොගෙවීමේ සංස්කෘතියක් රට තුළ නිර්මාණය වෙලා තිබුණේ. විශේෂයෙන්ම මේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට නම්, එක පැත්තකින් අපි මේ බදු අය කර ගැනීමේ ක්‍රියාවලිය සරල කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන්, බදු පැහැර හැරීමේ සංස්කෘතිය වෙනුවට බදු ගෙවීමේ සංස්කෘතියක් ඇති කළ යුතුයි. ඒ වාගේම විවිධ පුද්ගලයන් යම් යම් නිතිරීතිවලට මුවා වෙලා බදු පැහැර හැරීමේ ක්‍රියාවලිය අපි අවසන් කළ යුතුයි. ඒ වාගේම බදු සම්බන්ධයෙන් විශ්වාසයක් ඇති කරගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ බදු ගැන කථා පසුගිය දවස්වල රජයේ පුවත්පත්වල, රටේ පුවත්පත්වල පළ වෙච්ච ප්‍රවෘත්ති කිහිපයකින් මම ඉදිරිපත් කරන්නම්. එකක් තිබෙනවා, "හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ පාලන සමයේ ආනයනික සීනි සඳහා පනවා තිබූ බදු අඩු කිරීමෙන් රජයට සිදුවූ රුපියල් කෝටි 1,590ක පාඩුව අය කර ගැනීමේ නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා ගොනු කළ මූලික අයිතිවාසිකම පෙත්සම අද කැඳවනු ලැබිය" කියලා. එය පුවත්පතක පළ වෙච්ච ලිපියක්. ඒ වාගේම තව එකක් තිබෙනවා, "අරක්කු බදු ගෙවීම පැහැර හැරිය ජොන්ස්ටන්ගේ 'වයඹ ඩිස්ටිලරීස්'අලුත් නමකින් වැඩ පටන් අරන්" කියලා. බලපත්‍රය අත්හිටුවලා තිබෙනවා. මිලියන 580ක බදු මුදලක් පැහැර හැරලා තිබෙනවා. ඒ බදු මුදල ගෙවන්නේ නැතුව "රෝයල් සිලෝන්" නමින් නම වෙනස් කරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පුවත්පත් වාර්තා කරනවා. ඉතින්, අපි කියන්නේ මෙතැනට ඇවිල්ලා ආණ්ඩුවට උපදෙස් දෙනවාට වඩා තමන්ගේ පක්ෂය නියෝජනය කරන මේ දේශපාලනඥයා සම්බන්ධ කරගෙන මේ හිඟ බදු මුදල ගෙවා දමන්න කටයුතු කළා නම්, නාමල් රාජපක්ෂ මහත්තයාට මීට වැඩිය හොඳින් ආදර්ශවත්ව බදු අය කිරීමේ ක්‍රියාවලියට දායක වෙන්න පුළුවන් බවයි.

විශේෂයෙන්ම මේ ගෙනන පනත් කෙටුම්පත යටතේ හිඟ බදු අය කර ගැනීම කියන කාරණය ගත්තොත්, සාමාන්‍යයෙන් හිඟ බදු මත පනවා තිබෙන පොලියක් සහ දඩයක් තිබෙනවාය කියන කාරණය අපි දන්නවා. සියයට 1.5ක් මාසිකව අය කරනවා. අවුරුද්දක් ගත්තොත් ඒක සියයට 18ක්. කවුරු හරි කෙනෙක් අවුරුදු 5ක් මේ බදු ගෙවීම පැහැර හැර තිබුණා නම්, අමතර සියයට 90ක් ගෙවිය යුතුයි. ඉතින්, මාස හයක් ඇතුළත මේ බදු මුදල ගෙවන්නේ නම් සම්පූර්ණ දඩ මුදල ඉවත් කරලා බදු මුදල පමණක් ගෙවන්න පුළුවන් ආකාරයට රජය සහනයක් ලබා දීලා තිබෙනවා. ඒක බොහෝ දෙනෙකුට බදු නැවත ගෙවීම සඳහා උත්තේජනයක් ඇති කරන ක්‍රියාවලියක් බවයි මට හිතෙන්නේ.

ඊළඟ කාරණය තමයි, ජීවිත රක්ෂණ ඔප්පුවලින් ලැබෙන මුදල් මත ආදායම් බදු අය කිරීම. මේ ගැන නිශ්චිත ක්‍රියාවලියක්, නිශ්චිත රේඛාවක් තිබුණේ නැහැ. සමහරු මේ ජීවිත රක්ෂණවලට මුවා වෙලා සමහර insurance companies එක්ක රජයේ යම් යම්

[ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා]

බදු පැහැර හැරීමට ක්‍රියාමාර්ග ගනිමින් තිබුණා. ඉතින් දැන් හරි පැහැදිලිව මේ පනත යටතේ ඒකට සීමාවක් ඇති කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ පනත යටතේ කාටහරි මරණයක් වෙනුවෙන් ලැබෙන දීමනාව මත, එහෙම නැත්නම් ජීවිත රක්ෂණය වෙනුවෙන් ලැබෙන දීමනාව මත බදු අය කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ. සිදු කරන අනෙකුත් ගනුදෙනුවලට තමයි මේ ජීවිත රක්ෂණ සම්බන්ධයෙන් බදු අය කිරීම සිද්ධ වෙන්නේ. විශේෂයෙන්ම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකට තෑග්ගක් හරි පරිත්‍යාගයක් දෙනවා නම්, ඒ මත තිබුණු බදු ක්‍රමය වෙනස් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලවලට ඒ වාගේ donation එකක් කරනවා නම්, ඒක donation එකක් වුණත් වටිනාකම දාලා තමයි, -

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ සඳහා ප්‍රාග්ධන බද්දක් ඇති වෙනවා. රජයේ විශ්වවිද්‍යාලයකට දෙනවා නම් ආදායම් බද්දෙන් ප්‍රාග්ධන බද්ද නිදහස් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ බදු ක්‍රියාවලිය ඇතුළේ තිබුණු සංකීර්ණතා ඉවත් කිරීම වෙනුවෙනුත්, ඒ වාගේම මේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඇති කිරීම වෙනුවෙනුත් ඉතාම වැදගත් ක්‍රියාමාර්ග රැසක් මේ පනත හරහා ඇති වෙලා තිබෙනවා කියලා මම හිතනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.11]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ප්‍රථමයෙන්ම අපේ රටේ නිදහස වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්, ආබාධිත රණවිරුවන් සියලු දෙනාම මේ වෙලාවේ සිහිපත් කිරීම අපේ යුතුකමක් වනවා. ඒක අගෞරවයට කාරණාවක් නොවෙයි. විශේෂයෙන්ම ඉතාම කනගාටුයි කියන්න, අද අපේ රටේ ජනාධිපතිවරයාට, අගමැතිවරියට, මේ ආණ්ඩුවට "රණවිරු" කියන නම පාවිච්චි කිරීමේ ගැටලුවක් පවතිනවා. Facebook post එකක් තියා, "රණවිරු" කියන නම කියා ගැනීමේත් ගැටලුවක් තිබෙනවා. ඒක ඉතාම කනගාටුදායකයි. අපේ රණ විරුවන් යුද්ධ කළේ ද්‍රවිඩ ජනතාවට විරුද්ධව නොවෙයි. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් කියන්නේ ද්‍රවිඩ ජනතාවටත් විශාල හානියක් කරපු කණ්ඩායමක්. එල්ටීටීඊ ත්‍රස්තවාදය තුරන් කරන්න කටයුතු කිරීම පිළිබඳව ඊට දේශපාලන නායකත්වය ලබා දුන් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇතුළු කණ්ඩායමටත්, ඒ වාගේම යුද ජයග්‍රහණය ළඟා කර ගැනීමට ඒ අවස්ථාවේදී ත්‍රිවිධ හමුදාවට නායකත්වය ලබා දුන් ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මැතිතුමා ඇතුළු කණ්ඩායමටත් කුහකත්වයක් නැතිව ඒ ගෞරවය මේ වෙලාවේදී අපි පුද කරනවා. ඒකේ කිසිම ගැටලුවක් නැහැ.

ඒ වාගේම මේ වෙලාවේ මම කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. විමල් වීරවංශ මැතිතුමාගේ දේශපාලන කටයුතුවලට, එහෙම නැත්නම් දේශපාලන මතයට අපි එකඟ නැහැ. නමුත්, එතුමා හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙක් රණවිරු ස්මාරකයකට ඇවිල්ලා මල් කලඹක් තැබීම වැරැද්දක්, එහෙම නැත්නම් ගැටලුවක් කර ගැනීම සුදුසු නැහැ. මේ වෙලාවේ ඒ සිද්ධිය පිළිබඳවත් මගේ කනාගටුව ප්‍රකාශ කරනවා.

අපි මේ වෙලාවේ සාකච්ඡා කරන්නේ Inland Revenue (Amendment) Bill එක පිළිබඳවයි. මේ අවස්ථාවේ අපි තේරුම් ගන්න ඕනෑ, මෙහි තිබෙන ප්‍රධානම ගැටලුව මොකක්ද කියලා. මීට ප්‍රථම තිබුණු පනතට අනුව ඇත්තටම දඬුවම් කරන්නේ, එහෙම නැත්නම් බරපතළ වරදක් ලෙස සලකන්නේ හිතාමතා බදු ගෙවීම පැහැර හැරීම, වංචාකාරී ලෙස ගිණුම් සැකසීම, ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම හා ආදායම් සැඟවීම වාගේ ක්‍රියා. ඒවා බරපතළ වංචා. එතකොට ඒවා අපරාධ වැරදි බවට පත් වනවා. හැබැයි, administrative lapses වාගේ සාමාන්‍යයෙන් යම් යම් වැරදි සිදු වන අවස්ථා තිබෙනවා. මම හිතන විධියට tax එකක් ගෙවන ඕනෑම පුද්ගලයෙක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ආයතනයක් වෙන්න පුළුවන්, ඒ ඕනෑම කෙනෙකුගෙන් යම් යම් අඩු පාඩු, administrative lapses සිදු වනවා. ඒ වාගේ අවස්ථාවලදී යම් යම් නිවැරදි කිරීම් සිදු කරනවා. මේ නව නීතියට අනුව ලියාපදිංචි නොවීම, වාර්තා ප්‍රමාදවීම, තාක්ෂණික අඩු පාඩු වාගේ කාරණා අපරාධමය වරදක් බවට පත්වීම ගැටලුවක්. ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා කියන්න උත්සාහ කරනවා, විපක්ෂයෙන් මෙහෙම කියන්නේ හොරු ආරක්ෂා කරන්න, වංචනිකයන් ආරක්ෂා කරන්න කියලා. හැබැයි අපි කිසිසේත්ම කියන්නේ නැහැ, හොරු ආරක්ෂා කරන්න ඕනෑ කියලා, වංචනිකයන් ආරක්ෂා කරන්න ඕනෑ කියලා. තමුන්නාන්සේලා තමයි ඒ පිළිබඳව කියපු දේවල් තවම නොකරන්නේ. උගන්ඩාවේ සල්ලි තිබෙනවා කිව්වා, ඩුබායිවල සල්ලි තිබෙනවා කිව්වා, අරහේ ඉඩම් තිබෙනවා කිව්වා, මෙහේ ඉඩම් තිබෙනවා කිව්වා, දැන් අවුරුදු දෙකක් ගත වෙලාත් තවම ඒවා මේ රටේ ජනතාවට ලබා දෙන්න හැකි වෙලා නැහැ. ඒ නිසා කරුණාකරලා හොරු අල්ලන්න. ඒ ගැන කිසිම සැකයක් නැහැ.

අය කර ගත යුතු, නමුත් තවම අය කර ගැනීමට හැකියාවක් නොලැබුණු බදු මුදල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ මහා පරිමාණයේ සමාගම්වලින්, එහෙම නැත්නම් පුද්ගලයන්ගෙන්. ඒ වාගේ අයට එක නීතියකුත්, අනෙක් අයට තව නීතියකුත් තමයි තිබෙන්නේ. හැබැයි, ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? ජනාධිපතිතුමා කියන්නේ, සියලුදෙනා නීතියට යටත්ලු. සියලුදෙනා නීතියට යටත් නම් ඒකට හොඳම උදාහරණය තමයි ඊයේ පෙරේදා දවසක සිදු වෙච්ච දේ. ඊයේ පෙරේදා දවසක මල්වානේ තිබෙන අර බංගලාවට තමුන්නාන්සේලාගේ ජනතා විමුක්ති පෙරමුණට හිතවත් තරුණ ශිෂ්‍ය පිරිසක් ගියා. මේ වන විට දවස් තුන හතරකුත් ගත වෙලා තිබෙනවා. හැබැයි, ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒක පුදුම වැඩක් නේ. රාජ්‍ය දේපළක් යටතට ගැනෙන ස්ථානයකට පැනලා බලහත්කාරයෙන් පදිංචි වෙලා ඉන්නකොට ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකරන හේතුව මොකක්ද? බැරි වෙලා හරි සමඟි ජන බලවේගයේ අපි හරි, විපක්ෂයේ වෙනත් කණ්ඩායමක් හරි එතැනට ගිහිල්ලා හිටියා නම් තමුන්නාන්සේලා ඔය විධියට සලකයිද? දෙවි හාමුදුරුවනේ! එහෙම නම් නඩු දාලා, CID

ගෙනිහින් කරන්න පුළුවන් හැම දෙයක්ම කරාවි. හැබැයි ඔබට හිතවත් අයට නීතිය ක්‍රියාත්මක කරනකොට තව විධියක්. තවත් කට ඇරලා ලජ්ජා නැතිව වේදිකාවක් වේදිකාවක් ගාණේ කියනවා, නීතිය හැමෝටම එකයි කියලා. නීතිය හැමෝටම එකක් වෙනවා නම් කරුණාකරලා ඒ අයට එරෙහිවත් නීතිය ක්‍රියාත්මක කරලා පෙන්වන්න.

අපි ඉතාම පැහැදිලිව කියනවා, ගල් අහුරු වංචාවට සම්බන්ධ අයට එරෙහිවත් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. මේ රටේ අහිංසක ජනතාවගෙන් බදු ගෙවීමේදී යම් සුළු අඩු පාඩුවක් සිදු වනකොට ඒ අය අපරාධ වරදකට ලක් කරන්න පුළුවන් නම්, ගල් අහුරු සිදුවීමත් එක්ක ඒ වෙච්ච මහා පරිමාණ හොරකමට සම්බන්ධ වූ අයට එරෙහිව මොකක්ද කරලා තිබෙන්නේ?

ඒ විතරක් නොවෙයි. මහා භාණ්ඩාගාරයේ, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයේ තිබුණු, බදු ගහලා, බදු ගහලා ගත්ත මුදල්වලින් ඩොලර් මිලියන 2.5ක් නැති වෙලා තිබෙනවා. සාධාරණව නීතිය ක්‍රියාත්මක වෙනවා නම් ඒ අයට එරෙහිව මොකක්ද කරලා තිබෙන්නේ? ඒ අමාත්‍යාංශ ලේකම්තුමාට මොනවාද කරලා තිබෙන්නේ? ඒ විතරක් නොවෙයි. ඒක භාරව සිටින ඇමතිවරයා මේ රටේ ජනාධිපතිවරයා. ඒ කවුරුවත් ඒවාට වග කියන්නේ නැහැ නේ. ඒ අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. අද වන විට දිගින් දිගටම මූල්‍ය කළමනාකරණය පිළිබඳව ලොකු ගැටලුවක් මතුව තිබෙනවා. මහජන බැංකුවේ මුදල් නැති වෙලා, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ මුදල් නැති වෙලා, මහා භාණ්ඩාගාරයේ මුදල් නැති වෙලා. ඒ එක්කම අස්වැසුමේ කියයි, RDA එකේ කියයි, මේ හැම තැනකම මූල්‍ය කළමනාකරණය පිළිබඳව දැවැන්ත ගැටලුවක් තිබෙන වෙලාවේ ආණ්ඩුවට හිතවත් මැති ඇමතිවරුන්ට කිසිම නීතියක් එක හා සමානව ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එම නිසා මේ වෙලාවේ අපි ඉතාම ඕනෑකමින් කියනවා, ඔබතුමන්ලා අපරාධ නීතිය තුළින් විපක්ෂය මර්දනය කරන්න, එහෙම නැත්නම් ආණ්ඩුවට විරුද්ධ කණ්ඩායම් මර්දනය කරන්න උත්සායක යෙදෙන්න පුළුවන් කියලා. හැබැයි, ඒ වාගේ අවස්ථාවක් ලබා ගැනීමට මේ පනත සංශෝධනය කිරීම පිළිබඳව අපේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා. එසේ කියමින්, මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.19]

ගරු රුවන්තිලක ජයකොඩි මහතා
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි පැහැදිලිවම සඳහන් කළ කාරණයක් තිබුණා. මේ රටේ බදු ප්‍රතිපත්තිය නිවැරදි ක්‍රමයකට ගෙන එන බවත්, බදු පරිපාලනය කාර්යක්ෂම කරන බවත්, සරල බදු ක්‍රමයක් ඇති කරන පරිවර්තනයක් කරන බවත් අපි පැහැදිලිව සඳහන් කරලා තිබුණා. ඒ කාරණාවලට අදාළව දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත අද සාකච්ඡාවට ගනු ලබනවා.

අපේ ප්‍රධානම අරමුණක් තමයි, වක්‍ර බදු වෙනුවට ඍජු බදු වැඩි කර ගැනීම. අපට බදු අවශ්‍ය ඇයි? අපේ රටේ ජනතාවට අවශ්‍ය සහන ලබා දෙන්න සහ ඔවුන්ගේ ජීවිත නහාසිටුවන්න අවශ්‍ය මුදල් සපයා ගන්න වෙන්නේ ආයෝජනවලින් සහ මේ බදු මුදල්වලින්. මේ රටේ පාසල් පද්ධතිය අපි හොඳ මට්ටමකට හදන්න ඕනෑ. නමුත් අපට තවමත් ඒ මට්ටමට ළඟා වෙන්න බැරි වෙලා තිබෙනවා. මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව තමයි, තමන්ගේ දු දරුවන් හොඳ අධ්‍යාපනයක් ලබා මේ රටේ හොඳ ජීවිතයක් ලබා ගනීවි කියන එක. පාසල්වලට අවශ්‍ය වැසිකිළි පද්ධති, ක්‍රීඩාංගණ, පන්ති කාමර, ඩෙස්ක්, බංකු, ගුරුවරුන් ඇතුළු අනෙකුත් පහසුකම් ලබා දීමේ අවශ්‍යතාව අපට තිබෙනවා. ඒ සඳහා අපි මුදල් සොයා ගන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම අපි රෝහල් පද්ධතියත් වැඩිදියුණු කර ගත යුතු වනවා. පසුගිය කාලයේ අපි බෙහෙත් මිල යම් මට්ටමකට අඩු කළත්, තවදුරටත් ඒ මිල ගණන් අඩු කිරීමේ සහ බෙහෙත් සුලබ කිරීමේ අවශ්‍යතාව තිබෙනවා. ඒ වාගේම රෝහල්වලට අවශ්‍ය උපස්ථායකයන් වැඩි කරන්න, යටිතල පහසුකම් වැඩිදියුණු කරන්න, රෝහල් පද්ධතිය නවීකරණය කරන ක්‍රම සහ වර්තමානයට ගැළපෙන ඩිජිටල්කරණයට අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවත්, ඒවා දියුණු කර ගැනීමේ අවශ්‍යතාවත් අපට තිබෙනවා. ඒ නිසා බදු ප්‍රතිපත්තිය හොඳ ක්‍රමයකට ගෙනැල්ලා, ඍජු බදු විධියට වැඩි ආදායම් ප්‍රමාණයක් එකතු කර ගැනීමේ අවශ්‍යතාව අපට තිබෙනවා.

ඒ වාගේම අපි ග්‍රාමීය ජනතාව වෙනුවෙන් ඒ ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩි කරන්න ඕනෑ. ඒ ප්‍රදේශවල මාර්ග වාගේම ඒ ජනතාවට අවශ්‍ය අනිකුත් පහසුකම් අපි වැඩිදියුණු කරන්න ඕනෑ. විශේෂයෙන් ඔබ දන්නවා, සාමාන්‍යයෙන් ගමක් තුළ රජයේ සේවකයන් යම් ප්‍රමාණයක් ඉන්න බව. ගමක් තුළ ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි නිලධාරීන් ඉන්නවා. මේගොල්ලන්ට අවශ්‍ය කාර්යාල හදා දෙන්න ඉතිහාසය පුරාවටම පැවති රජයන් අපොහොසත් වෙලා තිබෙනවා. එම නිසා ඒ සඳහා අවශ්‍ය වන මුදල් අපි හොයා ගන්න ඕනෑ. ඒ අයට අවශ්‍ය පහසුකම් හදා දුන්නොත් තමයි ග්‍රාමීය ජනතාවගේ ජීවිතය නහා සිටුවන්න අවශ්‍ය ඒ අදාළ ක්‍රියාමාර්ග අපට ගන්න පුළුවන් වන්නේ. ඒ සඳහා අපි මුදල් හොයා ගන්න ඕනෑ. ඒ වාගේම ඒ සඳහා අපි ක්‍රම හදන්න ඕනෑ. ඒ පහසුකම් සියල්ල සපයා දීම සඳහා අපේ බදු අය කර ගැනීමේ ප්‍රතිපත්තිය නිසි ක්‍රමයකට ගෙනැල්ලා, බදු ආදායම වැඩි කර ගැනීමේ අවශ්‍යතාව තිබෙනවා. මෙවැනි අවශ්‍යතාවක් තිබියදී පසුගිය කාලයේ ඇත්තටම සිදු වූයේ මොකක්ද කියන එක ඔබතුමන්ලා දන්නවා. පසුගිය කාලයේ දූර්වල බදු පරිපාලනයක් තිබුණු බවත් ඔබතුමන්ලා දන්නවා. ඒ වාගේම අකාර්යක්ෂමතාව, දූෂණය, බදු වංචා, හිතවතුන්ට බදු සහන ලබා දීම හා බදු පැහැර හැරීම නිසා සංවර්ධනය සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමේ අපහසුතාවක් තිබුණා.

මීට ඉස්සෙල්ලා කථා කළ සාටකයක් පොරවා ගත්ත ඒ මන්ත්‍රීතුමා ලොකුවට කළ ගර්ජනාව ඔබට මතක ඇති. ඇත්තටම අපි එතුමාට කියනවා, ඉස්සෙල්ලාම එතුමාගේ විදුලි බිල ජනතාවගේ බදු මුදලින් ගෙවන්නේ නැතුව එතුමාගේ මුදලින් ගෙව්වා නම් හොඳයි නේද කියලා. එතුමන්ලා පසුව ඒ වෙනස්කම කර ගත්තා.

බදු සහන ලබා දුන්නත්, දූෂණ සහ බදු වංචා කරද්දි ඒ හැම එකකටම දේශපාලනඥයා සම්බන්ධ වෙලා තිබෙන බව අපි දන්නවා. ඒවාට දේශපාලනඥයන් ප්‍රධාන වශයෙන්ම සම්බන්ධ වුණා. බදු පැහැර හැරීම් වැනි ගොඩක් කාරණාවලට ඉතිහාසයේ හිටපු දේශපාලනඥයන් සම්බන්ධ වුණා. සජීන් ද වාස් ගුණවර්ධන

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

රුපියල් ලක්ෂ 369ක බදු පැහැර හැරීමක් සිදු කර තිබෙන බව අපි දන්නවා. ඒ වෙනුවෙන් ඔහුට නඩුවක් තිබෙනවා. ඊළඟට, රුපියල් ලක්ෂ 735ක් වටිනා වත්කම් ඉපැයීම සම්බන්ධව යෝෂිත රාජපක්ෂට එරෙහිව නඩුවක් පවතිනවා. අපි අහන්න කැමැතියි, ඔවුන් එම වත්කම් උපයා ගත්තේ මේ රටේ මහ ජනතාවගේ බදු මුදල්වලින්ද, එහෙම නැත්නම් මැදමුලනේ පොල් කඩලා එකතු කර ගත්ත මුදල්වලින්ද කියලා. ඊළඟට, මර්වින් සිල්වාට රුපියල් කෝටි 15ක වත්කම් සම්බන්ධ නඩුවක් තිබෙනවා.

මෑත කාලයේ සිදු වුණු සුප්‍රකටම වංචාව තමයි, එයාර්බස් ගනුදෙනුව. ඒ ගනුදෙනුවේදී රජයට ලොකු පාඩුවක් සිදු වුණා. ගුවන් යානයක තටුවක්වත් ගෙනෙන්නේ නැතුව රුපියල් මිලියන 115ක් රජය විසින් ගෙවනවා. එහෙම ගනුදෙනුවක් තමයි සිදු වෙලා තිබුණේ. එම ගනුදෙනුවට සම්බන්ධ යැයි කියන කපිල චන්ද්‍රසේන මහතා අවාසනාවන්ත ලෙස මිය ගියා. ඔහු ප්‍රංශ සමාගමකින් ඩොලර් මිලියන 2ක කොමිස් මුදලක් අරගෙන තිබෙන බවට කථාවක් පැතුරුණා. ඒකෙන් රුපියල් මිලියන 20ක් එවකට ගුවන් සේවා විෂය භාරව හිටපු පියංකර ජයරත්න ඇමතිවරයාට ලබා දුන් බව ඔහු කිව්වා. ඒ වාගේම රුපියල් මිලියන විස්ස බැගින් තුන් වතාවක් එවකට ජනාධිපතිවරයා හැටියට හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමාට දුන්නා කියලාත් ඔහු ඇත්තටම කියලා තිබුණා. එහෙම තමයි මේ රටේ මුදල් අයුතු ලෙස වංචා කර තිබුණේ.

තව සිද්ධියක් තමයි, ගෝඨාභය රාජපක්ෂ රජය යටතේ සිදු වුණු සීනි බදු වංචාව. ඒ සම්බන්ධවත් නඩුවක් තිබෙනවා. එහෙම තමයි මේ රටේ හිටපු දේශපාලනඥයෝ බදු මුදල් වැරදි විධියට පාවිච්චි කළේ. මේ රටේ මිනිසුන්ට හොඳ ජීවිතයක්, හොඳ වට පිටාවක් හදා දෙන්න තිබෙන මුදල් හරි විධියට කළමනාකරණය නොකිරීම නිසා තමයි අපි ආණ්ඩුව විධියට මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙන කාරණයක් වන බදු ප්‍රතිපත්තිය නවීකරණය කරලා, හරි විධියට ඒ වැඩ පිළිවෙළ ගෙනැල්ලා තිබෙන්නේ ඒ නිසායි. අපි ඩිජිටල්කරණය තුළින් මෙය හොඳ මට්ටමකට ගෙනෙන්න බලාපොරොත්තු වනවා.

ඉස්සෙල්ලා මම කථා කළ එයාර්බස් ගනුදෙනුවට අදාළ සිද්ධි දාමය ගත්තොත්, ඒ තුළ අපට යම්කිසි පණිවුඩයක් ලැබෙනවා. ඒ පණිවුඩය තමයි, මේ රටේ වෙනස් වූ රාජ්‍යයක්, පාරා රාජ්‍යයක් තිබෙනවාය කියන එක. ඒ වෙනස් වූ රාජ්‍යයත් එක්ක, ඒ පාරා රාජ්‍යයත් එක්ක සුදු ඇඳ ගත්ත සමහර නිලධාරිනුත් සම්බන්ධ වෙලා ඉන්නවා. ඒගොල්ලනුත් එකතු වෙලා තමයි ඒ කටයුතු කරන්නේ. මෙහිදී අපි මතක තබා ගත යුතු විශේෂ කාරණයක් තිබෙනවා. ඒ සාමාජිකයන්ට මේ සිද්ධි නිසා අනාගතයේදී තමන්ගේ සුබ විහරණය වෙනුවෙන්, තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සමහර විට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වන මට්ටමට ඒ රාජ්‍යය දියුණු වෙලා තිබෙනවා.

ඉස්සෙල්ලා කථා කළ මන්ත්‍රීවරයෙක් කිව්වා, රනිල් වික්‍රමසිංහ සමයේදී ඩොලරය ස්ථාවර මට්ටමකට ගෙන ගියා, අපි ආවාට පසුවයි රට අස්ථාවර වුණේ කියලා. නමුත්, ඔබට මතක ඇති, ඩොලරයක අගය රුපියල් 289ට තිබුණාට ඇත්තටම රට වැසී තිබුණු බව. ඒ වාගේම ව්‍යාපාර බිඳ වැටී තිබුණා. ජනතාවට මිලදී ගැනීමට හාණ්ඩ තිබුණේ නැහැ. එය මිය යමින් ඉන්න රෝගියෙකු කෘත්‍රිමව සිහිසුන් කිරීමේ තත්ත්වයක් වාගේ කියායි අපට හිතෙන්නේ.

වර්තමානය වෙද්දී ඩොලරයක අගය රුපියල් 329, 339 සීමාවේ තිබෙනවා. හැබැයි, රටේ ආර්ථිකය විවෘතයි. අපි හාණ්ඩ ආනයනය නතර කරලා නැහැ. ජනතාවගේ වැටුප් කප්පාදු කරලා නැහැ. ගෝලීය සහ දේශීය කඩා වැටීම් මධ්‍යයේ වුවත් අපි ආර්ථිකය ඉතා ශක්තිමත්ව පවත්වාගෙන යනවා. එහෙම තත්ත්වයක් තමයි රටේ තිබෙන්නේ. එහෙම වුණත්, ඇත්තටම විපක්ෂයට අවශ්‍ය වෙලා තිබෙන්නේ නැවත වතාවක් මේ ආර්ථිකය පල්ලෙහාට ඇද දමා, තමන්ගේ දේශපාලන බලය තහවුරු කර ගැනීමේ අවශ්‍යතාව මිස ජනතාවට සැබෑ සහනයක් දීමට නොවෙයි. නමුත්, මෙවැනි කුණාටු මැද්දේ අපි රජයක් විධියට අපේ ආර්ථිකය සාධනීය, ස්ථාවර මට්ටමක පවත්වා ගනිමින් ඉතා හොඳින් මේ රට ඉදිරියට ගෙනියනවා කියන එක මතක් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[ප.ව. 2.28]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, என் உயிருக்கும் மேலான, இதுவரை இந்த மண்ணிலே கற்பழிக்கப்பட்டு, சிதைக்கப்பட்டு, கொலை செய்யப்பட்டு அழிக்கப்பட்ட என் இனத்தின் வரலாறாகிவிட்டவர்களுக்கு எங்களுடைய தமிழ் மண்ணின் ஒரு தமிழீழப் பாராளுமன்ற உறுப்பினர் என்ற அடிப்படையில், மே 18 ஆகிய இன்றைய தினம் என்னுடைய வீர வணக்கத்தையும் அஞ்சலியையும் செலுத்திக் கொள்கின்றேன். 2009ஆம் ஆண்டு மே 18, ஓர் இனப்படுகொலை செய்யப்பட்ட நாள்! ஓர் இனம் அழிக்கப்பட்ட நாள்! ஓர் இனம் சிதைக்கப்பட்ட நாள்! ஒரு போராட்டம் காட்டிக் கொடுக்கப்பட்ட நாள்! அதையெல்லாம் தாண்டிச் சொல்வதாக இருந்தால், தமிழ் பேசுபவர்கள் என்ற ஒரு காரணத்துக்காக ஒட்டுமொத்தமாகத் தமிழர்கள் கொன்று புதைக்கப்பட்ட இந்த நாளில் இந்த மண்ணிலிருந்து மீண்டுமொரு தமிழ்க் குரல் கேட்க வேண்டும் என்று ஆசைப்படுகின்ற தமிழ்நாட்டு மக்களுக்கும், மே 18இல் நடந்த எங்களுடைய மக்கள்மீதான இனப்படுகொலையைப் பற்றி, "தமிழ் மக்களின் துயர வரலாற்றை என்றும் இதயத்தில் ஏந்துவோம்" என்று சொன்ன தமிழ்நாட்டு முதலமைச்சர் அன்புக்கும் பாசத்துக்குமுரிய அண்ணா விஜய் அவர்களுக்கும், தளபதியின் தளபதி ஆதவ் அர்ஜுனா அண்ணா அவர்களுக்கும் ராஜ்மோகன் அண்ணா அவர்களுக்கும் என்னுடைய மனமார்ந்த நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

என்னைப் பொறுத்தவரைக்கும் இந்தியாவுக்கான எனது பயணம் மிகப் பெரிய வெற்றியைத் தந்திருக்கின்றது; அரசியல் தெரிந்தவர்களுக்கு அது நன்றாகத் தெரியும். தமிழகம், தமிழீழம் என்பன வார்த்தைகளால் மட்டுமல்ல, மொழிகளால் மட்டுமல்ல, உணர்வுகளால் மட்டுமல்ல, இரத்தத்தால் இணைந்த இரண்டு பிரதேசங்கள்! என்னுடைய கடந்த பாராளுமன்ற உரையிலே நான் சொல்லியிருந்தேன், "யாழ்ப்பாணத்தையும் மட்டக்களப்பையும் இந்தியாவுக்குக் கொடுங்கள்" என்று. இப்பொழுது நான் மேற்கொண்ட இந்தப் பயணத்தின் பின்பு சொல்ல வேண்டியிருக்கிறது, "இலங்கை முழுவதையும் தமிழகத்துக்கு எடுத்துக் கொள்ளுங்கள் please!"

என்று. ஏனென்றால் இங்கே ஊழல்! இங்கே தமிழன் அடக்கப்படுகிறான், ஒடுக்கப்படுகிறான். அதைவிட, மிகப் பெரிய கவலை என்னவென்றால், தமிழ் பேசுகின்ற ஒரு சில அரசியல் பொய்யர்களால்தான் - நேற்றைய தினம் சிரட்டையில் கஞ்சி குடித்துக் கொண்டிருந்தவர்களால்தான் - இன்றைக்கும் சிதைக்கப்படுகிறோம். எனது தமிழ் உரையைக் கேட்டு கொண்டு இருப்பவர்களுக்கும் சிங்களத்தில் கேட்டுக்கொண்டு இருப்பவர்களுக்கும் நன்றாகத் தெரியும், இந்தப் பாராளுமன்றத்திற்குள் சிங்களப் பாராளுமன்ற உறுப்பினர் களுக்கும் தமிழ் பாராளுமன்ற உறுப்பினர்களுக்கும் இடையில், தமிழர், சிங்களவர் என்ற வேற்றுமையில்லை என்று. ஏன், இப்போது அக்கிராசனத்திலே இருக்கின்ற கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களுடன் நான் கதைக்கும்போதுகூட 'அக்கா' என்றுதான் அவரை அழைப்பேன்.

ஆனால், இன்று பாதைகளிலே சிங்கள மக்களும் தமிழ் மக்களும் அடிபட்டுக்கொள்கிறார்கள் என்றால், அதற்குக் காரணம் பிச்சைத்தனமான இந்த அரசியல்வாதிகள்தான். முக்கியமாக எங்களுடைய தமிழ் பேசுகின்ற அரசியல்வாதிகள்தான். பின்னால் இருக்கிற அண்ணா! ஒருக்கால் உங்களுடைய பெயரைச் சொல்லுங்கோ, இங்கே சொல்லுவோம். தமிழ் பேசுகின்ற, தமிழீழ அரசியல்வாதிகள் என்று சொல்லிக்கொண்டிருக்கின்ற எங்களுடைய அரசியல்வாதிகளால்தான் இன்றைக்கும் நாங்கள் சிதைக்கப்படுகின்றோம். "இந்த மண்ணிலே சிங்கள மக்களை எதிர்க்கக் கூடாது" என்றோ, "சிங்கள மக்களோடு சேர்ந்து வாழ்வோம்" என்றோ நான் சொன்னால், பின்னால் இருக்கிறவர்கள் சிலர் சொல்லுவார்கள், "இல்லை, இல்லை, சிங்கள மக்களைக் கொல்ல வேண்டும்" என்று. ஆனால், பின்னால் இருக்கின்றவர்களின் பெயரைச் சொல்ல எனக்கு வெட்கம்! ஏனென்றால், இவர்கள் இன்றும் canteenஇல் ஒன்றாகத்தான் சாப்பிட்டுவிட்டு வந்திருக்கிறார்கள். இவர்களால் வெட்கம், மானம், மரியாதை இழந்த ஒரு தமிழினமாக இந்தப் பாராளுமன்றத்தை நாம் பிரதிநிதித்துவப்படுத்துகிறோம் எனும்போது மிகக் கவலையாக இருக்கின்றது; எங்களுக்கு வலிக்கிறது.

அந்த வகையிலே, முதலமைச்சர் விஜய் அண்ணா அவர்களுக்கு எங்களுடைய மனமார்ந்த நன்றி! எங்களுக்குப் போவதற்கு இடமில்லை. தமிழகம் மட்டும்தான் எங்களுக்கு இருக்கக்கூடிய ஓரிடம். அங்கேதான் எங்களால் போக முடியும். ஏனென்றால், தமிழகத்தில் கால்பதிக்கின்றபோதுதான் இன்னுமோர் அந்நிய நாட்டுக்கு வந்திருக்கிறோம் என்ற உணர்வு எங்களுக்கு இருக்காது. ஏனென்றால், தமிழகம் எங்களுடைய இரத்தம் சிந்திய இடம்! நான் என்னுடைய தேசியத் தலைவன் கடவுள் என்று தேசியத் தலைவர் பிரபாகரன் அவர்களுடைய பெயரை இன்று பாராளுமன்றத்தில் மட்டுமல்ல, பாராளுமன்றத்திற்கு வெளியேயும் சிங்கள ஊடகங்களிலும் சொல்லிக் கொண்டிருக்கின்றேன். ஆனால், முதுகெலும்புள்ள எவராவது இருந்தால் -

[இலக்கமையே අඟ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

போன்ற எவராவது இருந்தால் - அவ்வாறு கதைத்துப் பார்க்கலாம்! ஆனால், நான் சாதாரண அப்பாவிச் சிங்கள மக்களை எதிர்ப்பதற்கு முட்டாள் அல்ல. ஆனால், சிங்கள இனவாத அடக்குமுறை அரசு தமிழினப் படுகொலையை 2009 மே மாதம் 18ஆம் திகதி செய்தது என்பதை இன்றைக்கும் மனதில் இருத்தி, தந்தையை இழந்தவனாக இந்தப் பாராளுமன்றத்திலே கதைத்துக் கொண்டிருக்கின்றேன்.

என்னைப் பொறுத்தவரைக்கும் இந்த அரசியல் என்பது எங்களுடைய தமிழ் மக்களை அழிக்கிறது. அதற்கு முக்கியமான ஓர் உதாரணத்தை உங்களுக்குச் சொல்லலாம். தமிழ் நாட்டிற்கு நான் மேற்கொண்ட இரண்டு நாள் பயணத்தின்போது தமிழ் நாட்டு மக்கள் என்னை எவ்வளவு ஆதரித்தார்கள் என்பது அங்கே என்னைக் கடந்துவந்த உறவுகளுக்கும் என்னுடைய ஊடக பேட்டிகளைப் பார்த்த உறவுகளின் பின்னூட்டங்களிருந்து உங்களுக்கும் தெரிந்திருக்கும். தமிழ் நாடு எங்களுடைய தமிழீழ தேசத்தை அங்கீகரிக்கின்றது. வெறுமனே சிரட்டைகளிலே பாலைக் குடித்துக்கொண்டிருக்கின்ற எங்களுடைய

[இலக்கமையே අඟ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

இல்லாவிட்டால் உங்களைப் போன்றவர்களால்தான் - உங்களுடைய பெயரைச் சொல்ல வெட்கமாக இருக்கிறது; பாவம்! அதனால் சொல்லவில்லை - எங்களுடைய தமிழீழம் இன்றும் அழிகிறது. இந்தப் பாராளுமன்றத்திலே தமிழிலே கதைக்கின்ற முதுகெலும்புள்ள ஒரு பாராளுமன்ற உறுப்பினர் இருந்தால், அவர் தன்னுடைய தாயின் பாலைத்தான் குடித்தவராக இருந்தால், என்னோடு சேர்ந்து இன்றைக்கு தமிழீழத் தேசியம் தொடர்பாகக் கதைக்கலாம். ஆனால், இது வலிமிகுந்த விடயம். இது ஒருவனின் வலி, ஒருத்தியின் வலி இல்லை. இசைப்பிரியா மட்டுமல்ல, ஆயிரம் இசைப்பிரியாக்கள் புதைக்கப்பட்ட மண்ணிலே இன்று பௌத்த விகாரைகள் கட்டப்படுகின்றன. எங்களுடைய வலிகளைக் கேட்பதற்கு எவருமே தயாராக இல்லை. ஆனால், நாம் இங்கே காட்டிக் கொடுக்கிறோம். பெற்ற தாயைக் காட்டிக் கொடுக்கிறோம், தங்கையைக் காட்டிக் கொடுக்கிறோம், அக்காவைக் காட்டிக்கொடுக்கிறோம், தமிழ் இனத்தையே காட்டிக் கொடுக்கிறோம். இவ்வாறு காட்டிக் கொடுக்கின்றவர்களோடு வாழ்ந்து கொண்டிருக்கின்றபோது, சிதைக்கப்பட்ட ஓர் இனத்திலிருந்து உங்களிடம் கேட்கிறேன், மறுபடியும் எங்களுடைய மக்கள் நிம்மதியாக வாழ வேண்டுமென்றால், அதற்குரிய அரசியலை என்னைச் செய்ய விடுங்கள்!

அடுத்து, ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். எங்களுடைய அண்ணன் சீமான் அவர்கள் அன்றைய தினத்தில் "அவன் என்னடா" என்று சொல்லி என்னைப் பற்றி கேவலமான வார்த்தைகளெல்லாம் கதைத்திருந்தார். அண்ணை! நல்ல காலம் நீங்கள் இந்தியாவிலே! நான் இந்தியாவுக்கு வரும்போது ஆயுதம் கொண்டுவர ஏலாது. ஆயுதம் கொண்டுவர இயலுமென்றால் நான்

[இலக்கமையே අඟ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

நல்ல காலம் நீங்கள் இப்போது இந்தியாவிலே! இந்திய மக்கள் நல்லவர்கள். எங்களுடைய தமிழ்த் தேசியம் பற்றி கதைப்பதற்காக உங்களை அவர்கள் ஆதரவாகப் பார்க்கிறார்கள்.

[இலக்கமையே අඟ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

யாழ்ப்பாணத்துக்கு வந்திருந்தால்

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

பாதுகாப்பாக இந்தியாவிலே இருந்து கொள்ளுங்கள்! திரள்நிதி வரும்! வாங்கிக் கொள்ளுங்கள்! சாப்பிட்டு விட்டு மலங்கழிக்கலாம்! அப்படியே இருங்கள்! ஆனால், எங்களுடைய இனத்தை விற்க வேண்டாம்! எங்களுடைய வலிகளை விற்க வேண்டாம்! எனக்கு வலிக்கிறது. எங்களுடைய தந்தையர்கள் இறந்திருக்கிறார்கள், தாய்மார் இறந்திருக்கிறார்கள், பெண்கள் கற்பழிக்கப்பட்டிருக்கிறார்கள். எங்களுக்கு வலியடா! அதை விற்காதே! அவ்வளவுதான் நான் கேட்கிறேன். தாராளமாக திரள்நிதி வேண்டிக்கொண்டு வயிற்றை நிரப்பிக்கொள்வதில் எனக்குப் பிரச்சினையில்லை.

அடுத்து, ஒரு விடயத்தை நான் சிங்களத்திலே சொல்ல விரும்புகின்றேன்.

අපේ සිංහල ජනතාවට මම එකක් කියන්නම්. මම මෙච්චර වෙලා කථා කළේ දෙමළ භාෂාවෙන්. දැන් මම සිංහලෙන් කියන්නම්, කරුණාකරලා අහන්න. ප්‍රභාකරන්ගේ පින්තූර පුච්චලා එළියේ සීන් දාලා වැඩක් නැහැ. මට ඕනෑ නම්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මට ඕනෑ නම් නාමල් එක්ක සීල් එකක් ගහලා, නාමල් කොහේ හරි නිකම් ඉන්න තැනකදී

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

පුළුවන්. හැබැයි, මමයි, නාමල් රාජපක්ෂයි දෙදෙනාම කථා කරලා ඉවර කරනවා. සිංහල ජනතාව ගිහිල්ලා දෙමළ මිනිස්සුන් එක්ක හැප්පෙන්න එපා. ඇති. අවුරුදු 39ක් අපි රණ්ඩු වුණා. අපේ ප්‍රශ්න තිබෙනවා නම් අපි කථා කරලා 2029දී ඉවර කරන්නම්. මම අනුර කුමාර දිසානායකත් එක්ක මේක කථා කරලා ඉවර කරන්න කැමැතියි. හැබැයි, එතුමා කියන්නේ දෙමළ ජනතාව අපේ ජනතාව කියලා. අන්තිමට නාගදීපයට යන එකත් එතුමා කියලා තිබෙනවා, අනුරාධපුරයෙන් එහාට ආවොත්,-

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉරාමනාතන් අර්ච්චුනා)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා.

සිල් ගන්න නොවෙයි, ජාතිවාදය අවුස්සන නිසා. මේ විධියට ජනතාවත් එක්ක කථා කරන්න බැහැ. හැබැයි, 2029දී මම මේක නාමල් එක්ක කථා කරලා ඉවර කරන්නම්. කරුණාකරලා ජාතිවාදය අවුස්සලා මේක කරගන්න එපා. අපි ඕනෑ නම් මමයි, නාමලුයි ගහලා,-

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

හැබැයි, අහිංසක ජනතාව රණ්ඩු වෙන්න එපා කියලා ඉල්ලීමක් කරමින් මම වාඩි වෙනවා.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමාගේ කථාව තුළ තිබුණු තර්ජනාත්මක ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු කංචන වැලිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.37]

ගරු කංචන වැලිපිටිය මහතා
(මාණ්පුමිකු කඤ්චන වෙලිප්පිට්ටිය)
(The Hon. Kanchana Welipitiya)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත අද ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය කාලසීමාව ඇතුළත අපේ රටේ බදු ගෙවිය යුතු ජනතාව බදු පැහැර හැරීම හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස රජයේ බදු ආදායම ශීඝ්‍ර ලෙස පහත වැටී තිබුණා. ඒකට හේතු ලෙස අපි හඳුනා ගත්තා, දුර්වල බදු පරිපාලනය, අකාර්යක්ෂමතාව, දූෂණය, බදු වංචාව, හිතවතුන්ට බදු සහන ලබා දීම සහ බදු පැහැර හැරීම කියන කාරණා. ඒ කියන හේතු නිසා තමයි පසුගිය ඉතිහාසයේ අපේ රටේ බදු ආදායම අඩු වෙලා තිබුණේ. ඒ අඩු වෙච්ච ප්‍රමාණය කොච්චරද කියනවා නම්, 2023 අවුරුද්ද වන විට අපේ රටේ බදු ආදායම රුපියල් ට්‍රිලියන ලක්ෂ 11ට වැඩි ප්‍රමාණයක් රජයට නැති වෙලා තිබුණා. ඒක නිසාම තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුව භාරගත්තේ අපේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමන් පැහැදිලිවම රටට කිව්වේ, අපි මේක විධිමත්ව, කාර්යක්ෂම කරනවා කියලා. මේක ඇතුළේ තිබෙන වංචාව, දූෂණය, නාස්තිය නැති කරනවා කිව්වා. ජනතාවට අලුතින් සරල බදු ක්‍රමයක් හඳුන්වා දෙනවා කිව්වා. අන්න ඒ අනුව තමයි අද අපි මෙන්න මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. විපක්ෂයෙන් බොරු බිල්ලෙක් මවන්න හැදුවාට මේ ඉදිරිපත් කරපු සංශෝධන ඇතුළේ කාටවත් බදු වැඩි වන්නේ නැහැ. ජනතාවට පීඩනයක් ඇති වන විධියට මේ මණින් කටයුතු කරලා නැහැ. නමුත්, විපක්ෂය මේකට විරුද්ධව බිල්ලෙක් මවනවා. හැබැයි, ආණ්ඩුව විධියට අපි පහසුවෙන්, සරල විධියට ජනතාවගේ බදු ගෙවන්න පුළුවන් වන ආකාරයේ සංශෝධන පනත් කෙටුම්පතක් තමයි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. 2025 අවුරුද්දේත් අපි මේ විධියටම සංශෝධනයක් ගෙනාවා.

රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව කාලයේ විශ්වවිද්‍යාල ආචාර්යවරු, බැංකු නිලධාරීන් දැවැන්ත අරගළයක් කළා, ඒ අයගේ මාසික ආදායම මත අය කරන බද්ද අඩු කරන්න කියලා. විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ එතුමා තීන්දුවක් අරගෙන, අවුරුද්දකට රුපියල් ලක්ෂ 12කට වඩා - ඒ කියන්නේ මාසයකට ලක්ෂයකට වඩා - ආදායමක් ගන්න

කෙනෙකුට බදු අය කරන ක්‍රමයක් හදලා තිබුණා. එම නිසා තමයි විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු අනෙක් ක්ෂේත්‍රවල ඉහළ නිලධාරි මහත්ම මහත්මීන් දැවැන්ත අරගළයක් කළේ, බදු සහන ලබා දෙන්න කියලා. හැබැයි, ඒ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහත්මයා රටට කිව්වේ මොකක්ද? "මේකට මට කරන්න දෙයක් නැහැ, මේක IMF එක කියපු දෙයක්. ඒ නිසා මම ඔයගොල්ලන්ට IMF එකත් එක්ක සාකච්ඡාවක් සූදානම් කරලා දෙන්නම්. ඔයාලා ගිහිල්ලා ඒක IMF එකට කියන්න. එයාලා කියන දේ තමයි අපට කරන්න වෙන්නේ" කියලායි. ඒ වෙලාවේ එහෙම කියලා තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා ඇතුළු ආණ්ඩුව ජනතාවගෙන් බදු අය කළේ. හැබැයි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ආවාට පස්සේ, පසුගිය අවුරුද්දේ අපි ඒක සංශෝධනය කරලා ඒ සීමාව රුපියල් ලක්ෂ 18 දක්වා වැඩි කළා. රුපියල් ලක්ෂ 12ට තිබුණු සීමාව රුපියල් ලක්ෂ 18 දක්වා වැඩි කළා. ඉස්සර මාසයකට රුපියල් ලක්ෂයක ආදායමක් එනවා නම් අන්න ඒගොල්ලන්ට බදු ගැහුවා. හැබැයි, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව ඒක රුපියල් 150,000 දක්වා වැඩි කළා. ඒ නිසා තමයි අපි කියන්නේ අපි ජනතාවට හිතකර ආකාරයේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා කියලා.

මේ අලුත් බදු සංශෝධනය ඇතුළේ අපි ඉදිරිපත් කරපු තවත් විශේෂ කාරණයක් තිබෙනවා. ඉස්සර ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගෙන් සියයට 5ක බද්දක් අය කර ගත්තා. දැන් අපි එය සංශෝධනය කර තිබෙනවා. ඒගොල්ලන්ගේ ආදායම රුපියල් 60,000ට වඩා අඩු නම් ඒගොල්ලන්ගෙන් කිසිම බද්දක් අය කර ගන්නේ නැහැ. ඒකත් මේ සංශෝධන අතර තිබෙනවා.

ඒ වාගේම අපි තවත් යෝජනාවක් කරලා තිබෙනවා. අපේ රටේ ව්‍යාපාරික ජනතාව රටේ යම් අර්බුදයක් ඇති වුණු වෙලාවට රට ගොඩ නැඟීම වෙනුවෙන් අරමුදල් එකතු කරනවා. "දිටිවා" සුළි කුණාටුව වෙලාවේත් රටේ විවිධ ව්‍යාපාරික මහත්වරුන් අපේ ආණ්ඩුවට විවිධ පරිත්‍යාග කළා. එම නිසා ආණ්ඩුව විධියට අපි මේ පනත් කෙටුම්පත හරහා තීන්දු කරලා තිබෙනවා, ඒගොල්ලෝ රටට දෙන, ආණ්ඩුවට දෙන ඒ ප්‍රදානවලදී ඒ අය පරිත්‍යාග කරපු දේ ආදායම ඉක්මවා යනවා නම් ඒක ඉදිරි වසරවලදීත් අය කර ගන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ සංශෝධනවලට එකතු කිරීමට. එම නිසා ව්‍යාපාරිකයන්ට මේක ඇතුළේ සහනයක් තමයි ලැබෙන්නේ. ඒගොල්ලෝ රට වෙනුවෙන් පරිත්‍යාග කරද්දී මේ සංශෝධනය ඇතුළේ ඒගොල්ලන්ට සහන ලබා දීලා තිබෙනවා. පොදුවේ ගත්තොත්, අපි මේ සංශෝධන ඇතුළේ රටේ ජනතාවට හිතකර ආකාරයේ බදු අය කර ගන්න ක්‍රමයක් තමයි සකස් කරලා තිබෙන්නේ. විපක්ෂය කියන ආකාරයට, බොරු බිල්ලන් මවනවා වාගේ දේවල් අපි මේක ඇතුළේ කරලා නැහැ.

අද විපක්ෂ නායකතුමා කියනවා, මේ සංශෝධන ඇතුළේ බදු නොගෙවෙන ජනතාවට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කිරීම වැරැදියි, ඒ තුළින් ඔවුන් පීඩාවට ලක් කරනවා කියලා. පසුගිය කාලයේ සජිත් ප්‍රේමදාස මහත්මයාලා හිටපු ආණ්ඩුවකුත් තිබුණා. හැබැයි, ඒ ආණ්ඩුව කාලයේ තමයි මෙන්ඩිස් සමාගමේ අර්ජුන් ඇලෝසියස්ලා ගෙවන්න තිබෙන බදු නොගෙවා හිටියේ; බදු ගෙවන්නේ නැතිව මහ හැරියේ. ඒ වෙනුවෙන් තමයි අදත් සජිත් ප්‍රේමදාස මහත්මයාලා පෙනී ඉන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් තිබෙනවා. අර්ජුන් ඇලෝසියස් ඇතුළු පිරිස රුපියල් කෝටි 103ක් වංචා කළා කියලා තමයි ඒ නඩුව යන්නේ. ඒගොල්ලන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන එකට විරුද්ධව විපක්ෂ නායකතුමා අදත් මෙතැනට ඇවිල්ලා කථා කරනවා, ඒගොල්ලන් වෙනුවෙන් පෙනී ඉඳිමින් ඒ අය සාධාරණීකරණය කරන්න උත්සාහ කරමින් ඉන්නවා. අන්න එවැනි විපක්ෂ නායකතුමෙක් තමයි අපට ඉන්නේ. හැබැයි මේ සංශෝධන නිසා ජනතාව කවුරුවත් පීඩාවට පත් වන්නේ නැහැ. මේ බදු අය කර ගන්නේ ඒ ජනතාව උපයන දෙයින්. උපයන්නේ නැති දෙයකින් බදු අය කර ගැනීමක් නොවෙයි මේ කරන්නේ. ඒ නිසා කිසි කෙනෙක් පීඩාවට ලක් වන්නේ නැහැ, මේ තුළින්. හැබැයි එතුමා කියනවා, "දැන් ඩීසල් මිල වැඩි වෙලා තිබෙනවා, පෙට්‍රල් මිල වැඩි වෙලා තිබෙනවා, ඒ නිසා ව්‍යාපාර බිඳ වැටිලා තිබෙනවා" කියලා. ඒ මොනවා වුණත්, ලැබෙන ආදායමට අනුව තමයි මේ බද්ද අය කර ගන්නේ. එහෙම නැතුව පුරෝකථනය කරලා පරණ ඒවාට බදු අය කර ගැනීමක් නොවෙයි මේ කරන්නේ.

විශේෂයෙන්ම පොදුවේ ගත්තොත්, රටක් හැටියට අපි මේ වෙලාවේ අභියෝගයකට මුහුණ දී තිබෙනවා. එසේ අභියෝගයකට මුහුණ දී තිබෙන විට ආණ්ඩුවට සමහර තීන්දු තීරණ ගන්න සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය දවස්වල ඉන්දියාවේ අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහත්මයාත් රටේ ජනතාවගෙන් විවිධ ඉල්ලීම් කරනවා අපි දැක්කා. එතුමා රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කළා, රත්තරන් මිල දී ගන්නා එක අවුරුද්දකට සීමා කරමු, විදේශ සංචාර අවුරුද්දකට සීමා කරමු කියලා. මේ පවතින ලෝක ආර්ථික අර්බුදය, එහෙම නැත්නම් මැද පෙරදිග යුද්ධය නිසා තමයි මෝදි අග්‍රාමාත්‍යතුමා රටේ ජනතාවගෙන් ඒ ඉල්ලීම කළේ. හැබැයි අපේ රටේ ජනතාවට එහෙම ලොකු පීඩනයක් දැනෙන්න මේ ආණ්ඩුව කටයුතු කරලා නැහැ. මේ ආණ්ඩුව දැවැන්ත කැප කිරීමක් කරනවා. මේ ආණ්ඩුව දැනටමත් ජනතාවට ඩීසල් ලීටරයකට රුපියල් 100ක සහනාධාරයක් ලබා දෙනවා. පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක සහනාධාරයක් ලබා දෙනවා. අද චක්‍රලේඛයක් නිකුත් කර තිබෙනවා, එළැඹෙන වෙසක් සතිය වෙනුවෙන් ජනතාවට බාධාවක් නැතුව ආගමික කටයුතු කර ගන්න පුළුවන් වන ආකාරයට වැඩ කටයුතු සලස්වන්න කියලා. ඒ ආකාරයෙන් ජනතාවට කිසිම පීඩනයක් නැති වන විධියට වැඩ කරමින් යද්දීත් තමයි විපක්ෂය මෙලෙස බොරු චෝදනා කරන්නේ. විපක්ෂය මේ ඔක්කෝම චෝදනා කරන්නේ ලෝක ආර්ථික අර්බුදයක් නැහැ කියලා හිතලා. මැද පෙරදිග යුද්ධයක් නැහැ කියලා උපකල්පනය කරමින්, මේක හුදෙක් අපේ රට තුළ විතරක් සිද්ධ වුණු සිද්ධියක් හැටියට සලකමින් තමයි ඒගොල්ලන් කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ රටේ සියලු ජනතාවගෙන් ඉල්ලනවා, විපක්ෂය නහන මේ බොරු චෝදනාවලට, මේ මඩ අවලාදවලට රැවටෙන්න එපා කියලා.

මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව හැදුවේ මේ රටේ දුක් විඳින මිනිස්සු; මේ රටේ පොඩි මිනිස්සු. ඒ හින්දා ජනතාව ආරක්ෂා කර ගනිමින් ජනතාවගෙන් එකතු කරන බදු ටික මනා කළමනාකරණයකින් නැවත වතාවක් ජනතාවට ලබා දෙන එක තමයි අපේ අරමුණ. අන්න ඒ වෙනුවෙන් තමයි අප කටයුතු කරමින් ඉන්නේ. ඒ නිසා තමයි "දිටිවා" සුළි කුණාටුව ආපු වෙලාවේ අපේ රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න අපට පුළුවන් වුණේ.

විශේෂයෙන්ම කැගල්ල දිස්ත්‍රික්කයත් "දිටිවා" සුළි කුණාටුවට හසු වුණු දිස්ත්‍රික්කයක්. එම දිස්ත්‍රික්කය තුළ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තිබෙනවා. මේ වන විටත් ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාවට අපි රුපියල් කෝටි 14කට වැඩි මුදලක් ලබා දී තිබෙනවා. ඒ වාගේම, ගෙවල් 90කට වැඩි ප්‍රමාණයක් හදන්න අපට සිදු වෙනවා. ගෙවල් 90ක් හදන්න රුපියල් ලක්ෂ 50 ගණනේ දුන්නොත් රුපියල් කෝටි 45ක් යනවා. දැන් වන විටත් අපට මුදල් ටික එවලා තිබෙනවා. මේ හැම දෙයක්ම කර ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාව බදු ගෙවන නිසා. ජනතාවගේ බදු ටික එකතු කරගෙන, ඒවා විනාශ නොකර, ඒවා හොරකම් නොකර ජනතාව වෙනුවෙන්ම නැවත වතාවක් වියදම් කරන නිසා තමයි අපට ඒ කියපු දේවල් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. අද ඉදිරිපත් කර තිබෙන මේ

[ගරු කංචන වැලිපිටිය මහතා]

පනත් කෙටුම්පතත් එවැනි ජනතාවාදී පනත් කෙටුම්පතක්. ජනතාවට සහන සැලසීම වෙනුවෙන්, බදු ටික නිවැරැදි ආකාරයට එකතු කර ගැනීම වෙනුවෙන් සකස් කරපු මේ පනත් කෙටුම්පතට සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.47]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ විවාදය පැවැත්වෙන වෙලාවේ ආණ්ඩුව 17 වසරක් සපිරෙන රණවිරු ජයග්‍රහණය සමරන්න හදනවා. හැබැයි මම මේ වෙලාවේ මේ කාරණය කියන්න ඕනෑ. අපි ගිහිල්ලා රණවිරු ස්මාරකය අභියස මල් තියන්නේ නැහැ, රණවිරු සැමරුමට බාධා කරන්නේ නැහැ. නමුත් කියන්න ඕනෑ දේ අපි කියන්න ඕනෑ.

මේ රණවිරු ජයග්‍රහණය කවුරු කවුරුත් බෙදා ගත්තාට කමක් නැහැ. ආණ්ඩුවක් වුණාම ඒ ගැන සතුටු වෙනවා. හැබැයි මේ ආණ්ඩුව රණවිරු ජයග්‍රහණය කොච්චර වින්දත් මේ ආණ්ඩුවේ ඉන්න ඇමතිවරයෙක් ගැන අපට ආරංචියක් ලැබිලා තිබෙනවා. ඒක ආරංචියක් විතරක් නොවෙයි, හරියටම හරි එකක්. ඒක දකුණු පළාත නියෝජනය කරන ඇමති කෙනෙකුගේ දුවෙක් ගැන ආරංචියක්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මිනිස්සු ඉගෙන ගන්න ඕනෑ, උපාධි ගන්න ඕනෑ, PhDs ගන්න ඕනෑ. අපට කමක් නැහැ ඒකට. අපි ඉරිසියා කරන්නේ නැහැ. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇය PhD එක ගන්න ගිහිල්ලා ඉන්නේ කොහේද? එංගලන්තයේ නිව්කාසල් කියන නගරයේ. ඒ ගෙදර කාගේද? නිව්කාසල් "රාජා" කියන ඩයස්පෝරාවට හොඳටම සම්බන්ධ කෙනෙකුගේ ගෙදර තමයි ඇය ඉන්නේ. ඇය මේ රටේ කැබිනට් ඇමති කෙනෙකුගේ දුවක්. එංගලන්තයේ නිව්කාසල්වල තමයි ඇය ඉන්නේ. *[බාධා කිරීමක්]* නම් කියන්න අපි කැමැති නැහැ. නම් කියන්නේත් නැහැ. ඒක හරි නැහැ. ඒ දරුවා ඉගෙන ගන්න එකට අපෙන් කිසිම බාධාවක් නැහැ. දරුවෝ ඉගෙන ගන්න ඕනෑ. හැබැයි ඉතින් අපි කියන්නේ ඔයගොල්ලන් ඩයස් පෝරාව එක්ක ඉන්නවා නම්, කෙළින්ම ප්‍රකාශ කරන්න. ඒක අපට, රටට ප්‍රශ්නයක් නැහැ. එහේ එකක්, මෙහේ එකක් කියන්න ඕනෑ නැහැ. ඩබල් ගේම් ඕනෑ නැහැ. "අපි ඒගොල්ලන් එක්කත් ඉන්නවා, මෙගොල්ලන් එක්කත් ඉන්නවා." කියලා කෙළින්ම කියන්න. ඒකට අපට කිසිම ප්‍රශ්නයක් නැහැ.

ඊළඟට, ජනාධිපතිතුමා නුවරඑළියේදී හෝ වෙන කොහේ හරි හෝ පැවැති රැස්වීමකදී කිව්වා, "අපට වාහන ගෙන්වන එක නතර කරන්න වෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සාමාන්‍යයෙන් කැබිනට් එකේ වෙන ප්‍රකාශයක් එහෙම කියන්න හොඳ නැහැ. බලන්න, ට්ට පසුව වෙලා තිබෙන දේ. මේ වාහනවලට tax එකක් ගැහුවා. හැබැයි, ඒ වාහනවලට ගහපු tax එකේ ප්‍රතිඵලය අපට ගන්න පුළුවන්ද? බැහැ. මොකද හේතුව? ජනාධිපතිතුමා 13වැනි දා ඒක කිව්වා. 15වැනි දා තමයි ගැසට් එක ගැහුවේ සියයට 50ක බද්දක් පනවලා. 14වන දා වාහන 4,000කට LCs open කළා. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ 4,000ම බදු ආදායම ආණ්ඩුවට නැහැ. වාහන 4,000ක් කියන්නේ පොඩි ගණනක් නොවෙයි. වාහන 4,000ක් ගෙනෙනවා. වාහන 4,000කට LCs open කළා. කොහොමද ගේම? මේවා විය යුතු දේවල් නොවෙයි. මේවා වෙන්න හොඳ නැති දේවල්.

ඊළඟ එක. අපේ ජනාධිපතිතුමා රටේ ජනාධිපති. එතුමා මුදලාලි කෙනෙක් නොවෙයි, කොම්පැනියක කෙනෙක් නොවෙයි. එතුමා එක තැනකට ගිහිල්ලා කියනවා, "අපට තෙල් මිල වැඩි කරන්න වෙනවා" කියලා. තෙල් මිල වැඩි කරන්න නම් අපට ජනාධිපති කෙනෙක් ඕනෑ නැහැ. තෙල් මිල අඩු කරන්නත් අපට ජනාධිපති කෙනෙක් ඕනෑ නැහැ. ඒ දවස්වල කිව්වේත් එහෙමයි. මේ, බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති නොවෙයි. අනුර කුමාර ජනාධිපතිතුමා ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති. ජනරජයේ ජනාධිපති තෙල් මිල වැඩි කරන එක ගැන එක එක වේදිකාවල කියනවා. මේවා රටේ ජනාධිපති කෙනෙක් හැටියට කිව යුතු දේවල් නොවෙයි. මේවා කියන්න හොඳ නැහැ. අපි ඒ දේවල් හොඳින් මතක තබා ගන්න ඕනෑ.

ඊළඟ එක. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සර අපි පොඩි කාලයේ සින්දුවක් අසා තිබෙනවා, "එල්ලලාද මැරුවේ, මරලාද එල්ලුවේ, මේ ප්‍රහේලිකාව කවුද විසඳුවේ?" කියලා. "මරු සිරා" මැරුණේ කොහොමද, මැරුවේ කොහොමද කියලා දන්නේ නැහැ. "මේ ප්‍රහේලිකාව කවුද විසඳුවේ" කිව්වාට, තවම මේ රටේ ඒ ප්‍රහේලිකාව විසඳිලා නැහැ. "මරු සිරා" මැරිලාත් අද වෙනකොට අවුරුදු 40ක් විතර ඇති. හැබැයි, අද ප්‍රහේලිකා දෙකක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම නිසා දෙන්නෙක් බෙල්ලේ වැල දමා ගත්තා. ඒ බෙල්ලේ වැල දමා ගත් දෙන්නාටම සාක්ෂි නැහැ. නඩුවලට සාක්ෂි නැතුව දෙන්නාම මැරුණා. මැරෙන්න හේතුව මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සර හිටියා අලුගෝසුවා. අලුගෝසුවා පෙන්ෂන් යැව්වා. අලුගෝසුවෙක් හොයා ගන්න කියලා පසුගිය කාලයේ ආණ්ඩුවලින් කිව්වා. ලණුවකුත් ගෙනාවා පිට රටින්. හැබැයි, අපි තවම පාර්ලිමේන්තුවේ සම්මත කළේ නැහැ, අලුගෝසු තනතුර සහ ලණුව. අන්න දැන් අලුගෝසුවා ඉන්නවා, අල්ලස් කොමිසමේ. එයා තමයි දැන් අලුගෝසුවා. "එල්ලලාද මැරුවේ, මරලාද එල්ලුවේ, මේ ප්‍රහේලිකාව කවුද විසඳුවේ" නොවෙයි. එයා ලස්සනට ප්‍රහේලිකාව විසඳනවා, "සාක්ෂි දීපන්. රජයේ සාක්ෂිකාරයෙක් වෙයන්. නැත්නම් උඹට එල්ලිලා මැරෙන්න වෙනවා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ විධියට සාක්ෂි නැතුව එයා ලස්සනට අලුගෝසු වැඩේ කරනවා, Bribery Commission එක අස්සේ. මේවා මේ රටේ වෙච්ච දේවල් නොවෙයි. උගත්, බුද්ධිමත් සභාපතිලා, අධ්‍යක්ෂවරු මේ රටේ අල්ලස් කොමිසමේ ඉන්න අවස්ථාවක මෙවැනි දේවල් වෙනවා කියන්නේ මේ රටේ ඉදිරිය හොඳ තැනක නැහැ කියන එකයි. ඒ නිසා මේ රටේ නීතිය ගැන අපට කථා කරන්න වෙනවා.

ඒ ගැන කියන ගමන්, මම මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුයුක්තව වෛද්‍ය උපාධිය හදාරපු සිසුන් 10දෙනෙකුගෙන් 6දෙනෙක් හමුදාවටත්, 4දෙනෙක් පොලීසියටත් බඳවා ගන්න තීරණය කර තිබෙනවා. ඒ ළමයි වෛද්‍ය පීඨයේ අවුරුදු ගණනක් ඉගෙන ගත්ත ළමයි. ඒ අයගෙන් 4දෙනෙක් පොලීසියට බඳවා ගන්න ආරක්ෂක අමාත්‍යාංශයෙන් ගිවිසුමක් ගැහුවා. හැබැයි, අද වෙනතුරු පොලිස් දෙපාර්තමේන්තුව ඒ 4දෙනා බඳවා ගන්න අනුමැතිය දීලා නැහැ. ඒ නිසා දැන් ඒ 4දෙනාගේ ජීවිත අඳුරේ. පොලිස් දෙපාර්තමේන්තුවේ වෙන වැඩ තමයි මේවා. 4දෙනෙක් බඳවා ගන්න ගිහිල්ලා කරපු දේ තමයි, මේ.

ඊළඟ කරුණ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නුවරඑළිය නගරය කියන්නේ අපේ රටේ ඉතිරි වෙලා තිබෙන සම්පත්වලින් ඉතාම සුන්දර, වැදගත් තැනක්. අපි කවුරුත් දන්නවා, නුවරඑළිය නගරයේ ගෝල්ෆ් ක්‍රීඩාංගණය. මේ ක්‍රීඩාංගණයේ පැරණි ගස් තිබෙනවා. දැන් මේ නුවරඑළියේ ගෝල්ෆ් ක්‍රීඩාංගණයටත් ඔප්පුවක් හදලා. මහ නගර සභාව දන්නෙත් නැහැ, UDA එක දන්නෙත් නැහැ, නුවරඑළියේ ගෝල්ෆ් ක්‍රීඩාංගණයටත් එක්කෙනෙක් ඔප්පුවක් හදලා දැන් ඒකට නඩුවක් දාලා තිබෙනවා. මම මේ ළඟදී නියෝජ්‍ය පොලිස්පතිතුමාත් දැනුවත් කළා, මේ ක්‍රීඩාංගණයේ ගස් කපනවා කියලා. මේ ක්‍රීඩාංගණයේ තිබෙන පැරණි ගස් හෙමිහිට හෙමිහිට ක්‍රමානුකූලව අයින් කරන වැඩ පිළිවෙළක් යනවා. මේක එච්චර හොඳ දෙයක් නොවෙයි. මේ ගෝල්ෆ් ක්‍රීඩාංගණය ඉංග්‍රීසීන්ගේ කාලයේ ඉඳන් අපට ලෝකයටම පෙන්වන්න තිබෙන තැනක්. ඒ නිසා රජයක් හැටියට මේවා ගැන හොයා බලන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේක හැන්සාඩ් එකේත් ගියාට පස්සේ ආණ්ඩුව වෙවා, විපක්ෂය වෙවා කාගෙත් වගකීමක් තමයි මේ ගෝල්ෆ් ක්‍රීඩාංගණය ආරක්ෂා කර ගැනීම. මම අද ඒ ගැන මේ පාර්ලිමේන්තුව දැනුවත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟ කාරණය මේකයි. අම්පාරේ, සමන්තුරේ පිහිටා තිබෙන අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් අපේ පළාතේ ළමයින්ට බෝඩිම් දීලා තිබුණා. අපේ පළාතේ ළමයි එහේට ගියාම ඉන්න අමාරුයි. මොකද, එහේ වැඩිහරියක් ජීවත් වෙන්නේ මුස්ලිම් ජනතාව සහ ද්‍රවිඩ ජනතාව නිසා. ඒ පළාතේ බෝඩිම් හොයා ගන්න නැහැ. මේ ළඟකදී ඉඳලා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ළමයි එළියට දානවා බෝඩිම් ප්‍රශ්න නිසා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඒ කාරණයත් මතක් කරනවා. ඊයේ පෙරේදා බැසිල්ගේ ගේ අල්ලා ගත්තා. ඒ, මන්තරේද යන්තරේද කියලා මට තේරෙන්නේ නැහැ. ඒක ඇවිල්ලා ටිල්වින් සිල්වාගේ මන්තරේ වෙන්න ඇති. ඒක නම් අන්තරේ නොවෙයි. මොකද, අන්තරේට ගෙවල් හොයා ගන්න ඕනෑ නම්, - අර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අයට නම් දැන් ලේසියි. මොකද, දැන් පේරාදෙණිය දුම්රිය ස්ථානය වහලා. කෝච්චිය ආයේ යන්නේ නැහැ නේ. ආයේ කෝච්චිය යනවා කියලා අපට බලාපොරොත්තුවක් නැහැ නේ. පේරාදෙණිය තිබෙනවා "සරසවි උයන" කියලා ලස්සන දුම්රිය ස්ථානයක්. එතැන තිබෙනවා දුම්රිය දෙපාර්තමේන්තුවේ quarters. අන්න ඒ ටික දැන් අල්ලා ගන්න කියන්න. මොකද, කෝච්චිය ආයේ නුවරට යනවා කියලා අපට විශ්වාසයක් නැහැ. අපට දැන් ඒ විශ්වාසය නැහැ. ආයේත් පෙරාදෙණිය මල්වත්ත බලන්න ගම්පහ ඉඳලා කෝච්චියේ යන්න බැහැ, මන්ත්‍රීතුමනි. පොළොන්නරුවේ ඉඳන් පේරාදෙණියට කෝච්චියේ යන්න බැහැ. තවම නැහැ නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා නුවර එක්කෙනෙක්. හිනා වෙන්න එපා. මේවා ප්‍රශ්න නේ. සරසවි උයන වටේට තිබෙනවා quarters. අන්න, ඒ ටික අල්ලා ගන්න කියන්න. දෙයි හාමුදුරුවනේ පේරාදෙණියේ ඉඳන් කොච්චර දුරද ගම්පහට. ඒ නිසා ගම්පහ ඒවා අල්ලලා වැඩක් නැහැ. ඒවා වෙන කාට හරි දෙන්න. කාගේ ගෙයක් වුණත් කමක් නැහැ, ඒක දෙන්න ඕනෑ. ඒක දුන්නාට කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟ එක මේකයි. ජනාධිපතිතුමා කාටදෝ කිව්වා ඩෝසර් දෙකක් දෙන්න කියලා. කොත්මලේ හරි නුවරඑළියේ ගිහිල්ලා කිව්වා. දෙයි හාමුදුරුවනේ ජනාධිපතිතුමාට කියන්න. ඩෝසර් දෙකක් ජනාධිපතිතුමා ඉල්ලන්න ඕනෑ නැහැ. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී කාලයේත් අපි ඉල්ලුවාම දෙනවා. ජනාධිපතිතුමා ඒක කියන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමා ඩෝසර් දෙකක් ඉල්ල ඉල්ලා ඉන්න ඕනෑ නැහැ. ජනාධිපතිතුමාට orders දෙන්න කියන්න, මේවා දඩබඩ ගාලා කරන්න කියලා. ජනාධිපතිතුමා කිව්වොත් නොකර ඉන්න බැහැ නේ. මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ නේ. ඔය රාජ්‍ය නිලධාරින් එක්ක නිකම් ප්‍රශ්න හදා ගන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට SLTB ගැන හරිම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
කාලය තව චුට්ටක් වැඩි කරලා දෙන්න පුළුවන් නම් හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

දැන් බස්වලට ටයර් නැහැ. දැන් SLTB ඩිපෝවල බස් ගොඩක් නවත්වලා. ලබන මාසයේ ඉඳන් මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලා තිබෙනවා කියලා මට ආරංචියක් ලැබුණා. මහා භාණ්ඩාගාරයෙන් මුදල් දුන්නේ නැත්නම් SLTB බස් සියයට පනහක් නවතිනවා, ගම්වලට දුවන. ඒ විතරක් නොවෙයි ඩ්‍රයිවර්ස්ලාට, කොන්දොස්තරලාට පඩි බෙදා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. අපට මතකයි මේ අය කිව්වා, "කළුතර ඩිපෝ එකේ ලාභ ලබනවා. මට සර් කියලා කථා කළා" කියලා. මට මතකයි මේ සභාවේදී මන්ත්‍රීතුමෙක් කථා කරපුවා. හැබැයි, තවම SLTB එක පාඩු ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. SLTB එක වැටුණොත් විශාල වශයෙන් පාසල් ළමයින්ට ප්‍රශ්න මතු වෙනවා. ඒගොල්ලන්ට යන එන මං නැති වෙනවා. ඒවා ගැනත් බලලා වැඩ කරමු. ඔයගොල්ලන් වෙන මොනවාත් හදන්නේ නැත්නම් SLTB එකවත් හදන්නකෝ. කෝච්චි පාර හැදුවේ නැතත් කමක් නැහැ. කෝච්චි පාර හදනවාට වඩා වැඩිය වටිනවා නේ, SLTB එකට ටයර් ටික අරගෙන දීලා, ඩීසල් ටික දීලා බස් ටික දුවවන එක. ඒ ඩ්‍රයිවර්ස්ලාගේ, කොන්දොස්තරලාගේ වැටුප් ටික ලබා දෙන්න කියන්න කෝ. ඒ ටික දීගන්න බැරි තත්ත්වයට දැන් ආණ්ඩුව පත් වෙලා තිබෙනවා.

මම මේ ආණ්ඩුවට මේ කාරණය කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සම්බුද්ධ ජයන්තිය සිදුවෙලා දැන් අවුරුදු 2,500කට වැඩියි, අවුරුදු 2,600කට ළඟයි. අපට මොන ප්‍රශ්න තිබුණත් අපි අවුරුදු 2,500ක්ම බෞද්ධ ආගම රැකගෙන ආවා නේ. මේ රටේ රජවරු බිහි වුණා, නායකයෝ බිහි වුණා, ජනාධිපතිවරු බිහි වුණා. මොන ප්‍රශ්න තිබුණත්, ප්‍රශ්න පිට ප්‍රශ්න තිබුණත්, අපේ බෞද්ධ ආගම අපි ආරක්ෂා කරගෙන ආවා. ඒ නිසාවෙන වැඩ කරන්න ඕනෑ නැහැ, බෞද්ධ ආගම ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් හදන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
සමහර තැන්වල DIGsලා දාලා තිබෙනවා හාමුදුරුවන් ගැන හොයන්න. මිහින්තලේ හාමුදුරුවන් ගැන හොයන්න DIGsලා දාලා. අනුරාධපුරේ උඩමළුව ගැන හොයන්න DIGsලා දාලා. අපේ බෞද්ධ ආගම විනාශ කරන්න යම්කිසි වැඩ පිළිවෙළක් යටින් ක්‍රියාත්මක වෙනවා. ඒක නිසා අපි ඔබතුමන්ලාගේ, ඔබතුමියලාගේ ආණ්ඩුවෙන් අඩුම වශයෙන් ඉල්ලන්නේ මෙයයි. අපට අධිවේගී මාර්ග හදන කල් බලාගෙන ඉන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

කෝවිඩ් පාර හැදෙන්නේ නැති බව අපි දන්නවා. රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැති බව අපි දන්නවා. හැබැයි, අඩුම වශයෙන් අපට තිබෙන ආගමවත් ඉතුරු කරන්න, අප්පා! නැත්නම් මේ ආගමත් අපට නැති වෙනවා. මොන ප්‍රශ්න තිබුණත්, අවුරුදු 2,500ක් ගිහිල්ලාත් අපට මේ ආගම ඉතුරු වෙලා තිබුණා. අන්න ඒකවත් අපට ඉතුරු කරලා දෙන්න කියන ඉල්ලීම මේ ආණ්ඩුවෙන් කරමින් මා නිහඬ වෙනවා.

සියලුදෙනාටම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.00]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

අද විවාදයේ ප්‍රධාන කාරණය බවට පත් වන්නේ දේශීය ආදායම් පනතට කරන සංශෝධනයි. මේ සංශෝධන සිදු කිරීමේදී පනත ගැන ඉතාම පැහැදිලි විස්තරයක් අමාත්‍යාංශය පැත්තෙනුත්, නියෝජ්‍ය අමාත්‍යතුමා පැත්තෙනුත්, අපේ මන්ත්‍රීවරුන් පැත්තෙනුත් සිදු වුණා. එහිදී වැදගත් කාරණය තමයි, මේ පනත සංශෝධනය කිරීමේ අරමුණ මොකක්ද කියන කාරණය. දේශීය ආදායම් පනත සංශෝධනය කිරීමට තිබෙන ප්‍රධාන කාරණය ගැන අපේ පලිහේන මන්ත්‍රීතුමා ඉතාම පැහැදිලිව විස්තර කළා. අපේ රටේ මේ වෙන කොට වක්‍ර බදු සහ ඍජු බදු ගෙවීමේදී වක්‍ර බදු සහ ඍජු බදු අතර තිබෙන අනුපාතය සාධාරණ නැහැ. වක්‍ර බදු වැඩිපුර ගෙවනවා. ඍජු බදු අඩුවෙන් ගෙවන තත්ත්වයක් තමයි ලංකාවේ තිබෙන්නේ. ඍජු බදුවල ප්‍රධාන කොටසක් තමයි ආදායම් බදු. පුද්ගලික ආදායම් බදු කියන එක ඍජු බදුවල ප්‍රධාන කොටසක්. ඒක නිසා බදු සාධාරණත්වය කියන කාරණය අපේ බදු ක්‍රමය තුළ ඇති කිරීමට පුද්ගලික ආදායම් බදු - Personal Income Tax - අය කර ගැනීම වර්ධනය කර ගැනීම ඉතාම වැදගත්.

ලංකාවේ මිනිස්සු බදු ගෙවන්නේ නැතුවා නොවෙයි. ලංකාවේ මිනිස්සු බදු ගෙවනවා. අපේ රටේ වැඩිපුරම බදු ගෙවන්නේ පාරිභෝගිකයන්. VAT එක හැටියට, ඒ වාගේම Excise Duty එක හැටියට පාරිභෝගිකයන් විශාල ප්‍රමාණයක් වක්‍ර බදු ගෙවනවා. ඒ වාගේම ඍජු බදු හැටියටත් වැඩිපුරම බදු ගෙවන්නේ අපේ salaried workersලා, වැටුප් ලබන අය. අපි ඒ අයට කියනවා වෘත්තිකයෝ කියලා. වෛද්‍යවරු, ඉංජිනේරුවෝ, රජයේ සේවකයෝ, පුද්ගලික අංශයේ සේවකයෝ තමයි අපේ රටේ බදු ගෙවන්නේ. බදු ගෙවන ජනතාව කියන්නේ ඒ ජනතාව. බදු පද්ධතියක් තුළ බදු ගෙවන ජනතාවට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. කොටසක් විතරක් බදු ගෙවනවා, කොටසක් බදු ගෙවන්නේ නැහැ කියන තත්ත්වය රටක බදු ක්‍රමය පිළිබඳව, එහෙම නැත්නම් බදු නීතිය පිළිබඳව සාධාරණ තත්ත්වයක් පෙන්වන්නේ නැහැ. ඒ සාධාරණ තත්ත්වය ඇති කිරීමට නම් බදු ගෙවිය යුතු සියලුදෙනාම බදු ගෙවන්නට ඕනෑ.

මේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන වගකීම තමයි රාජ්‍ය මූල්‍ය පාලනය. පසුගිය දවස්වල ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් කථා කළා. පාර්ලිමේන්තුවේ ප්‍රධාන වගකීම තමයි රාජ්‍ය මූල්‍ය පාලනය. රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය කරන්න පාර්ලිමේන්තුවේ කාරක සභා කිහිපයක් තිබෙනවා. රාජ්‍ය ආදායම අධීක්ෂණය කිරීමට වෙනම කාරක සභා තිබෙනවා. ඒක නිසා නීතිය තුළින් නියම කොට ඇති බදු ගෙවිය යුතු පිරිස බදු ගෙවන්න ඕනෑ නැහැයි කියලා විශ්වාස කිරීමේ අවශ්‍යතාවක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට තිබෙන්න විධියක් නැහැ.

මොකද, අපට ඒක තනි පුද්ගල කැමැත්ත මත තීරණය කරන්න පුළුවන් දෙයක් නොවෙයි. බදු ගෙවන්න ඕනෑ නම්, නීතියෙන් නියම කරලා තිබෙනවා නම්, අදාළ classification එකට තමන් අයිති වෙනවා නම් ඔවුන් බදු ගෙවන්නට අවශ්‍යයි. රටේ ආදායම එකතු කරන්නේ අපි කාගේවත් පෞද්ගලික පරිභෝජනයට නොවෙයි. මේ මහත්තුරු රටේ බදු ආදායම ජනතාවගේ සේවාවලට යොදවපු නැති නිසා, රටේ බදු ආදායම හැල්ලුවට ලක් කරපු නිසා, අද මේ මහත්වරුන්ට ඒක පුරුද්දට ගිහිල්ලා වෙන්න ඇති.

ඇත්තටම, අපි 2022 අවුරුද්දේ බංකොලොත් වීමට ප්‍රධාන හේතුවක් තමයි රජයේ බදු ආදායම සියයට 7 දක්වා අඩු වීම. බදු ආදායම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට සහ රජයට තිබෙන වගකීම පැහැර හැරපු නිසා තමයි අපේ රට බංකොලොත්භාවයට පත් වුණේ. මේ තත්ත්වය මේගොල්ලන්ට serious නැති නිසා මේගොල්ලෝ හිතනවා, අපටත් ඒක serious නැහැයි කියලා. එහෙම නැහැ. ගිය අවුරුද්දේ ලංකාවේ බදු ආදායම සියයට 16.6ක් වුණා. අපේ target එකටත් වඩා ඉහළින් අපි බදු එකතු කරලා තිබෙනවා. එසේ එකතු කරපු බදු ආදායම නිසා තමයි ආර්ථික අර්බුද කිහිපයක් තුළින් ගමන් කරද්දීත්, අසීරු කාල කිහිපයක් තුළින් ගමන් කරද්දීත් ජනතාවට සහන සපයන්න අපට හැකියාව ලැබී තිබෙන්නේ. රජය බදු අය කර ගන්නවා, රජයට බදු ගෙවිය යුතුයි කියලා අපි තේරුම් ගන්න ඕනෑ. ඒක සාධාරණ විය යුතුයි. එය සාධාරණව ඉටු කිරීමේ අරමුණින් තමයි අපි අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ. මොකද, බදු ගෙවන්න නියමයක් තිබෙනවා නම්, බදු අනුකූලතාව - tax compliance - කියන එක නීතියෙන් නියම කරලා තිබෙනවා නම් බදු ගෙවිය යුතුයි. අපි ඒ තත්ත්වය, ඒ සංස්කෘතිය, බදු ගෙවන්න තිබෙන උනන්දුව, බදු ගෙවන්නේ නැති එක වරදක් කියන මානසිකත්වය, බදු නීතිය යටතේ ඉදිරිපත් කරන්න ඕනෑ ලේඛන ඉදිරිපත් කරන්න ඕනෑය කියන අදහස ඇති කිරීම, ඒ සම්බන්ධයෙන් වගකීමක් ඇති කර ගැනීම නරක දෙයක් නොවෙයි. මේ විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු වගේ නොවෙයි, නීතියට ගරු කරන වැදගත් ජනතාවක් තමයි අපේ ලංකාවේ ඉන්නේ. බදු ගෙවන වැදගත් ජනතාවක් අපේ රටේ ඉන්නවා. බදු ගෙවීම සම්බන්ධයෙන්, බදු ගෙවීමට අවශ්‍ය ලේඛන සම්බන්ධයෙන්, කාලීන - timely - විධියට කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට ගැටලුවක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ.

අපි මතක් කර ගන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. 2024 අපි රජයට ආපු විගසම ඉදිරිපත් කළ පළමු අය වැයෙන්ම කරපු එක දෙයක් තමයි, බදු ගෙවන ජනතාව මත තිබුණු බදු බර අඩු කිරීම. ඒ වෙනකොට තිබුණු සියයට 18ක VAT එක අදටත් තිබෙනවා. "පෝෂණය" කියන කාරණය ගැන වැඩියෙන් හිතලා කිරි ආහාරවලට තිබෙන VAT එක අපි ඉවත් කළා. ඒ වාගේම උපයන විට ගෙවන බද්ද - PAYE tax එක - ගත්තොත්, ඒ වෙනකොට threshold එක විධියට තිබුණේ රුපියල් ලක්ෂයයි. මාසිකව රුපියල් ලක්ෂයක් උපයන හැම සේවකයෙකුම, හැම පුද්ගලයෙකුම බදු ගෙවීමේ අවශ්‍යතාව තිබුණා. අපි ඒක රුපියල් 150,000 දක්වා වැඩි කළා. ඒක තවත් වැඩි වෙන්න ඕනෑ කියන අදහසේ තමයි අපේ රජය ඉන්නේ.

ඒ වාගේම අපි tax ගෙවන ප්‍රමාණය - tax slab එක - එක් එක් bracket එකේ tax ගෙවන ප්‍රමාණය අඩු කළා. රුපියල් 150,000ක් උපයනවා නම් සියයට 100ක් අඩු කළා, රුපියල් ලක්ෂ 2ක් උපයනවා නම් සියයට 71ක් අඩු කළා, රුපියල් 250,000ක් උපයනවා නම් සියයට 61ක් අඩු කළා, රුපියල් ලක්ෂ 3ක් උපයනවා නම් සියයට 47ක් අඩු කළා. එහෙම බලනකොට, අපි දැනටමත් බදු ගෙවන ජනතාවට සහන ලබා දීලා තිබෙනවා; බදු බර අඩු කරලා තිබෙනවා. ඒ වාගේම බදු ගෙවිය යුතු නමුත්, බදු නොගෙවන පිරිසක් සිටිනවා. ඒ ජනතාව බදු ගෙවන තැනට අපි යොමු කර ගන්නට ඕනෑ. ඒ සඳහා තමයි මේ නීතිය සංශෝධනය කරන්නේ. මේක draconian law එකක් නොවෙයි.

මේකේ සරල අදහස මේකයි. අපි IRD එකට ලබා දිය යුතු ලේඛන තිබෙනවා. එම ලේඛන ඉදිරිපත් කරන්න දවස් 30ක කාලයක් තිබෙනවා. ඒ දවස් 30ක කාලයට පස්සේ IRD එක notice කරනවා. Notice කළාට පස්සේ ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබෙනවා. මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ම නැඟිටලා කියනවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රුපියල් බිලියන 900ක් එකතු කර ගන්න තිබෙනවා, රුපියල් ට්‍රිලියනයක් එකතු කර ගන්න තිබෙනවා, රුපියල් ට්‍රිලියන 1.2ක් එකතු කර ගන්න තිබෙනවා කියලා. ඒක තමයි ප්‍රශ්නය. ඒක තමයි අපිත් මේ කියන්නේ. Assess කරපු බදු ගෙවන්න ඕනෑ. බදු ගෙවන්න ඕනෑ කියලා නියම කරපු පිරිසක් ඉන්නවා. ඒ අය බදු ගෙවලා නැහැ. ඒක තමයි ගැටලුව. ඔබතුමන්ලාගේ කාලය තුළ තමයි ලබාගත යුතු බදු ප්‍රමාණය එකතුවෙලා නැත්තේ. එහෙම නැතුව මේක අවුරුද්දක් ඇතුළත අපි අලුතින් එකතු කරපු කොටසක් නොවෙයි නේ. අපි සියයට 16.6කින් බදු ගෙවීම් වැඩි කරලා තිබෙනවා, බදු අනුකූලතාවත් වැඩි කරලා තිබෙනවා. ඒක Central Bank එකේ Annual Report එකෙනුත් බොහොම පැහැදිලිව පෙන්වනවා. ගිය අවුරුද්දේ tax compliance වැඩි වෙලා තිබෙනවා. මේ, ඔබතුමන්ලාගේ කාලයේ බදු අය කිරීම්වල arrears එක. අපි ඒක අයකර ගන්න ඕනෑ. බදු ගෙවන්න නියම අය, assess කරලා තිබෙන අය බදු ගෙවන්න ඕනෑ. ඒ අරමුණින් තමයි අපි මේ නීතිය සංශෝධනය කරන්නේ. IRD එක කිසිම ආකාරයකින් CID එක වාගේ දැඩි implementation එකකට යන්නේ නැහැ. ඒක මේ මහත්වරු දන්නවා.

බදු ගෙවන අයට ඕනෑ තරම් අවස්ථා දෙනවා. Show cause කිරීමේ අවස්ථාව දෙනවා; grace periods දෙනවා. ඒ හැම දෙයම කරලා අවසානයට තමයි නඩු පවරන්නේ. බදු ගෙවන්න ඕනෑ නැහැ, බදු ගෙවන එක draconian දෙයක් වාගේ අදහසක් මිනිස්සු අතර ඇති කරන්න විපක්ෂය උනන්දු වෙනවා. ඒ ඇයි කියලා මම දන්නේ නැහැ. මේවා ඔබතුමන්ලා දාපු බදු. අපි දාපු බදු නොවෙයි. ඔබතුමන්ලා හදපු arrears මේ. ඒවා එකතු කරගන්නට ඕනෑ. ඉතින්, අපි ඒක කරන්න ඕනෑ. ඒක තමයි සාධාරණත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(මාණ්පුමිකු චට්ටත්තරණි (චෙල්වි) ලක්මාලි හේමචන්දිර)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒක නිසා විපක්ෂය ඉතාම වගකීම්සහගත වෙන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමාගේ සිට හැමෝම බදු විරෝධී අදහසක් සමාජගත කළා. මේ දෙකයි පනහේ දේශපාලනයක්. දෙකයි පනහේ දේශපාලනයක් තමයි බදු විරෝධී අදහසක් හදන එක. මොකද, රජයකට අවශ්‍ය දෙයක් තමයි බදු ආදායම. අපි ඒ ආදායම රටේ ජනතාවටම තමයි ආයෝජනය කරන්නේ. නැතිව වෙන මොකවත් කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපට ආර්ථික අර්බුදය අවස්ථාවේ රුපියල් බිලියන 100ක සහන පැකේජයක් ජනතාවට දෙන්න පුළුවන් වුණේ. ඒ කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. මට වෙලාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[ප.ප. 3.09]

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(මාණ්පුමිකු එම්.එස්. උදුමාලෙප්පෙ)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் நடைபெறுகின்ற நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரினால் சமர்ப்பிக்கப்பட்டுள்ள உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மிக்க மகிழ்ச்சியடைகின்றேன்.

இலங்கையின் சமச்சீரான பொருளாதார வளர்ச்சிக்கு கிழக்கு மாகாணம் ஒரு முக்கிய தூணாகும். திருகோணமலை, மட்டக்களப்பு, அம்பாறை ஆகிய மூன்று மாவட்டங்களையும் உள்ளடக்கிய இப்பிராந்தியம், பரந்த நிலப்பரப்பையும் நீண்ட கடற்கரையையும் கொண்டுள்ளபோதிலும், அதன் முழுமையான பொருளாதார வளர்ச்சி இன்னும் வெளிக்கொணரப்படவில்லை. இம்மாகாணத்தின் 70 சதவீதத்துக்கும் அதிகமான மக்கள், தங்களது அன்றாட வாழ்வாதாரத்துக்கு முதன்மைத் துறைகளான விவசாயம் மற்றும் மீன்பிடி என்பவற்றையே நம்பியுள்ளனர். கிழக்கு மாகாணத்தின் பொருளாதார இதயம் விவசாயமாகும். குறிப்பாக, அம்பாறை மாவட்டம் "இலங்கையின் அரிசிக் கிண்ணம்" என்று அழைக்கப்படுகின்றது. 'மகா', 'யால' ஆகிய இரு போகங்களிலும் இங்கு பாரியளவில் நெற்செய்கை மேற்கொள்ளப்படுகின்றது.

இலங்கையின் மொத்த நெல் உற்பத்தியில் சுமார் 20-25 சதவீதம் அம்பாறையில் இருந்தே கிடைக்கின்றது. கிழக்கு மாகாணம் என்பது வெறும் விவசாய நிலங்களையும் கடலையும் கொண்ட பகுதி அல்ல. அது இலங்கையின் பொருளாதார மறுமலர்ச்சிக்கான பெரும் ஆற்றலைக்கொண்ட ஒரு பிராந்தியமாகும். பால் உற்பத்திப் பிரச்சினைகளைத் தீர்த்து, மீன்பிடி மற்றும் விவசாயத் துறைகளை நவீனமயமாக்கி, மதிப்புக்கூட்டுத் தொழில்களை உருவாக்கவேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது. எங்களது அம்பாறை மாவட்டத்திலிருந்து தேசிய ரீதியில் 22 சதவீத நெல் உற்பத்தி கிடைக்கப் பெறுகிறது. அம்பாறை மாவட்டத்தில் நீண்ட காலமாக நீரில் மூழ்கியுள்ள 12,500 ஏக்கர் காணிகளை உள்ளடக்கிய சம்புக்களப்பு, கரைவாகுப்பற்று வடிச்சல் திட்டங்களை நிறைவுசெய்தால், இம்மாவட்டம் தேசிய ரீதியில் 30 சதவீத நெல் உற்பத்தியைப் பெறும் வாய்ப்பு ஏற்படும்.

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

අම්පාරை மாவட்ட விவசாயிகள் தங்களுக்கான உரத்தைப் பெறுவதற்காக 63 கோடி ரூபாயைச் செலுத்தியிருந்தும், இதுவரை அவர்களுக்கு உரிய நேரத்துக்கு உரம் வழங்கப்படாத நிலையே காணப்படுகின்றது. பணம் செலுத்தியிருந்தும் உரம் கிடைக்காத காரணத்தால், விவசாய நடவடிக்கைகளை உரிய நேரத்தில் மேற்கொள்ள முடியாமல் அவர்கள் பெரும் பாதிப்புக்கு உள்ளாகியிருக்கிறார்கள். கடந்த இரண்டு வருடங்களாக வெள்ளத்தால் பாதிக்கப்பட்ட எமது மாவட்ட மற்றும் மாகாண விவசாயிகளுக்கு உரிய நேரத்துக்கு உரம் கிடைக்காததால் பெரும் பிரச்சினையை எதிர்நோக்கி இருக்கிறார்கள். ஒரு கிழமைக்குள் அவர்களுக்கு உரம் வழங்கப்படவில்லை என்றால், அவர்கள் செய்த வேளாண்மையால் பிரயோசனம் இல்லாமல் போய்விடும்.

கடந்த இரண்டு வருடங்களாக வெள்ளத்தால் பாதிக்கப்பட்ட எமது மாவட்ட மற்றும் மாகாண விவசாயிகளுக்கு உரிய நேரத்துக்கு உரம் கிடைக்காததால் பெரும் பிரச்சினையை எதிர்நோக்கி இருக்கிறார்கள். ஒரு கிழமைக்குள் அவர்களுக்கு உரம் வழங்கப்படவில்லை என்றால், அவர்கள் செய்த வேளாண்மையால் பிரயோசனம் இல்லாமல் போய்விடும்.

இலங்கையை நிலையான பொருளாதாரப் பாதையில் இட்டுச்செல்லக்கூடிய ஒரு மாகாணமாகவும் எமது மாகாணம் இருக்கின்றது. அம்பாறை மாவட்டத்தின் சம்மாந்துறை பிரதேசத்தில் 8 கோடி ரூபாயும் மல்வத்தை பிரதேசத்தில் 5 கோடி ரூபாயும் இறக்காமம் பிரதேசத்தில் 3.85 கோடி ரூபாயும் அட்டாளைச்சேனை பிரதேசத்தில் 3 கோடி ரூபாயும் கோமாரி பிரதேசத்தில் 0.32 கோடி ரூபாயும் தம்பிலுவில் பிரதேசத்தில் 3.6 கோடி ரூபாயும் கல்முனை பிரதேசத்தில் 0.3 கோடி ரூபாயும் நிந்தவூர் பிரதேசத்தில் 4 கோடி ரூபாயும் சாய்ந்தமருது பிரதேசத்தில் 50 இலட்சம் ரூபாயும் அக்கரைப்பற்று மேற்கு பிரதேசத்தில் 3 கோடி ரூபாயும் காரைதீவு பிரதேசத்தில் 72 இலட்சம் ரூபாயும் பொத்துவில் பிரதேசத்தில் 8 கோடி ரூபாயும் தெஹியத்தகண்டிய பிரதேசத்தில் 8 கோடி ரூபாயும் பாணம பிரதேசத்தில் 1.5 கோடி ரூபாயுமென முழு மாவட்டத்திலும் 63 கோடி ரூபாயை விவசாயிகள் உரத்துக்காக வழங்கியிருந்தும், இதுவரை அவர்களுக்கு உரம் வழங்கப்படாத நிலைமையே காணப்படுகின்றது.

அம்பாறை மாவட்ட விவசாயிகளுக்கு வழங்கப்பட வேண்டிய மொத்த உரத்தின் அளவு 15,650 மெற்றிக் தொன் ஆகும். அதில் இதுவரை 6,311 மெற்றிக் தொன் மாத்திரமே வழங்கப்பட்டுள்ளது. இன்னும் 9,339 மெற்றிக் தொன் உரம் வழங்கப்பட வேண்டியுள்ளது. அதில் 1,145 மெற்றிக் தொன் உரத்தை வழங்குவதற்காக ஏற்பாடுகள் இப்பொழுது நடைபெறுகின்றன. அதாவது, எதிர்வரும் 22ஆம் திகதி மாண்புமிகு சனாதிபதி அவர்கள் அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்துக்கு - DCCக்கு - வருகைதர இருக்கின்ற காரணத்தாலும், நாம் எல்லோரும் சொல்லியதன் விளைவாகவும், தற்போது அதற்கான ஏற்பாடுகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அம்பாறை மாவட்ட விவசாயிகளுக்கு ஒதுக்கப்பட்டுள்ள மிகுதி 8,194 மெற்றிக் தொன் உரம் இன்னும் வழங்கப்படவேண்டிய நிலையிலே உள்ளது. எனவே, அம்பாறை மாவட்ட விவசாயிகளுக்கான உரத்தை விரைவாகவும் தடையின்றியும் வழங்குவதற்கு நடவடிக்கை எடுக்குமாறு நான் கௌரவ விவசாய அமைச்சரைக் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த அரசாங்க காலத்தில் 350 ரூபாயைச் செலுத்தினால் விவசாயிகளின் வீடுகளுக்கே உர மூடை வந்துசேரும். அவர்கள் உரிய காலத்தில் அதனை இடுவார்கள். ஆனால், இப்போது 18,000 ரூபாவுக்குக்கூட உர மூடையை தனியார் விற்பனை செய்கிறார்கள். நீங்கள் உரத்தை விநியோகிப்பதற்குக் கொடுத்திருக்கின்ற கம்பனிக்காரர்களின் தாமதத்தால்தான், எமது விவசாயிகள் இவ்வளவு பணத்தைச் செலுத்தியும் உரிய காலத்துக்குள் உரம் கிடைக்காமல் இருக்கின்றது. எனவே, இது சம்பந்தமாக மாற்றுத் திட்டங்களை ஏற்படுத்தவேண்டிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. கடந்த அரசாங்க காலத்தில் குறிப்பாக, கோட்டாபய ராஜபக்ஷ அவர்கள் சனாதிபதியாக வந்த பின்னர், முதலாவதாக விவசாயிகளில்தான் கைவைத்தார். அவர் திட்டமிடாமல் உரத் திட்டமொன்றைக் கொண்டுவந்த காரணத்தால், நாடு பூராவுமுள்ள விவசாயிகள் கொழும்புக்கு வந்து ஆர்ப்பாட்டம் செய்தார்கள். அவ்வாறானதொரு நிலைமையை நீங்கள் ஏற்படுத்தி விடாதீர்கள்! இந்த முக்கியமான விடயத்தை விவசாயிகளின் பிரதிநிதியாகவே நான் இங்கு சொல்கின்றேன். இன்று எங்களுடைய அம்பாறை மாவட்ட விவசாயிகள் உட்பட கிழக்கு மாகாண விவசாயிகள் மிகவும் பாதிக்கப்பட்ட நிலையிலே இருக்கிறார்கள். அவர்களுக்கு உரத்தை உரிய நேரத்துக்குக் கொடுக்கவில்லை என்றால், வேளாண்மையின் அறுவடையில் பிரயோசனமில்லாமல் போய்விடும்.

இன்னுமொரு முக்கிய பிரச்சினையும் இருக்கின்றது. கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கே இருக்கிறார். எங்களுடைய மாவட்ட விவசாயிகள் எதிர்வரும் யூலை மாதம் நெல் அறுவடை செய்ய இருக்கிறார்கள். எனினும், கடந்த ஒரு வருட காலமாக அம்பாறை மாவட்டத்திலுள்ள நெல் சந்தைப்படுத்தும் சபைக்குரிய களஞ்சியசாலைகளில் நெல் களஞ்சியப்படுத்தப்பட்ட நிலையிலே இருக்கின்றது. நான் இது பற்றி ஏற்கனவே இந்தச் சபையில் சொல்லியிருக்கிறேன். சம்மாந்துறை நெற்களஞ்சியசாலையில் 2,000 மெற்றிக் தொன் நெல்லும் மல்வத்தை நெற்களஞ்சியசாலையில் 2,300 மெற்றிக் தொன் நெல்லும் நாவிதன்வெளி நெற்களஞ்சியசாலையில் 2,000 மெற்றிக் தொன் நெல்லும் அட்டாளைச்சேனை நெற்களஞ்சியசாலையில் 1,500 மெற்றிக் தொன் நெல்லும் அக்கரைப்பற்றிலுள்ள இரண்டு நெற்களஞ்சியசாலைகளில் 3,400 மெற்றிக் தொன் நெல்லும் தம்பட்டை நெற்களஞ்சியசாலையில் 1,800 மெற்றிக் தொன் நெல்லும் சாகாமம் நெற்களஞ்சியசாலையில் 1,200 மெற்றிக் தொன் நெல்லும் பொத்துவில் நெற்களஞ்சியசாலையில் 2,000 மெற்றிக் தொன் நெல்லும் பாணம - லகுகல நெற்களஞ்சியசாலையில் 3,000 மெற்றிக் தொன் நெல்லும் களஞ்சியப்படுத்தப்பட்டு இருக்கின்றது. இவ்வாறு அம்பாறை மாவட்டத்தில் மொத்தம் 50,000 மெற்றிக் தொன் நெல் கடந்த ஒரு வருட காலமாக stockஇல் இருக்கின்றது.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

அறுவடை செய்யும் காலம் வருவதற்கு முன்னர், இந்த நெல்லை வேறு இடங்களுக்குக் கொண்டுசெல்வதற்குரிய

ஏற்பாடுகளை அல்லது அரிசியாக்குவதற்குரிய ஏற்பாடுகளை அல்லது வேறு ஏதாவது மாற்று ஏற்பாடுகளை இந்த அரசாங்கம் செய்யவில்லை என்றால், நமது விவசாயிகள் பாரிய நட்டத்தை அனுபவிப்பார்கள். இவ்விடயம் தொடர்பில் நிதி அமைச்சுக்கும் பொறுப்பு இருக்கின்றது. நிதி அமைச்சானது விசேட நிதி ஒதுக்கீட்டை மேற்கொண்டு, அந்த நெல்லை வேறு இடங்களுக்கு மாற்ற வேண்டும் அல்லது அவற்றை அரிசியாக மாற்றுவதற்குரிய நடவடிக்கையைச் செய்ய வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.17]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ රටට විශේෂ දවසක්. අද, දශක තුනකට අධික කාලයක් අපේ රටේ පැවති ත්‍රස්තවාදී යුද්ධය අවසන් කිරීමත්, ඒ වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කරපු ත්‍රිවිධ හමුදාවල සියලු සොල්දාදුවන් අනුස්මරණයත්, යුද ජයග්‍රහණයත් සනිටුහන් කරනවා. මේ වන විටත් ජනාධිපතිතුමා ඒ සඳහා සහභාගි වී සිටිනවා.

මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, ඉදිරියේදී විවාදයට භාජන වීමට නියමිත මාතෘකාවකට අදාළ කරුණක් පිළිබඳවත්. අද අපි 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීමට අදාළ පනත් කෙටුම්පත පිළිබඳවයි සාකච්ඡා කරන්නේ. ඉදිරියේදී 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කර ඇති රෙගුලාසි මේ පාර්ලිමේන්තුවේ අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතයි. ඒ තුළ සහල් ආනයනයට අදාළ රෙගුලාසි අනුමත කර ගැනීමත් ඇතුළත් වනවා. ඒ නිසා මම මේ කාරණය විශේෂයෙන් එතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

වී මිල පිළිබඳ සාකච්ඡාව මේ පාර්ලිමේන්තුවේ අවශ්‍ය අවස්ථාවල සිදු වනවා. ආණ්ඩුව හැටියට අපි පසුගිය කන්න තුනේදී එක දිගට වී මිලදී ගැනීම් කළා. මේ කන්නයේත් අපි වී මෙට්‍රික් ටොන් 85,000ක් මිලදී ගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ගිය කන්නයේ අපි වී මෙට්‍රික් ටොන් 50,000ක් මිලදී ගත්තා. ඒවා දැන් වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල තිබෙනවා. එම වී, සහල් බවට පත් කරන ක්‍රියාවලිය සමුපකාර තොග වෙළඳ සංස්ථාව හරහා කරනවා. මේ වන විටත් ටෙන්ඩර් කැඳවීම් දෙකක් හරහා සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ගෙන් මිල ගණන් කැඳවා වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල තිබෙන වී කොටලා සහල් කරලා, සතොස හරහා, සමුපකාර හරහා සහ පෞද්ගලික අංශය හරහා විකුණමින් කටයුතු කරනවා. පසුගිය මාස 3කට ආසන්න කාලය තුළ වී මෙට්‍රික් ටොන් 18,000ක් කොටලා තිබෙනවා. වෙළෙඳ පොළ තුළ තිබෙන්නේ සහල් මිලේ පහළ යෑමක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ සහල් නිෂ්පාදනයෙන් සියයට 85ක්ම සුදු සහ රතු නාඩු තමයි තිබෙන්නේ. සම්බා, කීරි සම්බා ඇතුළු අනෙකුත් සහල් වර්ග තිබෙන්නේ සියයට 15යි. ඒ අනුව, අප සතුව තිබෙන සහල් තොගවලින් සියයට 95ක්ම තිබෙන්නේ රතු සහ සුදු නාඩු. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන නැඟෙනහිර සහ උතුරු ප්‍රදේශවල වැඩිපුර තිබෙන්නේ රතු සහල්. විශේෂයෙන්ම ඔබතුමා ඔය මතු කරපු කරුණම අපි පසුගිය සතියේ පැවති ආහාර සුරක්ෂිතතා කමිටුවේදී අවධානයට යොමු කළා. මේ වන විට වී අලෙවි මණ්ඩලය සතුව වී මෙට්‍රික් ටොන් 135,000ක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වී මෙට්‍රික් ටොන් 135,000න් 30,000කට ටෙන්ඩරයක් දාලා අපි සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ට වී කොටන්න දීලා තිබෙන්නේ. ඒකෙන් මෙට්‍රික් ටොන් 18,000ක් දැන් කොටලා තිබෙනවා. ඒ වාගේම තවත් වී මෙට්‍රික් ටොන් 20,000ක් සහල් කරලා වෙළෙඳ පොළට ලබා දීම සඳහා නැවත ටෙන්ඩරයක් දැම්මා. මොකද, මේක පියවරෙන් පියවර යන්න ඕනෑ. සහල් ඉවර වෙන්න කලින් ටෙන්ඩරය දමන්න ඕනෑ. ඒ ටෙන්ඩරයත් දැන් පිරිනමා තිබෙනවා. ඒ අනුව, වී මෙට්‍රික් ටොන් 50,000ක් දැන් ගබඩාවලින් එළියට එනවා.

ඊට අමතරව, ඔබතුමා කියනවා වාගේම ජූනි මාසයේ 20වැනි දායින් පස්සේ ආපසු නැඟෙනහිර පළාතේ ගොයම් කැපෙන්න පටන් ගන්නවා. එතකොට වී ගබඩා ටික හිස් කරගන්න ඕනෑ. ඒ නිසාම ආහාර සුරක්ෂිතතා කමිටුව ඒ පිළිබඳව අවධානය යොමු කරලා අවශ්‍ය නම් තවත් වී මෙට්‍රික් ටොන් 45,000ක් හාල් බවට පත් කර වෙළෙඳ පොළට එවන්න, මෝල් හිමියන්ට වී නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගන්න අදාළ කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා අදාළ කැබිනට් පත්‍රිකාව කැබිනට් මණ්ඩලයට යොමු කර තිබෙනවා. කැබිනට් මණ්ඩලයෙන් ඒක අනුමත වුණාට පස්සේ පුවත් පත් දැන්වීම් දමා අපි වී ඉවත් කරනවා. ඒ නිසා ඔබතුමා මතු කරපු කාරණයට අදාළව ගබඩාවල තිබෙන වී හිස් කර ගැනීම සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාව මේ අනුගමනය කරන දෙවන ටෙන්ඩරයට අදාළව වී මෙට්‍රික් ටොන් 20,000 ලබා ගැනීමේ ක්‍රියාවලියේදී විශේෂයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා, උතුරු, නැඟෙනහිර පළාත්වලත්, අනුරාධපුරය, අම්පාර කියන දිස්ත්‍රික්කවලත් ගබඩාවල තිබෙන වී ඉවත් කරන්න. මොකද, මේ තැන්වලට තමයි ඊළඟ කන්නයේ වී අස්වැන්න ඒමට නියමිතව තිබෙන්නේ. ඒ නිසා Paddy Marketing Board - PMB - එකත්, සමුපකාර තොග වෙළඳ සංස්ථාවත්, ලංකා සතොස ආයතනයත් ඒකාබද්ධව මේ කාර්යය කරමින් යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේශීය ආදායම් පනතට සිදු කරන සංශෝධන පිළිබඳව අද සාකච්ඡාවට නියමිතව තිබුණත්, ඉදිරිපත් වුණු බොහෝ කථාවලදී, අද දවසේ තිබෙන විශේෂත්වය පිළිබඳව තමයි කරුණු ඉදිරිපත් කළේ. අද දවසේ තිබෙන විශේෂත්වයට විශේෂයෙන් සලකපු අයම තමයි අද ඒ ගැන ප්‍රශ්න කරන්න පටන් ගත්තේ. සාරිවල කටු ගහන්න නාවික හමුදාව තියාගෙන හිටපු අය තමයි අද රණවිරුවෝ ගැන අපට කියන්න එන්නේ. ගෙවල්වල කුස්සියේ උයන්න රණවිරුවන් තියාගෙන හිටපු අය, රග්බි ගහනකොට බේබිලාට හුරේ දාන්න නාවික හමුදාවේ platoons පිටින් එක්කගෙන ගිය අය තමයි අද අපට රණවිරුවෝ ගැන කියලා දෙන්න එන්නේ. එම නිසා ඒ පාඩම ගැන අපට වැඩිය කියන්න එන්න ඕනෑ නැහැ. මොකද, ඒගොල්ලන් ඉතිහාසයේ කරපුවා මුළු රටේම මිනිස්සු දන්නවා. ඒගොල්ලන් ත්‍රිවිධ හමුදාව වැඩ අනුව බෙදලා තමයි පාවිච්චි කළේ. සරත් ෆොන්සේකා මහත්මයා හිරේ දාලා තමයි පටන් ගත්තේ. ඒ සියලුදෙනාට ගෞරවනීය ලෙස සේවය කරගෙන යෑමට පුළුවන් වටපිටාව අපි දැන් හදලා තිබෙන්නේ.

දැන් ජාතික සමගිය ගැන කථා කරනවා. ආගම ආරක්ෂා කරන එක ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි පසුගිය Budget එකෙන් මුදල් වෙන් කරලා,

[ගරු වසන්ත සමරසිංහ මහතා]

යුද්ධයෙන් අවතැන් වූ උතුරු, නැඟෙනහිර ජනතාව වෙනුවෙන් ගෙවල් 4,500ක් හදනවා, වසර 17කට පස්සේ. යුද්ධයෙන් අවතැන් වූ උතුරු, නැඟෙනහිර පළාත්වල ජනතාවට නිවාස ලබා දීමට වසර 17කට පස්සේ නිවාස 4,500ක් හදනවා, විශේෂ ව්‍යාපෘතියක් ලෙස. අවුරුදු 17කට පසුව, අපේ ආණ්ඩුව බලයට ආවාම තමයි ඒ ප්‍රදේශවල නිවාස හදන්න පටන් අරගෙන තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ කාරණය මම කියන්න ඕනෑ වෙන මුකුත් නිසා නොවෙයි.

දැන් බොහොම උජාරුවෙන් පෙනී ඉන්න අය බදු ගැන කථා කරනවා; බදු එකතු කරන එක ගැන කථා කරනවා; ජනතාවට බදු ගහන එක ගැන කථා කරනවා. භාණ්ඩාගාරයම හිස් කරලා තිබුණු වෙලාවක තමයි මේ රට ජාතික ජන බලවේගය ආණ්ඩුව භාර ගත්තේ. ඒ විතරක් නොවෙයි, එකතු කරපු බදු හොරා කාපු අය තමයි දැන් අපට මේ ගැන කියන්න එන්නේ. ඒ හොරා කාපු අයගේ නඩු ටික දැන් එක පෙළට එනවා. ඒ නිසා තමයි දැන් සමහර අයට අදාළ නිලධාරීන් අලුගෝසුවන් බවට පත් වෙලා තිබෙන්නේ.

අපට මතකයි, හිටපු ඇමතිවරයෙකුට පරීක්ෂණය ආවාට පස්සේ අමාත්‍යාංශ කාර්යාලයේදී නයා කෑවා කියලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගියේ නැති බව. එතුමා මේ වෙලාවේ පාර්ලිමේන්තුවේ නැහැ. මේක තමයි, ඉතිහාසය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කිව්වාම, නයා කෑවා කියලා ගියේ නැහැ. ඊට දින කිහිපයකට පසුව බලනකොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්තුමා ත්‍රිකුණාමලයේ විනිශ්චයකාරවරයා කරලා යවලා. එහෙම ඉතිහාසයක් තිබෙන අය තමයි හොරා කාලා මාට්ටු වෙලා, නඩු වැටිලා, ෆයිල් එක ගිහිල්ලා උසාවියේ නඩුව විභාග වෙනකොට ඒ අදාළ නිලධාරීන් අලුගෝසුවන් කරන්න හදන්නේ. මහජන මුදල් වංචා කරපු මිනිසුන්ට මහජනතාව ඉදිරියේ දඬුවම් දෙනවා කියලා බලයට ආපු ජාතික ජන බලවේගය ආණ්ඩුව නීති හදලා, නීති ශක්තිමත් කරලා ඒ කටයුත්ත අඩුවක් නැතිව කරනවාය කියන එක අපි අද කියනවා.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. තව නඩු ටිකක් තිබෙනවා. ඒ නඩු මොනවාද? කුලී හමුදා හදා ගෙන හිටියා. ඒ, කවුද? රාජපක්ෂලා ත්‍රිවිධ හමුදාවේ සමහර සොල්දාදුවන් කුලී හමුදා ලෙස පාවිච්චි කරලා අමාරුවේ දැම්මා; ඔවුන් සමහර ඝාතනවලට සම්බන්ධ කළා. එහෙම කුලී හමුදා පවත්වාගෙන ගිය අය අද හමුදාව ගැන කථා කරන්න එනවා.

මේ හැමෝටම නඩු තිබෙනවා. ඒ වැරදිවලට, අපරාධවලට, හොරකම්වලට, දූෂණවලට සම්බන්ධ වෙච්ච සියලුදෙනාටම නඩු තිබෙනවා. ඒ නඩු සම්බන්ධව කටයුතු කරන්න අද අපේ රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. යන එන ගමන් තැන් තැන්වල කයිවාරුකමට කට ඇරියාට, මේ දේවල් එළියේ කියන්නේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකද, ඕනෑ නම් තව 5ක් ඇතුළේ ඉන්න දාලා දෙනවා. පුළුවන් නම් කියන්න කෝ ඒවා එළියේ කියන්න කියලා. පාර්ලිමේන්තු බලය පාවිච්චි කරලා බොරුවට කයිය ගහනවා. අපි මේ රටේ ජනතාවගේ ජන වරමින් බලයට ආපු ආණ්ඩුවක්. ජනතාවට අපි කිව්වා, මේ රටේ බදු ප්‍රතිපත්තිය සකස් කරනවා, සියලුදෙනා බදු ගෙවිය යුතු පුද්ගලයන් හැටියට ගෙවිය යුතු බදු ගෙවන්න ඕනෑ, ජනතාවට බරක් නොවී ඒ සමහර බදු අය කර ගන්න අපි කටයුතු කරනවාය කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි 2024දී රට භාර ගන්නකොට තිබුණු රාජ්‍ය ආදායම එක්ක බැලුවාම, 2025 අවුරුද්ද අවසන් වනකොට සියයට සියයකටත් වැඩි ප්‍රමාණයකින් බදු ආදායම ඉහළ ගියා. අපි අලුතින් බදු හඳුන්වා දුන්නාද? නැහැ. තිබුණු බදු ප්‍රතිපත්තිය අපි විධිමත් කළා. ඒ වාගේම, බදු ගෙවීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩි කළා. බදු නොගෙවන අයට බදු ගෙවන්න කියලා සැලසුම් සකස් කළා. අපි මේ කාරණයත් කියන්න ඕනෑ. පසුගිය කාලයේ බදු නොගෙවා හිටපු සමහර අය දැන් බදු ෆයිල් හදලා බදු ගෙවනවා. ඒක හොඳයි. අයථා රැස් කිරීම් පිළිබඳ පනත් හදලා තිබෙනවා; නීති සකස් කර තිබෙනවා. ඒ නිසා අද ඒවා හංගන්න බැහැ. එවැනි අයට හැංගෙන්න බැහැ. ඒ අනුව හැම කෙනාටම බදු ගෙවන්න අවශ්‍ය වටපිටාව අපි සකස් කර තිබෙනවා. වසර 76ක් රට පාලනය කරලා, අවසානයේ බංකොලොත් රටක් බවට පත් කරලා තමයි මේ රට අපට භාර දුන්නේ. ඒ බංකොලොත් කරපු රට භාර ගත්ත ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ අවුරුදු එකහමාර ඇතුළත කරපු බොහෝ දේවල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ බොහෝ දේවල් අතර අද අපි මුහුණ දීලා තිබෙන අර්බුදය ගැනත් මම කියන්න ඕනෑ.

අද වනවිට අපි අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒ අර්බුදය තමයි, මේ dollar crisis එක. ඒ කියන්නේ, රුපියලට සාපේක්ෂව ඩොලරයේ වටිනාකම වැඩි වෙන එක. නැත්නම් රුපියල අවප්‍රමාණ වෙන එක. ඒ හරහා මොකක්ද වෙන්නේ? උද්ධමනයක් ඇති වෙනවා. හැබැයි, මේ තත්ත්වය ජාතික ජන බලවේගය ආණ්ඩුව හදපු තත්ත්වයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝක ආර්ථික අර්බුදයක් ඇතුළේ මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ අපි විතරක් නොවෙයි. රුපියල අවප්‍රමාණ වීම පිළිබඳව ඇති තරමට අපට සාක්ෂි තිබෙනවා. ඊයේත් මහ බැංකු අධිපතිතුමා මේ ගැන රටට කිව්වා. රුපියල අවප්‍රමාණ වීම පිළිබඳව එතුමා පැහැදිලි කළා. මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන අර්බුදය අපි හැමෝටම බරපතළ ලෙස බලපා තිබෙනවා කියන කාරණය අප දන්නවා. ඩොලර් බිලියන 700ක් විතර විදේශ වත්කම් තිබෙන ඉන්දියාව පවා අනුගමනය කරමින් තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා බලන්න. ඩොලර් බිලියන 7කට ආසන්න විදේශ වත්කම් තිබෙන අපි අනුගමනය කරමින් තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියාත් බලන්න. ලෝකයේ අනෙකුත් රටවල් අනුගමනය කරමින් තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියාත් බලන්න. මේ සියල්ල මේ ඩොලර් අර්බුදය අතික්‍රමණය කිරීම සඳහා ලෝකයේ රටවල් ගන්නා ක්‍රියාමාර්ග අතර තිබෙනවා.

මම විශේෂයෙන්ම මෙන්න මේ කාරණය පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉන්දියානු රුපියල ඩොලරයට සාපේක්ෂව සියයට 6.4කින් කඩාගෙන වැටිලා තිබෙනවා. නේපාලයේ රුපියල සියයට 6.2කින් කඩාගෙන වැටිලා තිබෙනවා. ඉන්දුනීසියානු රුපියල සියයට 5.2කින් කඩාගෙන වැටිලා තිබෙනවා. ශ්‍රී ලංකා රුපියල සියයට 4.8කින්, පිලිපීනයේ Peso එක සියයට 4.7කින්, තායිලන්තයේ Baht එක සියයට 4ක් වැනි ප්‍රමාණයකින් කඩාගෙන වැටිලා තිබෙනවා. පොදුවේ ගත්තාම අනෙක් රටවලත් ඩොලරයට සාපේක්ෂව මුදල් ඒකකය දුර්වල වෙලා තිබෙන්නේ. මොකක්ද ඒකට හේතුව? කෙටි කාලයක් තුළ අපේ රටේ වාහන වෙළෙඳ පොළ අපි විවෘත කළා. පසුගිය අවුරුද්දේත් අපි ඩොලර් බිලියන දෙකකට ආසන්න ප්‍රමාණයක වාහන ආනයනය කළා. ඒ නිසා තමයි මේ අවුරුද්දේ අපට මේ සම්බන්ධයෙන් තීරණය කරන්න වුණේ. මේ යන විධිය ගත්තාම වාහනවලට වැඩිපුර යම් බද්දක් අය කළේ නැත්නම් අපේ

ඩොලර් සංචිතයට මොකක්ද වෙන්නේ? එම නිසා අපේ රටේ අලුතින් පෞද්ගලික වාහන වැඩි වන එක අඩු කරන්න ඕනෑ. ඒ නිසා පොදු වාහනවලට අපි මේ බද්ද ගැහුවේ නැහැ. බස් රථයට, ලොරියට, ත්‍රී වීලරයට, මෝටර් සයිකලයට, පොඩි මිනිහාගේ වාහනවලට මේ බද්ද වැඩි කළේ නැහැ. හැබැයි, පෞද්ගලිකව පාවිච්චි කරන්න කෙනෙක් වාහනයක් ගෙනෙනවා නම් ඒක ගෙනෙන එක ටිකක් කල් දමන්න. මාස 3ක් දක්වා වූ කාලයකට මේ තීරු බද්ද සියයට 30 ඉඳන් සියයට 45ක් දක්වා වැඩි කළා; ඒ තීරු බද්ද සියයට 30 සිට සියයට 45 දක්වා වැඩි කළා, මාස 3ක කාලයකට. ඒ මාස 3 ඇතුළේ අපේ රටට වාහන ආනයනය කිරීම අඩු කරලා, තෙල් පරිභෝජනයත් යම් ප්‍රමාණයකට අඩු කරලා, රටේ ඩොලර් සංචිතය ආරක්ෂා කර ගනිමින් ඉදිරියට යන්න අපට පුළුවන්කම ලැබෙනවා නම් අපට යම් ප්‍රමාණයකින් මේ අර්බුදයට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙනවා. අපි මේ දේවල් අමතක කරන්න හොඳ නැහැ.

නොවැම්බර් මාසයේ "දිට්වා" සුළි කුණාටුව ආවා. මැද පෙරදිග යුද්ධය මාර්තු මාසයේ පටන් ගත්තා. අපි දැන් මාස දෙකක් තිස්සේ තෙල් සඳහා ඉතිහාසයේ වැඩිම මුදල ගෙවනවා. මේ අර්බුදය තුළ ප්‍රවාහන ගාස්තු වැඩි වෙලා; නාවික ගාස්තු වැඩි වෙලා; ඉන්ෂුවරන්ස් ගාස්තු වැඩි වෙලා. ඒවායේ වැඩි වීමත් එක්ක රටේ ජනතාවට ඒ බර පැටවෙමින් තිබෙනවා. හැබැයි, ඒ අස්සේ රටක් හැටියට ජනතාවට ලබා දෙන්න පුළුවන් පහසුකම් ටික අපේ ආණ්ඩුව ලබා දෙමින් තිබෙනවා. ජනාධිපතිවරයා මේ පිළිබඳව නිතර අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය ඇතුළු මෙයට සම්බන්ධ දෙපාර්තමේන්තු සියල්ලේ නිලධාරීන් එක්ක සාකච්ඡා කරමින් අපේ රටේ ආර්ථිකය අඛණ්ඩව පවත්වා ගෙන යෑමට අවශ්‍ය තීන්දු තීරණ ගන්නවා. නමුත්, අපි අමුද්‍රව්‍ය - raw materials - ගෙනෙන ඒවාට බදු අය කරලා නැහැ. ඒ නිසා යම් සීමා කිරීම් අපට කරන්න වෙවි.

හැබැයි, ඒ සීමා කිරීම් කරන්නේ මොකටද? ලෝකයේ රටවල් පිට පොට ගහනවා ඩොලර් එක වේගයෙන් ඉහළට යනකොට, ඛනිජ තෙල් මිල ඉහළ යනකොට.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
මම විනාඩියෙන් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එහෙම මිල ඉහළ යනකොට අපට ඒකට ලෑස්ති වෙන්න වුවමනාව තිබෙනවා. වෙළෙඳ පොළේ තෙල් මිල ඉහළ ගියා. පොහොර මිටියක් රුපියල් හයහත්දාහකින් වැඩි වුණා. දැනුත් ගොවියාට තිබෙන ප්‍රශ්නය ඒක. අපි -වී අලෙවි මණ්ඩලය, ගොවිජන සේවා මධ්‍යස්ථානය- රුපියල් 10,200ට පොහොර මිටියක් දෙනකොට, රුපියල් 17,000යි, 18,000යි එළියේ පොහොර මිටිය. ඒක තමයි ඇත්ත ගණන. ඒ විතරක් නොවෙයි. පාරවල් හදන්න අපි මේ වෙනකොට කොන්ත්‍රාත් දීලා තිබෙනවා. අනුරාධපුරයේ විතරක් කොන්ත්‍රාත් 15ක් දීලා තිබෙනවා පාරවල් කාපට් කරන්න. ඒ 15දෙනාම දැන් ඉල්ලනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මිල වැඩි කරන්න කියලා. මොකද, price එක වැඩි වෙලා. තාර ටොන් එකක් විතරක් රුපියල් 20,000කින් වැඩි වෙලා තිබෙනවා. ඒ මිල වැඩි වීම තිබෙන්නේ මේ ලෝක අර්බුදයත් එක්ක; මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන අර්බුදයත් එක්ක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ අර්බුදයත් එක්ක වැඩි වෙච්ච මිල ගණන් පාලනය කර ගැනීම සඳහා වන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අපට ගන්න වෙනවා. ඒ ක්‍රියාමාර්ග ගනිමින්, ආර්ථිකය ක්‍රමවත් කර ගන්නා ගමන්, ඩොලර් සංචිතය ආරක්ෂා කර ගනිමින් අපි ඉස්සරහට යන්න අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හරහා අපේ රටේ ආර්ථිකය තවදුරටත් කඩාගෙන වැටෙන්න දෙන්නේ නැතුව පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. රජයක් හැටියට ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ අපි ගන්නවා. ඒ වෙනුවෙන් තමයි මේ පනත් සංශෝධනය කරන්නේ. බදු නොගෙවන අය නිශ්චිතව බදු ගෙවලා, රටේ ආදායමට එකතු වෙන ගමන් ආර්ථිකය පවත්වාගෙන යෑමට දායකත්වය ලබා දෙන්න මැදිහත් වෙන්න කියන ඉල්ලීමත් කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[பி.ப. 3.32]

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டிருக்கின்ற விடயம் நிதி அமைச்சினுடைய வரிகள் சம்பந்தமானது. இந்த நாட்டினுடைய பொருளாதாரத்தை ஒழுங்குபடுத்துவதற்காக வரிகளை வலுக்கட்டாயமாகப் பெற வேண்டுமென்ற அடிப்படையிலே வரி வீதங்களை இந்த அரசாங்கம் கூட்டிக்கொண்டு செல்கின்றது. அந்த அடிப்படையில், ஒரு நாளைக்கு ஓரிலட்சம் ரூபாய் அளவில் வியாபாரம் செய்கின்ற சாதாரண ஒரு வியாபாரிகூட இந்த நாட்டில் வரியைச் செலுத்த வேண்டிய ஒரு கட்டாயத்துக்கு உட்படுத்தப்பட்டு இருக்கின்றார். ஆண்டுக்கு 36 மில்லியன் ரூபாய் புரள்வைக் கொண்டிருக்கின்ற ஒரு வியாபாரி அதற்கான வரியைச் செலுத்த வேண்டும். இந்த வரி வீதம் இப்போது 20.5 என்ற நிலைக்குத் தள்ளப்பட்டு இருக்கின்றது. நுகர்வு செய்கின்ற சாதாரண மக்களிடமிருந்துதான் இந்த வியாபாரிகள் இந்த வரிப் பணத்தைப் பெற வேண்டிய தேவை இருக்கின்றது.

முந்தைய காலங்களில், பாரிய வியாபார நிறுவனங்களை நடத்துபவர்களும் தொழிற்பேட்டைகளில் உற்பத்திகளைச் செய்கின்றவர்களும்தான் இந்த வரி விதிப்புக்கு உட்பட்டிருந்தார்கள். ஆனால், இன்று தனியார் துறையினரைப் பாவித்து, அவர்கள்மூலமாக இந்த அரசாங்கம் சாதாரண மக்களிடம் மறைமுக வரியைப் பெறுகின்ற விடயத்தைப் பார்க்கின்றோம். இவ்வாறு மறைமுகமாகப் பெறுகின்ற இந்த வரிப் பணம் மீண்டும் மக்களுடைய வாக்குகளைப் பெற்று அரசியல் செய்வதற்காக அதே மக்களுக்கு மானியங்களாகவும் பல்வேறு திட்டங்களாகவும் வழங்கப்படுகின்றது. ஆளுந்தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் இங்கே பேசுகின்றபோது, "நாங்கள் காலத்துக்குக் காலம் மக்களிடமிருந்து தேவையான வரிகளைப் பெற்று அந்த மக்களுக்கு மானியங்களைக் கொடுக்கின்றோம்" என்று குறிப்பிட்டார்கள். நீங்கள் மானியங்களைக் கொடுப்பதன் நோக்கம் என்ன? அவ்வாறு மானியங்கள் கொடுப்பதென்பது, அடுத்த தேர்தலுக்காக உங்களை ஆயத்தப்படுத்திக் கொள்கின்ற ஒரு விடயம். அந்த விடயத்தை மிகக் கவனமாகச் செய்துகொள்வதற்காக வர்த்தகர்களை - சாதாரண ஒரு தேநீர்க் கடை வைத்திருப்பவர்களைக்கூட - நீங்கள் பயன்படுத்த எண்ணுகிறீர்கள்.

நாங்கள் அறிந்த காலத்தில் இருந்து 50 சதத்துக்கு விற்ற தேநீர் இன்று 50 ரூபாய்க்கும் மேல் விற்கப்படும் சந்தர்ப்பத்தைப் பார்க்கின்றோம். ஒரு tea 250 ரூபாய் வரை விற்கப்படுகின்றது. ஒருவர் ஒரு தேநீர்க் கடைக்குச் சென்றால், 500 ரூபாய்க்குக் குறையாத ஒரு தொகையைச் செலவிடவேண்டி இருக்கின்றது. அவ்வாறு பார்க்கும்போது, ஒரு தேநீர்க் கடை ஓரிலட்சத்திற்கும் அதிகமான தொழில் நடைமுறையைச் செய்கின்றது. அவ்வாறு பார்த்தால், அவர்கள் யாரிடமிருந்து இந்த வரியைப் பெறுவார்கள்? தேநீர்க் கடைக்குச் செல்பவர்கள் சாதாரண மக்கள்! எனவே, அந்த மக்களிடமிருந்து இந்த வரியைப் பெற்றுக்கொண்டு, அரசாங்கம் மக்களுக்குக் கூடுதலான மானியங்களை வழங்குகின்றது என்று ஏதோவோர் அடிப்படையில் அரசியல் செய்கின்ற ஒரு விடயத்தை நாங்கள் பார்க்கின்றோம்.

இவ்வாறு இருக்கின்ற ஒரு சந்தர்ப்பத்திலே, இன்று இலங்கையில் இருக்கின்ற எரிபொருள் நிலையங்களுடைய புரள்வு வீதம் மிகக் கூடுதலாக இருக்கின்றது. சாதாரணமாக சில காலத்துக்கு முன் ஒரு லீற்றர் 100 ரூபாயாக இருந்த எரிபொருளின் விலை இன்று 400 ரூபாய்க்கும் மேல் அதிகரித்து, உச்ச நிலையை அடைந்திருக்கின்றது. இருந்தாலும்கூட, 3 சதவீதமாக இருந்த எரிபொருள் நிலையங்களுடைய இலாபப் பங்கின் percentage இன்று 2.2 சதவீதமாக, 1.5 சதவீதமாகக் குறைக்கப்பட்டிருக்கின்றது. இந்தச் சந்தர்ப்பத்தில் அவர்களுக்குச் செலவினங்களும் இருக்கின்றன. அங்கு தொழில் செய்பவர்களுக்கும் தொழில் நிறுவனர்களுக்கும் அந்த இடத்துக்குரிய வாடகைப் பெறுமானத்துக்கும்கூட சம்பாதித்துக்கொள்ள முடியாத நிலை! ஏனென்றால், இங்கு ஏற்பட்டுள்ள எரிபொருள் தட்டுப்பாடு காரணமாக வியாபாரங்கள் நடைபெறுகின்ற வீதம் குறைந்துள்ளது. QR code systemஇன்மூலம் எரிபொருள் வழங்கப்படுவதால் கூடுதலான எரிபொருள் விநியோகம் இல்லாமல் இருக்கின்றது. குறிப்பாக, அவர்களுடைய வருமானத்தை வைத்துக்கொண்டு தொழிலாளர்களுக்கான சம்பளத்தைக் கொடுப்பதே மிகக் கஷ்டமாக இருக்கின்ற ஒரு சூழ்நிலையிலே, அவர்களுக்குக் கிடைக்கின்ற அந்த வருமானத்தில் VATஐச் செலுத்த வேண்டுமென்ற விடயத்தை நீங்கள் திணிக்கின்ற ஒரு நிலையைப் பார்க்கின்றோம். அந்த நிறுவனங்கள் எரிபொருளை இறக்குமதி செய்கின்றபொழுது harbourஇல் வைத்து அதற்கான அத்தனை வரிகளையும் செலுத்திவிட்டு வருவதாகக் கூறுகின்றபோது, இங்கேயிருக்கின்ற விநியோகஸ்தர்களிடம் இதனை அறவிடுகின்ற விடயத்தைக் கவனத்தில் கொள்ளுமாறு நான் தயவாக இச்சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கிறேன்.

இன்று இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற ஆகக்கூடுதலான வரி அறவிடுகின்ற பிரச்சினையைப் பார்க்கின்றபொழுது, அடுத்ததாக எதிர்பார்க்கப்படுவது என்னவென்றால், நாங்கள் டொலர் கையிருப்பை வைத்திருக்க வேண்டுமென்ற ஒரு பார்வை இங்கே பார்க்கப்படுவதாகும். இவ்வாறுதான் கடந்த கோட்டாபய ராஜபக்ஷவினுடைய அரசாங்கக் காலத்திலும் முதன்முதலாக ஏற்பட்ட பிரச்சினை உரத்தை இறக்குமதி செய்யத் தடை விதித்தமையோடு ஆரம்பித்தது. டொலரைக் கையிருப்பாக வைத்திருக்க வேண்டுமென்ற நோக்கத்தோடு, உரத்தை இறக்குமதி செய்வதற்குக் கட்டுப்பாடு விதித்ததன் காரணமாகத்தான் இந்த நாடு தடம் புரண்டது என்ற ஒரு வரலாறு இருக்கின்றது. எனவே, அவ்வாறான ஒரு சூழல் மீண்டும் ஏற்பட்டுவிடக் கூடாது.

இன்று மாண்புமிகு சனாதிபதி அவர்கள் பேசுகின்றபொழுது, இந்த நாட்டுக்குத் தேவையான உரம் கையிருப்பில் இருக்கின்றது; அளவுக்கதிகமான உரம் கையிருப்பில் இருக்கின்றது என்ற விடயத்தை அடிக்கடி பேசுகின்றார்; அமைச்சர்களும் பேசுகின்றார்கள். ஆனால், எங்களுடைய பிரதேசத்திலே இன்னும் விவசாயிகளுக்குத் தேவையான உரங்கள் வந்து சேரவில்லை. நாங்கள் உரிய காலத்திலே உரங்களை விவசாயத்துக்குப் பயன்படுத்தாவிட்டால், அதற்குரிய பிரயோசனத்தையும் அதற்கான அறுவடையையும் பெற முடியாத சந்தர்ப்பம் ஏற்படும். அம்பாறை மாவட்டம் விவசாயத்தின்மூலம் இந்த நாட்டுக்கு 20 சதவீதத்துக்கும் அதிகமான நெல் உற்பத்தியை வழங்குகின்ற ஒரு பிரதேசமாக இருக்கின்றது. ஆனால், இன்று தாம் உற்பத்தி செய்த நெல்லை ஒரு கிலோ 85 ரூபாய்க்குக்கூட விற்பனை செய்ய முடியாத ஒரு சூழலிலே அங்குள்ள விவசாயிகள் தத்தளித்துக் கொண்டிருக்கின்றார்கள். இவ்வாறான ஒரு சூழலிலே இரண்டு பிரச்சினைகள் எழுகின்றன. முதலாவது, இரண்டு போகங்களாக அங்கே சேமித்து வைக்கப்பட்டிருக்கின்ற நெல்லை விற்பனை செய்யும் பிரச்சினை. அடுத்ததாக, உரத்தினுடைய பிரச்சினை.

எமது விவசாயிகள் இம்முறை மிகக்கூடுதலான செலவினத்தை மேற்கொண்டு விவசாயத்தை ஆரம்பித்திருக்கின்றார்கள். எரிபொருளினுடைய விலை அதிகரிப்புக் காரணமாக, அங்கு எல்லாவற்றுக்கும் விலை அதிகரித்து இருக்கின்றது. உழவு மற்றும் ஏனைய இயந்திரங்களுக்கான செலவினங்கள், அறுவடைக்கான செலவினங்கள் கூடுதலாக இருக்கின்றது. எனவே, இப்போது அறுவடை செய்யப்பட்ட நெல்லை 150 ரூபாய்க்கு விற்றால்தான் முதலீட்டை மீளப் பெற்றுக்கொள்ள முடியும் என்ற ஒரு சந்தர்ப்பத்திலே, அறுவடை செய்த நெல்லை 85 ரூபாய்க்கும் விற்க முடியாத ஒரு சூழல் இருக்கின்றது. எனவே, இந்த அரசாங்கம் என்ன செய்யப்போகின்றது என்ற கேள்வியை இச்சந்தர்ப்பதிலே நான் கேட்க விரும்புகின்றேன்.

எதிர்வருகின்ற 22ஆம் திகதி மாண்புமிகு ஜனாதிபதி அவர்கள் அம்பாறை மாவட்டத்திற்கு விஜயம் செய்யவிருப்பதாக அறிகிறோம். மர்ஹூம் எம்.எச்.எம். அஷ்ரஃப் என்கின்ற ஒரு மாமனிதருடைய நாமத்துடன் உருவாக்கப்படுகின்ற நிந்தவூர் கலாசார மண்டபத்தினுடைய குறை வேலைத்திட்டங்களை மீண்டும் ஆரம்பித்து வைப்பதற்காக நிந்தவூருக்கு வருகைதரவிருக்கின்ற ஜனாதிபதி அவர்களை அந்த ஊர் மக்கள் சார்பாகவும் எங்களுடைய சமூகம் சார்பாகவும் இச்சந்தர்ப்பத்திலே அன்பாக வரவேற்றுக் கொள்கின்றேன். குறிப்பாக எம்.எச்.எம். அஷ்ரஃப் அவர்கள் தனி மனிதராக இருந்து இந்தச் சமூகத்திற்காப் பல பணிகளைச் செய்தவர். அவருடைய பெயரிலே 1997ஆம் ஆண்டு காலப்பகுதியில் ஆரம்பிக்கப்பட்ட அந்த வேலைத்திட்டத்தை நிறைவேற்றவது சம்பந்தமாக நான் தலைவர் ரிஸாட் பதியுதீன் அவர்களோடு ஜனாதிபதி அவர்களைச் சந்தித்தபோது, தலைவர் அஷ்ரஃப் அவர்கள் இந்த நாட்டுக்காகச் செய்த அரசியல் சம்பந்தமான பல விடயங்களையும் நீங்கள் ஜனாதிபதியாக இன்று வந்திருப்பதற்கான மூலகாரணத்திற்கு அவர்தான் முக்கியமானவர் என்ற விடயத்தையும் நாங்கள் கூறினோம்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
ஒரு நிமிடம் தாருங்கள்!

1988ஆம் ஆண்டு ஜனாதிபதி ஆர். பிரேமதாஸ அவர்கள் அப்போது நடைபெற்ற தேர்தலில் தனக்கான ஆதரவைப் பெறுவதற்காக ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸுடைய தலைவர் எம்.எச்.எம். அஷ்ரஃப் அவர்களைச் சந்தித்துப் பேசியபோது, தேர்தல் முறையில் மாவட்ட மட்டத்தில் மொத்த வாக்குகளில் 12.5 சதவீதமாக இருந்த வெட்டுப்புள்ளியை 5 சதவீதமாகக் குறைத்துத் தருகின்ற பட்சத்திலே, தான் அவருக்கான ஆதரவைத் தருவதாகக் கேட்ட அந்தக் கோரிக்கையை நிறைவேற்றியதன் நிமித்தம்தான் சிறுபான்மைக் கட்சிகளும் சிறிய கட்சிகளும் இன்று பாராளுமன்றத்திலே தங்களது பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்தியிருக்கின்றன. அதன்மூலம் அன்று பாராளுமன்றத்துக்கு வருகைதந்த அநுர குமார திஸாநாயக்க ஆகிய நீங்கள் இன்று ஒரு ஜனாதிபதியாக வருவதற்கு அடித்தளமிட்டவர் அவர்தான் என்பதைக் கூறியிருந்தோம். அச்சந்தர்ப்பத்தில் குறித்த கலாசார மண்டபத்துக்குரிய நிதியொதுக்கீட்டைச் செய்து தருவதாக ஜனாதிபதி அவர்கள் வாக்குறுதியளித்திருந்தார். அந்த வாக்குறுதியை நிறைவேற்றும் நிமித்தமாக அதற்கான வேலைத்திட்டங்களை ஆரம்பித்து வைப்பதற்காக வரவிருக்கின்ற ஜனாதிபதி அவர்களுக்கு எனது வாழ்த்துகளையும் நன்றியையும் இந்தச் சந்தர்ப்பத்தில் தெரிவித்து, விடை பெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මදු ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.40]

ගරු මුහම්මදු ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அஸ்ஸலாமு அலைக்கும்! ආයුබෝවන්! வணக்கம்!

இன்றைய தினம் ஒரு விசேட தினமாகும். அதாவது, எமது நாட்டில் யுத்தத்தை முடிவுக்குக் கொண்டுவரும் முயற்சியில் ஈடுபட்டு, உயிரிழந்த அனைத்து இராணுவ வீரர்களையும் நினைவுகூரும் தினமாகும். அவர்களை இச்சந்தர்ப்பத்தில் நினைவுகூர்ந்துகொண்டு, இன்றைய தினம் நடைபெறுகின்ற உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம் தொடர்பில் எனது கருத்துகளைத் தெரிவிக்க விரும்புகின்றேன்.

இந்தச் சட்டமூலமானது எமது நாட்டின் பொருளாதாரத்தோடும் சமூக நலனோடும் நேரடியாகத் தொடர்புடைய ஒன்றாகும். ஒரு நாட்டின் வளர்ச்சியை அளவிடும் முக்கிய அளவுகோல்களில் ஒன்றுதான் தேசிய வருமானம். தேசிய வருமானம் உயர்வது மட்டும் போதுமானதல்ல. அந்த வருமானம் சமமாகப் பகிரப்படுகின்றதா, அதன்மூலம் மக்களின் வாழ்க்கைத்தரம் உயர்கின்றதா, வேலைவாய்ப்புகள் அதிகரிக்கின்றதா என்பதையும் நாங்கள் பார்க்க வேண்டும். இதன்மூலம் எதிர்பார்ப்பது என்னவெனில், நாட்டின் பொருளாதாரத்தை ஒழுங்குபடுத்தி, வருமான ஆதாரங்களை விரிவுபடுத்தி, அரசின் வருவாய் சேகரிப்பை மேம்படுத்துவதாகும். வரி நிருவாகத்தை வெளிப்படையானதாக மாற்றுவது, வரி ஏய்ப்புகளைக் கட்டுப்படுத்துவது, அரசின் அபிவிருத்தித் திட்டங்களுக்கு நிலையான நிதி அடித்தளத்தை உருவாக்குதல் போன்ற நோக்கங்களை இது கொண்டிருக்கும்.

இந்த அரசாங்கம் ஏழை மக்கள் மீதான வரிச் சுமையை அதிகரிப்பதாக இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசிய பலர் கூறினார்கள். இதற்குக் காரணம் நாங்கள் அல்ல. கடந்த கால ஆட்சியாளர்கள் அரசாங்க சொத்துக்களை அதிகமாக விற்றிருந்தார்கள். அதேநேரம், அவர்கள் தேசிய உற்பத்தியில் எந்தவிதக் கவனமும் எடுக்கவில்லை. அரச சொத்துக்களைப் பாதுகாக்க வேண்டியவர்களே அவற்றைப் பாதுகாக்கவில்லை. மேலும், அவர்கள் கடன்களை வாங்கி, உள்நாட்டு உற்பத்தியை அதிகரிக்காமல் அவற்றை வெவ்வேறு தேவைகளுக்காகப் பயன்படுத்தினார்கள். இதன் காரணமாகவே மக்களிடமிருந்து அதிக வரியை அறவிடவேண்டிய நிலை ஏற்பட்டுள்ளது.

இன்று விவாதிக்கப்படுகின்ற இந்தச் சட்டமூலமானது, ஏழை மக்களுக்கு நன்மை பயக்கக்கூடியதாக இருக்கும்.

[ගරු මුහම්මදු නයිසාල් මහතා]

අතේනේරම්, තනිමනිත මුරෙයිල් අතිකමාන සලුකෙකළෙයුම් කොණ්ටිරුක්කින්රතු. ඉන්දච් චට්ටමූලත්තින්පටි, ඈට්ටප්පටුම් ඉලාපත්තුක්කු මට්ටුමේ වරි සෙලුත්ත වේණ්ටුම්. ඉරක්කුමදි සෙය්කින්ර මර්රුම් සිරු වියාපාරිකළුක්කු වරි සෙලුත්තුවදු ඉල්ලාමල් ඉරුප්පතෝටු, වරි සෙලුත්තාමල් ඉරුප්පවර්කළ් වරියෙච් සෙලුත්තුවතර්කාන එල්ලා ඒර්පාටුකළෙයුම් ඉන්දච් චට්ටමූලම් කොණ්ටුළ්ළන.

2025ආම් ආණ්ටු සුංකත්තුරෙ අරිවිත්තපටි, 2 ට්රිල්ලියන් රූපාවුක්කුම් අතිකමාන වරුවාය්ය ඉන්රු එමතු නාටු පෙර්රුළ්ළතු. ඉතු ඉලංකෙයින් වරලාර්රිල් ඈට්ටප්පට්ටුළ්ළ මිකවුම් උයර්න්ත වරුමානමාකුම්. එමතු නාට්ටු මක්කළ්මීතු විතික්කප්පට්ටුළ්ළ වරියෙක් කුරෙප්පතර්කුක් කට්ටාය්ය නාංකළ් වෙළිනාට්ටුක්කාන ඒර්රුමතිය්යුම් උළ්නාට්ටු උර්පත්තිය්යුම් අතිකරික්ක වේණ්ටුම්. ඉවර්රෙච් චෙය්තාල් නාට්ටු මක්කළ්මීතු විතික්කප්පට්ටුළ්ළ වරියෙක් කුරෙක්ක මුටිය්යුම්. 2025ආම් ආණ්ටිල් එමතු අරසාංකමානතු 2,002 පිල්ලියන් රූපාය්ය වරි වරුමානමාකප් පෙර්රුළ්ළතු. අතනෙ නාම් ඉන්ත නාට්ටින් අපිවිරුත්තික්කුච් චෙලවුලික්ක වේණ්ටුම්. අව්වාරු චෙලවුලිප්පතන්මූලම් ඉන්ත නාට්ටින් උර්පත්තිය්යුම් පොරුළාතාරත්තෙය්යුම් මේම්පටුත්ති, මක්කළ්මීතු විතික්කප්පට්ටු ඉරුක්කින්ර වරිකළෙක් කුරෙක්ක මුටිය්යුම්.

ඉන්නුමොරු මුක්කිය්යමාන විටය්යත්තෙය්යුම් කූර වේණ්ටුම්. කටන්ත වරුටම් නවම්පර් මාතම් ඒර්පට්ට 'තිත්වා' සූරාවළියාල් මුළු නාටුම් අතිකළවිල් පාතික්කප්පට්ටතු. පුත්තළම් මාවට්ටමුම් අතනාල් පාතික්කප්පට්ටතු. කුරිප්පාක, පුත්තළම් තොකුති අතිකළවිල් පාතික්කප්පට්ටතුටන්, අංකුළ්ළ වීටුකළුම් වෙළ්ළත්තාල් චේතමටෙන්රන. තර්පෝතු, අවර්රුක්කාන නට්ටෙඋටුකළ් චිරන්ත මුරෙයිල් වළංකප්පට්ටු වරුකින්රන. කටන්ත වාරම් පෙය්ත මළෙ කාරණමාකවුම් පුත්තළම් මාවට්ටම් වෙළ්ළත්තාල් පාතික්කප්පට්ටතු. කුරිප්පාක, පුත්තළම් තොකුති මුළුමෙයාකප් පාතික්කප්පට්ටතු. අංකිරුක්කින්ර මුන්තල් මර්රුම් පුත්තළම් පිරතේච චෙයලාළර් පිරිවුකළිල් වාළුකින්ර මක්කළ් වෙළ්ළත්තාල් අතිකමාකප් පාතික්කප්පට්ටු ඉරුක්කිරාර්කළ්. මේලුම්, වනාත්තුවිල්ලු පිරතේච චෙයලාළර් පිරිවිලුළ්ළ පාතෙකළ් මික මෝචමාකප් පාතික්කප්පට්ටු ඉරුප්පතුටන්, කර්පිට්ටි පිරතේච චෙයලාළර් පිරිවිලුළ්ළ මක්කළුටෙය විවචාය නිලංකළුම් අතිකමාකප් පාතික්කප්පට්ටු ඉරුක්කින්රන. ඉන්ත වෙළ්ළත්තාල් පුත්තළම් නකරම් මුළුමෙයාකප් පාතික්කප්පට්ටු ඉරුන්තතු. ඉතනාල් අංකුළ්ළ පාටචාලෙකළුක්කු ඉරණ්ටු නාට්කළ් විටුමුරෙයුම් වළංකප්පට්ටතු.

මාණ්පුමිකු චනාතිපති අවර්කළ් පුත්තළම් නකරුක්කු වන්තපෝතු, පුත්තළම් තළ වෙත්තියචාලෙයෙත් තරමුයර්ත්තිත් තරුවතාකවුම් පුත්තළම් නකරත්තුක්කාන වටිකාන් අමෙප්පෙච් චීරාන මුරෙයිල් චෙය්තු තරුවතාකවුම් චොල්ලියිරුන්තාර් තර්පෝතු, කුරිත්ත වෙත්තියචාලෙයෙ තරමුයර්ත්තුවතර්කාන වේලෙකළ් මික වේකමාක නටන්තුකොණ්ටු ඉරුක්කින්රන. ඔව්වොරු මළෙ කාලත්තිලුම් පුත්තළම් නකරම් වෙළ්ළත්තාල් අතිකමාකප් පාතික්කප්පටුවතාල් අංකුළ්ළ පාටචාලෙකළුක්කු විටුමුරෙ වළංකප්පටුකින්රන. ඉතනාල් මාණවර්කළින් කල්විච් චෙයර්පාටුකළ් මිකවුම් පාතිප්පටෙකින්රන. අතුමාත්තිරමන්රි, අංකු පෝක්කුවරත්තුච් චෙයර්පාටුකළුම් අතිකමාකප් පාතික්කප්පටුකින්රන. අංකුළ්ළ වටිකාන් අමෙප්පු චීරාක ඉල්ලාමෙයාලේ ඉන්ත නිලෙ ඒර්පටුකින්රතු. එනවේ, පුත්තළම් නකරත්තුක්කාන මුළුමෙයාන වටිකාන් අමෙප්පෙච් චීර්චෙය්ය වේණ්ටුම්. ඉතනෙ නාන් උරියවර්කළින් කවනත්තුක්කුක් කොණ්ටු වරුකින්රේන්.

මුන්තල් මර්රුම් කර්පිට්ටි පිරතේච චපෙක්කු උට්පට පකුතියිලුළ්ළ 3 පෙරිය පාලංකළ් අතිකළවු චේතමටෙන්තිරුක්කින්රන. කර්පිට්ටි පිරතේච චපෙක්කු උට්පට්ට විරුතෝටෙයිල් ඉරුක්කින්ර පාලම් 'තිත්වා' සූරාවළියාල් පාතිප්පටෙන්තතාල්, අතනුටන් තොටර්පුටෙය පාතෙයූටාකප් පෝක්කුවරත්තුච් චෙය්ය මුටියාමල් ඉරුන්තතු. මක්කළින් පෝක්කුවරත්තුක්කාක අතෙ ඔරළවු චරිචෙය්ත නිලෙයිල්, චෙන්ර වාරම් පෙය්ත මළෙයාල් අතු මීණ්ටුම් පාතිප්පටෙන්තු, තර්පෝතු අතනූටාකප් පෝක්කුවරත්තුච් චෙය්ය මුටියාත නිලෙ ඒර්පට්ටිරුක්කින්රතු. අතෙප් පුනරමෙත්තුත් තරුවතිල් කවනම් චෙලුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. 10ආම් කට්ටෙයිලිරුන්තු කනමුල්ලෙක්කුච් චෙල්කින්ර පාතෙයිල් ඉරුක්කින්ර පෙරිය පාලමුම් වෙළ්ළප්පෙරුක්කාල් උටෙන්තු කාණප්පටුකින්රතු. අතනෙයුම් පුනරමෙත්තුත් තරුවතිල් කවනම්චෙලුත්ත වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්.

පුළිච්චාක්කුළම් පාටචාලෙක්කු අරුකිල් ඉරුක්කින්ර පාලම් ඔටුක්කමාක ඉරුක්කින්රපටියාල්, 'තිත්වා' සූරාවළියාල් ඒර්පට්ට වෙළ්ළප්පෙරුක්කින්පෝතු, අතනූටාකප් පයණිත්ත ඉරණ්ටු චිරුවර්කළ් උයිරිළන්තාර්කළ්. ඉන්තප් පාලමානතු, අන්තප් පාටචාලෙක්කු මුන්නාල් ඉරුක්කින්රපටියාල්, අප්පාටචාලෙක්කුච් චෙල්කින්ර මාණවර්කළුක්කු මිකවුම් අච්චුරුත්තලාක ඉරුක්කින්රතු. එනවේ, අන්තප් පාලත්තෙ අංකුළ්ළ පාතෙක්කු ඒර්ර වකෙයිල්, මික විරෙවාක අකලමාක්කවේණ්ටිය තේවෙ ඉරුක්කින්රතු.

ඉන්රු විවාතික්කප්පටුකින්ර ඉන්තච් චට්ටමූලත්තෙ නිරෙවේර්රි නටෙමුරෙප්පටුත්තුම්පෝතු, එමතු නාට්ටිල් චමූක නීති, පොරුළාතාර චමනිලෙ, වෙළිප්පටෙත් තන්මෙ, මක්කළින් නලන් එන්පවර්රෙ මුතන්මෙප්පටුත්ත මුටියුම්. අතු මාත්තිරමන්රි, එමතු නාට්ටු මක්කළුක්කුච් චිරන්ත වාළ්වාතාරත්තෙය්යුම් පොරුළාතාරත්තෙය්යුම් ඒර්පටුත්තිච් කොටුක්ක මුටියුම්. නාට්ටින් පොරුළාතාරත්තෙ මීට්ටෙටුත්තු, අනෙවරුක්කුම් චමමාන වාය්ප්පුකළුටන්කූටිය වළමාන එතිර්කාලත්තෙ උරුවාක්කුම් නෝක්කිල්, ඉන්තච් චට්ටමූලත්තිල් තේවෙයාන තිරුත්තංකළෙ මේර්කොළ්ළ වේණ්ටුමෙනක් කේට්ටු, එනතු උරෙයෙ මුටිත්තුක් කොළ්කින්රේන්. නන්රි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ගෙන තිබෙන මේ අවස්ථාවේ කරුණු ගණනාවක් මතු කරන්න තිබෙනවා. ලංකාවේ පළමුවැනි වතාවට බදු නොගෙවන්නන්ට නඩු පවරන්න යනවා. එහිදී මහෙස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ රුපියල් 400,000ක් නොඉක්මවන දඩයකට යටත් වෙනවා. නැත්නම් මාස 6ක් නොඉක්මවන කාල සීමාවකට හිරේ දමන්න පුළුවන්. නැත්නම් ඒ දෙකම ක්‍රියාත්මක කරන්න පුළුවන්, මහෙස්ත්‍රාත්තුමාගේ අභිමතය පරිදි. එක මන්ත්‍රීවරයෙක් මෙතැනදී කිව්වා, බදු නොගෙවා ඉන්න අයට තමයිලු, මේ දඩුවම තිබෙන්නේ. බදු නොගෙවා ඉන්න අයට වෙනම දඩුවමක් දුන්නාට කමක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ ඒක

නොවෙයි. මේ පනත ක්‍රියාත්මක වුණාට පස්සේ අනාගතයේදී මේ ලංකාවේ ඕනෑම බදු ගෙවන්නෙකුට මේක බලපානවා. මේක බලපාන්නේ ඉතිහාසයට නොවෙයි. ඉතිහාසයේදී මමත්, චම්පික රණවක මැතිතුමාත් - අපි - විශාල මහන්සියක් ගත්තා, බදු නොගෙවා හිටපු අයට බදු ගෙවන්න පුළුවන් විධියේ විශාල බලපෑමක් කරන්න. අපට ඒක කරන්න පුළුවන්කම ලැබුණා, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ වැඩ කරනකොට. ඒක නොවෙයි මේ කියන්නේ.

දැන් ඔබතුමන්ලා බදු පදනම පුළුල් කරලා තිබෙනවා, එක පැත්තකින්. පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 60, 36 දක්වා අඩු කළාම සාමාන්‍යයෙන් කාර්තුවකට රුපියල් මිලියන 9ක විතර පිරිවැටුමක් තිබෙන අයත් බදු ගෙවන්න වෙන තත්ත්වයට පත් වෙනවා. ඒ වාගේ තත්ත්වයක්, වාතාවරණයක් තුළ සාමාන්‍යයෙන් බදු ගෙවන අයට වුණත් යම් කිසි විධියක බලපෑමක් එනවා. ඒ වාගේ කරුණු ගණනාවක් මේකට ඇතුළත් කරලා තිබෙනවා. "කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි නොවීම" යනාදී වශයෙන් වගන්ති ගණනාවක් තිබෙනවා. ඒ වගන්ති උල්ලංඝනය කළොත් ඔවුන්ට විරුද්ධව අපරාධ නඩු පවරන්න පුළුවන්, ලංකාවේ පළමුවැනි වතාවට. දැන් අද ඔබතුමන්ලා කථා කරන හැම දේටම - දිට්වාවලට වෙන්න පුළුවන්, අස්වැසුමට වෙන්න පුළුවන්, අනෙක් ඒවාට වෙන්න පුළුවන් - ඒ හැම එකටම බදු ගෙවන පිරිසක් ලංකාවේ ඉන්නවා. බදු නොගෙවන පිරිසකුත් ඉන්නවා. බදු නොගෙවා, සත පහකවත් වැඩක් කරන්නේත් නැතුව මාසයට රුපියල් 15,000ක්, 20,000ක් ගන්න අයත් ඉන්නවා. එතකොට, ඒ බදු ගෙවන මිනිසුන්ට මොනවාද තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ? බදු ගෙවීම නිසා අඩුම තරමින් ඒ අයට පෝලිමක ඉන්නේ නැතුව ඉස්සරහට එන්න පුළුවන්ද? ඒ සහනයවත් දීලා තිබෙනවාද? නැත්නම් අඩුම තරමින් කාඩ් එකක් දීලා තිබෙනවාද, බදු ගෙවන නිසා ඔබට මෙන්න මේ වාගේ සාධාරණයක් තිබෙනවාය කියලා? නැහැ. අවංකවම දැන් මේ රටේ බදු ගෙවන මිනිස්සු තමයි ඔබතුමන්ලා දඩු කඳේ ගහන්න හදන්නේ. ඉතින් "නයි අරිනවා" කියන්නේ මේවාට තමයි. නයි අරිනවා කියන්නේ මේවාට තමයි. ඉතින් ඒ නිසා මේක අනිවාර්යයෙන් කථා කරන්න ඕනෑ කාරණයක්.

ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ කාරණයත්. අද තමයි රණවිරුවන් සමරන දිනය. ගිය අවුරුද්දේ ජනාධිපතිවරයා බොහොම අමාරුවෙන්, බල්ලෝ නාවන්න ගෙනියනවා වාගේ තමයි ගෙනාවේ, රණවිරු දින සැමරුමට. අද වෙනකොට මොකද වෙලා තිබෙන්නේ? මේ රටේ ආණ්ඩුවකට විරුද්ධව - මේ ආණ්ඩුවට විරුද්ධව වුණත් කමක් නැහැ - කවුරු හරි අවි ආයුධ ගන්නවා නම්, ඒ අය ත්‍රස්තවාදීන්. ඒ අයට ත්‍රස්තවාදීන්ට වාගේ සලකන්න ඕනෑ. එක කට්ටියක් රණවිරුවන්, අනෙක් කට්ටිය විමුක්ති හමුදාව කියලා ඉන්න විධියක් නැහැ. ඒ නිසා රණවිරුවන් සැමරීම පිළිබඳව, දමිළ ජනතාවට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන අර්බුද, ප්‍රශ්න පිළිබඳව, ඔවුන්ගේ විශාල පිරිසක් මිය යෑම පිළිබඳව,- 1971 කැරැල්ලේදීත් සාමාන්‍ය මිනිස්සු මිය ගියා. 1988-1989 කාලයේදීත් සාමාන්‍ය මිනිස්සු මිය ගියා. ඒ ගැන අප සියලුදෙනාටම විශාල කනගාටුවක් තිබෙනවා. යුද්ධයකදී එහෙම තමයි සිද්ධ වෙන්නේ.

හැබැයි, අද මේ රණවිරු සැමරුම මහින්ද රාජපක්ෂ මහත්මයාට කියලා නැහැ. මේ රණවිරු සැමරුම හමුදාවේ ප්‍රධාන නිලධාරීන්ට කියලා නැහැ. ඒගොල්ලන් පැත්තකට විසි කරලා තමයි අද මේ රණවිරු සැමරුම පවත්වන්නේ. ඒ නිසා නිකම් කරන්නන් වාලේට කරන රණවිරු සැමරුමක් තමයි අද තිබෙන්නේ.

විශේෂයෙන්ම බදු පිළිබඳව කථා කළොත්, 2023.10.13 සුනිල් හඳුන්නෙත්ති මහත්තයා කිව්වේ මොකක්ද? "උඹලා බදු ගහපල්ලා, අපි ගෙවන්නේ නැහැ" කියලා. හැබැයි, දැන් මොකද කියන්නේ? දැන් කියනවා, හැමෝම බදු ගෙවන්න ලෑස්ති වෙන්න, කවුරුත් බදු සහන ඉල්ලන්න එපා කියලා. මේක තමයි දැන් තිබෙන තත්ත්වය. මේ ක්‍රියාවලිය තුළ අද මේ ආණ්ඩුවට විශාල අර්බුද ගණනාවක් මතුවෙලා තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, ඩීසල් රුපියල් 720ට දෙන්න වෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2026.04.30වැනි දා ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ඉල්ලීමක් කළා, කරුණාකරලා අපට මේ පිළිබඳ තොරතුරු දෙන්න කියලා. තිබෙන unsolicited proposals මොනවාද, මේවා ගෙනාපු ගණන් කීයද, කීයටද spot tenders ගහලා තිබෙන්නේ, ඉදිරිපත් කරපු ආයතන මොනවාද, ඩීසල්, පෙට්‍රල් මිලදී ගත්තේ කීයටද යනාදී වශයෙන් ප්‍රශ්න ගණනාවක් සකස් කරලා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හරහා ඒ තොරතුරු ලබා දෙන්න කියලා ඉල්ලීමක් කළා. නමුත්, අද වෙනතුරු ඒ තොරතුරු නැහැ. ඒ තොරතුරු දෙන්න විධියක් නැහැ. ඇයි දෙන්නේ නැත්තේ? තොරතුරු දෙන්නේ නැත්තේ හංගන්න යමක් තිබෙන නිසා. බදු ගහනවා වාගේම, අනෙක් පැත්තෙන් මේ ආණ්ඩුව, තෙල්වලට - ඩීසල්, පෙට්‍රල් - බොරු ගණන් දමලා මේ රටේ මිනිස්සුන්ගෙන් විශාල මුදලක් බදු විධියට එකතු කර ගන්නවා. ඒක තමයි මේ ක්‍රියාත්මක කරමින් ඉන්නේ.

මම තවත් කාරණයක් කියන්න කැමැතියි. අපේ චාමර සම්පත් මැතිතුමාත් මේ ගැන කිව්වා. වාහන ගෙන්වීමේදී සියයට 50ක අධිභාරයක් ගැහුවා. ඒ සියයට 50ක අධිභාරය ගහන්න කලින් ජනාධිපතිතුමා මාතලේටයි නුවරඑළියටයි ගිහිල්ලා කිව්වා, දැන් වාහන ගෙන්වීම සීමා කරන්න වෙනවා කියලා. ඊට පස්සේ මොකද කළේ? ඊට කලින් දවසේ ඇමෙරිකානු ඩොලර් මිලියන 20කට - US Dollars 20 million - මහ බැංකුවෙන් නිකුත් කරලා තිබෙනවා,- *[බාධා කිරීමක්]* එහෙම නොවෙයි නම්, මහ බැංකු අධිපතිතුමා කරුණාකරලා ප්‍රකාශයක් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මොකද, ඩොලර් 20,000 ගණනේ වාහන 1,000කට වැඩිය ගෙන්වන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒකෙන් ලංකාවට සිදුවුණු පාඩුව රුපියල් බිලියන 3.5යි. එහෙම නැත්නම් රුපියල් කෝටි 3500යි. මේවාට මොකද වුණේ කියන්න. අද මේ ආණ්ඩුව ඇන ගනිමින් යන්නේ. එදා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයෙන් යනකොට ඩොලරය රුපියල් 360යි. රනිල් වික්‍රමසිංහ මහත්මයා බලයෙන් යනකොට ඩොලරය රුපියල් 300යි, අද ඩොලරය රුපියල් 334යි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉන්නකොට පෙට්‍රල් රුපියල් 332යි, ඩීසල් රුපියල් 344යි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
උද්ධමනය 64.05යි. රනිල් වික්‍රමසිංහ මහත්මයා රට භාර දෙනකොට සියයට 5.4යි. අද සියයට 4.5ට බැහැලා තිබෙනවා.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

විදේශ සංචිතත් ඒ වාගෙයි. ප්‍රාථමික ගිණුමේ ශේෂයත් ඒ වාගෙයි. ආර්ථික වර්ධන වේගය ගත්තොත්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ සෘණ 7.3යි, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කාලයේ ට 4.5යි. 4ට අඩුවෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර දිසානායක මැතිතුමා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා හම්බවෙන දවස වැඩි ඇතක නැහැ. ඩොලරය රුපියල් 360ට තිබෙනකොට තමයි මේ රටේ මිනිස්සු ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ගහලා එළෙව්වේ. රුපියල් 370ට ගිය ගමන් එතැනට පත් වෙනවා. ඒක මතක තබා ගන්න. බැරි නිසා තමයි දැන් විවිධ පක්ෂවල අය අරගෙන ආණ්ඩු හදන්න කටයුතු කරන්නේ කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.57]

ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, ආවට ගියාට රණවිරු සැමරුමක් කරනවා කියලා. ඒක ආවට ගියාට කරන සැමරුමක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. දැන් තමයි ඇත්තටම රණවිරුවා වෙනුවෙන් සැබෑ රණවිරු සැමරුමක් පවත්වන්නේ.

ඔබතුමන්ලාගේ පාලන කාලවල කළේ රණවිරු සැමරුම්ද, එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ පවුල් සහසන්න, ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන්න අවශ්‍ය සැලසුම්ද කියන එක අවුරුදු 21ක් නාවික හමුදාවේ හිටපු පුද්ගලයකු විධියට මම දන්නවා. මොකද, ඒ වෙද්දී කඳවුරුවල හිටපු රණවිරුවන් මාස දෙකක, තුනක කාලයක් කඳවුරුවලට හිර කරලා තිබුණා ඒ සැමරුම්වල පාරවල් අතුගාන්න, පාරවල් හෝදන්න. ගස් හෝදන්න පවා දාලා තිබුණා. ඒවා අමුතු ප්‍රභූත්වයක් මවා ගෙන කරපු සැමරුම් නිසා රණවිරුවන් සෑහෙන්න වෙහෙස මහන්සි වුණා, දුක් වින්දා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විජයග්‍රහණයේ දහහත්වෙනි රණවිරු සැමරුම පවත්වන අද දිනයේ කථා කරන්නට ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා. මීට පෙර කථා කරපු අර්ව්වුනා මන්ත්‍රීතුමා සඳහන් කළා, දෙමළ ජනතාව සමූලඝාතනය කළා කියලා. ශ්‍රී ලංකාවේ අප සතුව සිටි, අද සිටින ත්‍රිවිධ හමුදාව වෘත්තීය හමුදාවක්. වෘත්තීය ත්‍රිවිධ හමුදා රණවිරුවන් තමයි ඉන්නේ. ඒ සියලුදෙනාම පසුගිය කාලයේ කළේ මානුෂීය යුද්ධයක්. අපි පෞද්ගලිකව දන්නවා, ඒ ත්‍රිවිධ හමුදාවේ සොල්දාදුවන්ට, - රණවිරුවන්ට - නිලධාරීන්ට කන්න තිබෙන කෑම ටික උතුරේ සහෝදර සහෝදරියන්ට දීලා තිබෙනවා, බෙහෙත් ටික, වෛද්‍යාධාර ඇතුළු සියලු දේවල් උතුරේ සහෝදර සහෝදරියන්ට දීලා තිබෙනවා කියලා. ඒ හැරෙන්න කිසිම වෙලාවක අපේ වෘත්තීය රණවිරුවන් සමූලඝාතනයක් කළේ නැහැ. රටට විරුද්ධව වැඩ කරපු එල්ටීටීඊ සංවිධානය තුරන් කරලා මේ රටට සාමය උදා කරන්න, ජාතියට සාමය උදා කරන්න තමයි ඔවුන් වැඩ කටයුතු කළේ. ඒත් එක්කම කියන්න ඕනෑ, සමහර අයගේ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක වෙද්දී 1983 ජූලි 23වැනි දා ශ්‍රී ලංකා යුද හමුදාවේ සෙබළුන් 13දෙනෙක් තිරුණෙවේලිවලදී ඝාතනය වුණා. 1983 ජූලි 23වැනි දා ඒ ඝාතනයට පෙරත් යම් යම් ගැටුම් ඇති වෙලා තිබෙනවා. 1985 ඔක්තෝබර් 15වැනි දාත් යුද හමුදා රණවිරුවන් දෙදෙනෙක් ඝාතනය වුණා. නමුත්, ඒවා ප්‍රධාන ගැටුම් විධියට ගියේ නැහැ. 1983 ජූලි 23වැනි දා වෙච්ච ප්‍රහාරයෙන් මියගිය ඒ වීරෝදාර රණවිරුවන්ගේ දේහ කොළඹට රැගෙන ඇවිත් කොළඹදී භූමදානය කළා. ඒ, එවකට පැවති රජයන්වල තිබුණු දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන්නයි. අන්න ඒ නිසා තමයි කළු ජූලිය වාගේ දේවල් ඇති වෙලා, දිගින් දිගටම ත්‍රිවිධ හමුදාව සහ ඒ වර්ගවාදී අරගළය කරපු කණ්ඩායම් අතර ගැටුමක් ඇති වෙලා, 2009 මැයි 18 වෙද්දී යුද හමුදාවේ 28,589දෙනෙක්, නාවික හමුදාවේ 1,160දෙනෙක්, ගුවන් හමුදාවේ 443දෙනෙක්, පොලිසියේ 2,568දෙනෙක් සහ සිවිල් ආරක්ෂක බළකායේ 456දෙනෙක් ජීවිතයට සමු දුන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැම තිස්සේම මේ යුද්ධ ඇති කළේ මෙගොල්ලන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරගන්නයි. ඇත්තටම යුද්ධය කරපු රණවිරුවන් ඉන්නේ ජාතික ජන බලවේගයේ රජයත් සමඟ. මොකද, අපි විපක්ෂයේ සිටියදීත් ජාතික ජන බලවේගය එක්ක එකතු වෙච්ච ත්‍රිවිධ හමුදා සාමූහිකය ගත්තොත් 40,000කට වඩා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්, වීරවරියන් අපිත් එක්ක හිටියා. අද වෙද්දී මුළු ත්‍රිවිධ හමුදාවම මේ රජයත් එක්ක ඉන්නවා. විශ්‍රාමික ත්‍රිවිධ හමුදා රණවිරුවන්, වීරවරියන් සියලුදෙනා අපිත් එක්ක ඉන්නවා. දැන් තමයි ඒ සියලු රණවිරුවන්ට, වීරවරියන්ට අවශ්‍ය නිසි ගෞරවය ලැබෙන්නේ. දැන් කානු සුද්ද කරන්න දමන්නේ නැහැ, හැට්ටෙට කට්ට ගහන්න යොදා ගන්නේ නැහැ. තාත්තා ප්‍රධාන ආරාධිතයා වෙලා, අම්මා ප්‍රධාන ආරාධිතයා වෙලා පුතා සෙල්ලම් කරලා, හවසට පුතා තරගයේ වීරයා වුණාම කුසලානය දෙන තරගවල cheering partiesවලට හමුදාව යවන්නේ නැහැ. පුතාට රේස් පදින්න වැලි කොට්ට ගහන්න යවන්නේ නැහැ. අන්න ඒ නිසාම තමයි මම මුලින්ම කිව්වේ, සැබෑ රණවිරු උත්සවය අදයි කියලා. මේ රජය යටතේ තමයි රණවිරුවා සමරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දශක තුනකට අධික කාලයක් දේශයේ භෞමික අඛණ්ඩතාව වෙනුවෙන්, දේශයේ එකමුතුව වෙනුවෙන්, දේශයේ සාමය වෙනුවෙන් ඇස් ඉස් මස් ලේ දන් දුන්, සදාකාලිකව ආබාධිත තත්ත්වයට පත්වෙච්ච, ජීවිත පූජා කළ ඒ සියලු රණවිරුවන්ට, වීරවරියන්ට කරන හොඳම ගෞරවය, හොඳම උපහාරය තමයි අපි ජාති, ආගම් භේදවලින් තොරව රටක් ලෙස, රජයක් ලෙස ඉදිරියට යෑම.

ඒත් එක්කම, මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදූ සියලු වීර පුතුන්ට, සියලු වීර දියණියන්ට, ඒ සියලු රණවිරුවන්ට ඔවුන් අදහන ආගම තුළින් ඒ අවශ්‍ය විමුක්තිය ලැබේවා, කෙළවර අමා මහ නිර්වාණ සුවය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා. ජීවත්ව සිටින සියලු රණවිරුවන්ට, වීරවරියන්ට නිරෝගී, සුවපත් දිවියක් ප්‍රාර්ථනය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.03]

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிணி சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු සංශෝධනයට අදාළ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව තුළ සාකච්ඡාවට ගෙන තිබෙන මොහොතක විශේෂයෙන් මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ අවුරුදු 30කට ආසන්න කාලයක් වර්ගවාදී යුද්ධයක් පැවතිලා ඒක නිමා කරපු දිනය සංකේතවත් කරන දවස අදයි. එහෙම නැත්නම් එය ස්මරණය කරන දවස අදයි. අවුරුදු 30ක යුද්ධය නිමා කිරීම වෙනුවෙන් කැප වුණු, ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ අපේ ත්‍රිවිධ හමුදාවේ නිලධාරින්ට, ශ්‍රී ලංකා පොලීසියට, සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරින්ට මේ අවස්ථාවේ අපගේ ප්‍රණාමය පුද කරන්න කැමැතියි. ඒ යුද්ධය හරහා එවැනි අමිහිරි මතකයක් අපට ලබා ගන්නට සිදු වුණේ ඇත්තටම ජාතීන් විධියට අපට එකිනෙකා කෙරෙහි යම්කිසි සැකයක්, අවිශ්වාසයක් ඇති වෙච්ච නිසා. ඉතින් ආණ්ඩුවක් විධියට, වගකිව යුතු ආණ්ඩුවක් විධියට රට ඇතුළේ එවැනි අවිශ්වාසයක්, සැකයක් යළි ඇති නොවන ලෙසත්, ජාතීන් විධියට සමඟිව සැබෑම ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැඟීමට අවශ්‍ය ඒ උපරිම මැදිහත්වීම අපි මේ වන විට කරමින් ඉන්නවාය කියන පණිවුඩය මේ මොහොතේ ලබා දෙනවා.

අපේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අදහස් දක්වද්දී, ආරක්ෂක නිලධාරින්ගේ, රජයේ හමුදා නිලධාරින්ගේ, ඒ ක්ෂේත්‍රයට අදාළ නිලධාරින්ගේ කටයුතු සඳහා අපේ මැදිහත්වීම ප්‍රමාණවත් නැහැ කියන අදහසක් මතු කරමින් කථා කළා. ඇත්තටම මේ මොහොත වන විටත් අපේ ගරු ජනාධිපතිතුමා අපේ යුද හමුදා නිලධාරින් හමුවෙමින්, ඒ උත්සවයට සම්බන්ධ වෙමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට හොඳ අත්දැකීමක් තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමයි රණවිරුවන්ට අදාළ, ත්‍රිවිධ හමුදා නිලධාරින්ට අදාළ ලොකුම නිවාස සංකීර්ණය තිබෙන්නේ. අද කථා කරන මේ මහත්වරු අතීතයේ ආණ්ඩුවල සිටිද්දී ඒ ඉඩම්, ඒ රණවිරුවන්ට හිමි වෙන්නට තිබුණු ඉඩම් ඒ අයගේ පෞද්ගලික බුක්තියට ලබා ගත් අයුරු පරීක්ෂා කරද්දී අපට හොඳට හොයා ගන්න පුළුවන් වුණා. පසුගිය දවසකත් ආරක්ෂක අමාත්‍යාංශය නියෝජනය කරමින් අපේ ජ්‍යෙෂ්ඨ ලේකම්වරයෙක් සම්බන්ධ වෙලා ඒකට අදාළ අඩුපාඩු සොයා බැලුවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ "රණ ජය පුර" ත්‍රිවිධ හමුදා නිවාස සංකීර්ණයේ සිටින ජනතාවගේ, එහෙම නැත්නම් යුද හමුදා විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්න ටික විසඳන්නේ කොහොමද කියන ඒ සොයා බැලීම කළා. ඉදිරියේදී ඒ සඳහා හොඳ මැදිහත්වීමක් කරන්න අවශ්‍ය සූදානමත් මේ වන විට අපි කරමින් ඉන්නවා.

ඔන්න ඔය දේවල් මතක් කරන ගමන් අද අපි සාකච්ඡාවට බඳුන් කරන්නේ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ගැනයි. ඒක පිළිබඳව මීට ඉහතත් යම් යම් අවස්ථාවලදී සාකච්ඡා වෙලා අපි මේ අවස්ථාවේ යම් සංශෝධන ඉදිරිපත් කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩුවක් විධියට අපි මෙවැනි සංශෝධනයන් ගෙනෙන්න බලාපොරොත්තු වුණේ බදු අය කිරීමේ දැල, රටක බදු අය කිරීමේ ක්‍රමය ශක්තිමත් කරන්න ඕනෑ නිසායි. මොකද, පසුගිය කාලය ගත්තාම, මේ බදු අය කිරීමට අදාළ පරිපාලනයේ අඩුපාඩු වාගේම බදු වංචා සිද්ධ වෙච්ච අවස්ථාත් තිබෙනවා. ඒ වාගේම හිතවතුන්ට බදු සහන ලබා දීම, බදු පැහැර හැරීම, බදු ගෙවීම්වලට අදාළ දූෂණය පසුගිය කාලයේ සිද්ධ වුණා. ඉතින් ඒක නිසා මෙවා විධිමත් කරන්න අවශ්‍යයි. ඒවා විධිමත් කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් සකස් කරන්නට ඕනෑ. මීට ඉහත විපක්ෂයෙන් කථා කරපු මන්ත්‍රීවරයෙක් බදු ගෙවන්නන්ට ලැබෙන වරප්‍රසාද ගැන කථා කළා. එතකොට බදු ගෙවන්නන්ට අදාළ වරප්‍රසාද ලබාදීම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් එක්ක තමයි අපි ඉස්සරහට යන්න ඕනෑ. අපට දවසින් දෙකෙන් මේ ක්‍රම වෙනස් කරන්න බැහැ. මොකද, එතුමන්ලාගේ කාලසීමාව ඇතුළත එවැනි විධිමත් වැඩ පිළිවෙළක් හදලා තිබුණේ නැහැ. එවැනි විධිමත් වැඩ පිළිවෙළකට යන්න තමයි මෙවැනි පනත් කෙටුම්පත් හරහා යම් යම් සංශෝධන කරලා සැලකිය යුතු නියාමනයක් කරන්නට අපි බලාපොරොත්තු වෙන්නේ.

ඒ වාගේම පසුගිය වර්ෂවල රටේ බදු ආදායම collect කර ගැනීම, එහෙම නැත්නම් එකතු කර ගැනීම කොයි ආකාරයෙන්ද සිද්ධ වුණේ කියන එක පිළිබඳවත් මම මතක් කරන්න ඕනෑ. 2023 වර්ෂයේදී බදු ගෙවන්නන් විසින් පැහැර හරින ලද බදු ප්‍රමාණය රුපියල් මිලියන 11,000ක්. ඉතින්, මේ බදු දැල ශක්තිමත් කිරීම තුළින් එවැනි බදු පැහැර හැරීම් වළක්වා ගන්න තමයි අපි උත්සාහ කරන්නේ. ඒ වාගේම මේ හරහා බදු පරිපාලනයත් කාර්යක්ෂමව සිදු වනවා වාගේම, රටේ ආදායමට සැලකිය යුතු කොටසක් බදු හරහා අපට ලබා ගන්නත් පුළුවන් වනවා. සෘජු බදු සහ වක්‍ර බදු වශයෙන් බදු වර්ග දෙකක් රට ඇතුළේ අය කර ගන්නවා. වක්‍ර බදු ස්වයංක්‍රීයව - auto - රටේ ජනතාව භාණ්ඩ පරිභෝජනය කරන අතරතුර රටේ ආදායමට එකතු වන අතර, සෘජු බදු මිනිස්සු ස්වකැමැත්තෙන් ඉදිරිපත් වෙලා ගෙවන්නට ඕනෑ. වැටුප් ගෙවීමේදී නම් ඒවා අය කර ගැනීමේ ක්‍රමයක් තිබෙනවා. නමුත්, අනෙක් බදු ස්වකැමැත්තෙන් ගෙවන තැනට මිනිස්සු නැඹුරු කර ගන්න ඕනෑ. එහෙම ස්වකැමැත්තෙන් යමෙකු බදු ගෙවන්නේ නැත්නම් යම් කිසි නීත්‍යානුකූල විධිවිධාන යටතේ ඔවුන් ඒ සඳහා එකඟ කර ගැනීම අවශ්‍යයි. එවැනි කාර්යයන් සඳහා අවශ්‍ය නියාමනය තමයි මේ හරහා සිද්ධ කරන්නේ.

මේ සංශෝධන පනත් කෙටුම්පත තුළින් අපි කරන්නට බලාපොරොත්තු වන කාරණා කිහිපයක් මේ වෙලාවේ මම කෙටියෙන් මතක් කරන්නම්. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විගණනයකින් තොරව මාස තුනක් ඇතුළත පොලී ආදායමේ අඩු කළ කොටස නැවත ලබා ගැනීමේ හැකියාව මේ තුළින් ලැබෙනවා. විශේෂයෙන්ම රඳවා ගැනීමේ බද්ද - Withholding Tax - අය කර ගැනීමේදී මේ නිදහස ලැබෙනවා කියලා තමයි කියන්නේ. ඒ වාගේම තමයි, විශ්වවිද්‍යාලයක් වැනි උසස් අධ්‍යාපන ආයතනයකට යම් කිසි පරිත්‍යාගයක් කරලා තිබෙනවා නම්, බදු ගෙවීමේදී යම් සහනයක් දෙන්නත් මේ තුළින් බලාපොරොත්තු වනවා. ඒ වාගේම TIN අංකයක් ලබා දී ඇති සෑම අයෙකුටම TIN සහතිකයක් ලබා දෙන්නටත් ඕනෑ. ඒ වාගේම ආදායම් බදු වාරික ගෙවීම සඳහාත් මේ තුළින් නව ක්‍රමයක් හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව ගෙවිය යුතු ඇස්තමේන්තු බද්දට වාරික ගෙවීම් ගණනය කළ යුතු වන්නේ පසුගිය වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මතයි. ඒ කියන්නේ, වාරික වශයෙන් ගෙවනවා නම් පසුගිය වර්ෂයේ බදු අය කළ හැකි ආදායම මත ඒ වාරික ගෙවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි හදලා තිබෙනවා. ඒ වාගේම මුදල්වලින් කරන ලද ගනුදෙනු අඩු කිරීමේ හැකියාව පිළිබඳවත් මෙහි පැහැදිලි කරලා තිබෙනවා. ඒ වාගේම වෙනත් ආදායම් ගණනය කිරීමේදී මෝටර් වාහන උපලබ්ධියෙන් ලැබෙන ලැබීම් බැහැර කරන්නට අවශ්‍ය කටයුතුත් මේ තුළින් සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම භාවිතයට නොගත් සුදුසුකම් ලබන පරිත්‍යාග ඉදිරියට ගෙන යෑම හා ඒවා අනුයාත තක්සේරු වර්ෂවලදී අඩු කිරීමටත් මේ හරහා විධිවිධාන සලසා තිබෙනවා. ඒ

[ගරු තිළිණ සමරකෝන් මහතා]

වාගේම පුද්ගලයෙකුගේ තක්සේරු කළ හැකි ආදායම ගණනය කිරීමේදී බැහැර කළ යුතු ජීවිත රක්ෂණ ඔප්පු හරහා ලැබෙන ලැබීම් අපි නිශ්චිතව දක්වා තිබෙනවා. විශේෂයෙන්ම රක්ෂිත තැනැත්තකුගේ මරණය සිද්ධ වීමේදී, ඒ වාගේම ජීවිත රක්ෂණ ඔප්පුව කල් පිරීමේදී හෝ ජීවිත රක්ෂණ ඔප්පුවේ පවාරණ අගය අත් පත් කර ගැනීමේදී ලැබෙන මුදල් බදු අය කළ හැකි ආදායමින් බැහැර කිරීමත් මේ තුළින් කරනු ලබනවා. ඒ වාගේම ඇතැම් කොන්දේසිවලට යටත්ව පුණ්‍ය ආයතනවලට tax credit එකක් ප්‍රදානය කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට හැකියාව ලබා දීමත් මේ තුළින් සිදු වනවා. මෙන්න මේ විධියට ගත්තාම ආදායම් බදුවලට අදාළව යම් යම් නිදහස් කිරීම් වාගේම, යම් කිසි නියාමනයක් ඇති කිරීමත් මේ පනත තුළින් අපි බලාපොරොත්තු වනවා.

ඒ වාගේම මේ වෙලාවේ මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. සේවා නියුක්තිකයන් විසින් ලබා ගන්නා හිඟ වැටුප් මත බදු බර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වූ විධිවිධානත් මේ හරහා සලස්වා තිබෙනවා. යම් කිසි arrears එකක් කෙනෙකුට ලැබුණු මොහොතකදී එය එකවර tax එකට ඇතුළත් කරනවා වෙනුවට, ඒ අනුයාත වර්ෂවලට අනුව, ඒ ප්‍රතිශතවලට අනුව ඒ tax එක ගෙවීමේ අවස්ථාවත් මේ පනත තුළින් හදලා දීලා තිබෙනවා. මෙන්න මේ වාගේ ලොකු වෙනස්කම් ප්‍රමාණයක් අපි මේ සංශෝධන හරහා සිදු කරලා තිබෙනවා. මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ, tax ගෙවන අය අධෛර්යවත් කිරීම නොවෙයි. ඔවුන් ධෛර්යවත් කරලා රටේ ආදායම තවදුරටත් වැඩි කරලා, ඒ හරහා අපේ ජන ජීවිත ඉහළ තැනකට ගෙන එන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ හරහා සිද්ධ කරමින් තිබෙන්නේ. මෙවැනි කටයුතු තුළින් පසුගිය කාලයේ තිබුණු අර්බුදය ඇතුළේ අපේ ආර්ථිකය කළමනාකරණය කරමින්, හොඳ රටක් ගොඩනැඟීමට අවශ්‍ය මහ අපි පාදා තිබෙනවා. නොයෙක් තැන්වලින් නොයෙක් අදහස් ආවත්, ඒ කටයුත්ත ඉතා සාර්ථකව කරමින්, රටේ අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින්, අපි ආර්ථිකය කළමනාකරණය කරමින් ඉන්නවා කියන අදහස මේ ගරු සභාවට ඉදිරිපත් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.13]

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත විවාදයට ලක් වන මේ වෙලාවේ විවිධ කරුණු කාරණා ඔස්සේ ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වූවා. විශේෂයෙන්ම අද ඉතා වැදගත් දවසක්. අද අපේ රටේ රණවිරුවන් සිහිපත් කරන දිනය. අපේ ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා හිටපු රණවිරුවෙකු විධියටත්, වත්මන් ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරයෙකු විධියටත් රණවිරුවන් ගැන යම් ප්‍රකාශයක් කළා. ඇත්තටම එතුමා ඒ ප්‍රකාශය කිරීම ගැන ස්තුතිවන්ත වනවා. මොකද, "රණවිරුවා" කියලා ආමන්ත්‍රණය කරලා ප්‍රකාශයක් කරන්න එතුමාට පුළුවන් වුණාට අපේ රටේ ජනාධිපතිතුමාට පුළුවන්කමක් ලැබුණේ නැහැ, "රණවිරුවා" කියලා ආමන්ත්‍රණය කරන්න. අපි දැක්කා, පසුගිය කාලයේ රණ විරුවා සෙබළා වෙලා තිබෙනවා. රණවිරුවා නිසා තමයි ඔබ අපි මේ මට්ටමින් මේ රට තුළ ජීවත් වෙන්නේ. අපේ රණවිරුවන්ට ඒ ගෞරවය දීමෙන් කාට හරි මදිපුංචිකමක් වනවා නම් ඒක අපේ රටේ අවාසනාව කියලා මා විශ්වාස කරනවා.

දේශීය ආදායම් පනතට සංශෝධනයක් ගෙනෙන මේ වෙලාවේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුගෙන්ම කියැවුණා, අපේ රටේ ආදායම් වැඩි කර ගන්න ඕනෑ කියලා. මේ රටේ ආයතනවල මූල්‍ය ශක්තිය වැඩි කර ගන්න විවිධ වූ යෝජනා ඉදිරිපත් වනවාත් අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කෙටි වෙලාව තුළ මම තවත් කරුණක් පැහැදිලි කරන්න කැමැතියි. අපේ රටේ දීර්ඝ කාලයක් තිස්සේත්, මේ මොහොත වන විටත් රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා විධියට ඉන්නේ, සාමාන්‍ය රක්ෂණයේ පළමුවෙනි තැන ඉන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි. ගිය සතියේ "Sunday Observer" පුවත් පතට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපතිවරයා ප්‍රකාශයක් කරලා තිබෙනවා මේ ආයතනය කොටස් වෙළෙඳ පොළට යොමු කරන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා. හොඳට ලාභ ලබමින් තිබෙන ආයතනයක්, දීර්ඝ කාලයක් තිස්සේ මේ රටට බරක් නොවී පවත්වාගෙන යන ආයතනයක් සම්බන්ධව එක පාරටම ඒ ආකාරයට කටයුතු කරන්න තීන්දුවක් ගන්නේ ඇයි කියලා අපි දන්නේ නැහැ. මේ ගැන හොයා බැලුවාම අපට පෙනුණා, මේ සභාපතිතුමාගේ හැසිරීම කොහොමද කියලා. මේ සභාපතිතුමා කිසිදු හේතුවක් නැතිව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන නිලධාරීන් හත්දෙනෙකු එක වර ඉවත් කරලා තිබෙනවා. ඒ නිලධාරීන් හත්දෙනාගේ නම් සහ ඒ අය ඉවත් කිරීමට හේතු සඳහන් ලේඛනයක් මේ වෙලාවේ මම **සභාගත*** කරනවා.

ආයෙත් තව දින කිහිපයක් ගිහිල්ලා තවත් නිලධාරීන් හයදෙනෙක් එතුමා ඉවත් කරලා දානවා. ඒ නිකම් සාමාන්‍ය නිලධාරීන් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා මොකකටද එන්නේ කියලා අපි හොයා බැලුවා. Mr. Rohitha Amarapala, DGM (HR and Administration); former President, CIPM. ඉතාම කීර්තිමත්, අවුරුදු ගාණක සේවා පළපුරුද්දක් තිබෙන පුද්ගලයෙක්. ඉතිහාසය පුරාවට මේ ආයතනයට කිසිම දේශපාලන අධිකාරියක් විසින් මේ ආකාරයට බලපෑමක් කරලා නැහැ. ඒ වාගේම Mr. Thilina Hiripitiya, DGM (HR), Mr. Malaka Bandara, CFO, Mr. Shrilal Rathnayake, DGM (Internal Audit), Mr. Lalith de Silva, DGM (Distribution), Mr. Rohana Kumara, Regional Manager සහ Mr. Indunil Navarathna, Seniour Manager (HR). මේ ප්‍රධාන නිලධාරීන් හත්දෙනෙක්. සාමාන්‍යයෙන් ඕනෑම ආයතනයක නිලධාරියෙක් වංචාවක්, හොරකමක්, ජඩ වැඩක් කළා නම් එළවලා දාන්න ඕනෑමයි. නමුත් මේ කිසිම හේතුවක් නැතිවයි මේ නිලධාරීන් අයින් කරලා තිබෙන්නේ. මේකට කියන හේතු තමයි, එතුමා නියෝජනය කරන වෘත්තීය සමිතිය මේ නිලධාරීන්ට කැමැති නැහැ කියන එක. මම දන්නේ නැහැ, එතකොට මේ රට පාලනය කරන්නේ වෘත්තීය සමිතියක්ද, එහෙම නැතිව විධායකය විසින් පත් කරන ලද රාජ්‍ය සේවයක් විසින්ද කියලා. කෙසේ හෝ ඒක හේතු කොටගෙන මේ නිලධාරීන් සියලුදෙනා අයින් කරලා තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පස්සේ අපි මේ සභාපතිතුමා කවුද කියලා හොයා බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාපතිතුමා අඩුම ගාණේ තේ කඩයක්වත් කරපු නැති මනුස්සයෙක්. අපි වත්මන් ඇමතිතුමා විධියට ජනාධිපතිතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවනවා. ඒ, තලවතුගොඩින් මහරගම නගර සභාවට මාලිමාවෙන් ඡන්දය ඉල්ලපු නුසිත් කුමාරතුංග කියන කෙනායි. මා ළඟ එතුමාගේ ඡන්ද පෝස්ටරය තිබෙනවා. මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න ආපු අනුර කුමාර දිසානායක මහත්තයා ප්‍රධාන මේ වත්මන් රජය දේශපාලන හෙංචයියන්ට මේ රටේ ප්‍රධාන තනතුරු දෙන්නේ නැහැයි කියලා මේ රටට සපථ කළා. හැබැයි අද පෙනෙනවානේ වෙලා තිබෙන දේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දේශපාලන හෙංචයියෝ ප්‍රධාන පුටුවලට ගිහින් මේ ආයතනයේ අවුරුදු 25, 30 වැඩ කළ මිනිස්සු එළවලා දානවා. මොකද, ඒ අය සේවාව, රැකියාව දන්නවා. එතකොට එයාට ඕනෑ විධියට කටයුතු කරන්න බැහැ නේ. දැන් එතුමා ඕඩර්ස් දෙනවාලු, බෙලිඅත්ත ආසන සංවිධායකගේ දුව රැකියාවට ගන්න කියලා. එහෙම තමන්ට ඕනෑ ඕනෑ අයගේ දුව, පුතා රජයේ රැකියාවලට බඳවා ගන්න ක්‍රමයක් නැහැ. රාජ්‍ය සේවයට යම් කෙනෙක් බඳවා ගන්නා යම් නිශ්චිත ක්‍රමයක් තිබෙනවා. ඒ ගැන අවබෝධයක් නැති, දේශපාලනය විතරක් ඇහේ තිබෙන මිනිස්සු මේ ප්‍රධාන පුටුවලට ගියාම මේ රටේ රාජ්‍ය ක්ෂේත්‍රයට ඉතාම දරුණු කඩා වැටීමකට ලක් වන්න සිදු වනවා. එම අවදානම තිබෙනවා. එම නිසා අපි ආණ්ඩුවට වාගේම ආණ්ඩුවේ වගකිව යුත්තන්ට කියනවා, රජයේ ප්‍රධාන පුටුවල ඉන්න දේශපාලන හිතවතුන් ඉවත් කිරීම අඩුම ගණනේ රටේ නීතියට අනුව කරන්න කියලා.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ඉවත් කළ එම ප්‍රධාන නිලධාරීන් හත්දෙනා ගැන මම කලින් සඳහන් කළා. ඊට අදාළ ලේඛනය මම සභාගත කළා. චෝදනාවක් තිබෙනවා නම් අපි කැමැතියි, පාර්ලිමේන්තුවේදී හෝ ඉන් පිටතදී ඒ ගැන සාකච්ඡා කරන්න. ඒ අයගේ නම් ටික අපිට එව්වේ චෝදනා තිබෙනවා කියලා. හැබැයි, අපි හොයා බැලුවාම ඒ අයට කිසි චෝදනාවක් නැහැ. ඒ රාමුව තුළ සභාපතිවරයාට අවශ්‍ය දේශපාලන අනුගත වීම නොමැති වීම තමයි තිබෙන චෝදනාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා. මේ රටේ වහලා දමන්න ඕනෑ ආයතන තිබෙනවා නම් වහලා දමන්න. මොකද, ඒවා රටට බරක් වන නිසා. ඒකට අපිත් විරුද්ධ නැහැ. නමුත්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කියන්නේ රටට බරක් නැති ආයතනයක්. රක්ෂණ සංස්ථාවේ සභාපතිතුමා කියනවා, මේ ආයතනය කොටස් වෙළෙඳ පොළට යොමු කරන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා. මම දන්නේ නැහැ, මේ වනකොට ආණ්ඩුව ඒ අදහසේ ඉන්නවාද කියලා. රටට බරක් නැති ආයතනයක් මේ තත්ත්වයට පත් වන්නේ ඇයි කියන කාරණාව මා විශේෂයෙන්ම දැනගන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(මාණ්පුමිකු හේෂා විතානකේ අංකුම්පුර ආරච්චි)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් ඉල්ලීමක් කරනවා. ඔය කියන වෘත්තීය සමිතියේ ප්‍රධාන ලේකම්තුමාට චෝදනා ඉදිරිපත් වෙලා, විනය පරීක්ෂණයක් පවත්වා, වසන්ත ජයරත්න කියන මහත්මයා නිරීක්ෂණ ඉදිරිපත් කරලා තිබෙනවා, ඒ වෙනුවෙන් කටයුතු කරන්න කියලා. නමුත්, කිසිම දෙයක් කරලා නැහැ. අපට පෙනෙනවා, යම් පිරිසක් දේශපාලන අතපෙවීම් නිසා ආරක්ෂා වනකොට මේ රටට යමක් කළ මිනිසුන්ට කිසිදු හේතුවක් නැතුව ගෙදර යන්න වෙලා තිබෙන බව. අද වනකොට ඒ මිනිස්සු වැටුපෙන් භාගයක් අරගෙන ගෙදරට වෙලා ඉන්නවා. එම නිසා අදාළ බලධාරීන් මේ ගැන පරීක්ෂණයක් කරයි කියලා අප බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.20]

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

ශ්‍රී ලංකා ඉතිහාසය ගත්තාම අද අපට අමතක කරන්න බැරි දවසක්. අද වැනි දවසක තමයි අප රටේ පැවති තිස් අවුරුදු යුද්ධය අවසන් වුණේ. එම තිස් අවුරුදු යුද්ධය අනාගත පරම්පරාව වෙනුවෙන් අවසන් කරන්න ජීවිත පරිත්‍යාග කළ වීරෝදාර රණවිරුවන් සහ යුද්ධයේදී මිය ගිය සියලුදෙනා සිහි කරමින් එම සැමරුම් උත්සවය මා මේ කථා කරන මොහොතේදී ගරු ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් පැවැත්වෙනවා.

இன்றைய தினம் நம் நாட்டுக்கு உணர்வுபூர்வமான நாள்! ஏனென்றால், 30 வருடங்கள் இந்த நாட்டில இருந்த இனவாதப் போரின் - இனவாத யுத்தத்தின் - முடிவை நேற்று நினைவுகூர்ந்தோம். அந்த யுத்தத்தில் உயிரிழந்த மக்கள் அனைவரையும் நாங்க இன்னைக்கு நினைவுகூருவோம். அது கட்டாயம் நினைவுகூர வேணும். ஏன்னா, வெறும் நினைவுக்காக மட்டுமில்ல, அந்தமாதிரி இனவாத அரசியலினால் நடந்த யுத்தம் இனி மீண்டும் இந்த நாட்டில நடக்கக் கூடாது என்று நாங்கள் நினைவுகூர வேண்டிய நாள் இது. அதுக்காக நாங்க இந்த நாளை கட்டாயம் நினைவுகூர வேணும்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි , ජාතිවාදී යුද්ධය නිසා අපේ රටේ ජනතාව අවුරුදු ගණනක් පීඩා වින්දා. දකුණේත්, උතුරේත් ජීවිත විශාල සංඛ්‍යාවක් ඒ නිසා අහිමි වුණා.
වඩක්කිලුම්, තෙර්කිලුම එංගු තෝණ්ඩිප් පාර්ත්තාලුම් එලුම්පුක්කූටුකළ්තාන් කිටෙක්කුම්. අපේ රට ඇනි තරම් ලේවලින් තෙත් වෙලා තිබෙනවා. නම්ම නාටු ඉරත්තමුම් කණ්ණීරුම් පාය්න්ත නාටු. අතු මීණ්ටුම් නටක්කක් කූටාතු එන්රතුතාන් නම්ම අරසාංකත්තිනුටෙය නෝක්කම්.
එවැනි ජාතිවාදී යුද්ධයක් නැවත ඇති වෙන්න එපාය කියන අරමුණින් තමයි අපි දේශපාලනය කරන්නේ. අපි රජය කරගෙන යන්නේ ඒ අරමුණින්. එම ජාතිවාදී යුද්ධය සඳහා බලපෑ දේශපාලන කාරණා මොනවාද කියන එක දැන් මේ රටේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවා. අපේ රටේ කාලයක් තිස්සේ ජාතිවාදී දේශපාලනයක් ක්‍රියාත්මක වුණා. ඒ ජාතිවාදී දේශපාලන කුමන්ත්‍රණ අදටත් ක්‍රියාත්මක වනවා. මේ පාර්ලිමේන්තුව තුළත්

[ගරු රොෂාන් අක්මීමන මහතා]

ජාතිවාදී දේශපාලනය කරන අය ඉන්නවා. ඉලංකෙ වරලාත්‍රිලේ ඉරුන්දු ඉනවාත අරසියල් ඉරුක්කින්රදු. ඉප්පෝදුම් අන්ත ඉනවාත අරසියල් ඉලංකෙයිල් ඉරුක්කින්රදු. ඉන්දප් පාරාළුමන්රත්දිලුම් ඉරුක්කින්රදු. ඒ නිසා අපි හිතනවා, ඒ ජාතිවාදී දේශපාලනය පරාජය කිරීමෙන් තොරව නිකම්ම නිකම් හුදු යුද ජයග්‍රහණය සිහි කිරීමෙන් වැඩක් නැහැ කියලා. අපි මේ දිනය සිහි කිරීමේදී, යුද්ධයේදී මේ රටේ අනාගත පරම්පරාව වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කළ ඒ රණවිරුවන් සිහි කරනවා වාගේම, එම යුද්ධය ඇති වෙන්න බලපෑ ජාතිවාදී දේශපාලනය පිළිබඳවත් නැවත නැවතත් මතක් කර ගන්න ඕනෑ. අපි ඒක අමතක වෙන්න දෙන්න හොඳ නැහැ. ඒ නිසාම මම කියනවා, ඒ දිනය අපි අනාගතයේදීත් සිහි කළ යුතුයි කියලා. මොකද, ඒ ජාතිවාදී දේශපාලනය, ඒ ජාතිවාදී දේශපාලනය නිසා හැලුණු ලේ, කඳුළු අනාගත පරම්පරාවටවත් අමතක වෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ. ඉන්ද ඉනවාත යුත්තත්තිනාල් ඉන්ද නාට්ටිල් පෝදුමාන ඉරත්තමුම් කණ්ණීරුම් පාය්න්තදු. අදු අදුත්ත පරම්පරෙක්කුම් තෙරිය වේණ්ඩුම්. යාර් අන්ත මාතිරි ඉනවාත අරසියලෛච් සෙය්තදු? අදු අදුත්ත generationක්කුම් තෙරිය වේණුම්. අතර්කාක ඉන්ද නාළෛ නාම කට්ටායම් නිනෛවුකූර වේණුම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්නම්, මේ ජාතිවාදී දේශපාලනය සම්බන්ධව. මම මේ කියන්නේ එකම හිමිකරුවාගේ පත්තරය ගැන. ලංකාවේ ජාතිවාදී දේශපාලනයේ මහ මොළකරුවෝ මේ පාර්ලිමේන්තුවේත් ඉන්නවා. මේ, එකම පුවත් පතක අයිතිකරුවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න දිලිත් ජයවීර මහත්මයාට අයිති, "දෙරණ" නාළිකාවේ හිමිකරුට අයිති, දෙමළ මාධ්‍ය පුවත් පත "තමිලන්",-සිංහල පුවත් පතේ නම "අරුණ" - රූපවාහිනී නාළිකාවේ නම "දෙරණ" බව අපි දන්නවා. එකම අයිතිකරුවා, එකම දේශපාලන ව්‍යාපාරය, එකම ජාතිවාදී දේශපාලනය සමාජ කණ්ඩායම් දෙකක් අතර, ජන වර්ග දෙකක් අතර වැඩ කරන විධිය මේ තිබෙන්නේ. ඊයේ "දෙරණ" නාළිකාව අයිතිකරුවාගේ, දිලිත් ජයවීර මහත්මයාගේ දෙමළ මාධ්‍ය "තමිලන්" පුවත් පතේ headline එකේ මෙසේ සඳහන් වනවා:

> 'தொடர் போராட்டமே தமிழர்களின் தெரிவு'
> 'தமிழினப் படுகொலை நினைவேந்தல் இன்று'

දෙමළ පත්තරේ "දෙමළ ජන සංහාරය සිහි කෙරේ" කියලා headline එකක් ගහලා, සිංහල පත්තරේ පළ කරනවා, "මෙන්න, රණ විරුවන්ට අපහාස කරනවා, රණ විරුවන් සිහි කරන්නේ නැහැ, අන්න උතුරේ කොටි නැඟිටලා" කියලා. උදේට "දෙරණ" නාළිකාවේ ලේ පිපාසිත මාධ්‍යවේදීන් ඇවිල්ලා ජාතිවාදය අවුස්සනවා. මෙන්න, මේ ජාතිවාදය තමයි අපි එපා කියන්නේ. ජාතිවාදය මේ රටට ආයෙත් එපා. මේ ජාතිවාදය ඇවිස්සීමෙන් මොනවාද අපේ රටට ලැබුණේ? තරුණ පරම්පරාව පොළොවට පස් වුණා. ඒ ලේ සුවඳට ඉව කරන දේශපාලනඥයන් තවමත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අදත් ඇවිල්ලා බෙරිහන් දීලා ගියා. ඒ ලේ සුවඳට ඉව කරලා ගියා. ඒකට අපි ඉඩ තියන්නේ නැහැ.

ඉන්දත් තේසිය මක්කළ් සක්ති අරසාංකම්, අන්ත ඉනවාතත්තිර්කු එතිරාක ඉන්ද නාට්ටු මක්කළ් ඔන්රාකච් චේර්න්තු, ඔන්රිණෛන්තු උරුවාක්කිය අරසාංකම්. කාංකේසන් තුරෛයිලිරුන්දු තිස්සමහාරාම වරෛක්කුම්, කම්පහවිලිරුන්දු තිරුකෝණමලෛ වරෛක්කුම් ඉන්ද නාට්ටෝට මක්කළ් ඉප්ප ඔන්රාක නිර්කින්රනර්. ඉප්ප ඉලංකෙ අන්ත එල්ලෝරුටෙය නාටාක ඉරුක්කින්රදු. අදුතාන් නමක්කු වේණුම්. මීට වඩා මොකක්ද අපට ඕනෑ? සංහිඳියාවට බාධා කරන, ජාතික සමගියට බාධා කරන, ඒ ජාතිවාදී දේශපාලනයට අපි ඉඩ දෙන්නේ නැහැ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් පැමිණි මන්ත්‍රීවරයෙකු විධියට මම මේ පාර්ලිමේන්තුවේදී භය නැතිව කියන්න කැමැතියි, අපි ඒකට විරුද්ධව සටන් කරනවාය කියන එක.

හැම දාම උදේට මෙතැන නැටුම් නටන මන්ත්‍රී කෙනෙක් ඇවිල්ලා, රනිල් වික්‍රමසිංහ හිටපු කාලයේයි, දැන් කාලයයි අතර අපේ ආර්ථිකයේ වෙනස පෙන්නලා බෙරිහන් දීලා ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගත කරන මේ සමකාලීන ලෝකය කියන්නේ, බොහොම අවිනිශ්චිත ලෝකයක්. මේ, තිබුණු බල ආධිපත්‍යය බිඳ වැටෙමින් යන, නව බල ආධිපත්‍යය ගොඩ නැහෙමින් යන කාලයක්. බොහොම අවිනිශ්චිත කාල පරිච්ඡේදයක අපි ඉන්නේ. පුරෝකථනය කළ හැකි එකම දේ අවිනිශ්චිතභාවය. මේකට අපි ආර්ථික විද්‍යාවේ කියනවා, බාහිර කම්පනයක් - supply shock - කියලා.

අද ආනයන මත යැපෙන ගොඩක් රටවල විනිමය අනුපාත අවප්‍රමාණ වෙලා, ආනයන වියදම් වැඩි වෙලා, ඩොලර් සංචිත අඩු වෙමින් යනවා. වේගයෙන් වර්ධනය වන ආර්ථිකයක් තිබෙන ඉන්දියාවේ පවා මේ වනවිට ආනයන සීමා කරන්න ජනතාව දිරි ගන්වමින් ඉන්නවා. අපේ රටේ තත්ත්වය මොකක්ද? අපේ රටෙත් ඉන්ධන ආනයන වියදම විතරක් පසුගිය මාස කිහිපයේ සියයට 75කින් වැඩි වෙලා තිබෙනවා. ඉන්ධන ආනයනය කරන්න යන වියදම විතරක් සියයට 75කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා, අපේ රටේ. හැබැයි, එහෙම තිබියදීත් විදේශ ශ්‍රමික ප්‍රේෂණ පසුගිය කාර්තුවේ සියයට 26කින් වැඩි වෙලා තිබෙනවා. කොහොමද එහෙම වෙන්නේ? ලෝකයේ ආර්ථික කම්පනයක් තිබියදීත් විදේශ රැකියා කරන ශ්‍රමිකයන් අපේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් තවම විශ්වාසය තබාගෙන ඉන්නවා. ඒ විශ්වාසය තව තවත් වර්ධනය වෙලා තිබෙනවා. පසුගිය කාර්තුවේ රාජ්‍ය ආදායම සියයට 39කින් ඉහළ ගිහිල්ලා, පසුගිය අවුරුද්දට සාපේක්ෂව. මේ බාහිර කම්පනයට මුහුණ දෙන්න අපේ අභ්‍යන්තර ආර්ථිකය දැන් ශක්තිමත්, අපේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි වෙලා. ජාත්‍යන්තර ආයතන පවා දැන් ඒක පිළිගන්නවා; ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. ඉදිරි මාස දෙක තුනේදී අපට තවත් ඩොලර් මිලියන 1,000ක් පමණ - ඩොලර් බිලියනයක් පමණ - විදේශ මුදල් ලැබෙන්න නියමිතයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු රොෂාන් අක්මීමන මහතා
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරනවා.

අපේ විදේශ අංශය ශක්තිමත් කරගන්න අපට ඉස්සරහට ඉඩ අවස්ථාව තිබෙනවා. අපට එන විදේශ කම්පනයට මුහුණ දෙන්න අවශ්‍ය විධියට අපේ අභ්‍යන්තර ආර්ථික ස්ථායීතාව, අපේ ඔරොත්තු දීමේ හැකියාව අපි පසුගිය කාලයේ වර්ධනය කරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ජනතාවට පීඩාවක් නොකර, හිටපු පාලකයන් ඇති කළා වාගේ අර්බුදයකට මේ රටේ ජනතාවට නැවත මුහුණ දෙන්න ඉඩ නොදී මේ අර්බුදය කළමනාකරණය කරන්න පුළුවන් වෙයි කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.30]

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආදායම් පනතට ගෙන එන සංශෝධන පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් පවා බාහිරින් ඒ පිළිබඳව සාධනීය ලෙස කථා කළත් ඒ අයගේ හිත් දන්නවා, ඒ පනත් කෙටුම්පතේ තිබෙන විධිවිධානවල සාධනීයභාවය කෙසේ වෙතත්, එය ඉදිරිපත් කරන කාලය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙන බව. I think there is a huge issue about the timing of this particular amendment. එම නිසා තමයි විපක්ෂය විධියට අපි කල්පනා කළේ, අඩුම ගාණේ මේ සඳහා යම් සංශෝධනයක්, අවම වශයෙන් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා යම් කාල වේලාවක් හරි ලබා දීමේ අත්‍යවශ්‍යතාවක් තිබෙන්න ඕනෑ කියලා. මොකද, ඔය වගන්ති ක්‍රියාත්මක වීමේදී නීතිය ඉදිරියේ එය කෙසේ ක්‍රියාත්මක වෙයිද කියන ප්‍රශ්නය පැත්තක තැබුවත්, බැලූ බැල්මටම පෙනෙන දේ තමයි, දේශීය ආදායම් පිළිබඳ තමන්ගේ වාර්තා ඉදිරිපත් නොකිරීම, තමාට වෙනම TIN file එකක් හදා නොගැනීම තුළින් අපරාධමය වගකීමකට ලක් වන බව. They have created it a statutory offence. මේ ව්‍යවස්ථාපිත වැරැදි සිදු කිරීම හරහා විශේෂයෙන් තරුණ නව ව්‍යවසායකයන් - new entrepreneurs - අතර එකවරම යම්කිසි බියක්, ලොකු සැකයක් මතු වෙනවා, "අපි දැන් ව්‍යාපාරයක් කරලා යම්කිසි ලාභයක් ගන්න පටන් ගත්තාම අපරාධමය වැරදිවලට අහු වෙන්න වෙනවා" කියලා.

අපි දන්නවා, දැන් VAT එකේ threshold එකත් පහළ දමලා තිබෙන්නේ. ඩොලර් ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. රුපියල අවප්‍රමාණ වෙලා තිබෙනවා. එතකොට තෙල් මිල ඉහළ යනවා. මෙවැනි ආර්ථික අර්බුද තිබෙන වකවානුවක - සමහර විට නියෝජ්‍ය මුදල් ඇමතිතුමා මා එක්ක එකඟ වෙන්න පුළුවන්; ඒක පිළි නොගත්තත් - මේ ගෙනෙන දේශීය ආදායම් පිළිබඳ සංශෝධනය කෙතරම් උචිතද කියන එක පිළිබඳවත්, එය වහාම ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන ප්‍රතිවිපාකය පිළිබඳවත් පොඩ්ඩක් ඔබතුමන්ලා හොයා බලන්න ඕනෑ. It might have an adverse impact on the entire economic growth as, I would say, it will definitely discourage the new entrepreneurs. The youth who want to do business on their own and who want to start their life with a very successful business will think twice about the whole thing now. ඇත්තටම විපක්ෂය විධියට අපි නම් ඒ පිළිබඳව වැඩිය කලබල වෙන්න ඕනෑ නැහැ. මොකද, එහි ඵල විපාකවලට, එයින් මතු වන ප්‍රශ්නවලට ආණ්ඩුවට තමයි මුහුණ පාන්න සිද්ධ වෙන්නේ. අපට නම් නිකම් බලාගෙන ඉන්න පුළුවන්, එයින් ලැබෙන ප්‍රතිවිපාක දෙස. The consequences will have to be met by the Government, not by the Opposition.

இன்னுமொரு முக்கியமான விடயம் சம்பந்தமாக இன்று நான் பேசவேண்டும். பலஸ்தீன் பிரச்சினை சம்பந்தமாக, இந்த 2026ஆம் ஆண்டு Global Sumud Flotilla என்ற ஒரு organization மூலமாக நிறைய volunteers இலங்கையிலிருந்து போயிருந்தார்கள் என்பது உங்களுக்கு ஞாபகமிருக்கும். சமீரா மஹ்பூதீன் என்ற ஓர் இலங்கையரும் போயிருந்தார். அவரை இப்பொழுது கைது செய்து வைத்திருக்கிறார்கள். අද අපේ විදේශ කටයුතු ඇමතිතුමා සභාවේ නැහැ. නමුත්, මම කියන්න කැමැතියි, Israeli Zionists විසින් අත්අඩංගුවට පත් කර ඇති සමීරා මහබූබ්දීන් මුහුණු පොතේ පළ කර තිබෙන සටහනක් ගැන. ඒ සටහන මා කියවන්නම්.

"අස්සලාමු අලෙකුම්. මම සමීරා මහබූබ්දීන්. මම ශ්‍රී ලාංකික පුරවැසියෙක්. ඒ වාගේම, Global Sumud Flotilla 2026 මෙහෙයුමේ සෞඛ්‍ය නිලධාරිනියක්. අපි මානුෂීය සහ අවිහිංසාවාදී මෙහෙයුමක්. ගාසා තීරයට මානුෂීය ආධාර රැගෙන යාමට ගන්නා උත්සාහයක්. ඔබ මේ වීඩියෝව දකිනවා නම් එහි තේරුම අපව මේ වෙද්දි ජාත්‍යන්තර මුහුදේදී සියොන්වාදී හමුදා විසින් පැහැර ගැනීමට ලක් වී ඇති බවයි." මම හිතන විධියට, එතුමිය පළ කර තිබෙන වීඩියෝව ටික්ටොක් වීඩියෝවක් වෙන්න ඕනෑ. එතුමිය ඔබ රජයෙන් ඉල්ලීමක් කර තිබෙනවා, මේ ආකාරයට.

"මා ඉල්ලා සිටිනවා, ඔබගේ රජයන්ගෙන් ඉල්ලීම් කරන්න, සියොන්වාදී පාලනයට යටත් නොවී පලස්තීන ජනතාවගේ නිදහස වෙනුවෙන් පෙනී සිටින්න කියලා. පලස්තීනයට නිදහස!"

ஏனென்றால், இந்த அரசாங்கம் இஸ்ரேல் அரசாங்கத்துடன் நட்புறவு வைத்திருப்பதாகச் சொல்கின்றது. இலங்கையி லிருந்து சமாதானத் தூதர்களுடன் போன இந்தப் பெண்மணி அங்கே தடுத்து வைக்கப்பட்டிருக்கின்றார். ஆகவே, அவரை விடுதலை செய்வதற்காக நீங்கள் என்ன நடவடிக்கை எடுத்திருக்கிறீர்கள்? என்று நான் கேட்க வேண்டும்.

මෙම තැනැත්තිය අරගළ වකවානුව තුළත් ක්‍රියාකාරී තැනැත්තියක් බවයි මට දැනගන්න ලැබුණේ. මෙම තැනැත්තිය සෞඛ්‍ය නිලධාරිනියක් හැටියට ස්වේච්ඡාවෙන් කටයුතු කරන්න ගාසා තීරයට යන්න ගිහිල්ලා දැනට රඳවාගෙන තිබෙනවා, ඊශ්‍රායල ආණ්ඩුව විසින්. රජය වහාම ඒ පිළිබඳවත් ක්‍රියාත්මක වෙලා, අදාළ නිලධාරීන් සමඟ කථා කරලා ඒ තැනැත්තියව නිදහස් කරගන්න කටයුතු කරන්න කියලා මේ ආණ්ඩුවෙන් මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

உண்மையிலேயே இன்று -

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම හිතනවා, ගරු මන්ත්‍රීතුමා මතු කරන කරුණු ගැන විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් ලබා දෙයි කියලා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා reply කරනවාද?

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
ඔව්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

Okay. He will reply. අපි සති දෙකකට කලින් ඉඳලාම තුර්කියේ ඉන්න ලංකාවේ Ambassadorට කථා කරලා, activistට කථා කරලා, contact එක establish කරලා තිබෙනවා. එතකොට ඇය board වෙලා තිබුණේ නැහැ. ඔක්කෝම කටයුතු කරලා තිබෙන්නේ. ඒක Palestine Solidarity Committee එකත් දන්නවා. නමුත් අපේ නියෝජ්‍ය ඇමතිතුමා මේකට උත්තර දෙයි, එතුමාගේ කථාවේදී.

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ඇත්තවශයෙන්ම ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, ඒ වෙලාවේම ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වලා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ගැන විපක්ෂය වෙනුවෙනුත්, ඒ තැනැත්තිය වෙනුවෙනුත්, ඒ තැනැත්තිය පෙනී සිටින පලස්තීන නිදහස සඳහා සටන් කරන ස්වේච්ඡා නිලධාරීන් වෙනුවෙනුත්, ස්වේච්ඡාවෙන් ඒ කටයුත්තේ යෙදී සිටින සියලුදෙනා වෙනුවෙනුත් මගේ ස්තුතිය පළ කරනවා.

දේශීය ආදායම් පනතට ගෙනෙන සංශෝධන ගැන අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමැතියි. අද තිබෙන මේ ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ මේක පොඩ්ඩක් හදිසි නොකොට- ඒ කියන්නේ ඒකෙන් බලාපොරොත්තු වෙන ප්‍රතිඵලය සම්බන්ධයෙන් අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඉස්සර තිබුණේ සිවිල් නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් දඩයක් හරහා අය කර ගැනීම. දැන් එය අපරාධමය තත්ත්වයකට පත් කරලා තිබෙන්නේ. මේවාට කියන්නේ statutory offences කියලා. No *mens rea.*; ඒ කියන්නේ චේතනාව පිළිබඳව කිසිම සැලකිල්ලක් නොදක්වා අපරාධකරුවෙකුට දඬුවමක් ලබා දිය හැකි තත්ත්වයක් තිබෙන්නේ. මම හිතන විධියට, මහෙස්ත්‍රාත්තුමා පළමුවැනි සැරේම Rs. 400,000 and six months කියලා නියෝග දෙන එකක් නැහැ. ඒක වෙනම කථාවක්. නමුත් නීත්‍යානුකූලව ඒ පුද්ගලයාට කියන්න පුළුවන්, "You could be liable for a fine and imprisonment" කියලා. එතකොට දඩයට සහ සිර දඬුවමට යටත් විය හැකියි. අඩුම ගණනේ පළමුවැනි offence එකට සිර දඬුවමකට යටත් නොවන බවට හරි මෙය වෙනස් කළ යුතුව තිබුණා. එම කාරණයත් සඳහන් කරමින් කාලය අවසන් නිසා මම කථාව අවසන් කරනවා.

Thank you very much.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[4.38 p.m.]

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Presiding Member, first, I wish to inform this House that the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism is closely following the situation concerning Ms. Sameera Mahboobdeen, the Sri Lankan national who is reported to have been among the participants of the Gaza-bound flotilla. According to the information available to us, the flotilla was intercepted by Israeli authorities and several persons on board are reported to have been taken into custody. The Ministry has already taken action through relevant diplomatic channels. Our Embassy in Tel Aviv has formally requested for consular access to Ms. Mahboobdeen from the Israeli authorities. The purpose of this request is to confirm her present condition, ensure her safety and welfare and verify the legal and procedural position relating to her detention.

Sir, at this stage, the Government does not wish to make premature conclusions on all matters surrounding the interception of the flotilla. However, our position is very clear: whatever the circumstances, the safety, welfare, legal rights and dignity of the Sri Lankan national concerned must be protected. We are continuing our engagement with the relevant authorities through our Embassy in Tel Aviv and other official channels. We are also seeking verified information through official channels rather than relying on media reports and unofficial communications. The Ministry will continue to monitor the matter closely and will take all necessary steps to ensure that Ms. Mahboobdeen receives consular protection and due process.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප මේ විවාදය කරගෙන යන්නේ විශේෂයෙන්ම දේශීය ආදායම් පනතට අදාළ සංශෝධන සම්බන්ධයෙන්. අපි හිතනවා, මේ සංශෝධන ඉතාම වැදගත් කියලා. විශේෂයෙන්ම ආර්ථිකයක් විධියට, රටක් විධියට අප ඉස්සරහට යනකොට අපි බලාපොරොත්තු වෙනවා, මේ සංශෝධන අවශ්‍යයි කියලා. මොකද, මේ බොහෝ දේවල්, ඒ සංශෝධන කරන්න ඕනෑ වෙලාවට නිසි පරිදි කළේ නැති එකේ ප්‍රතිඵලය තමයි අද අපට භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි හිතනවා, මේ වාගේ සංශෝධන; විශේෂයෙන්ම අද ඉදිරිපත් වෙලා තිබෙන මේ දේවල් කිරීම අත්‍යවශ්‍යයි කියලා. ඒ නිසා අපි මේ සංශෝධනවලට එකඟයි.

ඒ වාගේම තවත් කාරණාවක් මතු කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අපේ රටේ ආර්ථිකය සම්බන්ධව විවිධ කරුණු කාරණා මෙහිදී මතු කර තිබුණා. ඒවායෙන් විශේෂ ලෙස මතු කළ කාරණාවක් ගැන කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)

හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අප මේ රට භාර ගන්න කොට තිබුණු ආර්ථික තත්ත්වය කෙබඳු එකක්ද? හැකිළුණු ආර්ථිකයක් තමයි ලංකාව තුළ තිබුණේ. ආනයනය සීමා වෙලා තිබුණා. ඒ වාගේම ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ ප්‍රශ්න, ගැටලු වගයක් නිර්මාණය

වෙලා තිබුණා. එවැනි ගැටුම්කාරී, ගැටලුකාරී තත්ත්වයක් එක්ක තමයි අප මේ ආර්ථිකය භාර ගත්තේ. නමුත් අපි බෙහෙවින්ම සතුටු වෙනවා, ඉතාම කෙටි කාලයක් තුළ අපට මේ ආර්ථිකය හරි විධියට, හරි මාර්ගයට - හරි track එකට - හරවන්න අවස්ථාවක් ලැබීම ගැන. ඒකට මූලිකවම හේතු වුණු කාරණාව තමයි මූල්‍ය විනය. ඒ වාගේම ඉතාම සැලසුම් සහගතව ආර්ථිකයට අදාළ කරන මෙහෙයවීම අපි කළා. ඒ වාගේම තමයි ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ සියලු ක්ෂේත්‍ර තෝරා ගෙන ඒ ක්ෂේත්‍රවලට අදාළ කරන ප්‍රමුඛත්වය අපි ලබා දුන්නා.

මෙතැනදී අප සඳහන් කළ යුතුයි, අපේ ආර්ථිකයට බාහිර ලෙස බලපෑම් කිහිපයක් එල්ල වී තිබුණු බව. ඒවායෙන් එකක් තමයි "දිටවා" සුළි කුණාටු තත්ත්වය. ඒ වාගේම මැද පෙරදිග කලාපයේ ඇති වෙලා තිබෙන වත්මන් තත්ත්වයත් අපේ ආර්ථිකයට බලපෑමක් එල්ල කරනවා. නමුත් අපි මේ සියලු අභියෝගවලට මුහුණ දෙමින්, අපේ රටට හරියාකාරව ඉස්සරහට යන්න පුළුවන් තත්ත්වයක් දැන් නිර්මාණය කර තිබෙනවා.

අපේ ප්‍රධාන කර්තව්‍යයක් තමයි අපේ බලශක්ති ක්ෂේත්‍රයට අදාළ කරන බලශක්ති සුරක්ෂිතතාව මේ සමාජය තුළ තහවුරු කිරීම. ඒකත් අපි හරි විධියට කරගෙන යනවා. විදුලි විසන්ධිය හෝ තෙල් පෝලිම් නිර්මාණය වීම කිසිසේත් සිදු නොවීම ඉතාම වැදගත් කාරණාවක්. ඒ ආකාරයට නිෂ්පාදනයට අදාළ කරන ජාලය ඉතාම ශක්තිමත් ආකාරයෙන් පවත්වා ගෙන යන්න පුළුවන් අවස්ථාවක්, ඉඩ කඩක් දැන් අපට නිර්මාණය වෙලා තිබෙනවා.

ලෝකය තුළ ඕනෑම ආකාරයක අභියෝගයක් නිර්මාණය වෙන්න පුළුවන්. ඒ අභියෝග ජය ගනිමින් රටක් විධියට ඉස්සරහට යන්න පුළුවන් අවස්ථාව, ඉඩ කඩ අපට ලැබී තිබෙනවා. සියලු දෙනාට අපි ආරාධනා කරනවා, එකට ගමන් කරමු කියලා.

ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[4.44 p.m.]

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I take pride in speaking on the Inland Revenue (Amendment) Bill.

We have never had criminal sanctions with regard to certain areas under the Inland Revenue Act. This Amendment, I would say, is draconian. Clause 31 of the Bill, while an appeal is pending before the Tax Appeal Tribunal or a writ is pending, allows the Commissioner to issue a certificate to the Magistrate's Court and initiate proceedings. The Supreme Court, in its Determination on this Bill, stated that it is unconstitutional and would require a two-thirds majority and a Referendum. In line with that Determination, you all have brought amendments to the Bill.

Firstly, this shows your mindset. While a matter is pending before the Tax Appeal Tribunal or a writ application is filed, giving the Commissioner the power to expeditiously initiate proceedings in a Magistrate's Court is draconian. Collection of taxes is important, but we should be conscious of the difficulties that people suffer. People go to court or to the Tax Appeal Tribunal to seek redress when the decision of the Commissioner is considered bad under the law.

In addition, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සංශෝධන පනත් කෙටුම්පතේ 34 වන වගන්තියේ, 185අ. (1) යටතේ දක්වා තිබෙනවා, යම් තැනැත්තකු විසින් 86 වන වගන්තිය මඟින් නියම කර ඇති පරිදි වාර්ෂික වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් නොකරපු අවස්ථාවක, 93 වන වගන්තිය යටතේ ආදායම් වාර්තාවක් කොමසාරිස් ජනරාල්වරයා වෙත යොමු කිරීමට අපොහොසත් වුණු අවස්ථාවක, 102 වන වගන්තිය යටතේ නියම කර ඇති පරිදි කොමසාරිස් ජනරාල්වරයා වෙත ලියාපදිංචි වීමට අපොහොසත් වුණු අවස්ථාවක, 123 වන වගන්තිය යටතේ දෙන ලද දැන්වීමකට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා ඉදිරියේ පෙනී සිටීමට අපහසු වුණු අවස්ථාවක සහ 126 වන වගන්තිය යටතේ බදු වාර්තාවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වුණු අවස්ථාවක කටයුතු කරන ආකාරය. කලින් මෙවැනි අතපසුවීම් සම්බන්ධව දණ්ඩනීය ක්‍රියාමාර්ග ගෙන නැහැ. නමුත් තමුන්නාන්සේලා මේ මඟින් දණ්ඩනීය ක්‍රියාමාර්ගයකට ගිහින් තිබෙනවා, මාස හයක සිර දඬුවමක් හා රුපියල් ලක්ෂ හතර නොඉක්මවන දඩයකට යටත් කරමින්. මෙවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම තුළින් සාමාන්‍ය ජනතාවට තමයි බලපෑමක් ඇති වෙන්නේ. ලොකු ලොකු කොම්පැනිකාරයන්ට auditorsලා ඉන්නවා ඒ කටයුතු කරවා ගන්න.

තමුන්නාන්සේලා කියනවා මේ රටේ සෑම කෙනෙකුටම tax file එකක් තිබිය යුතුයි කියලා. මේ ක්‍රියාදාමය තුළින් වෙන්නේ අපේ අහිංසක ජනතාවට මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු දමන එකයි. එවැනි නඩුවකදී වරදකාරයෙකු වුණු අවස්ථාවක එවැනි පුද්ගලයන්ට පිට රට යනකොට එහෙම ප්‍රශ්න ඇති වෙනවා. ඒ නිසා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, මේ දණ්ඩනීය ක්‍රියාමාර්ගය ගන්න එපා කියලා. මීට කලින් මෙවැනි ප්‍රශ්න විසඳුවේ administrative decisions සහ සිවිල් ක්‍රියාදාමයකින්. හැබැයි, මේ දණ්ඩනීය ක්‍රියාදාමය තුළින් අපේ - *[බාධා කිරීමක්]* Hon. Deputy Minister, what did you say? *[බාධා කිරීමක්]* ඒක ඔබතුමාගේ මතය. What I am asking is, do you need to have criminal sanction?

කෙනෙකුට Inland Revenue Department එකේ register කිරීමේ අපහසුතාව මත annual return එකක් submit කරන්න අපහසුවක් තිබුණා නම්, එවැනි දේවල් tax defaults නොවෙයි. ඔබතුමා දන්න භාෂාවෙන්ම කියනවා නම්, බදු පැහැර හරින එක වෙනම දෙයක්. හැබැයි, යම් අතපසුවීමක් තුළින් යම් දෙයක් කරන්න බැරි වුණ අවස්ථාවක දී මෙම දණ්ඩනීය ක්‍රියාමාර්ගයක් ගැනීම කොයි තරම් දුරට සදාචාරාත්මක ද කියන එක මම අහන්න කැමතියි. ඒ කියන්නේ තමුන්නාන්සේලා බලයට එන්න කලිනුත් දිගින් දිගටම රජයයන් හිටියා. ඒ කිසිම රජයක් මේ දණ්ඩනීය ක්‍රියාමාර්ගයට යන්න තීන්දු තීරණ ගත්තේ නැහැ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා මේ ක්‍රියාමාර්ගය ගැන නැවතත් සලකා බලන්න කියලා. Hon. Minister, it is not the big corporates who are going to suffer, but it is Banda, Sirisena and Mohamed who are going to suffer. You say that every person in this country must have a tax file. They would have tax files, but when it comes to filing annual returns and appearing before the Commissioner General, it is the people who have sufficient means who could do that. Every taxpayer does not have sufficient means to do that.

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

In addition to that, අද ඔබතුමන්ලා VAT එක මසකට රුපියල් මිලියන 5 ඉඳලා මිලියන 3කට අඩු කරලා තිබෙනවා. VAT එක ගෙවන්නේ turnover එකෙන් මිස ලාභයෙන් නොවෙයි. අද රටේ තිබෙන මේ තත්ත්වය යටතේ මේ VAT එක මසකට රුපියල් මිලියන 5 සිට මිලියන 3 දක්වා අඩු කරන එක ජනතාවට ලොකු බරක් කියලා මම හිතනවා. ආදායම මත බදු පැනවීම වෙන දෙයක්. මේ VAT එක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වන්නේ ජූලි මාසයේ ඉඳන්. දැනට මේක කල් දාලා තිබෙනවා. ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු ඉන්නවා. මම ගරු සභානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ආණ්ඩුව මේ ගත්ත තීන්දුව ගැන නැවත සලකා බලන්න කියලා. VAT එක මාසයකට මිලියන 5 සිට මිලියන 3ට අඩු කිරීම තුළින් අපේ පොඩි සිල්ලර කඩ හිමියාටත් අමාරුයි. අද ඕනෑම සිල්ලර කඩයක වුණත් turnover එක මිලියන තුනකට වඩා වැඩි වෙනවා. Turnover එක බලනකොට ඒගොල්ලන්ගේ ලාභය ඉතාම පොඩි ගණනක්. ඊට අමතරව VAT එක අද වැඩි කරලා තිබෙනවා සියයට 20කට. ඒ නිසා 18 per cent VAT plus 2.5 per cent කියන්නේ 20.5 per cent. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ජනතාව වෙනුවෙන් පත් වූ නියෝජිතයෝ. ඔබතුමන්ලා ජනතාවට බදු බරක් දෙන්නේ නැහැ කියපු ආණ්ඩුවක්. හැබැයි දිනෙන් දින බදු වැඩි වෙනවා. ජනතාවට මේ බදු බර දරා ගන්න බැරි තරමට වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා මේ VAT එක ගැන නැවත සලකා බලන්න කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.51]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) අනිල් ජයන්ත - තොළිල් අමෛච්සරුම් නිති, තිට්ටමිටල් පිරති අමෛච්සරුම්)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දේශීය ආදායම් පනතට ගෙන එන සංශෝධන පිළිබඳ විවාදයයි තිබෙන්නේ. ඇත්තටම සංශෝධන විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ සංශෝධන මොනවාද කියලා සාකච්ඡා කරන්න ප්‍රථමයෙන්, මේ සංශෝධනවලින් සිදු වෙන්නේ මොකක්ද, මේ සමාජයට ඇති වැදගත්කම මොකක්ද කියන කාරණය තේරුම් ගන්නට ඕනෑ. අපි කවුරු ආණ්ඩු කළත් ආණ්ඩුවක් පත් වෙන්නේ පොදු මහජනතාවගේ,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! අද දිනට නියමිත කටයුතු අවසන් වන තෙක් විවාදය පවත්වාගෙන යාමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (කලානිති) අනිල් ජයන්ත)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකරණයේදී, ආණ්ඩු පවත්වා ගෙන යෑමේදී ආණ්ඩුවකට පැවරෙන වගකීම්, මහජන යුතුකම් ඉෂ්ට කිරීමේදී තිබෙන ප්‍රධානම දෙයක් තමයි සාධාරණ බදු මූලධර්මවලට අනුව බදු අය කර ගන්න එක. බදු අය කර ගන්න එක ගැටලුවක් නොවෙයි. බදු වංචා කරන එක, අය කර ගන්න බදු අවභාවිත කරන එක තමයි ගැටලුව බවට පත් වෙන්නේ. සාධාරණ ආකාරයට, සරල ආකාරයට පහසුවෙන් රාජ්‍යය පවත්වා ගෙන යන්න බදු අය කර ගන්න එක යහපත් සමාජයක මූලධර්මයක්.

ඒක නිසාම තමයි, යහපත් සමාජයක් හදන්න, සියලුදෙනාටම වැඩදායි සමාජයක් හදන්න අපි ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් මේ කරුණු ඇතුළත් කළේ. එය තමයි මෙහි පදනම බවට පත් වෙන්නේ. මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනවලට අමතරව අපට ඉදිරියේදී තව සංශෝධන කරගන්න වෙවි. තිබුණු තත්ත්වයෙන් පියවරෙන් පියවර සාධනීය දිශාවට ඇවිත් බදු මූලධර්මවලට එකඟව, එයට අනුකූලව තමයි අපි ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ. ඒ අනුකූලතාවේදී අපි ඇස්තමේන්තු කරන ලද බදු ආදායම වර්ෂය මුලදී අය කරගන්න පුළුවන් නම් අපි එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, අනුමත කරලා, අය වැයකදී කියනවා, "මෙන්න මෙච්චර ප්‍රමාණයක් ඊළඟ අවුරුද්දේ අපේ වියදම් පියවා ගැනීම සඳහා ආදායම් එකතු කරනවා" කියලා. ආණ්ඩුවක වගකීම තමයි සැලසුම් කළ ආකාරයට ඒ ආදායම එකතු කර ගන්න පුළුවන්ද කියන එක. ඒ සඳහා බලපාන කාරණා අතර බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව, බදු අනුකූලතාව වැදගත් වෙනවා. අපි බදු පදනම පුළුල් කර ගන්න ඕනෑ. අපි සියලුදෙනාම බදු ගෙවීමට සම්බන්ධ වෙන්න ඕනෑ.

සමාජයේ වැරැදි අදහසක් තිබෙනවා, කිහිප දෙනෙක් බදු ගෙවනවා අනෙක් අය බදු ගෙවන්නේ නැහැ කියලා. ඒක වැරැදියි. මේ සමාජයේ සියලුදෙනා බදු ගෙවනවා. ස්ථිර ආදායමක් නැති කෙනාත්, ආණ්ඩුවෙන් යම් දීමනාවක් ලබන කෙනාත් බදු ගෙවනවා. අපි "අස්වැසුම" ලබන කෙනෙක් ගත්තොත්, ඔහු ආදායමක් උපයන්නේ නැති වුණත්, ඒ ලැබෙන රුපියල් 15,000න් කඩයට ගිහිල්ලා බඩු ටිකක් ගත්තොත් ඔහුත් බද්දක් ගෙවනවා. මේ රටේ පුරවැසියන් සෑම කෙනෙක්ම බදු ගෙවනවා. හැබැයි, ආදායම් බදුවලට එනකොට, ආදායම අනුව තමයි බදු ගෙවන්න වෙන්නේ, සාධාරණ පදනමකට. ඒ නිසාම තමයි අපේ ආදායම් බදු නීතියේ තිබෙන්නේ, සෑම තැනැත්තෙකුම ආදායම් බද්දට යටත් - every person is liable to tax - කියලා. "තැනැත්තා" වෙනුවෙන් තනි තනි පුද්ගලයන් ඉන්නවා, සමාගම් ඉන්නවා, සංස්ථාපිත ආයතන තිබෙනවා. මූලික වශයෙන් සියලුදෙනා බදු ගෙවනවා. හැබැයි කොහොමද ගෙවන්නේ? ආදායම් බදු ගෙවීමේදී සාධාරණ පදනම වන්නේ මෙයයි. වැඩියෙන් ආදායම් උපයන කෙනා සාපේක්ෂව වැඩියෙනුත්, අඩුවෙන් උපයන කෙනා අඩුවෙනුත් බදු ගෙවනවා. ඒ වාගේම තමන්ගේ වියදමට ප්‍රමාණවත් ආදායමක් නැත්නම් ඔහු බදු ගෙවන්නේත් නැහැ. ඒක නිසා තමයි ආදායම් බදු ගෙවීමේදී බදු නිදහස් දීමනාවක් ලෙස සාමාන්‍ය පුරවැසියන්ට අවුරුද්දකට රුපියල් ලක්ෂ 18ක් දීලා තිබෙන්නේ.

අපි බලයට එනකොට බදු නිදහස දීලා තිබුණේ, අවුරුද්දකට රුපියල් ලක්ෂ 12යි. අපි ඒක රුපියල් ලක්ෂ 18 දක්වා වැඩි කළා.

අපි ඉදිරියේදීත් කල්පනා කරලා බලනවා, කොහොමද මේ සාධාරණ බව තවදුරටත් පුළුල් කර ගන්නේ කියලා. එහෙම නම් මෙහි පදනම හැටියට තිබෙන්නේ, "සාධාරණ බව" කියන කාරණය.

ආදායම් අය කර ගැනීමේ කාර්යක්ෂමතාව ගැන මම පෙන්නලා දෙන්නම්. 2025 වර්ෂයේදී ඉතා විශාල ප්‍රගතියක් අපි අත්පත් කර ගත්තා. සැලසුම් කළාට වඩා වැඩිපුර ආදායම් අපි එකතු කර ගත්තා. ඒ එකතු කර ගත්තු ඒවා අපි නාස්ති කළේ නැහැ; වංචා කළේ නැහැ; මැති ඇමතිවරුන්ගේ අවශ්‍යතාවලට පාවිච්චි කළේ නැහැ. ඒවා පෙරළා මහජනතාවට දුන්නා. විශේෂයෙන්ම සහන විධියට ලබා දුන්නා. "දිවිවා" සුළි කුණාටුව ආපු වෙලාවේ අපට රුපියල් බිලියන 500ක් විවිධ වූ වැඩසටහන් යටතේ වෙන් කරන්න පුළුවන් වුණේ මෙන්න මේ නිසායි. ඒ වාගේම, ලෝක පරිමාණයෙන් ඇති වෙලා තිබෙන මේ යුද තත්ත්වයේදී තවත් අතිරේක රුපියල් බිලියන 100ක් වෙන් කරන්න පුළුවන් වුණේ ඒ අනුවයි. අපි බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව ඇති කිරීම 2025දී ආරම්භ කළා.

2026දී විවිධ දුෂ්කරතා, අභියෝග, චෝදනා මැද මැයි 15වන දා වෙනකොට අපට පුළුවන් වෙලා තිබෙනවා, අපි සැලසුම් කරලා තිබෙන මේ අවුරුද්දේ බදු ආදායමින් සියයට 43.1ක් අය කර ගන්න. සාමාන්‍යයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් එවැනි ආදායම් සැලසුම් කරද්දී පළමු මාස හයේදී සැලසුම් කරන්නේ සියයට 40යි. දෙවැනි මාස හයේදී සැලසුම් කරන්නේ සියයට 60යි. අපට පුළුවන් වෙනවා, මාස හතරහමාරක් යනකොට සියයට 40 ඉක්මවලා සියයට 43 ලකුණු කරන්න. සමස්තයක් වශයෙන් ගත්තාම අපි රුපියල් බිලියන 2,273ක් අය කරගෙන තිබෙනවා. මේකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? තවමත් බදු දැලට එකතු වෙලා නැති, බදු අනුකූලතාවට ආවේ නැති විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒක නිසා අපි ආදායම් ඒකාග්‍රතාව - fiscal consolidation - පවත්වාගෙන යන්න නම් මේ බදු දැලට එකතු වෙන්නට ඕනෑ; සම්බන්ධ වෙන්නට ඕනෑ. මේ සහයෝගය ඇති කර ගත්තාට පස්සේ අපට පුළුවන් තව සහන ලබා දෙන්න. එහෙම නැතුව එක පාරටම කියනවා, "මේකට නඩු දාන්න යනවා. මේක ඉතාම අසාධාරණයි" කියලා. මෙතැන වාද විවාද කළ යුතු වන්නේ මේ ඉදිරිපත් කරන ලද සංශෝධනවල මම මේ කියපු මූලධර්මවලට තිබෙන එකඟතා අනුව. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එවැනි දෙයක් කිරීමට කිසිදු වුවමනාවක් නැහැ. ඔවුන්ට පළමුවෙන්ම අවශ්‍ය කරන්නේ කාර්යක්ෂමව බදු අය කර ගන්නයි; බදු අය කිරීමේදී යන වියදම අඩු කර ගන්නයි. ශ්‍රී ලංකාවේ රුපියලක් අය කරගන්න කොට ඒ සඳහා වැය කරන මුදල ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය, මැලේසියාව වාගේ අපේ කලාපයේ රටවලට සාපේක්ෂව ගත්තාම අපි ටිකක් උඩින් ඉන්නේ. ඒක නිසා තාක්ෂණය කැඳවමින්, බදු අනුකූලතාව වැඩි කර ගත්තොත් අපට බදු වැඩිපුර එකතු කර ගන්න පුළුවන් වෙනවා.

අපි කවුරුත් දන්නවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නඩු දාලා කවුරුවත් නඩුවලට ගෙන්වන්න යන්නේ නැහැ කියලා. නඩුවලට ගියොත් වියදම් වැඩි වෙනවා. බදු එකතු කර ගැනීමේ පිරිවැය වැඩි වෙනවා. ඉතින් අපට එහෙම අවශ්‍යතාවක් ඇත්තේ නැහැ. හැබැයි, මේ නඩු කටයුත්ත පවා අපි ඇතුළත් කරන්නේ අදාළ ක්‍රියාමාර්ග පියවරින් පියවර අරගෙන වෙනත් විකල්පයක් නැතිම වුණොත්. මේ සඳහා අදාළ දින දීම්, කල් දීම්, වෙනත් ක්‍රියාමාර්ග ගැනීම්, කැඳවීම්, සාකච්ඡා කිරීම් හරහා ඔවුන්ටත් කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව දීලා බැරිම තැනක් විශේෂයෙන්ම වුණොත් තමයි අපි මේ නඩු කටයුතුවලට යන්නේ. ඉතිහාසයේ බදු අය කර ගැනීමේ ගැටලු නිසා බදු වංචා කොච්චර වෙලා තිබෙනවාද? සුප්‍රකට VAT වංචාව නිසා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම බිලියන ගණනක බදු leakage එකක් වුණා. ඒ නිසා කිසිදු ආකාරයකින් කාටවත් දඬුවම් කිරීම හෝ වෙනත් අරමුණක් වෙනුවෙන් නොව, නිසි ආකාරයට සමාජයට අවශ්‍ය කරන බදු ටික එකතු කර ගැනීම සඳහා වූ ගමන් මාර්ගයක් තමයි මේක ඇතුළේ තිබෙන්නේ.

බදු අනුකූලතාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලින් එකක් දෙකක් මම පෙන්වන්නම්. බදු අනුකූලතාව වැඩි කර ගන්න,- යම් පුද්ගලයකුගේ පසුගිය වර්ෂයේ තක්සේරු ආදායමට වඩා ඊළඟ වර්ෂයේ තක්සේරු ආදායම වැඩි වෙනවා නම්, තමන් ස්ව කැමැත්තෙන්, සද්භාවයෙන් ගණනය කිරීම කරලා පසුගිය වර්ෂයට වඩා සියයට 20ක් වැඩිපුර ගෙවන්න පුළුවන් නම් සහ ඔහු ඒ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙනවා නම්, අන්න අපි පළමුවෙන් විශ්වාස කරනවා. එහෙම නැතුව නඩු දමන්න යන්නේ නැහැ. පළමුවෙන් ඔහුව විශ්වාස කරනවා. ඔහුගේ දිවුරුම් ප්‍රකාශය සැලකිල්ලට භාජන කරමින් ඔහුට අපහසුවකින් තොරව, ගැටලුවකින් තොරව බදු ගෙවන්න ඉඩ කඩ ලබා දෙනවා. බදු අනුකූලතාව වැඩි කර ගන්නේ අන්න එතැනින්.

ඒ වාගේම ඒකක භාර සම්බන්ධය ගැනත් මම කියන්නම්. සමහරු දන්නවා, බදු අය කර ගන්නකොට දැනටමත් තිබෙන නීති රීතිවල සහ අණ පනත්වල ගැටලු නිසා බදුවලින් රිංගා යන්න. අපි බදු සම්බන්ධයෙන් වැරදි ලෙස භාවිත කරන වචනයක් තිබෙනවා. බදු ආදායම එකතු කර ගන්න බැරි වන කාරණයක් තමයි බදු පැහැර හැරීම සහ නොගෙවා මහ හැරීම - tax avoidance and evasion. ඒ විධියට නොගෙවා සිටීම සහ ගෙවීම මහ හැරීම හඳුනා ගත් ඒකක දෙකක් අපි මෙතැනදී එකතු කර ගන්නවා. ඒ කියන්නේ, ඒකක භාර සම්බන්ධයෙන් ගත්තොත්, කවුද ඒකක භාරයේ සිටින නියෝජිතයා, ඔහුට කොච්චර මුදලක් යනවාද කියලා ඒ පිළිබඳ තොරතුරු වාර්තා කරන්න ඔවුන්ට සිද්ධ වෙනවා. දැනට යම් බදු සහන ප්‍රමාණයක් දීලා තිබෙනවා. හැබැයි, ඉදිරියේදී ඒ තොරතුරු හරියට ඉදිරිපත් කරන්නේ නැත්නම් ඔවුන් වාසික සමාගමක් ලෙස සලකලා බද්දට යටත් කරනවා. මේ සෑම ක්‍රියාමාර්ගයක්ම අරගෙන තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම බදු අනුකූලතාව වැඩි කර ගන්න, ක්‍රමිකව ඉදිරියට අරගෙන යන්න.

ඊළඟට තිබෙනවා, සාධාරණ බව. බදුවල සාධාරණ බව ඉතාම වැදගත් වෙනවා. මම කලිනුත් කිව්වා, සෑම කෙනෙක්ම බද්දට යටත් වෙනවා කියලා. හැබැයි, අඩු ආදායම්ලාභියෙක් නම් බදු ගෙවන්න අවශ්‍ය නැහැ. ජීවිත රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් ගත්තාම සමාජය තුළ ඒ ක්ෂේත්‍රයේ සිටින අයටත්, ආයෝජකයන්ටත් ප්‍රශ්නයක් පැනනැඟුණා. ඒ මොකක්ද? අපි දන්නවා, ජීවිත රක්ෂණ ඔප්පුවක් කල් පිරෙනකොට, නැත්නම් ප්‍රවාරණය කරනකොට, අනතුරකට ලක් වෙනකොට ඔහුට වන්දියක් ලැබෙන බව. ඒක බද්දෙන් නිදහස්. ඒ වාගේම යම් අවස්ථාවාදී සමහර කණ්ඩායම් විසින් මෙම රක්ෂණ ඔප්පු භාවිත කරගෙන බද්දෙන් නිදහස් කර ගැනීම සඳහා කෙටි කාලීනව පොලී ලබා දීම්, යම් ප්‍රතිලාභ ලබා දීම්, වෙනත් ආකාරයට ආයෝජන ප්‍රතිලාභ ලබා දීම් සිදු කරනවා. අපි කවුරුත් දන්නවා, තැන්පතුවක් කළොත් ඔහු උපයන ආදායම රුපියල් ලක්ෂ 18 ඉක්මවනවා නම්, පොලියෙන් බද්දක් අය කර ගන්න බව. එහෙම නම් අපි මෙතැනදී සිද්ධ කරන්නේත් එවැනි රක්ෂණ ඔප්පුවල හැංගිලා තිබෙන, අපි කියන සාධාරණ බවට ගැටලුවක් වන තැන් ආවරණය වන විධියට අනවශ්‍ය ගෙවීම් ඉවත් කිරීම.

ඊළඟට මම කියන්න කැමැතියි, මේ කාරණයත්. මේක වැදගත්. උදාහරණයක් විධියට, ශ්‍රී ලංකා ධජය යටතේ නැව්වල සේවයේ නියුතු පුද්ගලයන් ගන්න. අන්න, නැවතත් සාධාරණ බව. යම් පුද්ගලයෙකුගේ සේවා නියුක්ති කාලය පමණක් නේවාසික විධියට සලකනවා. හැම කාලයම සලකන්නේ නැහැ. ඒ වාගේම යම් විදේශිකයෙක් ඒ නැව්වල සේවය කරනවා නම්,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඔහු ආදායම් බද්ද ගෙවිය යුතු වන්නේ නැවේ සේවා නියුක්තියෙන් ලබන ආදායම මත පමණයි. මම මේ විධියට උදාහරණයක් දෙකක් පෙන්වන්නේ, පුංචි කාරණයක් වුණත් මේ තුළින් බදු මූලධර්ම ආරක්ෂා වෙලා තිබෙන්නේ කොහොමද කියන කාරණය පෙන්වීමටයි.

බදු ගෙවීමේ පහසුව පිළිබඳව අපි කරුණු කාරණා ඉදිරිපත් කළා. ඇස්තමේන්තු කරලා, Statement of Estimated Tax Payable ලබා දීමට අනවශ්‍ය ආකාරයක ගැටලුවක් නිර්මාණය වෙලා තිබුණා. අපි ඒක ඉවත් කරලා සරල කරනවා. ඉදිරියේදී තාක්ෂණය කැඳවලා online ක්‍රමවේද හරහාත් බදු ගෙවීමට ඉඩ සලස්වනවා. ඒක සමාජය තුළ විශාල ගැටලුවක් ඇති කරන්න ඕනෑ දෙයක් නොවෙයි. අපි පියවරෙන් පියවර ඉදිරියට යනවා. තාක්ෂණය යොදා ගනිමින් එකකට එකක් සම්බන්ධ කරගෙන ඉදිරියට යනවා. DMT එක වුණත්, ඉඩම් සම්බන්ධයෙන් වුණත්, Sri Lanka Customs එක වුණත්, මේ රට ඇතුළේ තිබෙන ප්‍රධාන ආයතන අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ අන්තර් සම්බන්ධතාව ගොඩනැඟීමේ නීති රාමුවේ ගැටලු තිබෙනවා නම්, ඉදිරියේදී ඒවාත් වෙනස් කරගෙන ක්‍රමිකව අදාළ පියවර ගන්නවා. ඒ අනුව ඉතා පහසුවෙන් බදු ගෙවන්න පුළුවන්කම ලැබෙනවා.

මෙම සංශෝධනවලට අදාළ වෙන්නේ නැති වුණත්, අද VAT සම්බන්ධවත් කරුණු ඉදිරිපත් කළා. ඒ අනුව, සියයට 20.5ක VAT එකක් ගහනවා කියලා කිව්වා. ඒක වැරැදියි. අපි සංශෝධනයක් ඉදිරිපත් කළේ, මූල්‍ය සේවාවන් සඳහා පමණයි. මූල්‍ය සේවාවන් සඳහා VAT අය කරන්නේ සාමාන්‍ය VAT අය කරන විධියට නොවෙයි. එතැනදී VAT එක සියයට 18කුත්, SSCL එක සියයට 2.5කුත් අය කරනවා. ඒක අනෙක් භාණ්ඩවලටත් තිබෙනවා. අනෙක් භාණ්ඩවලට බදු අය කරන්නේ පදනම් දෙකකින්. වෙළෙඳාමක් නම්, නැත්නම් නිෂ්පාදනයක් නම්, සියයට 18ක් අය කරන පදනමත්, සියයට 2.5ක් අය කරන පදනමත් දෙකක්. හැබැයි, මූල්‍ය සේවාවලදී දෙකටම එකම පදනමක්. එහෙම නම්, මේ සරල කිරීම තුළින් සියයට 18 සහ සියයට 2.5 එකතු කරලා සියයට 20.5ක් අය කිරීම අපට වඩාත් ලෙහෙසි වෙනවා. VAT එක සියයට 25ක් ගහනවා කියලා වැරැදි කාරණයක් සමාජගත කර තිබෙනවා.

මේ කරුණු කාරණා තමයි මම ඉදිරිපත් කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ අනුව බදු අනුකූලතාව, සාධාරණ බව, බදු ගෙවීමේ පහසුව සඳහා විතරක් නොවෙයි, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා අදාළ වන ප්‍රධාන සංශෝධන දෙකක් මෙහි ඉදිරිපත් කර තිබෙනවා.

Thin capitalization කියන එක බලමු. ව්‍යාපාර ආයතන තමන්ගේ ප්‍රාග්ධනය යොදවනවාට අමතරව ණය ප්‍රාග්ධනය අරගෙන ව්‍යාපාර කටයුතු කරනවා. හැබැයි, මෙහි ගැටලුවක් තිබෙනවා. ඔවුන්ගේ ප්‍රාග්ධනය ගණනය කරනකොට ඍණ සංචිත තිබුණා නම්, ඔවුන්ට ඒ පොලිය අඩු කර ගැනීමේ නොහැකියාවක් තිබුණා කියලා අර්ථකථනයේ තිබෙනවා. අපි ඒ තත්ත්වය ඉවත් කරලා, ඒ ආයතනවලට පහසුවෙන් තමන් ගෙවන ලද පොලිය අඩු කළ හැකි වියදමක් විධියට සලස්වා තිබෙනවා, බදු ගෙවීමේ පහසුවට.

ඒ වාගේම ප්‍රාග්ධන දීමනාව ගැනීමට තිබෙන සීමාව අඩු කරනවා. ඒ කියන්නේ මිලියන තුනේ ආයෝජනය වෙනුවට ඒක ලක්ෂ දෙකහමාර දක්වා පහළට ගෙන එනවා. මේ සංශෝධනවල සාරාංශය සමස්තයක් වශයෙන් ගත්තාම බදු මූලධර්ම වැඩි කිරීමත්, බදු පදනම පුළුල් කිරීමත් සිදු වෙනවා. රාජ්‍ය මූල්‍ය විනය ස්ථාවර කර ගැනීමට හොඳ පදනමකට යෑමට අවශ්‍ය සංශෝධන ගණනාවක් තමයි මේක ඇතුළේ තිබෙන්නේ.

ඒත් එක්කම මම තවත් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. අද දවස පුරා මෙයට අදාළ නොවන කාරණා ඉදිරිපත් කළා. වාහන ආනයනය සම්බන්ධයෙන් බදු පැනවීම පිළිබඳව වැරදි තොරතුරු ඉදිරිපත් කළා. ඒ වාගේම විදේශ විනිමය සම්බන්ධයෙනුත් කරුණු ඉදිරිපත් කළා. ඇත්තටම මේ අවස්ථාව වෙනකොට අපට පාලනය කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ලෝක පරිමාණයෙන් ඇති වී තිබෙන යුද්ධයේදී තෙල් මිල ඉහළ යෑමත්, ඩොලරයට ඇති වෙච්ච ඉල්ලුමත් නිසා යම් තෙරපුමක්, යම් පීඩනයක් ඇවිල්ලා තිබෙනවා. ඒක කිසිදු ආකාරයකට මේ රට අර්බුදයට යන දෙයක් නොවෙයි. අපි ඒක පාලනය කරමින් ඉන්නවා. ඒ නිසා මම මහජනතාවට අවධාරණය කරනවා, ඔබ තොරතුරු විශ්ලේෂණය කරලා තීන්දු තීරණ ගන්නකොට බොරු තොරතුරුවලට, නොමඟ යවන තොරතුරුවලට, අපට විශ්වාස කරන්න බැරි තොරතුරුවලට යටත් වෙලා තීන්දු තීරණ ගන්න එපා කියලා. ඔබට සමහර අවස්ථාවලදී මූල්‍ය අලාභ විඳින්න සිදුවේවි. වෙළෙඳ පොළ ඇතුළේ වාහන මිල විශාල වශයෙන් ඉහළ යනවා කියලා කතිකාවක් මේ වෙනකොට ඇති කර තිබෙනවා. ඔබ එවැනි දේවල්වලට අහුවෙන්න එපා. එවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා නැහැ. බොහෝදුරට මේ වැරදි තොරතුරු ඉදිරිපත් කරන අය මේවායේ වින්දිතයන් බවට පත් වෙන්නේ නැහැ. ඇත්තටම වින්දිතයන් බවට පත් වෙන්නේ මේ වැරදි තොරතුරු දිහා බලලා වැරදි තීන්දු තීරණ ගන්න අය.

ඔබ විදේශ විනිමය සම්බන්ධයෙනුත් කලබල වෙලා අනවශ්‍ය විධියේ මුදල් ආයෝජනය කිරීම්, විදේශ වෙළෙඳපොළට මැදිහත්වීම් කළොත් ඔබට යම් ගැටලු ඇති වෙන්නට පුළුවන්. මෙවැනි අර්බුදයකදී වඩාත් හොඳ වෙන්නේ සාමූහිකව තිබෙන තොරතුරු මත කටයුතු කිරීමයි. සමාජ මාධ්‍ය හරහා ලැබෙන විශ්වාස කරන්නට බැරි තොරුතුරු, වැරදි ප්‍රකාශ පිළිබඳව විශ්වාස කරන්න එපා කියන ඉල්ලීම කරමින්, මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

தீர்மானிக்கப்பட்டது:

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[THE. HON. PRESIDING MEMBER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය)

වාසකම 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்)

CLAUSE 1.- *(Short title and the date of operation)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කරන්න."

(2) "2 වන පිටුවේ, 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

***1** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1, as amended, ordered to stand part of the Bill.

***2** සහ **3** වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
2ஆம், 3ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 2 and 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 18ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 4.- *(Amendment of section 18 of the principal enactment)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 11 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***4** වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.*
4ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, ordered to be left out of the Bill.

***5** සිට **8** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
5ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாகசம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 5 to 8 ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் 67ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 9.- *(Amendment of section 67 of the principal enactment)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "8 වන පිටුවේ, 6 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(2) "9 වන පිටුවේ, 1 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(3) "10 වන පිටුවේ, 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

***9** වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.*
9ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 9 ordered to be left out of the Bill.

***10** වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
10ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 10 ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 69ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 11.- *(Amendment of section 69 of the principal enactment)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ලබන ආයෝජන කාණ්ඩයේ නේවාසික වීසා' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

***11** වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 11, as amended, ordered to stand part of the Bill.

***12** සිට **27** තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
12ஆம் வாசகத்திலிருந்து 27ஆம் வாகசம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 12 to 27 ordered to stand part of the Bill.

28 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාසකම 28.- (මුදන්මෛச் சட்டவாக்கத்தின் 122ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 28.- *(Amendment of section 122 of the principal enactment)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "27 වන පිටුවේ, 5 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(2) "28 වන පිටුවේ, 1 වන පේළියේ සිට 28 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(3) "29 වන පිටුවේ, 1 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

28 වන වගන්තිය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.
28ஆம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 28, ordered to be left out of the Bill.

29 සහ 30 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
29ஆம் வாசகத்திலிருந்து 30ஆம் வாகசம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 29 and 30 ordered to stand part of the Bill.

31 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාසකම 31.- (මුදන්මෛச் சட்டவாக்கத்தின் 163ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 31.- *(Amendment of section 163 of the principal enactment)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "32 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, බදු ගෙවන්නා විසින් 139 වන වගන්තිය ප්‍රකාර ගෙවිය යුතු බද්ද පිළිබඳව පරිපාලන සමාලෝචනයක් ඉල්ලා සිටිනු ලැබ ඇති හෝ 140 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබ ඇති අවස්ථාවක දී සහ එම ඉල්ලීම විභාග වෙමින් පවතින අවස්ථාවක දී එවැනි සහතිකයක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.' "

(2) "34 වන පිටුවේ, 10 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'පිළිබඳව තීරණය කිරීමට හෝ ඒ නඩු කටයුතු දින තිහක් ඉක්මවන' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

31 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
31ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 31, as amended, ordered to stand part of the Bill.

32 සහ 33 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
32ஆம், 33ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 32 and 33 ordered to stand part of the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

34 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ දින 30 කියන එක දින 90 ලෙස තමයි පළමු සංශෝධනයෙන් අපි සඳහන් කර තිබෙන්නේ. එහිදී අවස්ථාවක් දෙන්න, දින 30කින් දඩයක්, දින 60කින් තවත් දඩයක්, දින 90කදී තවත් දඩයක් විධියට. එතකොට බදු ගෙවීම හිතාමතා මහ හරින අය අනිවාර්යයෙන් හසුවෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වංචනික ලෙස හිතාමතාම බදු ගෙවීම පැහැර හරින්නෙකු හසුකර ගැනීමට හැකිවන ආකාරයෙන් තමයි අපි දෙවන සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා මා පහත සඳහන් සංශෝධන තුන ඉදිරිපත් කරනවා:

(1) "39 වන පිටුවේ, 13 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'සිට දින අනූවක් ඇතුළත ඒ තැනැත්තා විසින් මේ' "

(2) "39 වන පිටුවේ, 19 සිට 22 දක්වා පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'වංචනික හේතු මත (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව කටයුතු ලෙස අපොහොසත් වන යම්' "

(3) "39 වන පිටුවේ, 31 වන පේළියෙන් ඉක්බිතිවම පහත පරිදි නව උපවගන්තියක් ඇතුළත් කරන්න:

'(3) යම් තැනැත්තෙකු පසුගිය වසර තුන ඇතුළත මෙම පනතේ XVII වන පරිච්ඡේදය යටතේ පෙරදී දඩුවමකට/දඩයකට යටත් වී සිටියේ නම් මිස, කොමසාරිස් ජනරාල්වරයා 185(අ)(2) වගන්තිය යටතේ ක්‍රියා නොකළ යුතුය.' "

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, එම සංශෝධනයට එකඟ ද?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

එම සංශෝධනයට අපි එකඟ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්පුමිකු சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ විරෝධතාව ප්‍රකාශ කළ යුතුයි, ඒක පිළිගත්තේ නැහැ කියලා. එම නිසා ඒක සටහන් කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විරෝධතාව සටහන් කරමි.

34 වන වගන්තිය ඇති සැටියෙන් සම්මත වූ බව සඳහන් කරමි.

34 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
34ආම් වාසකම් சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 34 ordered to stand part of the Bill.

35 සිට 44 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
35ආම් වාසකත්තිලිරුන්දු 44ආම් වාසකම් වරై சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 35 to 44 ordered to stand part of the Bill.

45 වන වගන්තිය.- (අඩුවෙන් කරන ලද ගෙවීම් සහ ප්‍රමාදව කරන ගෙවීම් මත වන යම් පොලියක් කපා හැරීම)

வாசகம் 45.- (குறைந்த செலுத்துகைகளுக்கும் பிந்திய செலுத்துகைகளுக்குமான வட்டியை பதிவழித்தல்)

CLAUSE 45.- *(Writing off any interest on underpayments and late payments)*

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

(1) "51 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'(අ) 2025 මාර්තු මස 31 වන දිනයෙන් අවසන් වන' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

45 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
45ආම් වාසකම් திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 45, as amended, ordered to stand part of the Bill.

46 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
46ආම් වාසකම් சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 46 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(මාණ්පුමිකු (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ සහ අංක දෝෂ නිවැරදි කර ගැනීම සඳහා සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

අලි-මිනිස් ගැටුමට තිරසර විසඳුමක්

යානෙ-මනිත මෝතලුක්කාන නිලෙයාන තීර්වු
SUSTAINABLE SOLUTION FOR HUMAN-ELEPHANT CONFLICT

[අ.භා. 5.16]

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අලි-මිනිස් ගැටුම හේතුවෙන් වටිනා මිනිස් ජීවිත මෙන්ම වනඅලින් ද අකාලයේ මිය යෑමේ සිද්ධීන් පසුගිය කාලයේ දිගින් දිගටම වාර්තා විය. මීට අමතරව නිවාස ඇතුළු වටිනා දේපළ මෙන්ම වගාබිම් විනාශ වන අවස්ථා ද නිරන්තරයෙන් වාර්තා වේ. එහි ආසන්නතම සිදුවීම ලෙස විල්ගමුව, හෙට්ටිපොල ප්‍රදේශයේදී පියෙකු සහ දියණියක වනඅලි ප්‍රහාරයකට ලක්ව අවාසනාවන්ත ලෙස මිය යෑමේ සිදුවීමක් ද අසන්නට ලැබිණි. ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත කර ඇති 5,500 සිට 6,000ක් පමණ වන වනඅලි ගහනයෙන් සියයට 70කට වඩා වැඩි සංඛ්‍යාවක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කළමනාකරණය කරන අලි ඇතුන් සහ අනෙකුත් වනසතුන් සඳහා වෙන් කර ඇති ආරක්ෂිත වනාන්තර ප්‍රදේශවලින් - protected areas - පිටත ජීවත් වන බවට අධ්‍යයනයකින් අනාවරණය කරගෙන ඇත. එවැනි පසුබිමක අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇතත්, (අලිවැට නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, අවශ්‍ය ස්ථාන සඳහා අලිවැට ස්ථාපිත නොවීම, නිසි පරිදි නඩත්තුවක් සිදු නොවීම) ඒවා අවශ්‍ය ප්‍රතිඵල ලබා දී නොමැති පසුබිමක තවදුරටත් මෙම ගැටලුව ජනතාවටත්, වනඅලින්ටත්, ජාතික ආර්ථිකයටත් බලපෑමක් නොවන ආකාරයෙන් කළමනාකරණය කර ගැනීම සඳහා තිරසර විසඳුමක අවශ්‍යතාව මේ ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම කථා කරන්නේ, හඬක් නඟන්නට බැරි දෙපිරිසක් පිළිබඳවයි. වනඅලින්ට ඡන්දය නැහැ; ගොවීන්ට භයිය නැහැ. අද අපට ඇහෙන්නේම, ගොවීන් සහ වනඅලි අතර ඇති වන මේ ගැටුම ගැන. මා නියෝජනය කරන මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රදේශයේදී මීට දින කිහිපයකට කලින් පියෙකු සහ දියණියක වනඅලි ප්‍රහාරයකින් ජීවිතක්ෂයට පත් වීම ඉතාම අවාසනාවන්ත සහ ආසන්නතම සිදුවීමයි. මෙතෙක් කාලයක් අලි-මිනිස් ගැටුම්වලින් මිය ගිය අයගේ පවුල්වල අයට මම මේ වෙලාවේ අපගේ සංවේගය ප්‍රකාශ කර සිටිනවා. ඒ සම්බන්ධයෙන් මාතලේ දිස්ත්‍රික්කයේ පවතින තත්ත්වය පිළිබඳව මම මුලින්ම පුංචි පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. මේ තොරතුරු මම අරගෙන තිබෙන්නේ, බකමූණ වනජීවී කාර්යාලයෙන්. ඒ තොරතුරු ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ඒ අනුව 2025-2026 වසර ඇතුළතදී අලි ඇතුන් 14කුත්, මිනිස් ජීවිත 12කුත් නැති වෙලා තිබෙනවා. ඒ වාගේම දේපළ හානි 50කුත් වාර්තා වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැන තිබෙන ගැටලුව තමයි, ඒ ජීවිත හානි වෙනුවෙන් තව වෙනකල් වන්දි නොගෙවීම, මරණයක් සිද්ධ වුණාම දෙන රුපියල් ලක්ෂය හැරුණුකොට. විල්ගමුව ගත්තොත්, මේ අවුරුදු දෙකට සිද්ධ වෙච්ච ජීවිත හානි 8ටම තවම වන්දි ගෙවීමක් සිද්ධ වෙලා නැහැ. මාතලේ දිස්ත්‍රික්කයේ වසම් 539න් 100කට ආසන්න ප්‍රමාණයක්, එහෙම නැත්නම් ඊට වඩා වැඩි ප්‍රමාණයක් වනඅලි තර්ජනයට ලක් වෙමින් තිබෙනවා. මම මේ කථා කළේ, මාතලේ දිස්ත්‍රික්කය ගැන විතරයි. ඊට ආසන්නව පොළොන්නරුව දිස්ත්‍රික්කය තිබෙනවා. ඊට එහා පැත්තෙන් අම්පාර දිස්ත්‍රික්කය තිබෙනවා. ඒ විධියට ගත්තාම උතුරේ ඉඳලා දකුණ දක්වා ලංකාව පුරාම අලි-මිනිස් ගැටුම දිගින් දිගටම පවතිනවා. ඒ නිසා මම යෝජනා කරන්නේ, ඒ සඳහා තිරසර විසඳුමක් අපි ගෙන එන්නට ඕනෑ කියලායි. අපි ඒ පිළිබඳව විද්‍යාත්මක ප්‍රවේශයකින් බලන්න ඕනෑය කියලා මම කියනවා. මොකද, මේ ප්‍රශ්නය පරණයි. හැබැයි, පිළිතුරු පරණ වෙන්න බැහැ. අපට මේවාට අලුත් පිළිතුරු ඕනෑ.

දැන් ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 82ක මිනිස්සු ජීවත් වෙනවා; සියයට 62ක අලි ඇතුන් ජීවත් වෙනවා. ඒ වාගේම ඒ දෙගොල්ලන්ම එකට ජීවත් වන භූමි ප්‍රමාණය සියයට 44යි. මේ ගැටුම එන්නේ, මෙන්න මේ සියයට 44ක් වන භූමිය ඇතුළේ. එතකොට අපට පෙනෙනවා, එතැන ගැටලුවක් තිබෙන බව. ඒ මොකක්ද? එකක් තමයි, ඒ ඉඩම් පරිහරණය පිළිබඳ ගැටලුව. මම මේ අලි-මිනිස් ගැටුම පිළිබඳව දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ කථා කරලා තිබෙනවා; යෝජනා ගෙනැල්ලා තිබෙනවා. ලෝකයේ වෙනත් රටවල් ඒවාට ගෙනෙන පිළියම් මොනවාද කියන එකත් අපි කථා කරලා තිබෙනවා. හැබැයි, ඒවා ක්‍රියාත්මක වෙනවාද යන්න පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම යෝජනා කරනවා, land-use plan එකක් අපට අවශ්‍ය බව. ඒ වාගේම අපට කෘෂිකර්මය අත්හැරලා යන්නත් බැහැ. හැබැයි, නව විද්‍යාත්මක ක්‍රම අනුව අඩු භූමි ප්‍රමාණයකින් වැඩි ඵලදාවක් - අස්වැන්නක්- ලැබෙන භෝග සම්බන්ධයෙන් අපි මීට වඩා පරීක්ෂණ කරන්න, කථා කරන්න ඕනෑ.

ඒ වාගේම අලි වැට සම්බන්ධයෙන් ගත්තාම තවදුරටත් ඒ සඳහා ලී කණු සුදුසුද? අලියා ලී කණු තල්ලු කරලා, ලස්සනට අලි වැටෙන් පැනලා එනවා. එහෙම නම් ඒ ලී කණු සුදුසුද, ඒ සඳහා අපි විකල්ප ගෙනෙනවාද? ඒ වාගේම විදුලි වැටේ ප්‍රමිතිය සම්බන්ධයෙනුත් ගැටලු තිබෙනවා. ඒ වාගේම මේ කටයුතු නියාමනය සම්බන්ධයෙනුත් ගැටලු තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තාම වනජීවී සංරක්ෂණ කාර්යාලවල පවතින යටිතල පහසුකම් සම්බන්ධයෙනුත් ගැටලු තිබෙනවා. ඒ සඳහා සුදුසු වාහන නැහැ. බයිසිකලයේ ගිහිල්ලා අලි එළවන්න බැහැ. 2015න් පස්සේ වාහන ලබා දීලා නැහැ.

ඒ වාගේම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ගත්තොත්, ඒ අයට අවශ්‍ය වන cadre එක 2019න් පස්සේ බඳවා ගෙන නැහැ. එමෙන්ම අලි වෙඩිවල භීතියක් තිබෙනවා. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් එකතු වෙලා තමයි මේ ගැටුම හැදෙන්නේ. ඒ නිසා මම යෝජනා කරනවා, ඒ ප්‍රශ්නවලට විසඳුම් දෙන්න ඕනෑ කියලා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න කැමතියි. මේ රටේ තිබෙන මෙවැනි දැවෙන ප්‍රශ්න පිළිබඳව ගරු විපක්ෂ නායකතුමාගේ උපදෙස් මත විපක්ෂ නායක කාර්යාලයේ පැවති සාකච්ඡාවකදී ආචාර්ය පෘථිවිරාජ් ප්‍රනාන්දු මහතා, හේමන්ත විතානගේ මහතා සහ මහාචාර්ය විශාකා සූරියබණ්ඩාර මහත්මිය මේ අලි-මිනිස් ගැටුම නිරාකරණය කිරීම සඳහා ඉදිරිපත් කරපු නිර්දේශ ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව කථා කරන්න වෙලාව නැති නිසා ඒ නිර්දේශ ඇතුළත් පත්‍රිකාව මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මේ පත්‍රිකාව අරගෙන බලන්න. මේ පත්‍රිකාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, තිබෙන ගැටලු මොනවාද කියලා. එම නිසා ඒ ගැටලු සම්බන්ධයෙන් සොයා බලා විධිමත්ව කටයුතු කරන්න කියා මම යෝජනා කරනවා. මේවා තනියෙන් රජයකට පමණක් නියාමනය කරන්න පුළුවන්ද? අලි වැට නඩත්තු කරන්න පුළුවන්ද? ලෝකයේ රටවල් මේ සඳහා නොයෙක් ක්‍රම භාවිත කරනවා. නියාමනය රජය යටතේ නියාගෙන, මෙම ගැටලුව විසඳීමට හැකි විධිමත් ආයතනික ව්‍යුහයක් සකස් කරන්න කියා මම යෝජනා කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම අලි-මිනිස් ගැටුම නියාමනය කිරීම රජය යටතේ තබා ගෙන, වගකීමක් දැරිය හැකි වෙනත් සුවිශේෂී පාර්ශ්ව මේ කටයුත්තට දායක කර ගන්න කියාත් මම ඉල්ලීමක් කරනවා. මොකද, මේ නැති වෙන්නේ මිනිස් ජීවිත. මිනිස්සු වාගේම වන සතුන්ද මේ පොළොවට අයිතිවාසිකම් කියනවා. එම නිසා ඒ සතුන්ට තිබෙන අයිතියත් ආරක්ෂා කර දීම රජයේ වගකීමක් සහ යුතුකමක් බව ප්‍රකාශ කරමින්, මින් ඉදිරියටවත් මේ දෙපාර්ශ්වයේම ජීවිත රැක ගැනීමට හැකි ආනි විධිමත් තිරසර වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම ඒ විෂ්දිතයින් වෙනුවෙන් අවශ්‍ය වන්දි ලබා දීම කඩිනම් කරන්න කියාත් මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද යෝජනාව මා ස්ථිර කරනවා.

අපේ රටේ දශක තුනක් පැවති යුද්ධය අවසන් වෙලා අවුරුදු 17ක් සැපිරීම සමරන මේ අවස්ථාවේදී රණවිරුන්ට සහ යුද සමයේ නායකත්වය ලබා දුන් රාජ්‍ය නායකයන් සියලුදෙනාටම මා ස්තුතිවන්ත වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලි-මිනිස් ගැටුම කියන්නේ, මම හිතන විධියට දීර්ඝ කාලයක් තිස්සේ කිසිම කෙනෙකුට කිසිම විසඳුමක් දෙන්න බැරි වුණු ගැටලුවක්. 2026 ජනවාරි මාසයේ 01වැනි දා ඉඳලා අප්‍රේල් මාසයේ 30වැනි දා දක්වා වන මාස 4ක වාගේ කාලය තුළ අලි-මිනිස් ගැටුම නිසා අපේ රටේ මිනිස්සු 35දෙනෙකුත්, අලින් 117කුත් මිය ගිහිල්ලා තිබෙනවා. මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඒ කාලය තුළ අලින් 22ක් සහ මිනිස්සු 7දෙනෙක් මිය ගොස් තිබෙනවා. ඒ වාගේම දේපළ හානි සිදු වෙලා තිබෙනවා; වගා බිම් සම්පූර්ණයෙන්ම නැති වෙලා තිබෙනවා. මට මතකයි, අය වැයෙනුත් විශාල මුදලක් අලි වැටවල් ඉදිකිරීම වෙනුවෙන් වෙන් කළ බව. නමුත්, රජයක් විධියට මොන යෝජනා ඉදිරිපත් කළත් ඒ කිසිම දෙයක් සාර්ථක වෙන්නේ නැහැ. ඒකට ඒ පළාත්වල ඉන්න මිනිස්සුන්ට වැරදි විධියට ඉඩම් ලබා දීම බලපා තිබෙනවා. ඒ නිසා අලින්ට ඉන්න තිබෙන ස්ථාන නැති වෙලා තිබෙනවා.

පොළොන්නරුවේ මාදුරු ඔය ජාතික වනෝද්‍යානය තිබෙනවා. ජාතික වනෝද්‍යානයක් ඇතුළේ මී හරක් ඉන්න බැහැ; ගම්වල සිටින කිරි හරක් ඉන්න බැහැ. දීර්ඝ කාලයක් තිස්සේ මේ ප්‍රශ්නය තිබෙනවා. ජාතික වනෝද්‍යානයක් ඇතුළේ වන සත්තු තමයි ඉන්න ඕනෑ. අපි මේ ප්‍රශ්නය දිගින් දිගටම කිව්වත් මේකට නිසි විසඳුමක් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා.

දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන්නේ විශාල ගොවි ජනපදයක්. ජාතික වනෝද්‍යානය තුළ හරක් ඉන්න නිසා අලි ටික ගම් වැදීම හේතුවෙන් අද වනකොට විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිඹුලාගල අධ්‍යාපන කලාපයේ පාසල් 99ක් තිබෙනවා. ඒ පාසල් 99ටම අලි-මිනිස් ගැටුම බලපා තිබෙනවා. පසුගිය මාසයේ පාසල් යන දරුවෙක් එම පාසල ඉස්සරහදීම අලියෙකු පහර දීම නිසා මරණයට පත් වුණා. ඒ වාගේම වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙන මූලික රෝහලේ සිටින කිසිම ලෙඩෙකුට රෑට එළියටවත් එන්න බැහැ. මොකද, එතැන අලි ඉන්නවා. මේ ගැන දිගින් දිගටම අපි කියලා තිබෙනවා. ඒ වාගේම හිඟුරක්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් 96ක් තිබෙනවා. ඒ පාසල් 96 අතරින් පාසල් 59කටම මේ අලි-මිනිස් ගැටුම බලපා තිබෙනවා. මේ ප්‍රශ්නය පිළිබඳව අපි දිගින් දිගටම පාර්ලිමේන්තුවේදී කථා කරනවා; කාරක සභාවලදී පෙන්වා දෙනවා. නමුත්, මේ ප්‍රශ්නයට මේ වනතුරු විසඳුමක් දෙන්න බැරි වෙලා තිබෙනවා.

අලි වැට හැදුවාට විතරක් වැඩක් නැහැ. ඒ අලි වැට ගැන පසුවිපරමක් කරන්න වෙනවා. අලි වැටේ නියමිත ධාරිතාව නැති වනකොට ඒ අලි වැටෙන් වැඩක් නැහැ. පසුගිය කාලයේ ඒ ධාරිතාව ගන්න තිබෙන බැටරිවල විශාල අඩුපාඩුවක් තිබුණා. අලි වැට කොච්චර ශක්තිමත්ව තිබුණත් ඒවා නඩත්තු වෙන්නේ නැත්නම් ඒවා කඩා ගෙන අලි ගම් ඇතුළට එනවා.

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් විශාල ප්‍රමාණයක් දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබෙනවා. ඒක හොඳයි. දීමනාවක් වශයෙන් රුපියල් 22,500ක් ඒ අයට ලබා දෙනවා කිව්වා. මේ වනකොට මාස හයක් විතර වෙනවා, ඒ අය අනුයුක්ත වෙලා. නමුත්, ඒ දීමනාව තවම ඔවුන්ට ලබා දීලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අයට මේ කටයුතු කරන්න විශාල මුදලක් වැය වෙනවා. ඒගොල්ලන් ඈත ප්‍රදේශවල ඉඳලා මෝටර්සයිකලේ තෙල් ගහගෙන එන්න ඕනෑ. ඒ නිසා ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. මම හිතන්නේ අවම පහසුකම් තිබෙන නිලධාරි කණ්ඩායමක් තමයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉන්නේ. ගරු පරිසර ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ ඉන්නවා. මා හිතන හැටියට ඔබතුමා ඒ ගැන හොයා බලනවා. අපි පොළොන්නරුවේ ජනතාවගෙන් ඒ ගැන හොයා බැලුවා. එතකොට දැනගන්න ලැබුණා, ඔබතුමා ඒ අයත් එක්ක ඒ ගැන සාකච්ඡා කරලා තිබුණා කියලා.

ගරු ඇමතිතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැවති විශාල අඩුපාඩුවක් තමයි, සේවකයන්ගේ හිඟය. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරින් එතැනට අනුයුක්ත කරපු නිසා මම හිතන විධියට දැන් ඒ ප්‍රශ්නය විසඳිලා තිබෙනවා. එම නිසා ඒ අයට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

අපේ ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය කිව්ව විධියට වාහනවල අඩුපාඩුවක් තිබෙනවා. ඔබතුමා අද උදේ කිව්වා, ඒ වාහන ගෙන්වන්න දැන් ක්‍රියාත්මක වෙනවා කියලා. ඒ කටයුතු කඩිනම්ව සිදු විය යුතු වෙනවා. ඒ දේවල් නිසි විධියට ක්‍රියාත්මක වුණොත් අපේ රටේ අලි-මිනිස් ගැටුම අවම කර ගන්න පුළුවන්.

විශේෂයෙන්ම ගොවි ජනපදවල ජීවත් වන ගොවීන් අස්වැන්න නෙළන කාලයට තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නේ. යල කන්නය දැන් ආරම්භ කර තිබෙනවා. ගොවි මහත්වරු අස්වැන්න ගෙනෙන්නේ ගෙදරට. ඒ අයට ඒ වී ටික ගබඩා කර ගන්න

[ගරු කිංස් නෙල්සන් මහතා]

පහසුකම් නැහැ; තැන් නැහැ. ඒ නිසා ඔවුන් ගෙදර තමයි වී ටික තියාගෙන ඉන්නේ. අලි පුරුදු වෙලා තිබෙනවා, ගෙවල් කඩලා විනාශ කර දමලා වී ටික කන්න. ඒ නිසා මම යෝජනා කරනවා, ගොවි සංවිධානවලින් අහලා වී එක්රැස් කරගෙන ඉන්න ගොවීන් හඳුනා ගෙන ඒ අයට කන්ටේනර් ලබා දෙන්න කියලා. මේ කාරණය දිගින් දිගටම මම යෝජනා කර තිබෙනවා. අලියෙකුට කන්ටේනරයක් කඩන්න බැහැ. ඒ නිසා කන්ටේනර් ලබා දුන්නොත් වී ටික ගබඩා කරන්න ගොවීන්ට හැකියාව ලැබෙනවා.

